ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

මාර්ග සංවර්ධන අධිකාරිය

වාර්ෂික වාර්තාව

2024

“ප්‍රගතිය සඳහා මහ සාදමින්”

-සම්බන්ධතාවය වැඩිදියුණු කරමින් -සංවර්ධනයට සහාය වෙමින් -සුරක්ෂිතතාව සහතික කරමින්



පෙරවදන

මාර්ග සංවර්ධන අධිකාරියේ 2024 වර්ෂයේ මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කරනු ලබන්නේ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021 හි දැක්වෙන උපදෙස්වලට අනුකූලවය.

මෙම වාර්ෂික වාර්තාව මගින් සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳව පුළුල් දළ විශ්ලේෂණයක් ලබාදෙනු ඇත.

පටුන

හැඳින්වීම	01-16
මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය	17-229
කළමනාකරණයේ සාකච්ඡා සහ විශ්ලේෂණය	230 – 239
සාමූහික සමාජ වගකීම පිළිබඳ වාර්තාව	240-242
මූල්‍ය ප්‍රකාශන	243-245

>>සංකේත නාම

AADT	වාර්ෂික සාමාන්‍ය දෛනික රථ ගමනාගමනය
AC	ඇස්පෝල්ට් කොංක්‍රීට්
AD	අතිරේක අධ්‍යක්ෂ
ADB	ආසියානු සංවර්ධන බැංකුව
ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ADT	සාමාන්‍ය දෛනික රථ ගමනාගමනය
AEC	අබ්දුල්හාදි ඉංජිනේරු උපදේශක මණ්ඩලය
AECO	අබුල්ජෙබෙන් ඉංජිනේරු උපදේශන කාර්යාලය
AIMS	වත්කම් තොරතුරු කළමනාකරණ පද්ධතිය
AIV	සමාහාර බලපෑම් අගය
AMC	විගණන හා කළමනාකාර කමිටුව
AVS	වත්කම් තක්සේරු කිරීමේ පද්ධතිය
BCRIP	බදුල්ල - චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
BDS	පාලම් දත්ත පද්ධතිය
BIMSTEC	බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාව සඳහා බෙංගාල බොක්කේ ආරම්භය
BM&AU	පාලම් කලමනාකරණය සහ තක්සේරු ඒකකය
BMS	පාලම් කළමනාකරණ ක්‍රමය
BOC	ලංකා බැංකුව
BoD	අධ්‍යක්ෂ මණ්ඩලය
BOI	ආයෝජන මණ්ඩලය
BOQ	ප්‍රමාණ පත්‍රය
CBMAC	කාබන් කළු මිශ්‍ර ඇස්පෝල්ට් කොන්ක්‍රීට්
CBR	කැලිෆෝනියානු ඉසුලුම් අනුපාතය
CCD	වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
CE	ප්‍රධාන ඉංජිනේරු / මධ්‍යම සීඝ්‍රගාමී මාර්ගය
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලිබල මණ්ඩලය
CEC	උපදේශක ඉංජිනේරුවරු සහ කොන්ත්‍රාත්කරුවන්
CEO	ප්‍රධාන විධායකයක නිලධාරි
CEP	මධ්‍යම සීඝ්‍රගාමී මාර්ග ව්‍යාපෘතිය
CERC	අසම්භාව්‍ය හදිසි ප්‍රතිචාර සංරචකය
CGHW	කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය
CH	දම්වැල් ගණන
CIDA	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
CIMS	බිඳවැටීම් තොරතුරු කළමනාකරණ පද්ධතිය
CKE	කොළඹ-කටුනායක සීඝ්‍රගාමී මාර්ගය
CMA	කොළඹ මෙට්‍රොපොලිටන් ප්‍රදේශය
CNSA	සම්මත අක්ෂවල සමුච්චිත ගණන
CPC	උපදේශක ප්‍රසම්පාදන කමිටු
CPD	අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය
CRWB	කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව
CSP	සංයුක්ත උපයාමාර්ගික සැලැස්ම
CSR	සාමූහික සමාජ වගකීම
DAB	ආරවුල් විනිශ්චය මණ්ඩලය
DCP	ගතික කාවැදුම් අවබෝධය
DDG	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
DG	අධ්‍යක්ෂ ජනරාල්
DFAT	විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව
DIS	ආපදා තොරතුරු පද්ධතිය
DS	ප්‍රාදේශීය ලේකම් කාර්යාල
EDMS	විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධතිය
EE	විධායක ඉංජිනේරු
e-GP	විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය
EIA	පාරිසරික බලපෑම් තක්සේරුව
EM&P	සීඝ්‍රගාමී මාර්ග කළමනාකරණය සහ ව්‍යාපෘති
EOI	උනන්දුව ප්‍රකාශ කිරීම
EOM&M	සීඝ්‍රගාමී මාර්ග මෙහෙයුම්, නඩත්තුව සහ කළමනාකරණය
EOT	කාලය දීර්ඝ කිරීම
ERD	භාහිර සම්පත් දෙපාර්තමේන්තුව
ESCMR	පාරිසරික ආරක්ෂණ අනුකූලතා නිරීක්ෂණ වාර්තාව
ESDD	පාරිසරික සහ සමාජ සංවාර්ධන අංශය
ESEP	දකුණු සීඝ්‍රගාමී මාර්ග ව්‍යාපෘතිය දීර්ඝ කිරීම
ESMP	පාරිසරික හා සමාජ කළමනාකරණ සැලසුම්
ESSR	පාරිසරිහා හා සමාජ නිවාරණ වාර්තා
ETC	ඉලෙක්ට්‍රෝනිකව බදු එකතු කිරීම
FMS	ගෘහභාණ්ඩ කළමනාකරණ පද්ධතිය
FR	මූල්‍ය රෙගුලාසි
FWD	වැටුම් බර උත්ක්‍රමානය
GCF	හරිත කාලගුණික අරමුදල
GHG	හරිතාගාර වායු
GIS	භූගෝලීය තොරතුරු පද්ධතිය
GOSL	ශ්‍රී ලංකා රජය
GPR	පොළොව විනිවිද යන රේඩාර්
GPS	ගෝලීය පිහිටුම් පද්ධතිය
HDM	මහා මාර්ග සංවර්ධනය සහ කළමනාකරණය
HIMS	සීඝ්‍රගාමී මාර්ග තොරතුරු කළමනාකරණ පද්ධතිය
HRD	මානව සම්පත් සංවර්ධනය
HRM	මානව සම්පත් කළමනාකරණය
HRMIS	මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය
HSR	අභ්‍යන්තර විගණන අංශය
IAD	අධිවේගී මාර්ග ගාස්ත්‍ර ලේඛනය
IC	අතුරුමාරුව
ICAHETS	සීඝ්‍රගාමී මාර්ග ඉංජිනේරු හා ප්‍රවාහන පද්ධති ප්‍රගමනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව
ICDP	සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය
ICT	සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය
ICTAD	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධනය කිරීමේ ආයතනය
IEE	මූලික පාරිසරික පරීක්ෂණ
IESL	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
IMF	ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
IPA	අතුරු ගෙවීම් ඉල්ලුම්පත්‍ර
IPC	අතුරු ගෙවීම් සහතිකය
IRI	රළු බව මැනීමේ ජාත්‍යන්තර දර්ශකය
IRSTM	යටිතල, මාර්ග ආරක්ෂාව සහ රථ වාහන කළමනාකරණය
ISO	ප්‍රමිතිකරණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය

IT	තොරතුරු තාක්ෂණය
JICA	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය
JV	බද්ධ ව්‍යාපාරය
KFAED	අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවෙයිට් අරමුදල
km	කිලෝමීටර්
KMTTDP	මහනුවර බහුමාත ප්‍රවාහන පර්යන්ත සංවර්ධනය ව්‍යාපෘතිය
KOICA	කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
KPI	ප්‍රධාන කාර්යසාධන දර්ශකය
KWD	කුවෙයිට් ඩිනාර්
LAN	ප්‍රාදේශීය පළාත් ජාලකය
LBFP & RRP	ප්‍රාදේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය
LECO	සීමාසහිත ලංකා විදුලි සමාගම
LHS	වමත් පස
LKR	ශ්‍රී ලංකා රුපියල්
LMC	Landing Craft-Mechanized
LOA	ප්‍රතිග්‍රාහක ලිපිය
LOS	සේවා මට්ටම
MA	කළමනාකරණ සහකාර
MCC	අතින් සිදුකරනු ලබන වර්ගීකරණ ගණන් ගැනීම / චීන ලෝහ විද්‍යා සංස්ථාව
Meng.	ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් උපාධිය
MFAP	විදේශාධාර ලබන විවිධ ව්‍යාපෘති
MFF	මල්ටි ට්‍රැන්ච් මූල්‍ය පහසුකම
MFNSV	බහු-කාර්ය ජාලක සමීක්ෂණ වාහකය
MIS	කළමනාකරණ තොරතුරු පද්ධතිය
MLFF	බහු මංතීරු නිදහස් ගැලීම
Mn	මිලියන
MOT&H	ප්‍රවාහන සහ මහා මාර්ග අමාත්‍යාංශය
MOTHP&CA	ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
MOU	අවබෝධතා ගිවිසුම
MSc.	විද්‍යාවේදී උසස් උපාධිය
MSD	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
MT	මෙට්‍රික් ටොන්
NAITA	ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය
NCC	ජාතික දේශගුණික වෙනස්වීම
NDCs	ජාතිකමය වශයෙන් නියම කරන ලද දායකත්ව
NIBM	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය
NITC	ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව
NOR	ජාතික මෙහෙයුම් මැදිරිය
NPD	ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
NRMP	ජාතික මාර්ග ප්‍රධාන සැලැස්ම
NSDI	ජාතික අවකාශ දත්ත යටිතල ව්‍යුහය
NTDBMS	ජාතික රථවාහන දත්ත ගබඩා කළමනාකරණ පද්ධතිය
NTRO	ජාතික මාර්ග ප්‍රවාහන සංවිධානය
NWSDB	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
OAS	අනිකුත් වත්කම් පද්ධති
OCHP	පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
OD	මූලෝත්පත්ති ගමනාන්තය
OFID	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා OPEC අරමුදල
OPEC	ඛණිජ තෙල් අපනයන රටවල සංවිධානය
PAEHP	වරාය ප්‍රවේශ උන්නත සීඝ්‍රගාමී මාර්ග ව්‍යාපෘතිය
PBM	කාර්යසාධනය පදනම් කරගත් නඩත්තු කිරීම
PD	පළාත් අධ්‍යක්ෂ / ව්‍යාපෘති අධ්‍යක්ෂ
PG	පශ්චාත් උපාධි
PIU	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක
PM&R	දේපළ කළමනාකරණය සහ ආදායම
PMU	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
PPP	රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර
R&D	පර්යේෂණ හා සංවර්ධන
RAM	මාර්ග තක්සේරු කළමනාකරණය
RAMP	විශාල ව්‍යාපෘති නැවත උපායමාර්ගීකරණය සහ කඩිනම් කිරීම
RAP	පිළිසකර කරන ලද ඇස්පෝල්ට් පදික වේදිකාව / ප්‍රතිවාසන ක්‍රියාකාරී සැලසුම්
RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
REP	රුවන්පුර සීඝ්‍රගාමී මාර්ග ව්‍යාපෘතිය
RHS	දකුණත් පස
RIS	මාර්ග තොරතුරු පද්ධතිය
RMC	මාර්ග කළමනාකරණ කොන්ත්‍රාත්තුව
RM&M	මාර්ග නඩත්තුව සහ කළමනාකරණය
RMMS	මාර්ග නඩත්තු හා කළමනාකරණ පද්ධතිය
RMTF	මාර්ග නඩත්තු භාර අරමුදල
Rs	රුපියල්
RWI	මාර්ග වැඩ වැඩිදියුණු කිරීම
SARIC	දකුණු ආසියානු කලාපීය යටිතල සම්බන්ධතාවය
SDFL	නිපුණතා සංවර්ධන අරමුදල
SDGs	තිරසර සංවර්ධන ඉලක්ක
SE	දක්ෂිණ අධිවේගී මාර්ගය
SEIA	පරිසූරක පාරිසරික බලපෑම් තක්සේරු කිරීම
SFD	සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල
SIL	සහසය ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
SLGS	ශ්‍රී ලංකා භූ තාක්ෂණික සංගමය
SLIIT	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණායතනය
SLPA	ශ්‍රී ලංකා වරාය අධිකාරිය
SLRAMS	ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය
SLT	ශ්‍රී ලංකා ටෙලිකොම්
SLTDBMS	ශ්‍රී ලංකා රථ වාහන දත්ත ගබඩාව කළමනාකරණ පද්ධතිය
SOR	බඳවා ගැනීමේ විස්තරය
SPMU	විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
SRCP	දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය
SSCM	ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහා සම්මත පිරිවිතර
SSCMR	විශේෂ ආරක්ෂණ අනුකූලතා නිරීක්ෂණ වාර්තාව
SSL	ආරක්ෂිත සොකට් ස්ථරය
SSR	ගාස්තු පිළිබඳ විශේෂ උපලේඛනය
STDP	දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
STRADA	රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධතිය
TAS	තුනී ඇස්පෝල්ට් මතුපිට ඔප දැමීම
TCAMP	ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය

TEC	තාක්ෂණික ඇගයීම් කමිටුව / මූළු ඇස්තමේන්තු පිරිවැය
TIA	රථවාහන බලපෑම් තක්සේරුව
TLS	ප්‍රවාහන ස්ථර ආරක්ෂාව / රථවාහන ආලෝක සංඥා
TOR	විෂය ක්ෂේත්‍රය
TQM	පූර්ණ තත්ත්ව කළමනාකරණය
TSA	ප්‍රවාහන පද්ධති විශ්ලේෂණය
UDA	නාගරික සංවර්ධන අධිකාරිය

USD	එක්සත් ජනපද ඩොලර්
VAT	එකතු කළ අගය මත බද්ද
VMS	රථවාහන කළමනාකරණ පද්ධතිය
VVIP	ඉතාමත් වැදගත් පුද්ගලයා
WB	ලෝක බැංකුව
WP	බස්නාහිර පළාත
WMA	උණුසුම් මිශ්‍ර ඇස්පෝල්ට්

අපගේ දැක්ම

“සම්බන්ධතාවය වැඩිදියුණු කරමින්, සමෘද්ධිය කරා තිරසාරව කටයුතු කරමින්: ලෝක මට්ටමේ මාර්ගවලින් සම්බන්ධ කරන ලද අනාගතයට සූදානම් ශ්‍රී ලංකාවක්.”

අපගේ මෙහෙවර

“මාර්ග අංශයේ ප්‍රමුඛ ජාතික ආයතනය වශයෙන් ජාතියේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා මාවත විවර කරමින් මහජනතාවට ගමන් කිරීමට හා භාණ්ඩ ප්‍රවාහනයට සුරක්ෂිත බවේ හා සපපහසුවේ පිළිගත හැකි මට්ටමකින් සවලතාව සහ ප්‍රවේශත්වය වගබලා ගනිමින් තිරසර හා දේශගුණික ප්‍රත්‍යාස්ථ ආකාරයකින් ප්‍රමාණවත් සහ කාර්යක්ෂම ජාතික සීඝ්‍රගාමී මාර්ග ජාලයක් සැපයීම.”

අපගේ වටිනාකම්

- පූර්ණ තත්ත්ව කළමනාකරණ
- ජාතියට සේවය
- කාර්යක්ෂමතාවය සහ ඵළදායිතාව
- නව්‍යකරණය
- තිරසර බව
- සුරක්ෂිත බව හා සැපපහසුව
- කැපවීම
- වෘත්තීය දක්ෂකම

සභාපතිතුමාගේ පණිවිඩය



ටී. පාස්කරන්
සභාපති

> ග්‍රාමීය සම්බන්ධතාවය උසස් තත්ත්වයට ගෙනඑමින් සහ අපගේ සියලුම ප්‍රයත්නයන්වලදී තිරසර ක්‍රියාපිළිවෙත් අනුගමනය කරමින් අපගේ මාර්ග ජාලය තවදුරටත් පුළුල් කිරීමට අපි කැපවී සිටිමු.

මාර්ග සංවර්ධන අධිකාරියේ (මා.සං.අ.) 2024 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටට පත්වෙමි. ශ්‍රී ලංකාවේ මාර්ග යටිතල ව්‍යුහය උසස් තත්ත්වයට ගෙනඒමට තිබූ බාධකවලට මුහුණ දෙමින් අප විසින් අඛණ්ඩව කටයුතු කිරීම සහ එමගින් ජාතියේ ආර්ථික සංවර්ධනයට දායකත්වයක් ලබාදීමට හැකිවීම තුළින් මෙම වර්ෂය තුළ සුවිශේෂී ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

2024 වර්ෂය මා.සං. අධිකාරියේ වැඩිදියුණුවක් පෙන්වූ වසරක් විය. පෙර වර්ෂවලදී තබන මුලපිරීම් මත කටයුතු කරමින්, සම්බන්ධතාවය උසස් තත්ත්වයට ගෙනඑමින් සහ ජාතියේ වැඩිවන අවශ්‍යතා සපුරාලීමට නව විසඳුම් ක්‍රියාත්මක කරමින් අපගේ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සඳහා අප විසින් සැලකිය යුතු පියවරයන් ගණනාවක් තබා ඇත.

අනාගතය වෙත අවධානය යොමුකරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය උදෙසා මා.සං. අධිකාරිය තීරණාත්මක කාර්යභාරයක් ඉටුකිරීමට සූදානමින් සිටී. ග්‍රාමීය සම්බන්ධතාවය උසස් තත්ත්වයට ගෙනඑමින් සහ අපගේ සියලුම ප්‍රයත්නයන්වලදී තිරසර ක්‍රියාපිළිවෙත් අනුගමනය කරමින් අපගේ මාර්ග ජාලය තවදුරටත් පුළුල් කිරීමට අපි කැපවී සිටිමු.

මේ සඳහා අඛණ්ඩ සහයෝගය ලබාදුන් කැපවීමෙන් වැඩකළ අපගේ කාර්යමණ්ඩලයට, රජයේ හවුල්කරුවන්ට, පෞද්ගලික අංශයේ සහායකයින්ට සහ මහජනතාවට සහ ඔවුන් මා.සං. අධිකාරිය කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් මම මාගේ හෘදයාංගම කෘතඥතාවය පිරිනමමි. ඔබගේ දායකත්වය අපගේ සාර්ථකත්වය කෙරෙහි මහෝපකාරී විය.

පිරිසිදු සහ හරිත අනාගතයක් උදෙසා අපගේ කැපවීමේ ප්‍රමාණය කෙතරම්ද යත්, අපගේ දැක්ම වන පිරිසිදු ශ්‍රී ලංකාවක් උදෙසා අපගේ ව්‍යාපෘතිවල දායකත්වය ලබාදීමට වගබලා ගනිමින් අධිවේගී මාර්ග ඉදිකිරීම, මෙහෙයවීම සහ නඩත්තු කිරීම සඳහා පරිසර හිතකාමී පරිවයන් සහ තිරසර නිර්මාණ මූලධර්ම ප්‍රමුඛගත කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය අඛණ්ඩව කටයුතු කරනු ඇත.

2025 වර්ෂය තුළදී වඩ වඩාත් කැපවීමෙන් වැඩකිරීමට අපි බලාපොරොත්තු වෙමු.

මා.සං. අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය



ඊ. පාස්කරන් මහතා
සභාපති

ඉංජිනේරු ඊ. පාස්කරන් මහතා මා.සං. අධිකාරියේ සභාපති වශයෙන් 2024 ඔක්තෝම්බර් මස 07 වෙනි දින අධ්‍යක්ෂක මණ්ඩලට පත්කරන ලදි. ඔහු සිය මුල් අධ්‍යාපනය යාපනයේ හින්දු විද්‍යාලයෙන් ලබා ඇති අතර 1980 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබාගත්තේය. ඔහු 1982 දී ඉංජිනේරුවෙකු ලෙස මහා මාර්ග දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ අතර මා.සං. අධිකාරියේ ආරම්භයේ සිටම සිය සේවය අඛණ්ඩව ලබාදුන්නේය. ඔහු මා.සං. අධිකාරියේ විවිධ තනතුරු දරමින් වසර 33 ක් සේවය කළ අතර ජාතික මාර්ග ජාලයේ සංවර්ධනය වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් ලබාදෙමින් එහි ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් සේවය කරමින් සිටියදී 2015 වර්ෂයේදී විශ්‍රාම ගියේය. විශ්‍රාම ගැනීමෙන් පසුව මාර්ග ව්‍යාපෘති සහ නාය යෑම් අඩුකිරීම පිළිබඳ උපදේශකවරයෙකු වශයෙන් සේවය කළේය.



සුමුදු රත්නායක
සාමාජික

සුමුදු රත්නායක මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2024 ඔක්තෝම්බර් මස 18 වෙනි දින පත්කරන ලදි. දැනට ඔහු ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ උපදේශකවරයෙකු සහ ඩිජිටල් රාජ්‍ය යටිතල ව්‍යුහ ආයතනයේ (DPI) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ඩිජිටල් ආර්ථික අංශයේ ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශකවරයෙකු වශයෙන් සේවය කරයි. මීට පෙර ඔහු කොම්පාස් ප්ලස් ටෙක්නොලොජීස්හි (එක්සත් ජනපදය) ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානී (ඉන්ටෙක්), සේලාන් බැංකුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රධාන ඉංජිනේරු, නෝවුස් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩහි නායකත්ව කණ්ඩායම් සාමාජික සහ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ ගෙවීම් පද්ධති ඉංජිනේරු ඇතුළු ප්‍රධාන තනතුරු කිහිපයක් දරා ඇත.



අනන්දලාගේ වන්ද්‍රපාල
සාමාජික

අනන්දලාගේ වන්ද්‍රපාල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2024 ඔක්තෝම්බර් මස 18 වෙනි දින පත්කරන ලදි. දැනට ඔහු මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ස්වාධීන විමර්ශන කණ්ඩායම් සාමාජිකයෙකු වශයෙන් සේවය කරන අතර නියෝජ්‍ය විගණකාධිපති, සහකාර විගණකාධිපති සහ විගණන අධිකාරි ඇතුළුව ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුරු දරමින් රාජ්‍ය අංශයේ වසර 30 කට අධික කාලයක අත්දැකීම්වලින් සපිරි අයෙකි.



ඊ. භාරතිදාසන්
සාමාජික

ඊ. භාරතිදාසන් මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2024 ජූනි මස 11 වෙනි දින පත්කරන ලදි. දැනට ඔහු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි වශයෙන් සේවය කරයි. ඔහු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිවිල් ඉංජිනේරුවෙකු, කළමනාකරු (මෙහෙයුම් හා නඩත්තු), ව්‍යාපෘති අධ්‍යක්ෂ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වශයෙන් සේවය කොට වසර 31 ක අත්දැකීම්ලත් අයෙකි. ඊට අමතරව ඔහු සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණය මණ්ඩලයේ සාමාජිකයෙකුද වේ.



සී. ජයසූරිය
සාමාජික

සී. ජයසූරිය මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2024 පෙබරවාරි මස පත්කරන ලදි. දැනට ඔහු බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් සේවය කරන අතර ඊට පෙර වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වැනි ප්‍රධාන තනතුරු දරා ඇත.



ඊ.ඒ. රත්නසීල මහතා
සාමාජික

ඊ.ඒ. රත්නසීල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2025 ජනවාරි මස 29 වෙනි දින පත්කරන ලදි. දැනට ඔහු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි. ඊට පෙර ඔහු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ලෙස වසර 3 ක් ද සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයෙකු ලෙස වසර 2 ක් ද සේවය කර ඇත. ඔහු ආයුර්වේද ඖෂධ පශ්චාත් උපාධි ආයතනය, කාර්මික තාක්ෂණික ආයතනය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික විද්‍යාලය, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ්, ජාතික නව්‍යකරණ නියෝජිතායතනය ඇතුළු රාජ්‍ය ව්‍යවසායන් කිහිපයක අධ්‍යක්ෂක මණ්ඩලවල සාමාජිකයෙකු වශයෙන්ද සේවය කර ඇති අතර දැනට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි.



ඊ.ඒ.ආර්. රේණුකා මිය
සාමාජික

ඊ.ඒ.ආර්. රේණුකා මිය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වශයෙන් 2020 ජනවාරි මස 18 වෙනි දින පත්කරන ලදි. දැනට ඇය සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් සේවය කරන්නීය.



ජයන්ත චන්ද්‍රසිරි මහතා
සාමාජික

ජයන්ත දන්ද්‍රසිරි මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2024.10.18 වෙනි දින පත්කරන ලදි. දැනට ඔහු නීතිඥයෙකු වශයෙන් කටයුතු කරයි.



ඩබ්ලිව්.එච්.කේ.ඩී.බී. රත්නායක මහතා
සාමාජික

ඩබ්ලිව්.එච්.කේ.ඩී.බී. රත්නායක මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2020 අගෝස්තු මස 26 වෙනි දින පත්කරන ලදි. ඔහු ආර්ථික විද්‍යාව පිළිබඳ උසස් උපාධිය (MA Economics) ලබා ඇත. දැනට ඔහු ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) තනතුර දරයි.



මහින්ද විතානාරච්චි මහතා
සාමාජික

මහින්ද විතානාරච්චි මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2024 ඔක්තෝම්බර් මස 18 වෙනි දින පත්කරන ලදි. දැනට ඔහු නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි. ඔහුට නාගරික සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වසර 20 කට අධික අත්දැකීම් ඇත. කලින් ඔහු නාගරික සංවර්ධන අධිකාරියේ මණ්ඩල අධ්‍යක්ෂ / ලේකම් ලෙසද, සීමාසහිත ලංකා විදුලි සමාගමේ, ලංකා රෙස්ට් හවුසස් ලිමිටඩ්, චෝටර්ස් එජ් ලිමිටඩ්, නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම, කලම්බු ලැන්ඩ්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ඩ් කම්පැනි ලිමිටඩ් සහ මා.සං. අධිකාරිය යන ආයතනවල මණ්ඩල අධ්‍යක්ෂක ලෙසද කටයුතු කර ඇත.



ඊ.ඩබ්ලිව්.ඒ.පී. පුන්‍යාසිරි මිය
සාමාජික

ඊ.ඩබ්ලිව්.ඒ.පී. පුන්‍යාසිරි මිය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වශයෙන් 2025 පෙබරවාරි මස 22 වෙනි දින පත්කරන ලදි. දැනට ඇය ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ (ප්‍රවාහන අංශය) ප්‍රධාන ගණකාධිකාරි (ප්‍රසම්පාදන) ලෙස සේවය කරන්නීය.



බී.පී.කේ. අමරසේකර මහතා
සාමාජික


ඉංජිනේරු බී.පී.කේ. අමරසේකර මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2024 ඔක්තෝම්බර් මස 18 වෙනි දින පත්කරන ලදි. ඔහු මාර්ග හා යටිතල ව්‍යුහ සංවර්ධන පිළිබඳ වසර 30 ටත් වැඩි අත්දැකීම් සහිත පළපුරුදු සිවිල් ඉංජිනේරුවෙකි. දැනට ඔහු දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් සේවය කරන අතර මා.සං. අධිකාරියේ (දකුණු පළාත) හිටපු පළාත් අධ්‍යක්ෂක වේ.



එච්.එම්.එම්. විජේසුන්දර මහතා
සාමාජික

ඉංජිනේරු එච්.එම්.එම්. විජේසුන්දර මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වශයෙන් 2024 ඔක්තෝම්බර් මස 18 වෙනි දින පත්කරන ලදි. දැනට ඔහු මහ නැගුම රෝඩ් කන්ස්ට්‍රක්ෂන් ඉන්ව්ස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි සභාපති වශයෙන් කටයුතු කරයි. ඔහු මාර්ග සහ යටිතල ව්‍යුහ සංවර්ධනය පිළිබඳ ශක්තිමත් පසුබිමක් සහිත ඇත්දැකීම්ල සිවිල් ඉංජිනේරුවෙකි. කලින් ඔහු මා.සං. අධිකාරියේ ඉංජිනේරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර එහිදී ඔහු සිය තාක්ෂණික ප්‍රවීණතාව විවිධ ජාතික යටිතල ව්‍යුහ ව්‍යාපෘතිවලදී ලබාදී ඇත.

මා.සං. අධිකාරියේ ඉහළ කළමනාකරණ කණ්ඩායම



අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

මාර්ග සංවර්ධන අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේදී පසුගිය මාස කිහිපය තුළ වෙහෙස මහන්සි වී වැඩකිරීම සහ සිදුකරන ලද කැපකිරීමට වෙනුවෙන් අපගේ හෘදයාංගම ස්තූතිය අතරතුර එය මෙසේ ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව අපි සතුටට පත්වෙමු. අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට අනුගත වෙමින් සමස්ථ උපායමාර්ග නිශ්චය කිරීම, ඉහළ කළමනාකරණය තෝරා ගැනීම සහ ඇගයීම පිළිබඳව සොයා බැලීම ඇතුළුව අධිකාරියේ කාර්යසාධනය සහ උපායමාර්ගික දිශාව හැඩගැන්වීමේ තීරණාත්මක කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන ඇත.

මා.සං. අධිකාරිය විසින් පසුගිය වර්ෂය පුරාවට රටපුරා මාර්ග ඉදිකිරීම් සහ පුනරුත්ථාපන ව්‍යාපෘති ගණනාවක් සම්පූර්ණ කරමින් යටිතල ව්‍යුහ සංවර්ධනයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. මෙම ආරම්භයන් විසින් සම්බන්ධතාවය වැඩිදියුණු කරනු ලැබුවා පමණක් නොව ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයට දායකත්වය ලබාදෙමින් වඩාත් කාර්යක්ෂම භාණ්ඩ හා සේවා ප්‍රවාහනය උදෙසා පහසුකම්ද සලසා ඇත.

රටේ ආර්ථික පරිහාණිය හේතුකොට ගෙන පෙර වර්ෂවල සිට පැවත ආ මූල්‍ය අභියෝගවල බලපෑම මා.සං. අධිකාරියට 2024 වර්ෂයේදීම සිදුවිය. මෙම තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා මා.සං. අධිකාරිය විසින් පරිපාලන වියදම් අඩුකිරීම, අත්‍යාවශ්‍ය නොවන ව්‍යාපෘති ප්‍රමාද කිරීම සහ මා.සං. අධිකාරියට අයත් නොවන මාර්ග සංවර්ධනය සීමා කිරීම වැනි ක්‍රියාමාර්ග ඇතුළුව පිරිවැය සීමා කිරීමේ ක්‍රම ක්‍රියාත්මක කරන ලදි. 2014 වර්ෂාවසානය වන විට අධිකාරියේ මූල්‍ය තත්ත්වය පහත පරිදි සාරාංශගත කරනු ලැබේ.

	2024 රු.බි.	**20223 නැවත සඳහන් කරන ලද රු.බි.**
මුළු වත්කම්	1,338.67	1347.09
මුළු බැරකම්	380.64	427.61
මුළු වත්කම්/සමකොටස්	958.83	919.47

වැදගත් මූල්‍යමය කරුණු

මහජනතාව සඳහා මාර්ග යටිතල ව්‍යුහ සැපයීමේදී මා.සං. අධිකාරිය ප්‍රධාන වශයෙන් යැපෙන්නේ රජයේ අරමුදල් මත ය. එසේ හෙයින් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී එය අනුගමනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ය (SLPSAS). මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ අඛණ්ඩභාවයේ පදනම මත සහ වෙනත් හැටියකින් සඳහන් කොට ඇති විටෙක මිසක පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සමඟ වෙනස් නොවන මා.සං. අධිකාරිය විසින් භාවිතා කරනු ලබන ගිණුම් ප්‍රතිපත්ති මත ය.

සිසුගාමී මාර්ග මෙහෙයුම් කටයුතුවලින් මා.සං. අධිකාරිය 2024 වර්ෂයේදී රු.බි. 5.23 ශුද්ධ ලාභයක් ලැබූ අතර එය සුවිශේෂී ජයග්‍රහණයක් විය. මෙම අගය පෙර වර්ෂයේදී ලැබූ ලාභය මෙන් 1.5 ගුණයක් වූ අතර එය මෙම ආදායම් මූලාශ්‍රයෙන් ලද ආදායමේ විශාල වර්ධනයක් පෙන්නුම් කරන්නක්ද විය. මා.සං. අධිකාරියේ මූල්‍ය කාර්යසාධනයේ ප්‍රධාන දායකයා ලෙස සිසුගාමී මාර්ග ඉදිරියෙන්ම සිටින අතර ලාභ ලැබීමේ මෙම වර්ධනයට හේතුවී ඇත්තේ සිසුගාමී මාර්ග ජාලයේ පවතින සාර්ථක කළමනාකරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ය.

2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයේ සාරාංශය පහත පරිදි වේ.

විස්තරය	2024 රු.බි.	2023 නැවත සඳහන් කරන ලද රු.බි.
මුළු පුනරාවර්තන ආදායම	119.54	123.16
මුළු වියදම	(70.07)	(92.12)
රාජ්‍ය ආදායම සඳහා දායකත්වය (අයබදු සහ ආදායම් බදු)	(2.65)	(2.51)
අයබදු සහ බදුවලට පෙර කාලය සඳහා අතිරික්තය	**46.82**	**28.53**
ප්‍රාග්ධන ප්‍රදාන දේපළ, පිරියත සහ උපකරණ (PPE) මත ගැලපීම	(15.27)	51.70
බදුවලින් පසුව ඉතිරි අතිරික්තය	**31.55**	**80.23**

තවද, පහත නම් සඳහන් සමාගෙම් හතරේ ධාරක ආයතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියයි;

- මහ නැඟුම ඉමල්ෂන් ප්‍රොඩක්ෂන් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
- මහ නැඟුම රෝඩ් කන්සට්‍රක්ෂන් ඇන්ඩ් ඉක්විප්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
- මහ නැඟුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
- එක්ස්ප්‍රස් වේ ට්‍රාන්ස්පෝට් බස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්

මෙම පරිපාලන සමාගම් සිය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිණිස එකිනෙකට වෙනස් ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කරති. එබැවින්, මව් සංවිධානය සහ එහි පරිපාලන සමාගම් විසින් එකිනෙකට වෙනස් ගිණුම් ප්‍රමිතීන් දෙකක් අනුගමනය කරනු ලබන නිසා මාර්ග සංවර්ධන අධිකාරියට අදාළව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයක් පිළියෙල කරනු නොලැබේ.

රජයේ වියදම් අවම කිරීමේ අපේක්ෂාවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් මහ නැඟුම සමාගම සහ එක්ප්‍රස් වේ ට්‍රාන්ස්පෝට් කම්පැණි යන ආයතන වසා දැමීමට 2023 වර්ෂයේදී තීරණය කරන ලදි. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුගත වෙමින් එකී ආයතන දෙක වසා දැමීමේ ක්‍රියාවලිය පිළිබඳව සොයා බැලීමට මා.සං. අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකුද ඇතුළත් වන පරිදි එකී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කමිටුවක් පත් කරන ලදි. සමාගම හතරේම සේවකයින් සඳහා ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යෑමේ යෝජනාක්‍රමයක් (VRS) ආරම්භ කරන ලදි. සුමට සහ අවසන් වසා දැමීමක් සහතික කිරීම සඳහා ඉතිරිව තිබූ නෛතික බාධක විසඳීමට ප්‍රයත්න දරමින් එකී ක්‍රියාවලිය 2024 වර්ෂය තුළ අඛණ්ඩව කරගෙන යන ලදි.

මාර්ග සහ පාලම් ප්‍රාග්ධනීකරණය කිරීම

මා.සං. අධිකාරියේ වත්කම් මූලිකව සමන්විත වන්නේ මා.සං. අධිකරිය විසින් අත්පත් කරගන්නා ලද හෝ ඉදිකරන ලද මෙන්ම ව්‍යාපෘති කළමනාකරණ ඒකකවලින් පවරාගන්නා ලද වත්කම්වලින් ය. ඵලදායි කළමනාකරණයක් සහතික කිරීම පිණිස වත්කම් ප්‍රාග්ධනීකරණ කිරීම සඳහා මා.සං. අධිකාරිය විසින් මාර්ග යටිතල ව්‍යුහය සහ අනිකුත් වත්කම් යන ප්‍රධාන කාණ්ඩ දෙක යටතේ වත්කම් තක්සේරු කිරීමද ඇතුළත් වන පරිදි පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් වැඩිදියුණු කර ඇත. මාර්ග වත්කම්වලට මාර්ග, පාලම්, ආශ්‍රිත ව්‍යුහයන් සහ මාර්ග බඩුමුට්ටු යන මූලිකාංග අයත්ය. ප්‍රවාහන සම්බන්ධතාවයේ සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ (TCAMP) කොටසක් ලෙස ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) මගින් ක්‍රමවත් ප්‍රවේශයක් ඇතිකිරීම පිණිස වත්කම් තක්සේරු කිරීමේ පද්ධති මොඩියුලය වැඩිදියුණු කිරීම ආරම්භ කර ඇත. මෙම පද්ධතියට ඇතුළත් කිරීම සඳහා දත්ත මා.සං. අධිකාරිය විසින් මේ වනවිට එක්රැස් කරමින් සිටී. ඊට අමතරව, 2024 වර්ෂයේදී මා.සං. අධිකාරිය තුළ අළුතින් පිහිටුවන ලද මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (RAM) විසින් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ සහ ප්‍රාග්ධනීකරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ කාර්යය බලාගනු ඇත.

මාර්ග වත්කම් තක්සේරු කිරීමට, අවසන් වත්කම් වටිනාකම නිශ්චය කිරීමේදී දායක වන බහුවිධ සමාන්තර ක්‍රියාකාරකම් සම්බන්ධ වේ. ඉහත දැක්වූ එක් එක් පියවරයන්හි ප්‍රගතියක් ඇතිව මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (RAM) 2024 වර්ෂයේදී මෙම ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වා දී ඇති අතර එතුළින් මාර්ග වත්කම් තක්සේරු කිරීමට අදාළව සැලසුම් කරන ලද වැඩවලින් 75% ක ප්‍රමාණයක් සාක්ෂාත් කරගෙන ඇත.

2024 වර්ෂයේදී මාර්ග දිග ප්‍රාග්ධනීකරණය කිරීමේ ප්‍රතිශතය, 2023 වර්ෂයේ ප්‍රාග්ධනීකරණ ප්‍රතිශතය වූ 28.15% සමඟ සංසන්දනය කරන විට එය29.71% ක ප්‍රමාණයකින් වැඩිවී ඇත. මෙම ප්‍රතිශතය මගින්, දරණ ලද තථ්‍ය ඉදිකිරීම් පිරිවැය පදනම් කරගෙන ප්‍රාග්ධනීකරණය කරන ලද සිසුගාමී මාර්ගද ඇතුළුව ජාතික මාර්ග පිළිබිඹු කරයි. මෙම මුදල් වර්ෂය වනවිට ප්‍රාග්ධනීකරණය කරන ලද පාලම් සහ ඉහළින් වූ පාලම් මාර්ග ගණන පිළිවෙලින් 2024 ක් සහ 8 ක් විය.

ගොඩනැගිලි තක්සේරු කිරීම

සියලුම පළාත් සහ අනිකුත් කාර්යාල සඳහා ගොඩනැගිලි තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරයි. 2024 වර්ෂාවසානය වනවිට ගොඩනැගිල් 561 ක් ප්‍රත්‍යාගණනය කර ඇති අතර ඒවායේ වටිනාකම රු.මි. 4,242.80 ක් වේ.

ප්‍රයෝජනයට ගනු ලබන සහ මා.සං. අධිකාරියට අයත් රජයේ ඉඩම්

මා.සං. අධිකාරිය විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් කට්ටි 542 න් (හෙක්ටයාර 275.49) ඉඩම් කට්ටි 411 ක් (හෙක්ටයාර 206.86948) සඳහා නිදහස් ප්‍රදාන ලබාගැනීම පිණිස ඊට අදාළ ලේඛන දැනටමත් අධිකාරිය විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාටද පිටපත් සහිතව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඉදිරිපත් කර ඇත.

මෙම ක්‍රියාවලිය ඉක්මන් කිරීම පිණිස ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු මා.සං. අධිකාරියේ නිලධාරීන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සිදුකරයි.

මෙහෙයුම් කාර්යසාධනය

මා.සං. අධිකාරිය 2024 වර්ෂයේදී සිය අවධානය මූලිකවම යොමු කළේ පැවැති සීමිත මූල්‍ය සම්පත් උපයෝගී කරගනිමින් ජාතික මාර්ග ජාලය නඩත්තු කිරීමට ය. මාර්ග නඩත්තු සහ නඩත්තු අංශය මගින් පැළුම් වැසීම, නිවැරදි කිරීම, වැලි මුද්‍රා තැබීම, AC overlay සහ පතුරු වැසීම වැනි තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් කි.මී. 1,669.33 ක දුර ප්‍රමාණයකින් යුත් මාර්ග නඩත්තු කරන ලදි. ඒ අතුරින් කි.මී. 344.51 ක දුර ප්‍රමාණයකින් යුත් ජාතික මාර්ග (ඒ සහ බී පන්තියේ) වූ සම්පූර්ණයෙන්ම වැඩිදියුණු කොට අවසන් කරන ලද අතර ඉතිරි කි.මී. 123.61 ක දුර ප්‍රමාණයකින් යුත් මාර්ග වැඩිදියුණු කෙරෙමින් පවතී. තවදුරටත්, කි.මී. 1,616.33 දුර ප්‍රමාණයකින් යුත් මා.සං. අධිකාරියට අයත් නොවන සහ ග්‍රාමීය මාර්ග උසස් තත්ත්වයට ගෙන එන ලද අතර කි.මී. 699.52 ක දුර ප්‍රමාණයකින් යුත් මාර්ග විවිධ දේශීය සහ විදේශීය අරමුදල් ලබන ව්‍යාපෘති යටතේ මෙම වර්ෂයේ අවසානය වනවිට සම්පූර්ණ කිරීමේ අදහසින් ඉදිකෙරෙමින් පවතී.

සමහර ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක වැඩ නැවැත්වීම හේතුකොට ගෙන ඇතිවූ මූල්‍ය අර්බුදයට මුහුණදී තිබියදීත් මා.සං. අධිකාරි විසින් වරාය ප්‍රවේශ උන්නත සීඝ්‍රගාමී මාර්ග ව්‍යාපෘතිය, මධ්‍යම සීඝ්‍රගාමී මාර්ගයේ 1 සහ 3 කොටස්, පාලම්, ඉහළින් වූ පාලම් මාර්ග සහ, මහනුවර බහුමාත ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම් වැනි ඉදිකිරීම් කටයුතු ඉතා සාර්ථකව ආරම්භ කරන ලදි. වරාය ප්‍රවේශ උන්නත සීඝ්‍රගාමී මාර්ග ව්‍යාපෘතිය 2024 වර්ෂාවසානය වනවිට 97.40% ක ප්‍රමාණයකින් සාර්ථකව සම්පූර්ණ කර ඇති අතර එහි ඉදිකිරීම් කටයුතු 2025 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. මධ්‍යම අධිවේගී මාර්ගය - 1 වෙනි කොටසේ (කඩවත සිට මීරිගම දක්වා) ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 92.79% ක් දක්වා සම්පූර්ණ කර ඇති අතර ඊට අදාළ සිවිල් වැඩ සම්පූර්ණ කර ඇත. එහි 3 වෙනි කොටසේ (පොතුහැර සිට ගලගෙදර දක්වා) ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 89.60% කින්ද සිවිල් වැඩ 22.60% කින්ද සම්පූර්ණ කර ඇති අතර මාර්ගයේ සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු 2024 වර්ෂාවසානය වනවිට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකාව තුළ ජාතික මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් මාර්ග සහ පාලම් ඉදිකිරීමට වගකිව යුතු ප්‍රමුඛ ආයතනය ලෙස මා.සං. අධිකාරිය විසින් ඉහළින් වූ ප්‍රධාන පාලම් මාර්ග තුනක් 2024 වර්ෂය තුළදී ඉදිකොට සම්පූර්ණ කිරීම අධිකාරිය ලැබූ විශේෂ ජයග්‍රහණයක් විය. මෙම ඉහළින් වූ පාලම් මාර්ග තුන කොහුවල, උත්තරානන්ද මාවත සහ විනිසුරු අක්බර් මාවත යන ස්ථානවල ඉදිකරන ලද අතර ඒ සියල්ල සම්පූර්ණ කරනු ලැබුවේ විදේශාධාර ලබන විවිධ ව්‍යාපෘති යටතේ ය. කොහුවල ඉදිකරන ලද ඉහළින් වූ පාලම් මාර්ගය 2024.07.17 වෙනි දින මහජනතාව සඳහා විවෘත කරන ලද අතර උත්තරානන්ද මාවතේ සහ විනිසුරු අක්බර් මාවතේ ඉදිකරන ලද ඉහළින් වූ පාලම් මාර්ග පිළිවෙලින් 2024.04.08 සහ 2024.07.11 වෙනි දින මහජනතාව සඳහා විවෘත කරන ලදි. මෙම ව්‍යාපෘති, ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීමට මා.සං. අධිකාරිය විසින් ගනු ලබන ප්‍රයත්නයන්හි සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරන ලදි. එසේම විදේශාධාර ලබන විවිධ ව්‍යාපෘති යටතේ ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් තුනක් ඉදිකොට සම්පූර්ණ කරන ලදි. මෙම පාලම් අංක 4/2, 3/1 සහ 6/2 ලෙස හඳුනාගනු ලැබේ. ඊට අමතරව දේශීය අරමුදල් යටතේ 2024 වර්ෂය තුළදී ජාතික මාර්ගවල පිහිටි පාලම් 35 ක් නැවත ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම සිදුකරන ලද අතර මා.සං. අධිකාරියට අයත් නොවන මාර්ගවල පාලම් තුනක්ද ඉදිකොට සම්පූර්ණ කරන ලදි.

ජාතියේ මාර්ග ජාලයේ වැඩිදියුණු කිරීම ඵලදායීව ඉදිරියට ගෙනයාම සඳහා මා.සං. අධිකාරිය විසින් ප්‍රසම්පාදන සැලැස්ම සහ අයවැය ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් පුළුල් ආයතනික උපායමාර්ගික සැලැස්මක් සකස් කර ඇත. මෙම ප්‍රවේශය සැලසුම් කර ඇත්තේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමට සහ ඉදිරි වසරවල අඛණ්ඩ ප්‍රගතියක් සාක්ෂාත් කරගැනීම අරමුණු කරගෙන ය.

සාමූහික සමාජ වගකීම

සංස්ථාපිත සමාජ වගකීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ සියලුම පාර්ශවකරුවන්ට ආර්ථික, සමාජීය සහ පාරිසරික ප්‍රතිලාභ අත්කර දෙමින් තිරසර සංවර්ධනයක් වෙනුවෙන් දායක වන ක්‍රමික ප්‍රවේශයකටය. ලොව පුරා බොහෝ රාජ්‍ය ආයතන මෙන් මාර්ග සංවර්ධන අධිකාරියද සිය මෙහෙයුම් කටයුතුවලදී සංස්ථාපිත සමාජ වගකීමේ වැදගත්කම වැඩි වැඩියෙන් හඳුනා ගනිමින් කටයුතු කරයි. මාර්ග ඉදිකිරීමේදී සහ නඩත්තු කිරීමේදී සිදුවන සුවිශේෂී පාරිසරික බලපෑමත් සමඟ සංස්ථාපිත සමාජ වගකීමට අදාළව සිදුකරනු ලබන ක්‍රියාමාර්ග විසින් ස්ථාවරත්වය ඇතිකොට කාබන් පියසටහන් ඇතිවීම අඩුකරනු ඇත. එහි ආරම්භක පියවර වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාරේ මැද කොටස්වල/සීඝ්‍රගාමී මාර්ගවල රුක් රෝපණය කිරීම, අපවිත්‍රවීම අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහ වාසස්ථාන විනාශවීම අඩුකිරීම වැනි පරිසර හිතකාමී ඉදිකිරීමේ පරිවයන් අනුගමනය කරනු ඇත.

පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය, එහි නම් කරන ලද ජාතික අධිකාරිය ලෙස ශ්‍රී ලංකා රජය විසින් නම් කර ඇත. “ශ්‍රී ලංකාවේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ පැරිස් ගිවිසුම - 2021 ජූලි යටතේ යවත්කාලීන කරන ලද ජාතිකමය වශයෙන් නිශ්චිත දායකත්ව” නමින් අමාත්‍යාංශය විසින් ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයේ ජාතිකමය වශයෙන් නිශ්චිත දායකත්වයන් සෑම අංශයක් වෙතම ඉදිරිපත් කර ඇත.

එබැවින් මාර්ග සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ ජාතිකමය වශයෙන් නිශ්චිත දායකත්වවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම අධිකාරිය විසින් සිදුකළ යුතුය. ජාතිකමය වශයෙන් නිශ්චිත දායකත්ව ඵලදායීව ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය කරනු ලබන තාක්ෂණික, මූල්‍ය සහ අමතර හැකියාවන් වැඩිදියුණු කිරීමේදී ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට හරිත දේශගුණික අරමුදලින් සහාය විය හැක. මාර්ග සංවර්ධන අධිකාරිය ශ්‍රී ලාංකේය ජනතාවට ඉහළ ආර්ථික හා සමාජ සුභසාධනයක් ලබාදීමට කටයුතු කරන ආයතනයක් බැවින් මෙය, රටෙහි දේශගුණික වෙනස්වීම් සැහැල්ලු කිරීමට කටයුතු කරමින් කාබන් අඩු ගමන්පථ සහිතව ප්‍රත්‍යාස්ථිති විකල්ප ලබාදීමට උපකාරී වනු ඇත.

අදාළ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනවලින් අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කරනු ලබන පාරිසරික බලපෑම් තක්සේරු කිරීම, මූලික පාරිසරික පරීක්ෂණය, අතිරේක පාරිසරික තක්සේරු කිරීම්හෝ වෙනත් ආකාරයේ තක්සේරු කිරීම් ලබාගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය නිතරම කැපවී සිටී.

එක්සත් ජාතීන් විසින් ස්ථාපනය කරන ලද තිරසර සංවර්ධන ඉලක්ක 17 ක්‍රියාත්මක කිරීමට අනිකුත් රටවල් මෙන් ශ්‍රී ලංකාවද කැපවී කටයුතු කරයි. දේශයේ යටිතල ව්‍යුහ සංවර්ධනයේ ප්‍රමඛ ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකාරිය ඉහත කී තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ වගකීම පිළිබඳව ඉතා හොඳින් දැනුවත්ව සිටී.

තිරසර සංවර්ධන ඉලක්කවලින් මාර්ග හා යටිතල ව්‍යුහ සංවර්ධනයට මූලික වශයෙන්ම අදාළ වන්නේ ඉලක්ක අංක 9 යටතේ කර්මාන්ත, නව්‍යකරණය සහ යටිතල ව්‍යුහ සංවර්ධනය කිරීම ය. කෙසේ වෙතත්, මාර්ග යටිතල ව්‍යුහ සංවර්ධනය ඉලක්ක අංක 11 : තිරසර නගර සහ ප්‍රජාවන්, ඉලක්ක අංක 3 : මනා සෞඛ්‍යය සහ සුභසාධනය සහ, ඉලක්ක අංක 13 : දේශගුණික ක්‍රියාමාර්ග වැනි අනිකුත් තිරසර සංවර්ධන ඉලක්ක සමඟද අන්තර්ඡේදනය වේ.

2025 වර්ෂය සැලකිල්ලට ගනිමින් අපගේ ජාතියේ මාර්ග යටිතල ව්‍යුහය වෙනුවෙන් පිහිටුවන ලද දැක්මට අනුකූලව අඛණ්ඩව සහ එකමුතුව කටයුතු කරමු. 2024 වර්ෂය තුළදී ලබාගත් ජයග්‍රහණවලට පසුව මේ වනවිට ක්‍රියාත්මක වෙමින් තිබෙන ව්‍යාපෘති අඛණ්ඩව සිදුකිරීමට පමණක් නොව එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීම කඩිනම් කිරීමට කටයුතු කරනු ඇති අතර ඒවාට සමාන්තරව ශ්‍රී ලංකාව තුළ වඩාත් හොඳ සම්බන්ධතාවක් ඇතිකිරීම අරමුණු කරගෙන නව ව්‍යාපෘති ආරම්භ කිරීමටද කටයුතු කරමු. එබැවින් ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ උත්පාදනය මෙන්ම අපගේ කලාපය තුළට ප්‍රවේශය වැඩිදියුණු කරන සුවිශේෂී මාර්ග රථවාහන ගමනාගමනය, ප්‍රජාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබාදීමට අප අපේක්ෂා කරන අමතර දර්ශකයක් බවට අපි තරයේ විශ්වාස කරමු. ජාතික හා ජාත්‍යන්තර අර්ථයෙන් මාර්ග ඉදිකිරීමේදී අප විසින් අඛණ්ඩව ආයෝජනය කරනු ලබන බැවින් අපගේ ජාතියට දායාද කරනු ලබන මාර්ග ජාලය නඩත්තු කරනු ලබන බවට අපට සහතික කළ හැකිය.

2024 වර්ෂය තුළ අප ලද ජයග්‍රහණ සහ 2025 වර්ෂය තුළ අපට තිබෙන අවස්ථා පිළිබඳව අපි සැලකිලිමත් වන නිසා මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව අපි සතුටට පත්වෙමු. 2024 වර්ෂය සැලකිය යුතු වැදගත් සිද්ධීන්වලින් සහ අභියෝගවලින් පිරුණු වසරක් වූ අතර ඒ සියල්ල අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කිරීමටත් අනාගතය වෙනුවෙන් අපගේ උපායමාර්ගික දිශානතිය හැඩගැන්වීමටත් උපකාරී විය.

මාර්ග සංවර්ධන අධිකාරිය පිළිබඳ කෙටි හැඳින්වීමක්



මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.), ප්‍රවාහන යටිතල ව්‍යුහය වැඩිදියුණු කිරීම, වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම, සම්බන්ධතාවය උසස් තත්ත්වයට ගෙනඒම සහ කලාපීය සංවර්ධනයට උපකාරීවීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කඩිනම් කිරීමට කැපවූ රාජ්‍ය ආයතනයකි.


මා.සං. අධිකාරිය, 1981 අංක 73 දරණ මා.සං. අධිකාරිය පනත මගින් මහා මාර්ග අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපනය කරනු ලැබූ අතර 1986 වර්ෂයේදී මහා මාර්ග දෙපාර්තමේන්තුවේ අනුප්‍රාප්තිකයා විය.

මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික මාර්ග ජාලයේ නඩත්තුව සහ එය උසස් තත්ත්වයට ගෙනඒම සහ, පවතින මාර්ග යටිතල ව්‍යුහය පුළුල් කිරීම සඳහා නව අධිවේගී මාර්ග, පාලම් සහ සීඝ්‍රගාමී මාර්ග ඉදිකිරීම වෙනුවෙන් කටයුතු කරයි.

2024 වර්ෂාවසානය වනවිට ජාතික මාර්ග ජාලය කි.මී. 12,362.84 දිගින් යුත් මාර්ග (ඒ පන්තිය), ප්‍රධාන මාර්ග (බී පන්තිය), කි.මී. 312.59 දිගින් යුත් සීඝ්‍රගාමී මාර්ග සහ කි.මී. 4,322 ක දිගින් යුත් පාලම්වලින් සමන්විත වේ.

පළාත	ජාතික මාර්ග (කි.මී.)		
	ඒ පන්තිය	බී පන්තිය	එකතුව
බස්නාහිර පළාත	373.79	1,242.695	1,616.485
මධ්‍යම පළාත	408.59	1,348.342	1,756.932
දකුණු පළාත	352.91	1,155.465	1,508.375
උතුරු පළාත	734.49	524.990	1,259.480
නැගෙනහිර පළාත	619.55	557.74	1,177.29
වයඹ පළාත	352.80	1,010.89	1,363.69
උතුරු මැද පළාත	491.19	708.806	1,199.996
ඌව පළාත	468.52	692.944	1,161.464
සබරගමුව පළාත	415.58	803.547	1,219.127
එකතුව	**4,217.42**	**8,045.42**	**12,262.84**

පළාත	2024 වර්ෂාවසානය වනවිට පාලම් ගණන
බස්නාහිර පළාත	768
මධ්‍යම පළාත	483
දකුණු පළාත	497
උතුරු පළාත	398
නැගෙනහිර	396
වයඹ පළාත	423
උතුරු මැද පළාත	393
ඌව පළාත	415
සබරගමුව පළාත	549
එකතුව	**4322**




National Road Network in Sri Lanka

ශ්‍රී ලංකාවේ සීඝ්‍රගාමී මාර්ග ජාලය

E01	-	දක්ෂිණ අධිවේගී මාර්ගය (කොට්ටාව - මත්තල)	[කි.මී. 200.45]
E02	-	පිට වටරවුම් අධිවේගී මාර්ගය (කොට්ටාව - කෙරවලපිටිය)	[කි.මී. 28.86]
E03	-	කොළඹ - කටුනායක සීඝ්‍රගාමී මාර්ගය (පෑලියගොඩ - සීදුව)	[කි.මී. 25.8]
E04	-	මධ්‍යම අධිවේගී මාර්ගය (මීරිගම - කුරුණෑගල/ යග්ගහපිටිය)	[කි.මී. 40.91]
E05	-	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම (අන්දරවැව - හම්බන්තොට)	[කි.මී. 16.55]

මුළු මෙහෙයුම් දිග කි.මී. 312.57 කි.

පළාත	ජාතික මාර්ග (කි.මී.)
	සීඝ්‍රගාමී මාර්ග
බස්නාහිර පළාත	113.242
මධ්‍යම පළාත	-
දකුණු පළාත	161.819
උතුරු පළාත	-
නැගෙනහිර පළාත	-
වයඹ පළාත	35.670
උතුරු මැද පළාත	-
ඌව පළාත	-
සබරගමුව පළාත	1.855
එකතුව	312.586



1.0 හැඳින්වීම

1.1 සාමූහික පාලනය

මාර්ග සංවර්ධන අධිකාරියේ (අධිකාරිය) එදිනෙදා මෙයුම් කටයුතුවලදී කළමනාකරණයට මඟපෙන්වීම සඳහා මනා සංයුක්ත පාලන ව්‍යුහයන්, අවශ්‍යාංග සහ ක්‍රියාවලි පිහිටුවීමේ වගකීම එහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පැවරේ.

අධිකාරිය, පහත සඳහන් පනත් සහ අනිකුත් ප්‍රකාශනවල දැක්වෙන අවශ්‍යතා මගින් පාලනය කරනු ලබයි.

- 1981 අංක 73 දරණ මාර්ග සංවර්ධන අධිකාරිය පනත
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන සංස්ථාපිත පාලනය පිළිබඳ මාර්ගෝපදේශකත්වය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය පිළිබඳ හොඳම භාවිත සංග්‍රහය

අධ්‍යක්ෂ මණ්ඩලය

මා.සං. අධිකාරිය, වසර ගණනාවක ප්‍රවීණතාවකින් යුත් හොඳින් තුලනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයක් (BoD) මගින් පාලනය කරනු ලබන අතර ඔවුන් සතු දැනුම අධිකාරියේ අරමුණු සාක්ෂාත් කරගැනීමට උපකාරී විය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති වගකීම් ක්‍රියාවේ යෙදවීම පිණිස එය ක්‍රමිකව රැස් වේ.

අධිකාරියේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්යය පිණිස ඊට අදාළ සියලුම තීරණ සහ උපායමාර්ගික තීරණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගත යුතු අතර ව්‍යවස්ථාපිත සහ නියාමන බැඳීම් අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායී බවට වගබලා ගනු පිණිස සිය අභිමතානුසාරී බලය සද්භාවයෙන් පාවිච්චි කළ යුතුය. එසේම වැඩ ආචාරධර්ම සහ වටිනාකම් ඉස්මතු කරනු ලබන යහ පාලන සංස්කෘතියක් පවතින බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.

මණ්ඩලයේ සභාපති උපායමාර්ගික ගැටළු පිළිබඳව සොයා බලන අතර මණ්ඩලය ක්‍රියාපටිපාටීන් අනුගමනය කරන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් රැස්වීම්වලට ඵලදායී ලෙසින් සහභාගි වන බවටත් ඔහු වගබලා ගනී.

එදිනෙදා කළමනාකරණය, විධායක කණ්ඩායම්වල නායකත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ඇතිව අධිකාරියේ උපායමාර්ගික හා මෙහෙයුම් සැලසුම් ක්‍රියාවේ යෙදවීමේ වගකීම අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරේ. එදිනෙදා මෙයුම් කටයුතු, පවත්නා නීතිය සහ අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් අනුගමනය කරනු ලබන බවට ඔහු තවදුරටත් වගබලා ගනී.

මණ්ඩලයේ ලේකම් නීතිඥවරයෙකු වන අතර ඔහු/ඇය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පාලනය කරනු ලබන ක්‍රියාපටිපාටීන් අනුගමනය කරන බවට, අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලට බලපාන වගකීම්, නීති සහ රෙගුලාසි පිළිබඳව මඟපෙන්වීමට සහ උපදෙස් දීමට වගබලා ගනී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිත බව

අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති සහ විධායක නොවන අධ්‍යක්ෂකවරුන් 14 දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂකවරුන් 1981 අංක 73 දරණ පනත (පනත) මගින් සපයා ඇති ප්‍රතිපාදනවලට අනුව පත් කරනු ලැබේ. නිලබලයෙන් පත්වන සාමාජිකයින් නමදෙනෙක් අධ්‍යක්ෂකවරුන් වන බවට පනතේ විශේෂ කොට ගෙනම සඳහන් කර ඇත. නිලබලයෙන් පත්වන එකී සාමාජිකයින් වන්නේ,

1. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්
2. මුදල් ඇමතිවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්
3. විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්
4. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්

5. ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්
6. ජල සම්පාදන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා
7. නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා
8. පරිසර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරිවරයා
9. පරිසර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා

ඊට අමතරව, පනත මගින් තවත් 5 දෙනෙකු අධ්‍යක්ෂක මණ්ඩලය සඳහා අධ්‍යක්ෂකවරුන් ලෙස පත්කිරීමට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයාට බලය පවරා ඇත.

මණ්ඩල උප කමිටුව

මාර්ග සංවර්ධන අධිකාරියේ නියාමන අවශ්‍යතාවන් ඉටු කිරීමට හා මෙහෙයුම් කටයුතු වඩාත් හොඳින් පාලනය කිරීමට එහි පාලන ව්‍යුහය, මණ්ඩල අනු කමිටුවක් මගින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටුව (AMC) / විගණන කමිටුව; ක්‍රියාකාරකම් පාලනය කිරීමට, මූල්‍ය වාර්තාකරණය නිරීක්ෂණය කිරීමට, අවදානම් කළමනාකරණය කිරීමට සහ අභ්‍යන්තර පාලනය සඳහා සහාය දක්වයි. විගණන කමිටු වාර්තාව, වාර්ෂික වාර්තාවේ 1.1 පරිඡේදයේ දක්වා ඇති අතර කමිටුවේ ප්‍රතිපත්ති, පරිවයන් සහ අවධානය යොමුකරනු ලබන ක්ෂේත්‍ර එහි විස්තරාත්මකව දක්වා ඇත. කමිටුව වර්ෂයක් තුළ අවම වශයෙන් 4 වතාවක් රැස් වෙයි. විගණන හා කළමනාකරණ කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන පුද්ගලයින් වෙති. 2024 වර්ෂයේ විගණන කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

1. එම්.කේ.ඩී.එන්. මාදම්පේ මිය - සභාපති - 2022.05.03 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදි.
2. ඩී.පී. වික්‍රමසිංහ මයා - සාමාජික - 2024.09.27 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.
3. ඩබ්ලිව්.එච්.කේ.ඩී.බී. රත්නායක මයා - සාමාජික - 2022.05.03 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදි.
4. ඒ. චන්ද්‍රපාල මයා - සාමාජික - 2024.10.18 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදි.

2024 වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගිවීම

අංකය	අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික	තත්ත්වය : ස්වාධීන / විධායක නොවන	මණ්ඩලය	වෙනත්
1	චමින්ද අටඵවගේ මයා		11/16	ඉල්ලා අස්විය
1(අ)	රංජිත් ජී. රූබසිංහ මයා		2/16	2024.07.25 වෙනි දින පත් කළා 2024.09.27 වෙනි දින ඉල්ලා අස්විය
1(ආ)	ටී. පාස්කරන් මයා		3/16	2024.10.07 වෙනි දින පත් කළා
2	බී.එම්.සී.කේ. බස්නායක මයා	ස්වාධීන. /විධායක නොවන	12/16	2024.09.27 වෙනි දින ඉල්ලා අස්විය
3	වී.කේ. වොක්සි මයා	ස්වාධීන. /විධායක නොවන	9/16	2024.09.27 වෙනි දින ඉල්ලා අස්විය
3(අ)	මිල්ටන් විජේසුන්දර මයා	ස්වාධීන. /විධායක නොවන	16/16	2024.10.18 වෙනි දින පත් කළා
4	එම්.එම්. විජිත මනම්පේරි මයා	ස්වාධීන. /විධායක නොවන	13/16	2024.09.27 වෙනි දිනය ඉල්ලා අස්විය
4(අ)	බී.පී.කේ. අමරසේකර මයා	ස්වාධීන. /විධායක නොවන	3/16	2024.10.18 වෙනි දින පත් කළා

5	එම්.කේ.ඩී.එන්. මාදම්පේ මිය	ස්වාධීන. /විධායක නොවන	14/16	
6	සී. ජයසූරිය මයා	ස්වාධීන. /විධායක නොවන	12/16	
7	ඩබ්ලිව්.එච්.කේ.ඩී.බී. රත්නායක මයා	විධායක නොවන	15/16	
8	ඩබ්ලිව්.ඒ.ආර්. රේණුකා මිය	ස්වාධීන. /විධායක නොවන	15/16	
9	හේමන්ත ජයසිංහ මයා	ස්වාධීන. /විධායක නොවන	9/16	
10	එන්.කේ.සී. රණවීර මයා	ස්වාධීන. /විධායක නොවන	4/16	
10(අ)	මහින්ද චන්ද්‍රලාල් විතානාරච්චි මයා	ස්වාධීන. /විධායක නොවන	2/16	2024.07.12 වෙනි දින පත් කළා
11	ඩී.ටී.එස්. සුරවීර මයා	ස්වාධීන. /විධායක නොවන	7/16	
11(අ)	වී. ජහදීසන් මයා	ස්වාධීන. /විධායක නොවන	6/16	
12	එස්.ජී.එල්.ටී. මාලක මයා	ස්වාධීන. /විධායක නොවන	11/16	2024.09.27 වෙනි දින ඉල්ලා අස්විය
12(අ)	ආචාර්ය ඩී.ඒ. ජයන්ත චන්ද්‍රසිරි මයා	ස්වාධීන. /විධායක නොවන	11/16	2024.10.18 වෙනි දින පත් කළා
13	ජී. හර්ෂ විජයවර්ධන මයා	ස්වාධීන. /විධායක නොවන	11/16	2024.09.27 වෙනි දින ඉල්ලා අස්විය
13(අ)	ආනන්දලාගේ චන්ද්‍රපාල මයා	ස්වාධීන. /විධායක නොවන	3/16	2024.10.18 වෙනි දින පත් කළා
14	රුවන් ලියනගේ මයා	ස්වාධීන. /විධායක නොවන	5/16	2024.05.05 වෙනි දින විශ්‍රාම ගනු ලැබුවා
14(අ)	ටී. භාරතිදාසන් මයා	ස්වාධීන. /විධායක නොවන	6/16	2024.05.07 වෙනි දින පත් කළා
15	ඩී.පී. වික්‍රමසිංහ මයා	ස්වාධීන. /විධායක නොවන	12/16	2024.09.27 වෙනි දින ඉල්ලා අස්විය
15(අ)	සුමුදු රත්නායක මයා	ස්වාධීන. /විධායක නොවන	3/16	2024.10.18 වෙනි දින පත් කළා
16	මහාචාර්ය එච්.එම්. රංජිත් ප්‍රේමසිරි මයා	ස්වාධීන. /විධායක නොවන	4/16	2024.08.16 වෙනි දින පත් කළා

2023 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම්වලට සහභාගිවීම

	කමිටු සාමාජික	පැමිණීම	වෙනත්
1.	එම්.කේ.ඩී. මාදම්පේ මිය	5/5	2022.05.03 වෙනි දින පත්කළා.
2.	ඩී.පී. වික්‍රමසිංහ මයා	4/5	2024.09.27 වෙනි දින ඉල්ලා අස්වූවා
3.	ඩබ්ලිව්.එච්.කේ.ඩී.බී. රත්නායක මයා	5/5	2022.05.03 වෙනි දින පත්කළා.
4.	ඒ. චන්ද්‍රපාල මයා	**1/5**	2024.10.18 වෙනි දින පත්කළා.

විගණන කමිටු වාර්තාව

“ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටට පත් වෙමි. විගණන කමිටුවේ මූලික අරමුණු වන්නේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලියේදී සිදුවන දෝෂ, අභ්‍යන්තර පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ, නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම පෙන්වාදීම ය ”.

විගණන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරියේ (අධිකාරිය) මූල්‍ය වාර්තාකරණයේ සහ එහි අභ්‍යන්තර පාලන පරිසරයේ ඵලදායී බවේ විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට සහතික කරයි.

විගණන කමිටුව විශේෂ කොට ගෙනම සොයා බලනු ලබන්නේ අභ්‍යන්තර හා භාහිර විගණන කටයුතුවල, වංචා හා අවදානම් කළමනාකරණයේ හා අධිකාරියේ සමස්ථ කාර්යසාධනයේ ඵලදායිතාවය වේ.

විගණන කමිටුවේ සාමාජිකත්වය

විගණන කමිටුව විධායන නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් දෙදෙනෙකු ස්වාධීන පුද්ගලයින් විය.

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2022.02.18 වෙනි දින පත් කරන ලද විගණන කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය:

1. එම්.කේ.ඩී.එන්. මාදම්පේ මිය (සභාපති) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, - මුදල් අමාත්‍යාංශය
2. ඩී.පී. වික්‍රමසිංහ මහතා - පත්කළ සාමාජික
3. ඩබ්ලිව්.එච්.කේ.ඩී.බී. රත්නායක මහතා - සැලසුම් හා අධීක්ෂණ අධ්‍යක්ෂ, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

විගණන කමිටුවේ වර්තමාන සාමාජිකයින් මූල්‍යමය කරුණු සම්බන්ධයෙන් නිපුණත්වයක් ඇති මිශ්‍ර දක්ෂතාවන්ගෙන් යුත් ප්‍රවීණතා සහ මාර්ග ක්ෂේත්‍රයේ අත්දැකීම් සහිත පුද්ගලයින්ගෙන් සමන්විත වන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත් වේ.

විගණන කමිටු රැස්වීම් අධ්‍යක්ෂක (අභ්‍යන්තර විගණන) විසින් කැඳවනු ලබන අතර කමිටු වාර්තාද ඔහු විසින් පිළියෙල කරනු ලබයි. විගණන කමිටු රැස්වීම්වලට (හෝ එහි කොටසකට) පැමිණෙන අනිකුත් අය වන්නේ විගණකාධිපති, නියෝජිතයින් සහ ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා වේ. ඊට අමතරව, විගණන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන විගණන ගැටළුවලට ප්‍රතිචාර දක්වනු ලබන්නේ අධිකාරියේ අධ්‍යක්ෂකවරුන් සහ අනිකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණයයි.

කමිටුවේ කාර්භාරය

විගණන කමිටුවේ කාර්යභාරය සහ වගකීම් පහත සඳහන් 2009.06.09 දිනැති අංක DMA/2009(1) දරණ චක්‍රලේඛයේ දක්වා ඇත. විගණන කමිටුවේ වගකීම්වලට පහත සඳහන් කරුණු (එහෙත් ඒවාට සීමා නොවී) ඇතුළත් වේ.

- අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල අවංකභාවය පාලනය කිරීම.
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, නිර්දේශයකට අනුව පසුවිපරම් කිරීමෙන් පසුව අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා සමාලෝචනය කිරීම.
- අවදානම් කළමනාකරණ, අභ්‍යන්තර පාලන පද්ධති හා ක්‍රියාවලි පාලනය කිරීම.
- නෛතික හා නියාමන අවශ්‍යතා සමඟ එහි අනුකූලතාවය පාලනය කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්යයන්හි ඵලදායිතාවය සමාලෝචනය කිරීම.

මූල්‍ය වාර්තාකරණය

අධිකාරියේ මූල්‍ය වාර්තා කිරීම පාලනය කරමින් එහි වාර්ෂික මූල්‍ය ප්‍රතිඵලයන්හි නිරවද්‍යතාවය, සම්පූර්ණ බව හා කලට වේලාවට නිකුත් කරනු ලබන බවට වගබලා ගනී.

විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය ක්‍රමික පදනමක් මත සමාලෝචනය කරනු ලබන අතර අධිකාරියේ පාලනයේ හා කාර්යසාධනයේ වැඩිදියුණුව සඳහා අවශ්‍ය කරනු ලබන උපායමාර්ග හා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උපදෙස් දෙනු ලැබේ. අවශ්‍ය කරනු ලබන අවස්ථාවලදී අධ්‍යක්ෂක මණ්ඩලයේ මතය දැනගැනීම සඳහා හෝ අධ්‍යක්ෂක මණ්ඩලයේ දැනුවත්වීම සඳහා එකී කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණනය සහ අනුකූලවීම

අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු එහි සභාපති සහ විගණන කමිටුවේ සභාපති විසින් අනුමත කරනු ලබන වාර්ෂික විගණන සැලැස්ම පදනම් කරගෙන සිදුකරනු ලබයි. අභ්‍යන්තර විගණන අංශය විසින් සභාපති, විගණන කමිටුව හෝ අධ්‍යක්ෂක මණ්ඩලයේ ඉල්ලීම මත විමර්ශනද පවත්වනු ලබයි.

අභ්‍යන්තර විගණන කමිටුව අභ්‍යන්තර විගණන කටයුතුවල ඵලදායිතාවය, කාර්යසාධනය හා විෂයමූලිකත්වය පිළිබඳව නිරීක්ෂණය කරනු ලබන අතර පහත කරුණු සමාලෝචනයට ලක් කරයි:

- අභ්‍යන්තර විගණන සැලැස්ම සහ එකී සැලස්මේ සාක්ෂාත් කරගැනීම්.
- ප්‍රධාන අභ්‍යන්තර විගණන සොයාගැනීම්, කළමනාකරණයේ ප්‍රතිචාරයේ ප්‍රමාණවත් බව සහ ඔවුන් විසින් ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කලට වේලාවට ගැනීම.
- අභ්‍යන්තර විගණන සම්පත්වල ප්‍රමාණවත් බව.

අවදානම් කළමනාකරණය

විගණන කමිටුව, ප්‍රධාන අවදානම් හඳුනා ගැනීමේදී සහ තක්සේරු කිරීමේදී එකී අවදානම්, යෝග්‍ය හා කාලීන ක්‍රියාමාර්ග ගැනීම ඔස්සේ අඩු කිරීමේදී විගණන හා කළමනාකරණ කමිටුව අදාළ කාර්යයන්හි ප්‍රමාණාත්මක බව සමාලෝචනය කරයි.

2023 වර්ෂය තුළදී සිදුකරන ලද ක්‍රියාකාරකම්

2024 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 5 ක් පවත්වා ඇති අතර එහි ක්‍රියාකාරකම් පහත පරිදි වේ,

- 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කොට ඒවා අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරමින් අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදි.
- අභ්‍යන්තර හා භාහිර විගණනයේ සොයාගැනීම් සහ, නිර්දේශ පිළිබඳ කළමනාකරණය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම.
- ප්‍රධාන ගිණුම් ක්‍රියාවලියේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කරන ලද අතර වැඩිදියුණුව සඳහා ක්ෂේත්‍ර නිර්දේශ කරන ලදි.
- භාහිර විගණකවරයෙකුගේ සේවය ලබාගැනීම පිළිබඳව සමාලෝචනය කරන ලදි.
- අභ්‍යන්තර විගණන කාර්යයන්හි සහ එහි පවතින සම්පත්වල ප්‍රමාණාත්මක බව සමාලෝචනය කරන ලදි.

අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණාත්මක බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යයන් විසින් ලබාදෙන වාර්තා සමාලෝචනය කරන ලදි.

- අභ්‍යන්තර විගණන කාර්යයන්හි ඵලදායිතාවය තක්සේරු කොට එකී කාර්යයන් ශක්තිමත් කිරීමට නිර්දේශ නිකුත් කරන ලදි.

අවදානම් කළමනාකරණය

- අධිකාරියට අනාවරණය වී ඇති අවදානම් සහ එකී අවදානම් අඩු කිරීමේ ක්‍රියාමාර්ගවල ඵලදායිතාවය සමාලෝචනය කිරීම.

විගණන කමිටු රැස්වීම්වලට පැමිණීම පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ "සංස්ථාපිත පාලනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාවය" යන කොටසේ දක්වා ඇත.

විගණන සහ කළමනාකරණ කමිටුව වෙනුවට



එම්.කේ.ඩි.එන්. මාදම්පේ
සභාපති

1.2 අවදානම් කළමනාකරණය සහ ඒවා අඩුකිරීමේ උපායමාර්ග

අවදානම් සාධකය	අවදානම් මට්ටම	අඩුකිරීමේ උපායමාර්ග
මාර්ග ඉදිකිරීමට අදාළ අවදානම්		
• පැහැදිළි උපායමාර්ගික දැක්මක් නොමැතිකම සහ/හෝ විනිවිදභාවයක් රහිත ප්‍රතිපත්තිමය තීරණ හේතුකොට ගෙන යෝග්‍ය නොවන පරිදි ප්‍රමුඛතාව ලබාදීම	මධ්‍යම	• ජාතික මාර්ග ප්‍රතිපත්තියක් සකස් කර ඇත. • රටේ යටිතල ව්‍යුහයට අදාළ ජාතික මාර්ග වැඩිදියුණු කිරීම සඳහා වඩාත් යෝග්‍ය ආයෝජනය ඇගයීමට හා යෝජනා කිරීමට මහාමාර්ග අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මෙහෙයුම් කමිටුවක් පත්කිරීම.
• අත්‍යාවශ්‍ය මාර්ග/පාලම් නඩත්තුව ප්‍රමාදවීම	ඉහළ	• ව්‍යුහාත්මක නිර්මාණ සුලසුම් අංශයේ අංශයේ පාලම් නඩත්තු කිරීමේ සහ තක්සේරු කිරීමේ ඒකකයෙන් සහ පළාත් අධ්‍යක්ෂකවරුන්ගෙන් ලැබෙන තොරතුරු පදනම් කරගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම. • ප්‍රමුඛතා ලැයිස්තුව සහ අරමුදල් පැවතීම පදනම් කරගෙන වඩාත් තීරණාත්මක වැඩබිම් තෝරා ගැනීම.
• මාර්ග ඉදිකිරීමේදී දුර්වල ප්‍රමිතීන් අනුගමනය කිරීමේ හැකියාව	ඉහළ	• ඉදිකිරීම්වල ගුණාත්මක බව සහ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේ අංශය ස්ථාපනය කර ඇත. • අදාළ පරීක්ෂණ සිදුකිරීමේ සහ අනනුකූලතා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීමේ වගකීම ඉහත සඳහන් කළ අංශයට පැවරේ. • එසේම මාර්ගවල මතුපිට ගුණාත්මක බව පිළිබඳ විගණන පරීක්ෂණ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරනු ලබයි.
• මාර්ග ආරක්ෂාව පිළිබඳව දක්වන දුර්වල අවධානය නිසා සිදුවන අනතුරු	ඉහළ	• අවදානම් අඩුකිරීම සඳහා යටිතල ව්‍යුහ, මාර්ග ආරක්ෂාව හා රථ වාහන කළමණාකරන අංශය ස්ථාපනය කර ඇත. • මෙම අංශය විසින් උපද්‍රව සහිත ස්ථාන හඳුනාගෙන ආරක්ෂාව ඉහළ තත්ත්වයට ගෙනඒම සඳහා ක්‍රියාමාර්ග ගනු ලබයි. • පුහුණු කිරීමේ අංශය විසින් වගකිව යුතු ඉංජිනේරවරුන්ට සහ අනිකුත් තාක්ෂණික කාර්යමණ්ඩලයට ක්‍රමික පුහුණුව ලබා දෙයි.
• අතීත පසුවිපරම් වාර්තා සහ ප්‍රමාණවත් සම්පත් නොමැති අඩු පිරිවැයක් ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ හැකියාව. මෙම තත්ත්වය විසින් මුදලේ වටිනාකමට සේවාවක් ලබාගැනීමේ හැකියාව ඇත.	මධ්‍යම	• ටෙන්ඩර් ඇගයීමේ කමිටුව, වඩාත් අනුකූල ලංසුකරු තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත වේ. • තාක්ෂණික ඇගයීම් කමිටුව, කොන්ත්‍රාත්කරුවන්ගේ අතීත කාර්යසාධනය හා පසුවිපරම් වාර්තා පදනම් කරගෙන ඔවුන් ඇගයීමට ලක් කරයි.
• කොන්ත්‍රාත් වෙනස්වීම් සහ ලබාදී ඇති කාලය දීර්ඝ කිරීම අවභාවිතා කිරීමේ හැකියාව; සේවකයින් සමඟ දුස්සන්ධානය	මධ්‍යම	• විශ්වසනීය සාධක සැලකිල්ලට ගනිමින් වෙනස්වීම් අනුමත කරනු ලැබේ. • වෙනස්වීම් සහ ලබාදී ඇති කාලය දීර්ඝ කිරීම නිසි පරිදි සිදුවන බවට වගබලා ගැනීමට අභ්‍යන්තර විගණන අංශය විසින් ක්‍රමික විමර්ශන සිදුකරනු ලැබේ.
මහජන නොඝන්සුන් බව		
• වගකිව යුතු නිලධාරීන් මහජනතාවගේ ගැටළුවලට අවධානය යොමු නොකිරීම	මධ්‍යම	• ජාතික මාර්ග පද්ධතියට අදාළ මහජන පැමිණිලි එක්රැස් කිරීම සඳහා අංක 1968 දරණ දුරකථන අංකය ක්‍රියාකාරී තත්ත්වයට ගෙනඒම. • තොරතුරු මධ්‍යස්ථානය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ පුවත්පත් ලිපි එක්රැස් කරනු ලැබේ. • සීඝ්‍රගාමී මාර්ගවලට අදාළ පැමිණිලි කළමනාකරණය කිරීමට අංක 1969 දරණ දුරකථන අංකය ස්ථාපනය කරනු ලැබේ.

අවදානම් සාධකය	අවදානම් මට්ටම	අඩුකිරීමේ උපායමාර්ග
• ජාක හා සීඝ්‍රගාමී මාර්ග අතර දුර්වල සම්බන්ධතාවය හේතුකොට ගෙන අධික වාහන තදබදයක් ඇතිවීම	ඉහළ	• මෙම ගැටළුවට ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති (iRoad, සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘති, ප්‍රාදේශීය බැංකු විසින් අරමුදල් ලබන ව්‍යාපෘති) සිදුකිරීම මගින් ආමන්ත්‍රණය කර ඇත.
මානව සම්බන්ධතා හා වැඩ කාර්යසාධනයට අදාළ අවදානම්		
• අත්දැකීම් සහිත දක්ෂ වෘත්තිකයින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉවත්වීම	ඉහළ	• සෙවක බලකාය සඳහා ආකර්ෂණීය මූල්‍යමය හා මූල්‍යමය නොවන ප්‍රතිලාභ ප්‍රදානය කරමින් අභියෝගාත්මක වැඩ පරිසරයක් ස්ථාපනය කර ඇත.
• සේවා ස්ථානයේ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා	මධ්‍යම	• සුහද අන්තර් පුද්ගල සම්බන්ධතා වැඩිදියුණු කිරීම
• දූෂිත සේවකයින් කොන්ත්‍රාත්කරුවන් සමඟ දුස්සන්ධානයෙන් කටයුතු කරනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීමේ පිරිවැය ඉහළ යනු ඇති අතර ප්‍රමිතියෙන් බාල මාර්ග ඉදිවනු ඇත.	ඉහළ	• ස්වාධීන විමර්ශන සිදුකරනු ලබන අතර විනය ක්‍රියාමාර්ග අප්‍රමාදව ගනු ලැබේ.
• දුස්සන්ධානය මගින් ස්ථාපනය කරන ලද අභ්‍යන්තර පාලන ක්‍රම උල්ලංඝනය කිරීමේ හැකියාව	ඉහළ	• සේවක බලකායට අදාළව නිවැරදි වාර්තා තැබීම වගබලා ගැනීමට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය කර ඇත. • ස්ථාපනය කරන ලද පාලන ක්‍රම අභ්‍යන්තර විගණක විසින් තක්සේරු කරනු ලැබේ
• වැටුප් රහිත නිවාඩු ලබා සිටින සේවකයින්ට වැටුප් ගෙවීමේ හැකියාව	ඉහළ	
• සේවා ස්ථානයේ දුර්වල කාර්යසාධනය	ඉහළ	• කාර්යසාධනය ඇගයීම • අභ්‍යන්තර විගණන අංශය විසින් කාර්යසාධනය පිළිබඳ ක්‍රමික විගණන පරීක්ෂණ සිදුකරනු ලැබේ.
• සේවක බලකායට අදාළ නීති සහ චක්‍රලේඛ වරදවා අර්ථ දැක්වීම	අඩු	• සේවක බලකායට අදාළ පනත් හා චක්‍රලේඛ පැහැදිළි කිරීමට මානව සම්පත් කළමනාකරණ හා පාරිපාලන, අභ්‍යන්තර විගණන සහ, නීති අංශය මැදිහත් වේ.
• අවශ්‍ය කරනු ලබන සුදුසුකම් නොමැති සේවකයින් බඳවා ගැනීමේ හැකියාව	අඩු	• බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කොට අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. ඉදිරියේදී සිදුකරනු ලබන සියලුම බඳවා ගැනීම් එකී බඳවා ගැනීමේ පරිපාටිය පදනම් කරගෙන සිදුකරනු ඇත.
වත්කම් හා සම්බන්ධ අවදානම්		
• පොත් සහ ගිණුම්වල සටහන් කර නොමැති වත්කම් පැවතීම • නිසි ප්‍රයෝජනයක් නොමැති වත්කම් පැවතීම • වත්කම් අයුතු ලෙස අත්පත් කරගැනීම	මධ්‍යම	• වත්කම් සම්බන්ධයෙන් ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය කිරීම. • වත්කම් ලේඛනය සමඟ සංසන්දනය කරමින් වාර්ෂික විස්තීර්ණ වත්කම් ගණනයක් සිදුකිරීම. • සේවකයින් විසින් වත්කම් සොරකම් කරනු ලැබීම සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශන පැවැත්වීම සහ ඔවුන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම. • අභ්‍යන්තර විගණන අංශය විසින් නිසි ප්‍රයෝජනයක් නොමැති වත්කම් සත්‍යාපනය කිරීමට හා වත්කම් අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ විගණන පරීක්ෂණ පවත්වනු ලබයි.
• වත්කම්, සොරකම් කිරීම නිසා වත්කම් නැතිවිය හැක	අඩු	• රක්ෂණ යෝජනාක්‍රමයකට ඇතුළත් වෙමින් අවදානම මාරු කිරීම
• තුන්වන පාර්ශවයක් විසින් ප්‍රයෝජනයට ගත හැකි වත්කම් තිබීම.	මධ්‍යම	

අවදානම් සාධකය	අවදානම් මට්ටම	අඩුකිරීමේ උපායමාර්ග
තොරතුරු තාක්ෂණය පදනම් කරගත් මෙහෙයුම් කටයුතු සහ තොරතුරු කළමනාකරණ ක්‍රමවල මඳබව		
• සම්බන්ධතාවය අහිමිවීම	ඉහළ	• 'ඉඩම් පරිගණක දත්ත ගබඩාව' වැනි තෝරාගත් අවධි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුළුල් කළමනාකරණය ක්‍රමයක් ස්ථාපනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත.
• යවත්කාලීන කරන ලද පරිගණක දත්ත ගබඩාවක් නොමැතිවීම	ඉහළ	
• තාක්ෂණිකමය වශයෙන් සුදුසුකම් ලත් කාර්යමණ්ඩලයක හිඟකම්	ඉහළ	• මෙම ගැටළුවට බඳවා ගැනීමේ පරිපාටිය මගින් විසඳුම් ලබාදී ඇත.
• මෘදුකාංග සේවකයින් විසින් මෙහෙයවීම	අඩු	• ආයතනයේ අස්පෘශ්‍ය වත්කම් පිළිබඳව වාර්තා කිරීමට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය කර ඇත. උදා : මෘදුකාංග යවත්කාලීන කරනු ලබන්නේ නිල විද්‍යුත් තැපෑල මගින් පමණි
• වටිනා තොරතුරු අයුතු ලෙස අත්පත් කරගැනීම	අඩු	• යම් සේවකයෙකු ඉල්ලා අස්වුවහොත් ඔහු/ඇය සතු සියලුම වටිනා මෘදුකාංග ආපසු ගනු ලැබේ
• තොරතුරු තාක්ෂණය පදනම් කරගත් බදු මුදල් එකතු කිරීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීමට අපොහොසත්වීම	ඉහළ	• මීට අදාළ වැඩකටයුතු සිදුකෙමේන් පවති
විගණන අවදානම		
• විගණකවරුන් අවදානම් කල් ඇතිව හඳුනා ගැනීමට අපොහොසත්වීම	ඉහළ	• වදානම් සාධක සැලකිල්ලට ගනිමින් විගණන සැලැස්ම පිළියෙල කිරීම සහ ඒ අනුව විගණනය සිදුකිරීම • දක්ෂ කාර්යමණ්ඩලයක් බඳවා ගැනී • විගණන හා කළමනාකරණ රැස්වීම් කාර්තුමය වශයෙන් කැඳවීම

1.2 සාමූහික කළමනාකරණය



අධ්‍යක්ෂ ජනරාල් - ඉංජිනේරු කේ.ඩබ්ලිව්. කණ්ඩම්බි

මාර්ග සංවර්ධන අධිකාරියේ (මා.සං.අ.) සභාපති ඉංජිනේරු කේ.ඩබ්ලිව්. කණ්ඩම්බි මහතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස සිය කාර්යභාරය වෙනුවෙන් තමා සතු දශක තුනකට ආසන්න කාලයක ඉංජිනේරු සහ කළමනාකරණ අත්දැකීම් ප්‍රයෝජනයට ගනී.

- **මාර්ග ඉදිකිරීම් සහ නඩත්තුව සඳහා සිසිල් මිශ්‍ර ඇස්පෝල්ට්වලින් 100% ක් නැවත ගොඩනගන ලද ඇස්පෝල්ට් පදික වේදිකා (RAP) තක්සේරු කිරීම**

iv). හිඟුරක්ගොඩ ගුවන්තොටුපළ ධාවන පථය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා, මා.සං. අධිකාරිය සහ, පර්යේෂණ හා සංවර්ධන අංශය, උපදේශනය ලබාදෙමින් ඇස්පෝල්ට් පදික වේදිකා මිශ්‍ර, පස් සහ ඝන ශ්‍රේණිගත සමස්ථ පාදක පාඨමාලාව, ධාවන පථ පදික වේදිකා මිශ්‍රණය සහ, ඉදිකිරීම් කාලය තුළ තත්ත්ව පාලන පරීක්ෂණ සඳහා තාක්ෂණික පිරිවිතර සමාලෝචනය කිරීම සඳහා සහභාගි විය.

- **පර්යේෂණ හා සංවර්ධන අංශය සඳහා පිරියත, යන්ත්‍ර සහ උපකරණ අලුත්වැඩියා කිරීමේ සහ නඩත්තු කිරීමේ වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මිලියන 3.300 ක ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළදී රු. මිලියන 3.037 ක මුදලක් වියදම් කර ඇත.**

- පර්යේෂණ හා සංවර්ධන අංශය සඳහා පිරියත, යන්ත්‍ර සහ උපකරණ මිළදී ගැනීමේ වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මිලියන **1.500** ක ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළදී රු. මිලියන **1.467** ක මුදලක් වියදම් කර ඇත.
- පර්යේෂණ හා සංවර්ධන අංශය සඳහා සමීක්ෂණ හා විමර්ශන පැවැත්වීමේ වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මිලියන **4.700** ක ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළදී රු. මිලියන **4.599** ක මුදලක් වියදම් කර ඇත.
- පර්යේෂණ හා සංවර්ධන අංශය සඳහා සමීක්ෂණ හා විමර්ශන පැවැත්වීමේ වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මිලියන **9.500** ක ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළදී එකතුව රු. මිලියන **9.133** ක මුදලක් වියදම් කර ඇත.
- ඒ අනුව **2024** වර්ෂය තුළ සමස්ථ මූල්‍ය ප්‍රගතිය **96%** ක් සහ භෞතික ප්‍රගතිය **75%** ක් විය.
- රසායනාගාර පරීක්ෂණ, මිහිවිදමන් විමර්ශන සහ තාක්ෂණික උපදේශන වැඩ වෙනුවෙන් සේවාලාභී ආයතනවලින් ලැබුණු වාර්ෂික ආදායම රු. **63,731,856.25** ක් (වැට් සහිත) විය.

2024 වර්ෂය තුළ සිදුකරන ලද පර්යේෂණ ව්‍යාපෘති

අයිතම අංකය	විස්තරය / ක්‍රියාකාරකම	ඒකකය	ප්‍රමාණය	2023.12.31 දිනට සමවූවිත ප්‍රගතිය	2024 වර්ෂයේ භෞතික ඉලක්ක (%)	2024 වර්ෂය තුළ භෞතික ප්‍රගතිය (%)	2024.12.31 දිනට සමවිචිත භෞතික ප්‍රගතිය (%)	සංලක්ෂ්‍යය
1	**නව තාක්ෂණික ක්‍රම පරිචය කිරීම**	අයිතම ගණන	8					වැඩ අඛණ්ඩව සිදුකරගෙන යාම
1.1	උණුසුම් මිශ්‍ර ඇස්පෝල් තාක්ෂණය	අයිතම ගණන	3	30	30	20	50	වැඩ නිරීක්ෂණය කිරීම
1.2	කාබන් කළු විකරණය කරන ලද ඇස්පෝල්ට්							
1.3	තුනී ඇස්පෝලට් පිටිතල කිරීම සඳහා HMA							
1.4	අභ්‍යන්තර පදනම් කිරීමේ කොන්ක්‍රීට්	අයිතම ගණන	5	10	0	0	10	iRoad ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත්කරුවන් විසින් අයිතම 1.4, 1.5, 1.6, 1.7 සහ 1.8 සඳහා යන්ත්‍රාගාර සහ ක්ෂේත්‍ර අත්හදා බැලීම් යන කාර්යයන් දෙකම අත්හිටුවන ලදි.
1.5	රෝලර්-සුසංගිත කොන්ක්‍රීට්			0	0	0	0	
1.6	අර්ධ තද පදික වේදිකා			10	0	0	10	
1.7	තුනී ඇස්පෝට් පිටිතල කිරීම සඳහා පාෂාණ මාස්ටික් ඇස්පෝල්ට්			5	0	0	5	
1.8	ක්ෂුද්‍ර පිටිතල කිරීම			5	0	0	5	
2	බිටුමන් අන්තර්ගතය, සිසිල් මිශ්‍ර ඇස්පෝල්ට්වල ස්ථායිතාව සහ ප්‍රවාහය සහ, HMA සමඟ පිරිවැය සංසන්දනය (කුලියාපිටිය-පණ්ඩිවෙල මාර්ගයේ ක්ෂේත්‍ර අත්හදා බැලීම).	අයිතමය	1	60	20	20	80	වැඩ අඛණ්ඩව සිදුකරගෙන යාම
3	මාර්ග ඉදිකිරීම්වලදී ඇස්පෝල්ට් බන්ධන/ Wearing Course, නියාමන Course සහ සිසිල් මිශ්‍රණය පිළියෙල කිරීම සඳහා නැවත ඉදිකිරන ලද ඇස්පෝල්ට් පදික වේදිකා (RAP) භාවිතා කිරීම.	අයිතමය	1	30	40	70	100	වැඩ අඛණ්ඩව සිදුකරගෙන යාම
4	මාර්ග සලකුණු කිරීමේ පරීක්ෂණ සංඛ්‍යාත සහ පිරිවිතර සීමා ස්ථාපනය කිරීම	අයිතමය	1	40	40	0	40	වැඩ අඛණ්ඩව සිදුකරගෙන යාම
5	උණුසම් මිශ්‍ර ඇස්පෝල්ට්වල ගතිගුණ වැඩිදියුණු කිරීම සඳහා ආකලන ද්‍රව්‍යයක් ලෙස අඩු ඝනත්වයක් සහිත කසල පොලිතීන් සම්බන්ධ රසායනාගාර විමර්ශනය	අයිතමය	1	30	30	30	60	වැඩ අඛණ්ඩව සිදුකරගෙන යාම
6	ඉවතලන ටයර්වලින් ලබාගන්නා තාපවිච්ඡේදක කළු කාබන් භාවිතා කරමින් බිටුමන් වැඩිදියුණු කිරීම	අයිතමය	1	60	30	40	100	වැඩ අඛණ්ඩව සිදුකරගෙන යාම
7	ක්ලෝර්ටිස් අන්තර්ගතය සහිත ලෝහ සමාහාර භාවිතා කරමින් ඇස්පෝල්ට් මිශ්‍රණය නිෂ්පාදනය කිරීම සඳහා බිටුමන් 60/70 සුපර් බොන්ඩ් සහ, ඇලේට ලිස්සා යාමේ ප්‍රතිරෝධය වැඩිදියුණු කිරීමට එකතු කිරීම් යොදා ගැනීම සඳහා වානේ පාලම් තට්ටුවල කාන්දු වලක්වන ද්‍රව්‍ය	අයිතමය	1	0	20	0	-	iRoad ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත්කරුවන් විසින් යන්ත්‍රාගාර සහ ක්ෂේත්‍ර අත්හදා බැලීම් යන කාර්යයන් දෙකම අත්හිටුවන ලදි.
8	අඩු වාහන තදබදයක් සහිත මාර්ග සඳහා අඩු වියදම් සහිත පිටිතල අත්හදා බැලීම්	අයිතමය	1	0	40	0	-	ICDP ව්‍යාපෘතිය යටතේ Under the ICDP Project
	මුළු එකතුව		8	35	31.25	22.50	57.5	

මාර්ග සහ පාලම් වැඩවල තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතිය අධීක්ෂණය කිරීම

මා.සං. අධිකාරියේ තත්ත්ව සහතික කිරීමේ සහ කාර්යසාධන විගණන අංශය, කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකරනු ලබන වැඩ විශේෂිත වූ කොන්ත්‍රාත් අවශ්‍යතා සපුරාලන බවට වගබලා ගනී. මෙයට සම්පූර්ණ කරන ලද සිදුකෙරෙමින් පවතින වැඩ සම්බන්ධයෙන් අහඹු පරීක්ෂාවන් සිදුකිරීම මෙන්ම අනුකූලතා සත්‍යාපනය කිරීම පිණිස ස්වාධීන පරීක්ෂණද ඇතුළත් වේ. ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූල නොවන ඕනෑම අවස්ථාවක් අදාළ අධ්‍යක්ෂකවරුන්ට, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ට, පළාත් අධ්‍යක්ෂකරුවරුන්ට සහ මා.සං. අධිකාරියේ පාලනාධිකාරිය වෙත වාර්තා කරනු ලැබේ. එසේම වැඩබිම් වෙත සපයනු ලබන ද්‍රව්‍ය පිරිවිතර අවශ්‍යතා සපුරාලන බවට වගබලා ගැනීම පිණිස මෙම අංශය විසින් එකී ද්‍රව්‍ය පිළිබඳව අහඹු පරීක්ෂාවන්ද සිදුකරනු ලබයි. ඊට අමතරව මෙම අංශය අධ්‍යක්ෂකවරුන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIUs), උපදේශකවරුන් සහ අනිකුත් අදාළ අධිකාරීන් විසින් සපයන ලබන ප්‍රගති වාර්තාවල නිරවද්‍යතාවය සහතික කරගැනීම පිණිස ඒවා අහඹු විගණන මගින් සමාලෝචනය කරනු ලබයි.

2024 වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රගති ක්‍රියාකාරකම්

අහඹු ලෙස තෝරාගත් ව්‍යාපෘති හෝ අපේක්ෂිත ප්‍රගතිය සමඟ සංසන්දනය කරමින් දුර්වල ප්‍රගතියක් සහිත ව්‍යාපෘති පරීක්ෂා කිරීම. මෙම පරීක්ෂාව අධ්‍යක්ෂ ජනරාල්/මා.සං. අධිකාරිය හෝ සභාපති/මා.සං. අධිකාරිය විසින් පවරනු ලබන අතර ඉන් පසුව තාක්ෂණික විගණන වාර්තා සහ කොන්දේසි සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

තාක්ෂණික විගණනවල සාරාංශය

No	ව්‍යාපෘතියේ නම	වැඩබිම පරීක්ෂා කළ දිනය
1	ICDP ව්‍යාපෘතිය, මාතලේ - අංක - LK-RDA-251198-CW-LOT 2	11/01/2024 & 12/01/2024
2	ICDP ව්‍යාපෘතිය, අනුරාධපුර - අංක - LK-RDA-251200-CW-LOT 2	31/01/2024
3	කි.මී. 1,500 මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - ගාල්ල දිස්ත්‍රික්කය (පංච ථූපාරාමය, ඔලගන්දුව - යාලේගම, මංගල මාවත, බෙන්තොට)	29/03/2024
4	කි.මී. 1500 වැඩසටහන යටතේ මාර්ග වාහන ධාවන කළ හැකි තත්ත්වයට වැඩිදියුණු කිරීම (ඇල්ල හංදිය සිට කැටපොල මාර්ගය, කොළඹ හංදිය සිට විතාරන්පංගුව සහ තලවිය දීරගොඩ හරහා පරණගම මාර්ගය)	25/04/2024
5	ඇල්ලෙයි කන්තලේ මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 15+000 සිට 41+500 දක්වා)	05/04/2024
6	කි.මී. 1,500 මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කය	25/04/2024
7	කි.මී. 1500 වැඩසටහන යටතේ මාර්ග වාහන ධාවන කළ හැකි තත්ත්වයට වැඩිදියුණු කිරීම - මීගමුව විධායක ඉංජිනේරු කොට්ඨාශය	03/05/2024
8	කි.මී. 1500 වැඩසටහන යටතේ මාර්ග වාහන ධාවන කළ හැකි තත්ත්වයට වැඩිදියුණු කිරීම - මාතලේ දිස්ත්‍රික්කය	08/05/2024
9	කි.මී. 1500 වැඩසටහන යටතේ මාර්ග වාහන ධාවන කළ හැකි තත්ත්වයට වැඩිදියුණු කිරීම - මහව විධායක ඉංජිනේරු කොට්ඨාශය	15/05/2024
10	A-017 මාර්ගය පුනරුත්ථාපනය කිරීම කොරිඩෝ ව්‍යාපෘතිය - සූරියකන්ද - රක්වාන (Ch.124+60 කි.මී. සිට Ch. 130+600 කි.මී. දක්වා)	27/06/2024
11	ICDP ව්‍යාපෘතිය, මොණරාගල දිස්ත්‍රික්කය - LK–RDA–251205–CW–LOT1	16/07/2024
12	A-017 මාර්ගය පුනරුත්ථාපනය කිරීම කොරිඩෝ ව්‍යාපෘතිය - සූරියකන්ද - රක්වාන (Ch.118+460කි.මී. සිට Ch. 124+460 කි.මී. දක්වා)	30/07/2024
13	ICDP ව්‍යාපෘතිය, මොණරාගල දිස්ත්‍රික්කය - LK-RDA-251205-CW-LOT3	15/08/2024
14	A1 මාර්ගය මහර සිට කඩවත හංදිය දක්වා කොටස පුනරුත්ථාපනය කිරීම/ වැඩිදියුණු කිරීම	29/08/2024
15	මධ්‍යම සිඹුගාමී මාර්ග ව්‍යාපෘතිය පොතුහැර සිට ගලගෙදර දක්වා (Ch.8+ 050 කි.මී. සිට Ch.8+850 කි.මී. දක්වා)	03/12/2024

කොන්දේසි සමීක්ෂණ පිළිබඳ සාරාංශය

අංකය	ව්‍යාපෘතියේ නම	වැඩබිම පරීක්ෂා කළ දිනය
1	කොට්ටාව, හෝමාගම, මහරගම සහ නුගේගොඩ හංදිවල සිදුකරන ලද නඩත්තු වැඩ පරීක්ෂා කිරීම	26/02/2024, 27/02/2024, 29/02/2024 & 01/03/2024
2	මාවනැල්ල - හෙම්මාතගම - ගම්පොල මාර්ගය (B-279) CH.15+ 000 කි.මී. සිට 20+ 900 කි.මී. දක්වා)	05/06/2024
3	තංගල්ල - කදුරුපොකුණ - බෙලිඅත්ත මාර්ගය පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම	06/09/2024

මහජන පැමිණිලි පිළිබඳ සාරාංශය

අංකය	ව්‍යාපෘතියේ නම	වැඩබිම පරීක්ෂා කළ දිනය
1	Ch. 6+910 කි.මී. සිට Ch. 7+700 කි.මී. තොප්පිගල දක්වා දිවෙන මයදියෝඩායි ආනෙක්කටු මාර්ගවල අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීම (3 වෙනි අදියර)	13/09/2024
2	උඩුනුවර ප්‍රාදේශීය සභාව හරහා පේරාදෙණිය ගෙලිඔය නගරය වැඩිදියුණු කිරීම (Ch. 0+000 කි.මී. සිට Ch. 3+000 කි.මී. දක්වා)	27/09/2024
3	පොතුවිල් සර්වෝදය සුනාමි මාර්ගය සම්බන්ධිත අංකය RDA/SP/1500KM/AKK/19	08/10/2024
4	වැලිකැටිය තැන්කන්ද මාර්ගය වැඩිදියුණු කිරීම	24/10/2024
5	හික්ගොඩ සිට පහලබෝගොඩ දක්වා මාර්ගය වැඩිදියුණු කිරීම	19/11/2024
6	වරාවැව, හෙට්ටිආරච්චිගම රාජකරුණා මාර්ගය	26/11/2024
7	පේදුරු තුඩුව - මරුදන්කර්නි මාර්ගය	19/12/2024
8	වාවාකච්චේරි - පුලෝලි මාර්ගය	20/12/2024

1. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් යටතේ අධ්‍යක්ෂකවරුන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රගතිය පදනම් කරගත් ඒකාබද්ධ ප්‍රගතිය මා.සං. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව වාර්තා කරන ලදි.

2. ව්‍යාපාති අධ්‍යක්ෂකවරුන්, පළාත් අධ්‍යක්ෂකවරුන් සහ උපදේශකවරුන් යටතේ අධ්‍යක්ෂකවරුන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIU) විසින් පිළියෙල කරනු ලබන ප්‍රගති වාර්තා ලබාගන්නා ලදි. වාර්තා කිරීමේ නිරවද්‍යතාවය අහඹු ලෙස පරීක්ෂා කරන ලද අතර යම් දෝෂයක් හමුවුවහොත් ඒවා නිවැරදි කරන ලෙසට ඔවුනට දන්වන ලදි.

2.1.7 යටිතල ව්‍යුහය, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණය



ශ්‍රී ලංකාවේ ජාතික මාර්ග සහ සිසුගාමී මාර්ගවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැදගත් සුවිශේෂිතාවක් දක්වන විෂයයන් ලෙස සලකනු ලබන මාර්ග අයින යටිතල ව්‍යුහ ඒකාබද්ධ කිරීමේ කටයුතු, මාර්ග ආරක්ෂාව සහ රථවාහව කළමනාකරණය යන කාර්යයන් යටිතල ව්‍යුහ, මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණ (IRSTM) අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික මාර්ග ජාලයේ ආර්ථික හා සුරක්ෂිත භාවිතය උදෙසා යටිතල ව්‍යුහ, මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණ අංශයේ බැඳීම් අවදානම් කළමනාකරණ ක්‍රම විසින් ඉල්ලා සිටිනු ඇති අතර ක්‍රියාපටිපාටීන් පහත සඳහන් කාර්යයන් සඳහා සුදුසු පරිදි අනුගමනය කළ යුතුය:

- නව මාර්ග වැඩ සඳහා සැලසුම් නිර්මාණය කිරීමේදී උපකල්පනය කරනු ලබන මාර්ග පරිශීලක හැසිරීමේ මට්ටම පවත්වා ගැනීමට උපකාරීවීමට;
- දැනට පවතින ජාලයේ සුරක්ෂිත හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය කරනු ලබන හැසිරීම් මට්ටම පවත්වා ගැනීමට උපකාරීවීමට;
- මාර්ග ජාල කළමනාකරණයේදී ප්‍රධාන අරමුණු ලෙස මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය පිළිබඳව දැනගැනීමට;
- මාර්ග ජාලයේ ප්‍රමාණවත් ක්‍රමික ආරක්ෂාව හා රථවාහන කළමනාකරණ පරීක්ෂාවන් ලබාදීමට;
- අනාරක්ෂිත හෝ අකාර්යක්ෂම රථවාහන කළමනාකරණ තත්ත්ව දැනගත්විට ගත යුතු පියවර විශේෂ කොට දැක්වීමට

2024 වර්ෂය තුළ යටිතල ව්‍යුහ, මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණ (IRSTM) අංශය විසින් සිදුකරන ලද වැඩ

2023 වර්ෂය දක්වා යටිතල ව්‍යුහ, මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණ (IRSTM) අංශය විසින් සිදුකරන ලද නිත්‍ය වැඩපිළිවෙලෙහි සාරාංශය

විෂයයන්	ලැබුණු මුළු ඉල්ලීම් ගණන	සම්පූර්ණ කරන ලද ගණන
යටිතල ව්‍යුහය	29	28
මාර්ග ආරක්ෂාව	117	87
උපද්‍රව සහිත ස්ථානවලට ප්‍රතිකාර කිරීම	173	125
සංඥා සහ සලකුණු		
කි.මී. ගණන	452.06	452.06
අන්තර්ඡේදන ගණන	120	120
රථවාහන බලපෑම තක්සේරු කිරීම	153	153
මහජන ඉල්ලීම් හා පැමිණිලි	381	328
රථවාහන කළමනාකරණ කමිටුව	10	10
ඉදිරි උපදෙස් සංඥා පුවරු		
සංඥා පුවරු ගණන	225	225
රථවාහන ආලෝක පද්ධති	32	32
රථවාහන ආලෝක පද්ධති සහ පෙලිකන් පද්ධති	190	190
නව සැලසුම් නිර්මාණ	2	2

විෂයයන්	ලැබුණු මුළු ඉල්ලීම් ගණන	සම්පූර්ණ කරන ලද ගණන
වීථි ලාම්පු		
වීථි ලාම්පු සැලසුම් නිර්මාණය කිරීම	3	3
වීථි ලාම්පු සමාලෝචනය	3	3
අනිකුත් වැඩ		
පුහුණු සහ දැනුවත් කිරීම	15	15
මාර්ගෝපදේශ පිළියෙල කිරීම	14	14

සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) යටතේ ව්‍යාපෘතිවල යෝජනාවල ප්‍රගතිය

අයිතමය	සමුච්චිත ප්‍රගතිය (%)
(i) RS01 - ශ්‍රී ලංකාවේ මාර්ග යටිතල ව්‍යුහය සඳහා ජාතික මාර්ග ආරක්ෂාව සම්බන්ධ උපායමාර්ග සංවර්ධනය කිරීම	
මූලික සැලැස්ම පිළියෙල කිරීම	100
විෂය ක්ෂේත්‍රය (TOR) පිළියෙල කිරීම	90
උනන්දුව ප්‍රකාශ කිරීම (EOI) ඉදිරිපත් කිරීමේ ආකෘතිය පිළියෙල කිරීම	60
ප්‍රචාරක දැන්වීම් පිළියෙල කිරීම	60
(ii) RS05 - මාර්ග ආරක්ෂාව සම්බන්ධ අත්පොත් සහ ධාරිතා ගොඩනැංවීම සංවර්ධනය කිරීම	
මූලික සැලැස්ම පිළියෙල කිරීම	100
විෂය ක්ෂේත්‍රය (TOR) පිළියෙල කිරීම	80
උනන්දුව ප්‍රකාශ කිරීම (EOI) ඉදිරිපත් කිරීමේ ආකෘතිය පිළියෙල කිරීම	60
ප්‍රචාරක දැන්වීම් පිළියෙල කිරීම	60

2024 වාර්ෂික අයවැය මගින් සිදුකරන ලද වැඩවල සාරාංශය

අයිතම නිස්තරය	2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2024 වර්ෂාවසානය වනවිට වියදම (රු.මි.)	ක්‍රියාකාරකම්
යටිතල ව්‍යුහය සහ මාර්ග ආරක්ෂාව සම්බන්ධ වැය ශීර්ෂය (117-02-04-21-2104)	52.0	51.1	නාලන්ද සුදර්ශි ප්‍රාථමික පාසැල් කලාපයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම
			මාතලේ හින්දු විද්‍යාලයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම
			මාතලේ මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ ආරක්ෂාව වැඩිදියුණු කිරී
			රංගිරි දඹුලු ජාතික පාසලේ 1 කලාපයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම
			ගම්පහ විධායක ඉංජිනේරු කොට්ඨාශයේ නම්‍යශීලී බොලාර්ඩ් (රථවාහන පාලනයට මහා මාර්ගයේ ඇති කෙටි කුළුණු) සැපයීම
			හොරණ විධායක ඉංජිනේරු කොට්ඨාශයේ නම්‍යශීලී බොලාර්ඩ් (රථවාහන පාලනයට මහා

			මාර්ගයේ ඇති කෙටි කුළුණු) සවිකිරීම
රථවාහන කළමනාකරණය සම්බන්ධ වැය ශීර්ෂය (117-02-04-22-2104)	55.00	54.9	A4 මාර්ගයේ පිටිපන හංදියේ සංඥා සවිකිරීම
			A2 මාර්ගයේ අඟුලාන හංදියේ සංඥා සවිකිරීම
			බෙස්ලයින් මාර්ගයේ රථවාහන ආලෝක පද්ධති 6 හි සහ පෙලිකන් සංඥා පද්ධතියෙහි සංඥා ශීර්ෂ උසස් තත්ත්වයට ගෙනඒම
			B304 මාර්ගයේ නාගොඩ රෝහල් හංදියේ පෙලිකන් සංඥා
			A0 මාර්ගයේ රාජගිරිය ජා.ආ. හා ක.පු.ඇ. (NAITA) අසල පෙලිකන් සංඥා

2.1.8 ඉඩම් අත්පත් කරගැනීම සහ නැවත පදිංචි කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත් කරගැනීමේ අංශය ස්ථාපනය කරනු ලැබුවේ මාර්ග ඉදිකිරීම, බලපෑමට ලක්වූ පාර්ශවයන්ට වන්දි ගෙවීම සහ ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ සිදුකරනු ලබන සියලුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදුකිරීම, ඉඩම් පරිහරණය කිරීම, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිලි, ව්‍යුහයන් සහ මාර්ග වෙන් කිරීම්, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් සම්පත් නඩත්තු කිරීම පිණිස වත්කම් තක්සේරු කිරීම සඳහා සංවර්ධන ක්‍රියාපටිපාටීන් යන කරුණු වේගවත් කිරීමේ අරමුණ ඇතිවය.

2024 දෙසැම්බර් 31 දිනට නිදහස් ප්‍රදාන ඉල්ලුම් ක්‍රියාපටිපාටිය සම්බන්ධ ප්‍රකාශනය

අනු අංකය	පළාත	ගත යුතු මුළු ඉඩම් කට්ටි ගණන : නිදහස් ප්‍රදාන	නිදහස් ප්‍රදාන සඳහා ඉල්ලුම් කරන ලද ඉඩම් කට්ටි ගනන	විශාලත්වය	
				හෙක්ටයාර	අක්කර
1	උතුරු පළාත	32	32	12.7912	31.5943
2	නැගෙනහිර පළාත	55	55	17.1302	42.3115
3	දකුණු පළාත	24	23	13.0384	32.2049
4	බස්නාහිර පළාත	91	74	28.7999	71.1358
5	වයඹ පළාත	70	70	26.5986	65.6985
6	උතුරු මැද පළාත	38	38	19.5479	482833
7	මධ්‍යම පළාත	131	47	43.3545	107.0856
8	ඌව පළාත	41	17	15.8884	39.2443
9	සබරගමුව පළාත	60	56	30.1710	74.5224
එකතුව		542	412	207.3201	511.3861

පළාත්වලට අදාළව ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධ සාරාංශය

පළාත	දිස්ත්‍රික්කය	මාර්ග ගණන	මුළු ඉඩම් කට්ටි ගණන	මළු වපසරිය හෙක්ටයාරවලින්	2024.12.31 දින දක්වා හානිපූරණ වන්දි ප්‍රදානය කිරීම	2023.12.31 දින දක්වා ගෙවීම් 17 සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණන	2023.12.31 දින දක්වා අත්පත් කරගැනීම සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණන	2024 වර්ෂයේදී ගෙවීම් 17 සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණන	2024 වර්ෂයේදී අත්පත් කරගැනීම සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණන
බස්නාහිර පළාත	කොළඹ	15	1,847	8.63	1,072	1,011	42	62	173
	කළුතර	2	-	-	-	-	-	-	-
	ගම්පහ	39	7,600	59.22	6,064	5,729	413	111	-
මධ්‍යම පළාත	මහනුවර	22	3,457	11.15	2,905	2,576	125	111	8
	මාතලේ	7	4,434	11.66	1,862	1,188	119	544	66
	නුවරඑළිය	6	1,697	10.51	233	212	-	15	16
දකුණු පළාත	ගාල්ල	4	-	-	-	-	-	-	-
	මාතර	20	-	-	-	-	-	-	-
	හම්බන්තොට	28	6,159	176.92	2,847	2,720	603	110	53
උතුරු පළාත	යාපනය	-	-	-	-	-	-	-	-
	කිළිනොච්චිය	-	-	-	-	-	-	-	-
	මන්නාරම	-	-	-	-	-	-	-	-
	මුලතිව්	-	-	-	-	-	-	-	-
	වවුනියාව	-	-	-	-	-	-	-	-
නැගෙනහිර පළාත	ත්‍රිකුණාමලය	-	-	-	-	-	-	-	-
	මඩකලපුව	-	-	-	-	-	-	-	-
	අම්පාර	-	-	-	-	-	-	-	-
වයඹ පළාත	පුත්තලම	1	672	9.72	9	8	-	1	-
	කුරුණෑගල	15	978	16.04	1,136	1,111	-	116	-
උතුරු මැද පළාත	අනුරාධපුරය	-	-	-	-	-	-	-	-
	පොළොන්නරුව	3	-	-	-	-	-	-	-
ඌව පළාත	මොණරාගල	-	-	-	-	-	-	-	-
	බදුල්ල	4	217	0.14	143	140	-	9	-
සබරගමුව පළාත	කෑගල්ල	8	1,042	13.20	724	643	-	77	27
	රත්නපුරය	12	596	16.09	306	262	-	46	-

විදේශීය අරමුදල්වලින් සිදුකරනු ලබන ව්‍යාපෘතිවලට අදාළව ඉඩම් අත්පත් කරගැනීම්වල සාරාංශය

අනු අංකය	මාර්ගය සහ මාර්ග අංකය	මුළු ඉඩම් කට්ටි ගණන	මළු වපසරිය හෙක්ටයාරවලින්	2024.12.31 දින දක්වා හානිපූරණ වන්දි ප්‍රදානය කිරීම	2023.12.31 දින දක්වා ගෙවීම් 17 සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණ	2023.12.31 දින දක්වා අත්පත් කරගැනීම සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණන	2024 වර්ෂයේදී ගෙවීම් 17 සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණන	2024 වර්ෂයේදී අත්පත් කරගැනීම සම්පූර්ණ කරන ලද ඉඩම් කට්ටි ගණන	2023.12.31 දින දක්වා සිදුකරන ලද ගෙවීම්	2024 වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම්
1	දක්ෂිණ සිඝ්‍රගාමී මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - I	4155	297.71	3708	3603	2828	164	79	5,390,919,190.46	209,451,466.65
2	දක්ෂිණ සිඝ්‍රගාමී මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - II	2883	253.3	2806	2550	2209	23	194	2,075,114,269.08	37,346,820.75
3	දක්ෂිණ සිඝ්‍රගාමී මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - III	8395	83.95	3424	2393	3116	15	0	1,196,603,796.02	10,539,029.65
4	දක්ෂිණ සිඝ්‍රගාමී මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - IV	1107	182	1107	628	1107	0	0	242,808,540.92	8,641,494.57
5	දක්ෂින ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය	9389	951.17	9389	9389	6789	0	0	0.00	0.00
6	කොළඹ-කටුනායක සිඝ්‍රගාමී මාර්ගය (කි.මී. 25.8)	2583	183.5793	1971	1957	1957	14	0	2,413,724,120.97	20,291,422.61
7	පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර - II	1442	81.5	1136	1136	524	0	245	1,688,380,724.50	808,750.00
8	පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර - III	1702	99.7	1490	1475	775	2	806	8,375,710,000.00	29,850,000.00
9	ගාල්ල - බද්දේගම මාර්ගය (දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය)	1862	13.82	1321	1160	40	142	32		

10	පාමංකඩ - හොරණ මාර්ගය (දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය)	2128	23.823	1817	1803	0	14	72	5,152,345,577.05	596,631,819.34
11	මිරිහාන - ගොඩගම මාර්ගය (දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය)	158	0.2473	66	66	0	0	0	247,427,314.60	32,477,532.78
12	කිරුළපන - ගොඩගම මාර්ගය (දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය)	3362	10.944	1576	1354	0	222	242	3,357,905,368.35	844,548,616.14
13	මධ්‍යම අධිවේගී මාර්ගය (ම.අ.මා. 4)	5055	475	1	207	207	1	0	432,270,000.00	1,647,000.00
14	රුවන්පුර සීඝ්‍රගාමී මාර්ගය (රු.සී.මා.)	2910	209.32	1345	693	0	313	0	3,551,675,000.00	1,546,737,000.00
15	බෙස්ලයින් මාර්ගය (විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය)	200	2.6826	113	93	0	15	0	2,741,084,918.02	599,519,596.23
16	තිඹිරිගස්යාය මාර්ගය	226	1.5823	181	181	0	0	0	777,480,000.00	0.00

2.1.9 පාරිසරික සහ සමාජයීය ආරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම



පාරිසරික හා සමාජ සංවර්ධන අංශය, මා.සං. අධිකාරියේ ව්‍යාපෘතිවල පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමේදී මා.සං. අධිකාරිය සතු පාරිසරික හා සමාජ ආරක්ෂණ කටයුතු සම්බන්ධ ශාඛාව වේ. එසේම ව්‍යාපෘති සඳහා අනුමැතිය සහ, අවශ්‍ය වුවහොත් පාරිසරික හා සමාජ තක්සේරු කිරීම් ලබාගැනීමට මා.සං. අධිකාරියේ ස්ථාපනය කර ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකවලට සහයෝගයද පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් ලබාදෙයි.

අංශයේ ප්‍රධාන කාර්යයන් හා වගකීම් ප්‍රධාන වශයෙන් පහත කරුණු පහ යටතේ වර්ග කළ හැකිය.

i. මා.සං. අධිකාරියේ ව්‍යාපෘති සඳහා පාරිසරික හා සමාජයීය තක්සේරු වාර්තා (පාරිසරික බලපෑම් තක්සේරුව / මූලික පාරිසරික පරීක්ෂණ) පිළියෙල කිරීම.
ii. භාහිරින් සේවය ලබාගන්නා උපදේශකවරුන් විසින් පිළියෙල කරනු ලබන පාරිසරික හා සමාජයීය තක්සේරු වාර්තා (පාරිසරික බලපෑම් තක්සේරුව / මූලික පාරිසරික පරීක්ෂණ) සමාලෝචනය කිරීම.
iii. පරිත්‍යාගශීලී නියෝජිතායතනවල අවශ්‍යතාවලට අනුව වාර්තා පිළියෙල කිරීම.
iv. ශක්‍යතා අධ්‍යයන සඳහා පාරිසරික හා සමාජයීය පාර්ශව පිළියෙල කිරීම.
v. මා.සං. අධිකාරියේ ව්‍යාපෘතිවල පාරිසරික හා සමාජ ආරක්ෂණ අනුකූලතා නිරීක්ෂණය කිරීම.
vi. මා.සං. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන කමිටුවලට සහභාගිවීම.
vii. ජාතික මාර්ග සහ මා.සං. අධිකාරියේ ව්‍යාපෘති සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි වෙනුවෙන් කටයුතු කිරීම.
viii. භාහිර ව්‍යාපෘති සඳහා විවිධ ව්‍යාපෘති අනුමැති නියෝජිතායතන විසින් ස්ථාපනය කරනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයෙකු වශයෙන් සහභාගිවීම.
ix. යන්ත්‍රාගාර (ඇස්පෝල්ට්, කුඩු කරන යන්ත්‍ර) ස්ථාපනය කිරීම හා මෙහෙයවීම සහ, ද්‍රව්‍ය නිස්සාරණය කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන අනුමැතීන් ලබාගැනීමට ප්‍රධාන ඉංජිනේරුවරයාට සහ යන්ත්‍රාගාර ඒකකවලට සහායවීම.
x. පාරිසරික හා සමාජ ආරක්ෂණය පිළිබඳව මා.සං. අධිකාරියේ සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යමණ්ඩලය දැනුවත් කිරීම

2024 වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

1. පාරිසරික හා සමාජයීය තක්සේරු වාර්තා පිළියෙල කිරීම සහ සමාලෝචනය කිරීම

පාරිසරික සහ සමාජ සංවර්ධන අංශය (ESDD) විසින් 2024 වර්ෂය තුළ විවිධ ව්‍යාපෘති සඳහා පාරිසරික හා සමාජයීය තක්සේරු කිරීම් පිළියෙල කිරීම / යවත්කාලීන කිරීම අඛණ්ඩව සිදුකරන ලදි. වර්ෂයේ පළමු කාර්තු තුන තුළ පාරිසරික සහ සමාජ සංවර්ධන අංශය (ESDD) ප්‍රධාන වශයෙන් කටයුතු කළේ ගම්පහ අන්තර් ඡේදනය සඳහා පරිපූරක පාරිසරික බලපෑම් තක්සේරු කිරීම (SEIA) යවත්කාලීන කිරීමට ය. වර්ෂයේ අවසන් කාර්තුව තුළ පාරිසරික සහ සමාජ සංවර්ධන අංශය (ESDD) විසින් සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) යටතේ ලෝක බැංකු අරමුදල් මගින් ගම්පහ, යාපනය, ගාල්ල සහ කළුතර දිස්ත්‍රික්කවල ජාතික මාර්ග ජාලයේ හඳුනාගත් මූලික දුර්වල පාලම් 15 සඳහා පාරිසරිහා හා සමාජ නිවාරණ වාර්තා (ESSRs) සහ පාරිසරික හා සමාජ කළමනාකරණ සැලසුම් (ESMPs) පිළියෙල කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරන ලදි. පාලම් 15 ම සඳහා පාරිසරිහා හා සමාජ නිවාරණ වාර්තා (ESSRs) ලෝක බැංකුව විසින් අනුමත කරන ලද අතර පාරිසරික හා සමාජ කළමනාකරණ සැලසුම් (ESMPs) පිළියෙල කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ විෂයපථය 2024 නොවැම්බර් මාසය වනවිට යාපනය, කුරුණෑගල, අම්පර සහ පොලොන්නරුව යන දිස්ත්‍රික්කවල අමතර දුර්වල පාලම් 32 ක් දක්වා පුළුල් කරන ලදි.

2024 වර්ෂය තුළ පිළියෙල කරන ලද පාරිසරික හා සමාජයීය තක්සේරු වාර්තාවල ප්‍රගතිය

අංකය	ව්‍යාපෘති ක්‍රියාකාරකම	2023 වර්ෂාවසානය වනවිට භෞතික ප්‍රගතිය (%)	2024 වර්ෂාවසානය වනවිට භෞතික ප්‍රගතිය (%)
මූලික පාරිසරික පරීක්ෂණ (IEE)/පාරිසරික බලපෑම් තක්සේරුව (EIA)/පරිපූරක පාරිසරික බලපෑම් තක්සේරු කිරීම (SEIA)/ප්‍රතිවාසන ක්‍රියාකාරී සැලසුම් (RAP)/පාරිසරික නිර්දේශ පිළියෙල කිරීම			
1	පරිපූරක පාරිසරික බලපෑම් තක්සේරුව (SEIA) පිළියෙල කිරීම සහ මධ්‍යම සීඝ්‍රගාමී මාර්ගයේ ගම්පහ නව අන්තර් ඡේදනය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA)අනුමැතිය ලබාගැනීම	70	100
	පරිපූරක පාරිසරික බලපෑම් තක්සේරුවේ (SEIA) පරිශිෂ්ඨය පිළියෙල කිරීම	-	15
2	රුවන්පුර සීඝ්‍රගාමී මාර්ගයේ අදියර II සහ III හි පාරිසරික බලපෑම් තක්සේරුව (EIA)/ ප්‍රතිවාසන ක්‍රියාකාරී සැලසුම් (RAP) පිළියල කිරීම	90	95
3	කටුගස්තොට මහහැර යාම (Bypass) සඳහා අවසන් පාරිසරික පරීක්ෂණ වාර්තාව පිළියෙල කිරීම	-	5
4	කඩවත අන්තර්ඡේදනයේ ඉතිරි වැඩ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික නිරදේශ අළුත් කිරීම සඳහා වාර්තා පිළියෙල කිරීම	50	60
පරිත්‍යාගශීලී නියෝජිතායතන වාර්තා පිළියෙල කිරීම			
01	**ජාතික මාර්ග ජාලයේ හඳුනාගත් දුර්වල පාලම් 15 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා** පාරිසරිහා හා සමාජ නිවාරණ වාර්තා (ESSRs) සහ, පාරිසරික හා සමාජ කළමනාකරණ සැලසුම් (ESMPs) පිළියෙල කිරීම (ලෝක බැංකු ව්‍යාපෘති යටතේ සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය)	-	60
02	**ජාතික මාර්ග ජාලයේ හඳුනාගත්අමතර දුර්වල පාලම් 32 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා** පාරිසරිහා හා සමාජ නිවාරණ වාර්තා (ESSRs) සහ, පාරිසරික හා සමාජ කළමනාකරණ සැලසුම් (ESMPs) පිළියෙල කිරීම (ලෝක බැංකු ව්‍යාපෘති යටතේ සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය)	-	15

2. **අනිකුත් වැඩ**

පාරිසරික සහ සමාජ සංවර්ධන අංශය (ESDD), මා.සං. අධිකාරිය විසින් සිදුකරන ලද පහත සඳහන් වැඩවලදී මැදිහත්ව කටයුතු කරව ලදි.

- රුවන්පුර සීඝ්‍රගාමී මාර්ගයේ I වෙනි අදියරේ පාරිසරික අනුමැතියේ වලංගු කාලය දීර්ඝ කිරීම.
- උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II **අදියර (රාජගිරිය - අතුරුගිරිය) -** පාරිසරික බලපෑම් තක්සේරුවේ (EIA) ඉතිරි වැඩ සිදුකරීම
- සංයුක්ත උපායමාර්ගික සැලැස්ම සඳහා පාරිසරික සහ සමාජ සංවර්ධන අංශයේ (ESDD) දායකත්වය සම්බන්ධ වැඩ
- අධිවේගී මාර්ග සැලසුම් නිර්මාණය සඳහා ආරක්ෂිත බයිසිකල් පටුමාර්ග ඇතුළත් කිරීම සම්බන්ධයෙන් පාරිසරික සහ සමාජ සංවර්ධන අංශයේ (ESDD) අදහස් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ඉංජිනේරු සේවා වෙත යවන ලදි.
- දක්ෂිණ අධිවේගී මාර්ගය නැවත ඔපදැමීමේ ව්‍යාපෘතිය සඳහා පාරිසරික නිරීක්ෂණ සැලැස්ම පාරිසරික සහ සමාජ සංවර්ධන අංශය (ESDD) විසින් පිළියෙල කරන ලද අතර එය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති හා සීඝ්‍රගාමී මාර්ග කළමනාකරණ වෙත යවන ලදි.
- වත්කම් කළමනාකරණ දත්ත ගබඩාවට දත්ත ඇතුළත් කිරීම.
- කොල්ලුපිටිය - ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයේ සහ මහනුවර නගයේ රථවාහන පිළිබඳ අධ්‍යනයට සහයෝගය දක්වන ලදි.

3. **වාර්තා සමාලෝචනය කිරීම**

- **වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා මාසික** පාරිසරික ආරක්ෂණ අනුකූලතා නිරීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය කිරීම.
- **මධ්‍යම අධිවේගී මාර්ගයේ** III **වෙනි කොටස සඳහා** විශේෂ ආරක්ෂණ අනුකූලතා නිරීක්ෂණ වාර්තාව (SSCMR) **සමාලෝචනය කිරීම.**
- **මහනුවර උමං මාර්ග ව්‍යාපෘතිය සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ** පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සමාලෝචනය කිරීම.
- **යෝජිත කොච්චිකඩේ මහහැර යාම (Bypass) ව්‍යාපෘතියේ ශක්‍යතා වාර්තාව සමාලෝචනය කිරීම.**
- **ආර්ථික ඉඩම් කොරිඩෝව (Economic Land Corridor) වාර්තාවේ ශක්‍යතා වාර්තාව සමාලෝචනය කිරීම.**
- **පාරිසරික හා සමාජයීය ආරක්ෂාව නිරීක්ෂණය කිරීම.**

4. පාරිසරික හා සමාජයීය ආරක්ෂණ වැඩ නිරීක්ෂණය කිරීම

2024 වර්ෂය තුළ පාරිසරික හා සමාජයීය ආරක්ෂාව නිරීක්ෂණය කිරීම සම්බන්ධ ප්‍රගතිය

අංකය	ව්‍යාපෘතියේ නම	2024 වර්ෂාවසානය වනවිට භෞතික ප්‍රගතිය (%)
1	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ III වෙනි කොටස - පැකේජය I	52
2	වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ගය (අර්ධ වර්ෂික)	50
3	ගාල්ල - දෙණියාය - මාදම්පේ (A0017) මාර්ග ව්‍යාපෘතිය	32
4	බදුල්ල - වෙන්කලාඩි (බිබිල - ලුණුගල කොටස) මාර්ගය	30

5. භාණ්ඩ ව්‍යාපෘති සඳහා විවිධ ව්‍යාපෘති අනුමැති නියෝජිතායතන විසින් ස්ථාපනය කරනු ලබන තාක්ෂණික ඇගයීමේ කමිටුවල/නිරීක්ෂණ කමිටුවල සාමාජිකයෙකු වශයෙන් සහභාගිවීම.

පාරිසරික හා සමාජ සංවර්ධන අංශය (ESDD) 2024 වර්ෂය තුළදී මධ්‍යම පරිසර අධිකාරිය (CEA), වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව (CCD), මහවැලි අධිකාරිය සහ පරිසර අමාත්‍යාංශය යන ආයතන විසින් ස්ථාපනය කරන ලද තාක්ෂණික ඇගයීමේ කමිටු 37 කට සහභාගිවී ඇත. මෙම වර්ෂය තුළදී පාරිසරික හා සමාජ සංවර්ධන අංශය (ESDD), ව්‍යාපෘති අනුමැති නියෝජිතායතන විසින් විවිධ ව්‍යාපෘති සඳහා සංවිධානය කරන ලද පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂණවලට මා.සං. අධිකාරිය නියෝජනය කරමින් සහභාගි විය.

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල, යටියන්තොට කැළණි ගඟ ආශ්‍රිත කිතුල්ගල කුඩා ජලවිදුලි ව්‍යාපෘතිය (මෙ.නො. 7.5).
2. මොණරාගල ජලවිදුලි ව්‍යාපෘතය ඉදිකිරීම.
3. යෝජිත මෙ.වෙ. 60 ක දිඹුලාගල මාදුරුඔය සූර්ය බලශක්ති ව්‍යාපෘතිය.
4. හම්බන්තොට ජාත්‍යන්තර වරායේ සහ මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ කාර්මික උද්‍යානය.
5. යෝජිත තලවතුගොඩ බහුමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ව්‍යාපෘති ප්‍රදේශවලින් ගලාගෙන එන අපජලය ඉවත් කිරීම සම්බන්ධ ගැටළුව විසඳීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණය.
6. මන්නාරම, බලපත්‍ර ප්‍රදේශ EL 423 සහ EL 424 වලින් යෝජිත බැර ඛණිජ නිස්සාරණය කිරීම.



ක්ෂේත්‍ර පරීක්ෂණය - දුර්වල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම (සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය) යාපනය දිස්ත්‍රික්කය



ගාල්ල - දෙණියාය - මාදම්පේ මාර්ගයේ ක්ෂේත්‍ර පරීක්ෂණය



ක්ෂේත්‍ර පරීක්ෂණය - වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය



මධ්‍යම පරිසර අධිකාරිය(CEA) සමඟ ක්ෂේත්‍ර පරීක්ෂණය - උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය II කොටස

කලමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)

පෙර වර්ෂයේදී මෙන් කලමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) මෙම වසරේදීද පෙවහුගෝලීය සහ සමාජ තොරතරු එක්රැස් කිරීමට අඛණ්ඩව කටයුත්ත කර ඇත. මෙම තොරතුරු පාරිසරික හා සමාජ ආරක්ෂණ ලේඛන පිළියෙල කිරීමේදී ඵලදායී ලෙසින් භාවිතා කරනු ලැබීය. කලමනාකරණ තොරතුරු පද්ධතිය, පාරිසරික හා සමාජ සංවර්ධන අංශය (ESDD) විසින් පිළියෙල කරනු ලබන සුරක්ෂිතතා ලේඛන සඳහා සිතියම් පිළියෙල කිරීමේදී සහයෝගය දක්වයි. කලමනාකරණ තොරතුරු පද්ධති කණ්ඩායම පහත දැක්වෙන ව්‍යාපෘති යටතේ ක්ෂේත්‍රයෙන් භූගෝලීය තොරතුරු එක්රැස් කිරීමේදී, භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) දත්ත විශ්ලේෂණය කිරීමේදී, භූගෝලීය තොරතුරු පද්ධතිය සිතියම්කරණය සහ ගූගල් භූ සිතියම් සහ ඡායාරූපගත කිරීම්වලදී, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලදී (FGD's) වීඩියෝගත කිරීම් සහ ඡායාරූප ගැනීම් ආදී කටයුතුවලදී සහයෝගය දක්වන ලදී.

- **ගම්පහ අන්තර් හුවමාරුව**
- **කඩවත අන්තමහනුවර ගුවන් ර් හුවමාරුවේ ඉතිරි වැඩ**
- **උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර II** (රාජගිරිය - අතුරුගිරිය)
- **මහනුවර ගුවන් පාලම් මාර්ගයේ පූර්ව-ශක්‍යතාව**
- ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතියේ (ICDP) **පාලම් 15**
- ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතියේ (ICDP) **පාලම් 32**

තවද, කලමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) පහත සඳහන් කාර්යයන්වලටද මැදිහත් වී කටයුතු කර ඇත;

- අංශයේ පරිගණක ජාලයේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශයේ **(ESDD)** ඩොමේන් නාමය පරිපාලනය කිරීම සහ පරිගණක මෘදුකාංග සහ දෘඩාංගවලට අදාළ කරුණු සමථ කිරීම.
- සියලුම පෙත් සහ විමර්ශන ග්‍රන්ථ ඉන්වෙන්ට්‍රිගත කිරීම සහ ලේඛන පහසුවෙන් සොයා ගැනීමට සහ කළමනාකරණය කිරීමට පුස්තකාල පද්ධතියක් වැඩිදියුණු කිරීම. (ඉදිකිරීමේ සහ වැඩිදියුණු කිරීමේ අදියරේ පවතී)
- පාරිසරික ව්‍යාපෘති අලුත් කිරීමේ දින සිහිපත් කිරීමේ විද්‍යුත් තැපැල් කිරීම සඳහා මාර්ගගත පරිගණක දත්ත ගබඩාවක් කළමනාකරණය කිරීම.
- **තොරතුරු පද්ධති හා ජාල කළමනාකරණ අංශය විසින් සිදුකරනු ලබන උපකාරී මොඩියුල සහිත ආයතනික වෙබ් අඩවිය සහ කාර්යමණ්ඩල ද්වාරය අලුත්වැඩියා කිරීමට / සංවර්ධනය කිරීමට** පාරිසරික හා සමාජ සංවර්ධන අංශයේ පැමිණිලි පද්ධතිය එකතු කිරීමට මැදිහත්වීම.
- **ජලයේ ගුණාත්මකභාවය, ඝෝෂාව,** ගෝලීය පිහිටුම් පද්ධතිය **(GPS) සහිත වාතයේ ගුණාත්මකභාවය වැනි පාරිසරික දත්ත ගබඩා කිරීමට ස්ථානීය ධාරක වෙබ්-පාදක පද්ධතියක්** (local host web-based system) **වැඩිදියුණු කිරීම.**
- **මා.සං. අධිකාරියේ මාර්ග වත්කම් කළමනාකරණ අංශය විසින් පවත්වනු ලබන වත්කම් කළමනාකරණ පද්ධතියට පාරිසරික හා සමාජ දත්ත එක් කිරීමට මැදිහත්වීම.**

2.1.10 සැළසුම්කරණය



ව්‍යාපෘති සංකල්පයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබන ව්‍යාපෘතිවල සමස්ථ සැලසුම් කිරීමේ වගකීම මා.සං. අධිකාරියේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් (CSP) අංශය වෙත පැවරේ.

සමස්ථ සැලසුම්කරණයට, රජයේ ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවන් පදනම් කරගෙන සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ජාතික මාර්ග ජාලය සංවර්ධනය කිරීමට සහ ජාතික මාර්ග ජාලයේ මහා පරිමාණ සැලසුම්කරණයට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් වේ. ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් (CSP) අංශය පහත සඳහන් අංශ තුනෙන් සමන්විත වේ;

සැලසුම්කරණය I – රථවාහන දත්ත එක්රැස් කිරීම, තක්සේරු කිරීම සහ විශ්ලේෂණය කිරීම
සැලසුම්කරණය II – උපායමාර්ගික සැලසුම්කරණය සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS)
සැලසුම්කරණය III – රථවාහන නිරූපකරණය සහ සමාකරණය

1) රථවාහන දත්ත එක්රැස් කිරීම, තක්සේරු කිරීම සහ විශ්ලේෂණය කිරීම

රථවාහන දත්ත, මා.සං. අධිකාරියේ සැලසුම් කාර්යය සඳහා අත්‍යාවශ්‍ය ආදානයකි. ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් (CSP) යටතේ කටයුතු කරන දත්ත එක්රැස් කිරීමේ සහ තක්සේරු කිරීමේ ඒකකයට රථවාහන දත්ත එක්රැස් කිරීමේ සහ මා.සං. අධිකාරියේ රථවාහන පරිගණක දත්ත ගබඩාව පවත්වාගෙන යාමේ වගකීම පැවරේ.

රථවාහන දත්ත, වාර්ෂික වැඩසටහන් පදනම් කරගෙන වසර පුරාවට එක්රැස් කරනු ලැබේ. සාමාන්‍ය දෛනික රථවාහන (ADT) ධාරිතාව, වාර්ෂික සාමාන්‍ය දෛනික රථවාහන (AADT), සාමාන්‍ය රථවාහන වර්ගීකරණ ගැණීම (MCC) සහ ඇක්සල් ලෝඩ් කවුන්ට් වැනි රථවාහන සමීක්ෂණ දිනපතා සිදුකරනු ලැබේ. සාමාන්‍ය දෛනික රථවාහන (ADT) ධාරිතාවන් සඳහා ස්ථිර ස්ථාන 10 ක් පමණද, සාමාන්‍ය රථවාහන වර්ගීකරණ ගැණීම (MCC), සඳහා ස්ථිර ස්ථාන 7 ක්ද හඳුනාගෙන ඇති අතර ඇක්සල් ලෝඩ් කවුන්ට් සමීක්ෂණය සඳහා තවත් ස්ථාන 2 හඳුනාගෙන ඇත. විවර්තන සංචලන (සන්ධි රථවාහන) සමීක්ෂණ, ආරම්භක-ගමනාන්ත සමීක්ෂණ, පදික සමීක්ෂණ, නැවතුම් සමීක්ෂණ ආදී සමීක්ෂණ ඉල්ලීම මත සිදුකරනු ලැබේ.

2024 වර්ෂය තුළ සිදුකරන ලද රථවාහන සමීක්ෂණවල ප්‍රගතිය

අංකය	ක්‍රියාමාරකම	ඒකකය	ප්‍රගතිය	සංලක්ෂ්‍යය
1	සාමාන්‍ය	ස්ථානය	10	
2	සාමාන්‍ය රථවාහන වර්ගීකරණ ගැණීම	ස්ථානය	7	
3	ඇක්සල් ලෝඩ් සමීක්ෂණය	ස්ථානය	2	
4	විවර්තන සංචලන සමීක්ෂණය	ස්ථානය	26	
5	පදික ගැණීම් සමීක්ෂණය	ස්ථානය	105	
6	නැවතුම් සමීක්ෂණ	ස්ථානය	91	
7	ආරම්භක සහ ගමනාන්ත සමීක්ෂණ	ස්ථානය	0	ඉල්ලීම් නැත
8	සාමාන්‍ය වේගය	කොටස	0	ඉල්ලීම් නැත
9	ප්‍රමාදවීම් සමීක්ෂණ	හංදිය	0	ඉල්ලීම් නැත
10	මාර්ග පවරාගැනීම	ගණනින්	2	මාර්ග 4 ක් කමිටුවලට ඉදිරිපත් කර ඇති අතර 2 ක් ප්‍රතික්ෂේප කර ඇත.
11	කි.මී. කණු සිටුවීම		0	

මාර්ග පවරාගැනීම

දේශයේ මාර්ග ජාලය විවිධ සංවිධාන විසින් පරිපාලනය කොට කළමනාකරණය කරනු ලබයි. ජාල සම්බන්ධක හා සමහර තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ජාතික මහා මාර්ග ලෙස අනිකුත් මාර්ගද (පළාත්/ප්‍රාදේශීය සභා) කලින් කලට පවරා ගනු ලැබේ. 2008 අංක 40 දරණ ජාතික පොදු මාර්ග පනතේ 8 වෙනි වගන්නියට අනුව මහා මාර්ග අමාත්‍යාවරයාට ඕනෑම මාර්ගයක් ජාතික මහා මාර්ගයක් බවට පත්කෙට එය ගැසැට් පත්‍රයේ පලකිරීමට නියම කළ හැකිය. පහත සඳහන් මාර්ග දෙක 2024 වර්ෂයේදී ජාතික මහා මාර්ග ලෙස නම් කොට ප්‍රකාශයට පත්කරන ලදි..

1. බත්තරමුල්ල මහහැර යාමේ (Bypass) මාර්ගය – 0+000 – 1+315 කි.මී.
2. රිලාවල - කිරිගම්පමුණුව - මත්තේගොඩ මාර්ගය – 0+000 – 6+123 කි.මී.

2) උපායමාර්ගියක සැලසුම්කරණය සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS)

(i) ජාල සැලසම් කිරීම සහ වාර්තා කිරීම

සැලසුම් කිරීම සහ වාර්තා කිරීම, ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් (CSP) අංශයේ සැලසුම් අංක II ට පැවරී ඇති ප්‍රධාන කාර්යයනගෙන් එකකි. සෑම වර්ෂයක් ආරම්භයේදීම අනිකුත් අංශ, පළාත් අධ්‍යක්ෂකවරුන් සහ ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්ගේ උපදේශනය ඇතිව එක්රැස් කරනු ලබන තොරතුරු පදනම් කරගෙන වාර්ෂික ක්‍රියාකාරී සලැස්ම පිළියෙල කරනු ලැබේ. වර්ෂය තුළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩ සාමාන්‍ය පරිදි සිදුකරනු යනු ලැබේ. කෙසේ වෙතත් හදිසි අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය ලබාදෙනු ඇති අතර මෙම හදිසි අවශ්‍යතාවය ඇතුළත් කිරීම පිණිස වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වර්ෂයේ මැද භාගයේදී සංශෝධනය කරනු ලැබේ. සංක්ත සැලැස්ම, භූමිකා සැලැස්මක් ලෙස වර්ෂ 5 ක කාලයක් සඳහා පිළියෙල කරනු ලබන අතර පවත්නා වර්ෂයේ සහ ඉතිරි කාලසීමාවේ අවශ්‍යතා ඇතුළත් කිරීම පිණිස එය වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. වර්ෂය සඳහා වෙන් කරන ලද සම්පූර්ණ අයවැය පාවිච්චි කිරීම පිණිස මූල්‍ය රෙගුලාසි (මු.රෙ.) 66 ට අනුකූලව අයවැය මාරුකිරීම් සඳහා අවශ්‍ය කරනු ලබන භාණ්ඩාගාර අනුමැතිය ලබාගන්නා ලදි.

ව්‍යාපෘතිය සූත්‍රණය කිරීම (formulation)

යෝජිත ව්‍යාපෘති සඳහා මූල්‍ය අනුමැතිය ලබා ගැනීමේ කාර්යය පිණිස විධිමත් ක්‍රියාවලියක කොටසක් ලෙස මා.සං. අධිකාරිය විසින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙත සංකල්ප පත්‍රිකා ඉදිරිපත් කරනු ලබයි. මෙම සංකල්ප පත්‍රිකා, ව්‍යාපෘතියේ අරමුණු, ඉලක්ක, විෂයපථය සහ අපේක්ෂිත බලපෑම පිළිබඳ පැහැදිලි සහ සංක්ෂිප්ත දළ සටහනක් ලබාදෙමින් ව්‍යාපෘති අනුමත කිරීමේ චක්‍රයේ ආරම්භක පියවරක් ලෙස ක්‍රියා කරයි. මෙම සංකල්ප පත්‍රිකා සැලසුම් අංශය II විසින් පිළියෙල කරනු ලබන අතර අමාත්‍යාංශයෙන් හෝ දේශයේ මාර්ග යටිතල පහසුකම්වලට අදාළ වෙනත් ඕනෑම ආයතනයකින් ව්‍යාපෘති යෝජනාව ලැබුණු පසු එකී සංකල්ප පත්‍රිකා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙත ඉදිරිපත් කරනු ලබයි.

2024 වර්ෂය තුළ පහත සංකල්ප පත්‍රිකා සම්පූර්ණ කොට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙත යොමු කර ඇත;

1. වෙන්කලාඩි හන්දිය වැඩිදියුණු කිරීම
2. මහනුවර තැපැල් කාර්යාලය අසල, මහනුවර බහුමාත ප්‍රවාහන පර්යන්තයට (KMTT) පිවිසෙන ස්ථානයේ දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලමක් ඉදිකිරීම.
3. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශයේ (නෙළුම් වටරවුම, ගාලු මුවදොර වටරවුම ආදිය) රථවාහන බලපෑම් තක්සේරුව සහ භූමි විස්තර ලක්ෂණ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා අරමුදල් ලබා ගැනීම.
4. කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගය (CRWB-A004), හෝමාගම සිට ගොඩගම දක්වා වැඩිදියුණු කිරීම (I කොටස – කි.මී.23+350 සිට කි.මී.24+750 දක්වා සහ II කොටස - කි.මී. 25+850 සිට කි.මී. 28+070 දක්වා)
5. අම්පාර-උහන-මහඔය (AUM) මාර්ගය (A027), කෙවිලියාමඩු සිට මහඔය දක්වා පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම (කි.මී. 33+000 සිට කි.මී. 58+000 දක්වා)

6. වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (PAEHP) සඳහා ප්‍රධාන සම්බන්ධක මාර්ගය සහ ඒ ආශ්‍රිත ව්‍යුහයන් ඉදිකිරීම (රෑම්ප් 03 හි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, රෑවුම 04 හි සෙවනැලි ව්‍යුහය, ලෝටස් වටරවුම වැඩිදියුණු කිරීම, ජනාධිපති කාර්යාලය ඉදිරිපිට පාලම පුළුල් කිරීම)
7. වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ගය (PAEH) සම්බන්ධක මාර්ග සහ වරාය අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම සහ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) 1A දරණ ද්වාරය වෙනත් ස්ථානයකට ගෙනයාම
8. වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ගයේ සිට සමුද්‍රීය ධාවන දිගුව (අදියර 2) දක්වා සම්බන්ධතාවය ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම (ලෝටස් වටරවුම ප්‍රදේශයේ රථවාහන තදබදය අවම කිරීම)
9. කොළඹ මෙට්‍රොපොලිටන් ප්‍රදේශයේ (CMA) රථවාහන තදබදය අවම කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහාය
10. කන්දෙහන්දිය-අදිකාරිගම-රන්දෙණිගල-ලොග්ගල්ඔය මාර්ගය (B492) වැඩිදියුණු කිරීම (කි.මී. 7+000 - 15+000)
11. ඉක්මන් අවධානය යොමු කළ යුතු පාලම් පුනරුත්ථාපනය/වැඩිදියුණු කිරීම

වාර්තා පිළියෙල කිරීම

2024 වර්ෂය තුළදී පහත සඳහන් වාර්තා පිළියෙල කොට ඉදිරිපත් කිරීම පිණිස ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් (CSP) අංශයේ සැලසුම් අංශ II විසින් කටයුතු කරන ලදි;

- අයවැය වෙන් කිරීමට අනුව 2024 ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය පිළියෙල කොට ඉදිරිපත් මා.සං. අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත කරන ලදි.
- 2025 සඳහා මාස තුනක (පළමු කාර්තුව) ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමැතිය සඳහා මා.සං. අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.
- මා.සං. අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ කෙටුම්පත (ඉංග්‍රීසි අනුවාදය)
- 2024-2028 කාලය සඳහා ඒකාබද්ධ උපායමාර්ගික සැලැස්ම
- 2025-2029 කාලය සඳහා ඒකාබද්ධ උපායමාර්ගික සැලැස්ම
- සියලුම ප්‍රගති වාර්තා (මාසික සහ කාර්තුමය)
- ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා තොරතුරු - වාර්ෂික ව්‍යවස්ථාපිත ප්‍රකාශනය - 2023
- ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව - 2024
- ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙත ඉදිරිපත් කිරීම සඳහා අයවැය ඇස්තමේන්තු විශ්ලේෂණය - 2025

ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් අංශය විසින් සිදු කරන ලද අධ්‍යයනයන්

මෙම ඒකකය, යෝජිත පුනරුත්ථාපන/වැඩිදියුණු කිරීමේ කටයුතුවල ආර්ථික ශක්‍යතාව සහතික කරගැනීමට සිදු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ යෝජිත අධ්‍යයනවලට ක්‍රියාකාරීව සහභාගි වේ. නව ව්‍යාපෘති සම්බන්ධ කාරණයේදී ශක්‍යතා අධ්‍යයනයට අදාළ සියලු විකල්ප පිළිබඳව සලකා බලනු ලැබේ. රථවාහන විශ්ලේෂණය සිදු කිරීමේදී, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා (JICA) සහ රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධතිය (STRADA) යන රථවාහන පුරෝකථන ආකෘතිය භාවිතයෙන් මාර්ගවල අනාගත රථවාහන තත්වයන් පුරෝකථනය කරනු ලැබේ. ව්‍යාපෘතිය සිදුකළ හැකි නම් සහ ව්‍යාපෘතිය පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශයක් තුළ සිදුකරන්නේ නම්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ අධිකාරියෙන් පාරිසරික අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලෙසට මා.සං. අධිකාරියේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය **(ESDD)** වෙත ඉල්ලීම් කරනු ලැබේ.

මූලික අධ්‍යයන;

- යෝජිත රාගම මහහැර යාම (bypass) සඳහා අධ්‍යයනයන් සම්පූර්ණ කරන ලදි
- A000 මාර්ගයේ බොරැල්ල සිට බුත්ගමුව දක්වා ඒක මාර්ගික (one-way) ප්‍රවාහන ක්‍රමය පිළිබඳ අධ්‍යයනයන්.

අධිප්‍රමාණික / අධිබර වාහන ලියාපදිංචි කිරීම

2014/01/29 දිනැති අංක 1847/32 දරන ගැසට් පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නීත්‍යානුකූල මානයන් (දිග, පළල, උස සහ ඉදිරියට නෙරා තිබෙන) සහ බර සීමාවන් ඉක්මවා යන වාහන, ලියාපදිංචි කිරීම හෝ මාර්ගයේ තාවකාලික භාවිතය පිළිබඳ නිර්දේශ සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් මා.සං. අධිකාරිය වෙත යොමු කරනු ලැබේ. අධිප්‍රමාණික හෝ අධිබර වාහනවලට විශේෂ බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ගෝපදේශ මාලාවක් අනුගමනය කරනු ලබයි. මෙම වාහන, ඒවා භාවිතා කිරීමේදී පිළිපැදිය යුතු විශේෂ කොන්දේසි වලට යටත්ව ලියාපදිංචිය සඳහා නිර්දේශ කරනු ලැබේ. අධිප්‍රමාණික හෝ අධිබර වාහන ලියාපදිංචි කිරීමේදී ලබා ඇති ප්‍රගතිය පහත දක්වා ඇත;

I. අධිප්‍රමාණික/ධිබර වාහන හතරක් (4) තාවකාලිකව ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලදි.
II. අධිප්‍රමාණික/අධිබර වාහන ලියාපදිංචි කිරීමට අදාළ ඉල්ලුම්පත් දහයක් (10) විශ්ලේෂණය කොට නිර්දේශ පහක් (5) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලදි; වාහන පහක් (5) ලියාපදිංචි කිරීම සඳහා එකඟත්වය මා.සං. අධිකාරිය විසින් පලනොකරන ලදි.

අධිප්‍රමාණික සහ බර නැවිබූ (ව්‍යාපෘති භාණ්ඩ) ජාතික මාර්ගවල ප්‍රවාහනය කිරීමට අවසර ලබා දීම

සංවර්ධන ව්‍යාපෘති සඳහා උපකරණ, කම්හල් සහ යන්ත්‍රෝපකරණ වැනි අධිප්‍රමාණික සහ අධිබර භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මා.සං. අධිකාරිය, මෙවැනි භාණ්ඩ ජාතික මාර්ගවල ප්‍රවාහනයට අවසර ලබාදීමේ වගකිව යුතු මූලික ආයතනය වේ.

මෙම සන්දර්භය තුළ අයදුම්පත් කිහිපයක් ඇගයීමට ලක් කර ඇති අතර, 2024 වර්ෂයේදී දී අධිප්‍රමාණික සහ අධිබර භාණ්ඩ ජාතික මාර්ගවල ප්‍රවාහනය සඳහා අනුමැති පහක් (5) නිකුත් කර ඇත.

ඉඩම් සඳහා නිෂ්කාසනය නිකුත් කිරීමට විස්තර සැපයීම

ඉහත කරුණුවලට අමතරව සැලසුම් අංශය විසින් මහජන ඉල්ලීම මත ඉඩම් නිෂ්කාසනය නිකුත් කිරීම පිණිස ඉදිරි මාර්ග පළල් කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු / විස්තර මා.සං. අධිකාරියේ විධායක ඉංජිනේරුවරුන් වෙත නිකුත් කර ඇත. 2024 වර්ෂය තුළ එකී විස්තර මහජන ඉල්ලීම් විසිඅටක් (28) සඳහා සපයන ලදි.

(ii) භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS)

ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් අංශය යටතේ ක්‍රියාත්මක වන භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ඒකකය විසින් 2024 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකරන ලදි.

1. ජාතික මාර්ග ජාලයට (මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද ArcGIS 10.6 වැඩිදියුණු කරන ලද මෘදුකාංගය සහ 1:50000 පරිමාණ අංකිත ස්ථර භාමිතා කරමින් 2007 වර්ෂයේදී වැඩිදියුණු කරන ලදි) අදාළ භූ අවකාශ පරිගණක දත්ත ගබඩාව යවත්කාලීන කර ඇති අතර එය භූ තොරතුරු පද්ධතියේ (GIS) වෘත්තිකයින් විසින් පවත්වාගෙන යන ලදි. භූ පරිගණක දත්ත ගබඩාවට මාර්ග සම්බන්ධිත දත්ත, මාර්ග ව්‍යාපෘති විස්තර, ADT සහ ඇක්සල් ලෝඩ් සමීක්ෂණ ස්ථාන සහ පරිපාලන විස්තර (EE's, CE's, PDs, ආදිය) ඇතුළත් ය. එසේම ශ්‍රී ලංකාවේ සීඝ්‍රගාමී මාර්ග ජාලයේ භූ පරිගණක දත්ත ගබඩාව ව්‍යාපෘති නිලධාරීන් විසින් ලබාදෙන ලද CAD traces සහිතව යවත්කාලීන කර ඇත.

2. භූ පරිගණක දත්ත ගබඩාව, HDM-4 සහ STRADA, වැනි අනිකුත් මාර්ග පරිගණක දත්ත ගබඩා සමඟ සහයෝගීව කටයුතු කරන බැවින් STRADA ජාලයේ සම්භවික-ගමනාන්ත සමීක්ෂණය සඳහා නිවැරදි භූ තොරතුරු පද්ධතියේ (GIS) දත්ත ලබාදීම පිණිස ජාතික මාර්ග ජාලයේ ස්ථලක දෝෂ නිවැරදි කර ඇත. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ඇක්සල් ලෝඩ් සමීක්ෂණ ස්ථාන සහ සාමාන්‍ය වර්ගීකරණ ගැණීම් ස්ථානවල ආදර්ශ ලිපිගොනු පිළියෙල කර ඇත.

3. පූර්ව-ශක්‍යතා සහ ජාල සැලසුම් අංශයට වඩාත් හොඳ තීරණ ගැනීමට උපකාරීවීම පිණිස 2023 වර්ෂයේදී භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය විසින් දැනට පවතින මාර්ග, පවරා ගනු ලබන මාර්ග, විකල්ප මාර්ග සහ මහහැර යාමේ මාර්ග (bypass) සම්බන්ධයෙන් GPS සමීක්ෂණ අවම ගණනක් (සීමිත අයවැය සහ රටේ වර්තමාන තත්ත්වය හේතුකොට ගෙන) සිදුකරන ලදි. (උදා. හෝමාගම, මාහේනවත්ත දැනුම නගරය සම්බන්ධ කරමින් යෝජිත විකල්ප).

4. මාර්ග පුනරුත්ථාපන සහ ඉදිකිරීමේදී උපරිම මාර්ග ගණනක් හඳුනා ගැනීම පිණිස භූගෝලීය තොරතුරු පද්ධතිය මගින් අධීවේගී මාර්ග ඉංජිනේරුවන්ට පහසුකම් සලසන ලදි. ඊට අමතරව එමගින් අවකාශ ව්‍යාප්තිය තුළින් ජාල සම්බන්ධතාව හඳුනා ගන්නා ලදි. (උදා : මාහේනවත්ත දැනුම නගරය සම්බන්ධ කරමින් විකල්ප සහ මහනුවර දිස්ත්‍රික්කයේ තලාතුඔය - දෙල්තොට අතර සම්බන්ධතාවය හඳුනාගත්නා ලදි.).

5. 2022 වර්ෂය තුළ භූ තොරතුරු පද්ධති ඒකකය විසින් ව්‍යාපෘති යෝජනා, අරමුදල් ඉල්ලුම්පත්‍ර, ශක්‍යතා සහ පූර්ව-ශක්‍යතා අධ්‍යයන සඳහා සහ මාර්ග පවරා ගැනීමට ප්‍රසිද්ධ කරනු ලබන ගැසැට් නිවේදන; මහා මාර්ග අමාත්‍යාංශයේ ඒකාබද්ධ සැලසුම් අංශය, මා.සං. අධිකාරියේ අනිකුත් සියලුම අංශ සහ අනිකුත් භාහිර ආයතනවල ජාතික මාර්ග ජාලයට අදාළ අනිකුත් වාර්තා සඳහා 150 කට අධික ස්ථාන සිතියම් සහ විස්තරාත්මක සිතියම් පිළියෙල කර ඇත. ඊට අමතරව ජාතික මාර්ග ජාලයට අදාළ භූ තොරතුරු පද්ධති දත්ත සමඟ වැඩ කිරීමට භූ තොරතුරු පද්ධතියේ නොවන අනිකුත් පරිශීලකයින්ට පහසුකම් සලසමින් භූ තොරතුරු පද්ධති ඒකකය විසින් මාර්ගගත ගූගල් සිතියම් පිළියෙල කිරීම සහ බෙදාහදා ගැනීම ආරම්භ කර ඇත (2024 වර්ෂය තුළදී භූගෝලීය නොවන පරිශීලකයින් සමඟ මාර්ගගත සිතියම් දෙකක් පමණක් බෙදාහදා ගනු ලැබිණ).

6. එසේම 2024 වර්ෂයේදී ස්ථාන 30 ක් සඳහා නිශ්කාසන සහති නිකුත් කිරීම පිණිස භූ තොරතුරු පද්ධති ඒකකය විසින් අවකාශ තොරතුරු සපයන ලද අතර භාහිර අවශ්‍යතා ඉෂ්ඨ කරගැනීම පිණිස අධිප්‍රමාණික වාහන අවසරපත් ලබාදීම පිණිස ප්‍රවාහන මාර්ග පහක් හඳුනා ගන්නා ලදි.

7. මා.සං. අධිකාරිය, ශ්‍රී ලංකාවේ ජාතික අවකාශ දත්ත යටිතල ව්‍යුහ වැඩසටහනේ ප්‍රධාන පාර්ශවකරු වුවද, මා.සං. අධිකාරියේ භූ තොරතුරු පද්ධති ඒකකය 2024 වර්ෂය තුළ ජාතික අවකාශ දත්ත යටිතල ව්‍යුහය (NSDI) මගින් අනිකුත් ආයතන සමඟ ජාතික මාර්ග හා සිසුගාමී මාර්ග ජාලයට අදාළ අවකාශ දත්ත බෙදාහදා ගැනීමට මැදිහත් වූයේ නැත. තවද, පවතින මාර්ග ජාලය සමස්ත දිස්ත්‍රික්කය සඳහාම 1: 50,000 පරිමාණයෙන් වාර්ෂිකව යාවත්කාලීන කිරීම පිණිස භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ඒකකය මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරමින් සිටී. කෙසේ වෙතත් 2024 දී, ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) යටතේ ජාතික මාර්ග ජාලයේ අඛණ්ඩ යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තවමත් සිදුවෙමින් පවතින බැවින්, භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ඒකකය මාර්ග සංවර්ධන අධිකාරියේ දැට පවතින මාර්ග ජාලය යාවත්කාලීන කිරීමට දායක නොවීය.

8. මීට අමතරව, භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ඒකකය විසින් පාලම් සැලසුම් අංශයේ දායකත්වය සහ මග පෙන්වීම ඇතිව ශ්‍රී ලංකාවේ පාලම් පිළිබඳ අවකාශීය දත්ත ගබඩාවක් සකස් කරමින් පවතී.

9. පරිසරය සහ භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ක්ෂේත්‍රය අතර ඇති අන්තර් සම්බන්ධතාවය හේතුකොට ගෙන, භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය මා.සං. අධිකාරියේ ක්ලීං ශ්‍රී ලංකා කාර්යසාධක බලකායේ සාමාජිකයෙකු වශයෙන් 2024 වර්ෂයේදී පත්කරන ලද අතර මූලික වාර්තාව සහ පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම් පිළියෙල කිරීමට දායක විය.

10. භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ඒකකය විසින් සබරගමුව විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් සඳහා පමණක් අවම ඉන්ටර්න්ෂිප් (internship) වැඩසටහනක් පවත්වන ලදි. සීමිත අයවැය සහ රටේ වර්තමාන තත්ත්වය හේතුකොට ගෙන මෙම ඉන්ටර්ෂිප් වැඩසටහන් පැවැත්වීම සීමා කර ඇත.

11. 2024 වර්ෂාවසානය වන විට ශ්‍රී ලංකාවේ ජාතික මාර්ග ජාලයේ සහ අධිවේගී මාර්ග ජාලයේ යාවත්කාලීන කරන ලද සිතියම් JPG ආකෘතියෙන් මෙයට අමුණා ඇත.

3) රථවාහන නිරූපකරණය සහ සමාකරණය

ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් (CSP) අංශයේ රථවාහන නිරූපකරණ හා සමාකරණ අංශය (සැලසුම් III)) විසින් එහි මූලික කාර්යයන් ලෙස මහා පරිමාණ සහ ක්ෂද්‍ර පරිමාණ සමාකරණය සිදුකරනු ලබයි.

මහා පරිමාණ නිරූපකරණය

මහා පරිමාණ සහ කුඩා පරිමාණ රථවාහන නිරූපකරණය, රථවාහන නිරූපකරණය සහ සමාකරණ අංශයේ ප්‍රධාන කාර්යය වේ. *මහා පරිමාණ නිරූපකරණය* සිදුකරනු ලබන්නේ ජාතික මාර්ග ජාලය සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා (JICA) සහ රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධතිය (STRADA) (අනුවාදය 3.5) නමැති ගමන් ඉල්ලුම් නිරූපකරණ මෘදුකාංගයේ වේදිකාව පිළිබඳව වැඩිදියුණු කරනු ලබන ආකෘතිය පුරෝකථනය කරමින් රථවාහන ඉල්ලීමක් මගිනි. STRADA තිබෙන්නේ "රථවාහන ඉල්ලුම් විශ්ලේෂනය සඳහා පද්ධතිය" සඳහාය. නිරන්තර කාල අන්තරවලදී මා.සං. අධිකාරියේ ආකෘතිය උසස් තත්ත්වයට ගෙනඑනු ලබන අතර වර්තමාන

ආකෘතිය, ආරම්භක-ගමනාන්ත සමීක්ෂණ හා රථවාහන ධාරිතා සමීක්ෂණවල විස්තීර්ණ රථවාහන සමීක්ෂණ පදනම් කරගෙන වැඩිදියුණු කරන ලද පුළුල් ආකෘතියේ නවතම අනුවාදය වේ. තවද, මා.සං. අධිකාරියේ ආකෘතිය, එහි භූගෝලීය ක්ෂේත්‍රය ලෙස සමස්ථ දිවයිනම ආවරණය කරනු ලබන එකම කාරක රථවාහන ඉල්ලුම් ආකෘතිය වේ.

මා.සං.අ., ජපන් ජාත්‍යන්තර සහයෝගිතා (JICA) සහ රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධතිය (STRADA) යන ආකෘතිය, කලාප 800 ක ට්‍රිප් මරට්‍රික්ස් (trip matrix) මගින් නියෝජනය කරනු ලබන දෛනික රථවාහන ඉල්ලුම සමාකරණය කරනු ලබන trip-based විශාල පරිමාණ ආකෘතියක් වන අතර එය වාහන අකෘති 8 කට කොටස් කරනු ලැබේ. මෙම වර්ෂය සහ ඉදිරි වර්ෂය සඳහා ට්‍රිප් ඩිමාන්ඩ් (trip demand) සංවර්ධනය කිරීම, සම්ප්‍රදායික පියවර හතරේ නිරූපකරණ ක්‍රියාවලිය අනුගමනය කරනු ලබයි.

ක්ෂුද්‍ර නිරූපකරණය

සැලසුම් III හි කුඩා පරිමාණ නිරූපකරණය සිදුකරනු ලබන්නේ රථවාහන මෙහෙයුම් විශ්ලේෂණය කිරීමේ කාර්යය පිණිස පුළුල් ලෙස භාවිතා කරනු ලබන සියුම් රථවාහන නිරූපකරණ මෘදුකාංගයක් වන PTV VISSIM මෘදුකාංගය භාවිතා කරමිනි. එයට අන්තර් ඡේදන කිහිපයකින් සමන්විත ජාලයක් නිරූපකරණය කළ හැකි අතර පාලන ක්‍රියාවලියේදී භාහිර පාලන ඇල්ගොරිතමයක් භාවිතා කිරීමට ඉඩ සලසයි. මෙම ලක්ෂණ මගින් මෘදුකාංගය, සන්ධි කිහිපයක් හේතු කරගනිමින් විශ්ලේෂණය කිරීමට සහ MATLAB හි ලියා තිබෙන ඇල්ගොරිතම පාලනය කිරීමට සුදුසු තත්ත්වයට පත්කරයි. VISSIM, මෝටර් රථ අනුගාමික ආකෘතිය (Wiedemann, 1974 & 1999) පදනම් කරගෙන ඊනියා මනෝ භෞතික එළවුම් හැසිරීම් ආකෘතියක් භාවිතා කරයි. මෙම ආකෘතිය විසින් පද්ධතියේ හමුවන සියලුම මෝටර් රථ පිළිබඳ විස්තර ලබාදෙයි. වාහන, භොතික හා මානසික යන පරාමිතීන් (සම්භවය, ගමනාන්තය, වේගය, එළවුම් හැසිරීම, වාහනයේ වර්ගය ආදිය) දෙකම අර්ථ දක්වයි. VISSIM සමාකරණය පදනම් වන්නේ කඩිනම් කිරීමේ සහ මන්දගාමී කිරීමේ නැවත නැවත කරනු ලබන ක්‍රියාවලියක් මත ය.

වගකීම්

- සැලසුම් III හි මා.සං. අධිකාරියේ මහා පරිමාණ මෙන්ම ක්ෂුද්‍ර පරිමාණ නිරූපකරණයේ සංවර්ධන සහ මෙහෙයුම් කාර්යයන් සිදු කිරීමට ඒ සඳහා කැපවූ කාර්ය මණ්ඩලයක් සිටී.

- මහා පරිමාණ නිරූපකරණයට අදාළ වගකීම්, ආකෘති සංවර්ධනය සහ ආකෘති ක්‍රියාකාරිත්වය ලෙස වෙන වෙනම සාකච්ඡා කළ හැකිය. රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධතිය (STRADA) සඳහා මහා පරිමාණ ආකෘති සංවර්ධනය යටතේ, වර්තමාන සහ අනාගත OD matix හැසිරවීම, පරාමිති පිහිටුවීම, ජාල සංවර්ධනය සහ අනෙකුත් සාමාන්‍ය ආකෘති සංවර්ධන කාර්යයන් සිදු කරනු ලැබේ.

- මහා පරිමාණ ආකෘතිකරණයේ ප්‍රධාන මෙහෙයුම් කාර්යයන් වන්නේ ව්‍යාපෘති පදනම සඳහා ආකෘති ක්‍රමාංකණය සහ වලංගු කිරීම, ඉදිරි වර්ෂ සඳහා ජාල නිර්මාණය කිරීම, අනාගත ඕඩී මැට්‍රික්ස් (OD matrix) සකස් කිරීම, රථවාහන පුරෝකථනය සහ රථවාහන ධාරිතා එක්රැස් කිරීම සහ ඉදිරි වර්ෂවල විවිධ අවශ්‍යතා සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශකයන්ය. ඊට අමතරව විශේෂිත වූ පුරෝකථන අවශ්‍යතාවලට අනුව සමහර වැඩිමනත් විශ්ලේෂණද සිදුකරනු ලැබේ. රථවාහන පුරෝකථනවලින් ලබාගන්නා දත්ත, මහා මාර්ග හා පාලම් සැලසුම් නිර්මාණ කිරීමේ කාර්යය පිණිස මහා සැලසුම් නිර්මාණ හා පාලම් සැලසුම් නිර්මාණ අංශ, පාරිසරික අධ්‍යයන (ශබ්ද ආකෘති සඳහා යෙදවුමක් වශයෙන්) සඳහා මා.සං. අධිකාරියේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය සහ, පදික වේදිකා සැලසුම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා මා.සං. අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශය යන අංශ විසින් භාවිතා කරනු ලැබේ.

- තවදුරටත්, ක්ෂුද්‍ර නිරූපකරණයේ වගකීම් ආකෘතියේ සංවර්ධනය සහ මෙහෙයුම් කිරීම ලෙසද සාකච්ඡා කළ හැකිය. අකෘති සංවර්ධනයේදී මෘදුකාංගයේ පැහැර හරින වටිනාකම් අර්ථ දක්වනු ලබන මෝටර් රථ පසුගමන් කිරීම, මං තීරු වෙනස් කිරීමේ ප්‍රමුඛතා, පූර්වගාමී වාහන ගණන, පාර්ශවික හැසිරීම, සංඥා තීරණ සහ නැවතී සිටීමින් ඉදිරියට ගමන් කරන පරාමිතීන් වැනි ආකෘති පරාමිතීන් සකස් කළ යුතු අතර ශ්‍රී ලංකාවේ මාර්ග ජාලයේ රථවාහන තත්ත්වය නියෝජනය කිරීමට ක්‍රමාංකනය කළ යුතුය. ධාවන හැසිරීම ක්‍රමාංකනය කිරීම VISSIM සමාකරණ කාර්යයේදී මුළුමනින්ම පාහේ ඉතා වැදගත් දෙයක් වන අතර එමගින් සමාකරණ ධාවනය කිරීමට හැකිවන පරිදි තථ්‍ය තත්ත්වයට මුළුමනින්ම පාහේ සමාන ලෙස ක්‍රියා කරයි. මෙම ප්‍රයත්නයේදී සමීක්ෂණ

පැවැත්වීමට භාරගත යුත්තේ VISSIM ධාවන හැසිරීම් පරාමිතීන්වල දක්වා ඇති පරාමිතීන් අනුගමනය කරන තථ්‍ය වටිනාකම් නිශ්චය කිරීම පිණිසය.

- ක්ෂුද්‍ර පරිමාණ ආකෘති මෙහෙයුම් සඳහා සැලසුම් (I) ඒකකය විසින් සාධාරණ කාලපරිච්ඡේදයක් තුළ රථවාහන සමීක්ෂණයක් සිදුකර ඇත්නම් මිසක අධ්‍යයන ක්ෂේත්‍රයේ නවතම රථවාහන ධාරිතාව ලබාගැනීම සඳහා රථවාහන සමීක්ෂණ පැවැත්විය යුතුය. මෙම රථවාහන සමීක්ෂණ, අවශ්‍යතාවය මත රඳා පවතිමින් ආරම්භක-ගමනාන්ත සමීක්ෂණ ((OD සමීක්ෂණ), සාමාන්‍ය වර්ගීකරණ ගැණීම් සමීක්ෂණ (MCC Survey), විවර්තන වලන ගැණීම් සමීක්ෂණ ආදිය විය හැකිය. මෙම සමීක්ෂණ පැවැත්වීමේ වගකීම සැලසුම් III විසින් කරනු ලබන ඉල්ලීම පරිදි සැලසුම් I විසින් සිදුකරනු ලැබේ. තවද, ආකෘතියේ නිරවද්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා විශ්ලේෂණය කරනු ලබන ක්ෂේත්‍රයේ ජ්‍යාමිතික තත්ත්ව සම්බන්ධ අධ්‍යයන සිදුකරනු ලැබේ. යම් හෙයකින් අධ්‍යයනය කරනු ලබන ක්ෂේත්‍රයේ සංඥා පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන්නේ නම් ආකෘතිය සමඟ කාල නිශ්චය කිරීම් සහ සංඥා ආලෝක වැඩසටහන් ස්ථාපනය කළ යුතුය.

- දත්ත එක්රැස් කිරීමෙන් පසුව අධ්‍යයනය කරනු ලබන අන්තර් ඡේදනයේ පවත්නා සංඥා කාල නියමයන් සහිත ජ්‍යාමිතික සහ මං තීරු සලකුණු කිරීමේ සිතියම් පදනම් කරගත් මෘදුකාංගය භාවිතා කරමින් ස්ථලකය අඳිනු ලැබේ. සම්බන්ධතාවයේ වේගය, මං තීරුවේ පළල, මාර්ග අයිතිය ආදී මංමාවත් සම්බන්ධතාවල ගතිලක්ෂණ ආකෘතියට ඇතුළත් කරනු ලැබේ. සමීක්ෂණවලින් ලබාගන්නා රථවාහන ඉල්ලුම, රථවාහන ධාරිතා විස්තර සංයුතිය වශයෙන් ඇතුළත් කරනු ලබන අතර එසේ නොමැතිව ගතික පැවරුම් ක්‍රමය භාවිතා කරන්නේ නම්, මූලාරම්භක ගමනාන්ත ජ්‍යාමිතීන් ඇතුළත් කරනු ලැබේ. එවිට ක්‍රමාංකණය කරන ලද ආකෘතිය සමාකරණය කරනු ලබන අතර ප්‍රමාදවීම් සහ පෙළ දිග ප්‍රමාණවල් වැනි අවශ්‍ය කරනු ලබන ප්‍රතිඵල ලබාගනු ලැබේ. ප්‍රතිඵල, අධ්‍යයන ක්ෂේත්‍රයට අවශ්‍ය කරනු ලබන වැඩදියුණු කිරීම් හඳුනා ගැනීම පිණිස විශ්ලේෂණය කරනු ලැබේ.

2024 වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

පහත සඳහන් මාර්ග කොටස්වල අදාළ අංශ සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා (JICA) සහ රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධතිය (STRADA) භාවිතා කරමින් රථවාහන පුරෝකථන සිදුකරන ලදි.

- රථවාහන ධාරිතාවන් සහ පදික වේදිකා සැලසුම් නිර්මාණය සඳහා CNSA ගණන කරමින් ජපන් මිත්‍රත්ව මාර්ගය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- විවර්තන රථවාහන ධාරිතාවන් ඇස්තමේන්තු කරමින් ගම්පහ අන්තර් ඡේදනය සඳහා අකෘති ධාවනයක් සිදුකරන ලදි.
- KMMTT සඳහා අකෘති ධාවනයක් සිදුකරන ලද අතර මහනුවර ප්‍රදේශයේ මාර්ග සහ අන්තර් ඡේදනවල විවර්තන වලන සඳහා රථවාහන ධාරිතාව ඇස්තමේන්තු කරන ලදි.
- රථවාහන ධාරිතාවන් සහ පදික වේදිකා සැලසුම් නිර්මාණය සඳහා CNSA ගණනය කරමින් B 469 මාර්ගය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- රථවාහන ධාරිතාවන් සහ පදික වේදිකා සැලසුම් නිර්මාණය සඳහා CNSA ගණනය කරමින් B 005 මාර්ගය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- රථවාහන ධාරිතාවන් සහ පදික වේදිකා සැලසුම් නිර්මාණය සඳහා CNSA ගණනය කරමින් B 111 (කි.මී. 0 සිට කි.මී. 27 ක් දක්වා) මාර්ගය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- යෝජිත වැඩිදියුණු කිරීම් සහිතව සංසරාජව මාවතේ රථවාහන ගැලීම සඳහා ආකෘති ධාවනය.
- රථවාහන ධාරිතාවන් ඇස්තමේන්තු කරමින් B 364 මාර්ගය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- නව සම්බන්ධිත මාර්ගයේ රථවාහන බලපෑම සොයා ගැනීමට මධ්‍යම අධිවේගී මාර්ගයේ ගම්පහ අන්තර් ඡේදනය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- ඉදිරි වසර 10 සඳහා CNSA අගය ඇස්තමේන්තු කරමින් දිවුලපිටිය හංදිය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.

- සමස්ථ රටම සඳහා අකෘති ධාවනයක් 2024 වර්ෂයේදී සිදුකරන ලද අතර එය මාර්ග වත්කම් කළමනාකරණ (RAM) අංශය වෙත යවන ලදි.
- PAEH හේතුකොට ගෙන මාර්ගයේ සිදුවන රථවාහන බලපෑම් සොයා ගැනීමට ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- බාලදක්ෂ මාවත හි ඉදිකර ඇති ගුවන් පාලම නිසා මාර්ග ජාලයේ සිදුවන රථවාහන බලපෑම් සොයා ගැනීමට ආකෘති ධාවනය.
- ඉදිරි වර්ෂ 20 සඳහා රථවාහන ඇස්තමේන්තු කරමින් B 344 මාර්ගය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- ඉදිරි වර්ෂ 20 සඳහා රථවාහන ඇස්තමේන්තු කරමින් A035 මාර්ගය සඳහා ආකෘති ධාවනයක් සිදුකරන ලදි.
- B445 මාර්ගය සඳහා ආකෘති ක්‍රමාංකනය කොට රථවාහන ඇස්තමේන්තු කරන ලදි.
- මධ්‍යම අධිවේගී මාර්ගයේ III වෙනි කොටස (CEP III) (පොල්ගහවෙල සහ රඹුක්කන යන ස්ථානවල අන්තර් ඡේදන) ආකෘති ක්‍රමාංකනය කොට ඉදිරි වර්ෂ සඳහා අකෘති ධාවනය කරන ලදි.
- A003 මාර්ගය සඳහා ආකෘති ක්‍රමාංකනය කොට ඉදිරි වර්ෂ (වසර 10) සඳහා අකෘති ධාවනය සිදුකරන ලදි.
- සමස්ථ රටම සඳහා රථවාහන ඇස්තමේන්තු කරන ලද අතර එය මාර්ග වත්කම් කළමනාකරණ (RAM) අංශය වෙත යවන ලදි.
- A003 මාර්ගයේ (කි.මී. 2+000 සිට 18+ කි.මී. 000 දක්වා) CNSA අගය ගණනය කොට එම අගයන් පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත යවන ලදි.
- B 367 මාර්ගයේ (කි.මී. 0+000km සිට කි.මී. 5+500 දක්වා) CNSA අගය ගණනය කොට එම අගයන් පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත යවන ලදි.
- B 100 (කි.මී. 0+000 සිට කි.මී. 6+700 දක්වා) මාර්ගය සඳහා රථවාහන ඇස්තමේන්තු කොට එම අගයන් මහනුවර සැලසුම් නිර්මාණ කාර්යාලය වෙත යවන ලදි.
- A003 මාර්ගයේ (කි.මී. 2+000 සිට 18+ කි.මී. 000 දක්වා) CNSA අගය ගණනය කොට එම අගයන් පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත යවන ලදි.
- ජාල වෙනස්වීම් සහිතව නෙළුම් වටරවුමේ රඛවාහන තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කරන ලදි (සමහර මාර්ග සම්බන්ධතා විවෘත කිරීම).
- B322 මාර්ගය (කි.මී. 2+000 සිට කි.මී. 37+000දක්වා) සඳහා රථවාහන ඇස්තමේන්තු කරන ලද අතර එහි CNSA අගය ගණනය කොට එම අගයන් පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත යවන ලදි.
- A 010 මාර්ගය (කි.මී. 0+000 සිට කි.මී. 3+500දක්වා) සඳහා රථවාහන ඇස්තමේන්තු කරන ලද අතර එහි CNSA අගය ගණනය කොට එම අගයන් මහනුවර සැලසුම් නිර්මාණ කාර්යාලය වෙත යවන ලදි.
- B 452 මාර්ගය (කි.මී. 0+000 සිට කි.මී. 7+000දක්වා) සඳහා රථවාහන ඇස්තමේන්තු කරන ලද අතර එහි CNSA අගය ගණනය කොට එම අගයන් MFAP වෙත යවන ලදි.
- B 371 මාර්ගය (කි.මී. 15+000 සිට කි.මී. 31+400දක්වා) සඳහා රථවාහන ඇස්තමේන්තු කරන ලද අතර එහි CNSA අගය ගණනය කොට එම අගයන් පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත යවන ලදි.
- A 010 (කි.මී. 17+000 සිට 19+000 කි.මී. දක්වා), B 419 (කි.මී. 19+000 සිට 20+000 කි.මී. දක්වා), B 308 (කි.මී. 40+000 සිට 42+000 කි.මී. දක්වා) සහ B 614 (කි.මී. 0+000 සිට 1+000 කි.මී. දක්වා) මාර්ග සඳහා රථවාහන ඇස්තමේන්තු කරන ලද අතර ඒවායේ CNSA අගය ගණනය කොට එම අගයන් කුරුණෑගල පළාත් අධ්‍යක්ෂක වෙත යවන ලදි.
- B 128 (කි.මී. 0+978 සිට 19+000 කි.මී. දක්වා) සහ B 128 (කි.මී. 3+175 සිට 3+475 කි.මී. දක්වා) මාර්ග සඳහා රථවාහන ඇස්තමේන්තු කරන ලද අතර ඒවායේ CNSA අගය ගණනය කොට එම අගයන් පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත යවන ලදි.

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා (JICA) සහ රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධතියේ (STRADA) ආකෘති සංවර්ධනය

- සමීක්ෂණ වාහන දත්ත (භූගෝලීය සමුද්දේශිත වැඩ) අනුව යවත්කාලීන කරන ලද මංසල (node)සහ සම්බන්ධතාවය

පහත සඳහන් මාර්ග ජාල සහ අන්තර් ඡේදනය සඳහා PTV VISSIM භවිතා කරමින් රථවාහන සමාකරණ සිදුකරන ලදි.

- නෙළුම් වටරවුම සමාකරණය කරන ලදි
- A000 මාර්ගය සමාකරණය කරන ලදි

කොච්චිකඩේ මහහැරයාම (bypass) වාර්තාව සඳහා ශක්‍යතා වාර්තාව සමාලෝචනය කරන ලදි.

- ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික බිම් තීරුව ගොඩනැගීම සඳහා RFP ලේඛන සමාලෝචනය කරන ලද අතර අදහස් සහ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදි.

2.1.11 මාර්ග වත්කම් කළමනාකරණය



වත්කම් කළමනාකරණ වැඩපිළිවෙලක් යනු මාර්ග ආයතනයකට සිය වත්කම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අත්‍යවශ්‍ය වන මෙවලමකි. මනා වත්කම් කළමනාකරණ වැඩපිළිවෙලක් මඟින් ගුණාත්මක තොරතුරු සහ තීරණ ගැනීම මත පදනම්ව වැඩිදියුණු කරන ලද යටිතල පහසුකම් කළමනාකරණයට සහ වැඩිදියුණු කරන ලද තීරණ ගැනීමට මඟ පාදයි ,දේශපාලනඥයින් ,එසේම එමඟින් සිය ශ්‍රම බලකායට . එහි භාහිර හවුල්කරුවන් සහ මහජනතාව ඇතුළු භාහිර ,මාධ්‍ය පාර්ශවකරුවන්ට සිය ප්‍රවේශය සන්නිවේදනය කිරීම සඳහා මාර්ග ආයතනයට මඟ පාදයි.

එසේම වත්කම් කළමනාකරණ කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මා.සං. අධිකාරිය තුළ වත්කම් කළමනාකරණ වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීමේ වැදගත්කම හඳුනා ගන්නා ලදී. ඒ අනුව, මා.සං. අධිකාරිය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ, මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධති (HIMS) දත්ත ගබඩාව සහ වැඩපිළිවෙල තීරණය කිරීමේ උපකාරක මෙවලමෙන් සමන්විත පදික වේදිකා වත්කම් සඳහා වත්කම් තොරතුරු කළමනාකරණ පද්ධතියක් (AIMS) ප්‍රසම්පාදනය කරමින් ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහාය ඇතිව 2004 වර්ෂයේදී සැලසුම් අංශය හරහා මූලික පියවර ගන්නා ලදී. එතැන් සිට එම කාර්යය පියවරෙන් පියවර ප්‍රවේශය ඉදිරියට යමින් පවතින අතර, විශේෂයෙන් ලෝක බැංකුවේ අරමුදල් සහිත ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ මා.සං. අධිකාරියේ වත්කම් කළමනාකරණ පිළිවෙත් තවදුරටත් ශක්තිමත් කෙරෙමින් පවතී.

මා.සං. අධිකාරියේ අවශ්‍යතාවලට අනුකූලව වත්කම් කළමනාකරණ පිළිවෙත් වඩාත් පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින්, මා.සං. අධිකාරිය තුළ "මාර්ග වත්කම් කළමනාකරණ (RAM)" අංශය නමින් නව අංශයක් 2024 වසර ආරම්භයේදී ස්ථාපනය කර ඇත. මාර්ග වත්කම් කළමනාකරණ අංශය (RAM) ස්ථාපනය කර ඇත්තේ ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියට (SLRAMS) අලුතින් එකතු කරන ලද මාර්ග වත්කම් තක්සේරු කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යයට අමතරව සැලසුම් අංශයේ පෙර තිබූ IV වෙනි කොටස විසින් සිදුකරන ලද කාර්යයන් පවරමිනි.

මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ;

- HDM-4 සහ මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) වැනි වත්කම් කළමනාකරණ මෙවලම් භාවිතයෙන් ප්‍රමුඛතා පදනමක් මත විද්‍යාත්මකව මෙහෙයවනු ලබන දිගුකාලීන මාර්ග පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් සකස් කිරීම.
- ජාතික මාර්ග ජාලයේ තක්සේරු කිරීම.
- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) කළමනාකරණය කිරීම.
- මාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයන සඳහා ආර්ථික විශ්ලේෂණයක් පැවැත්වීම.
- මාර්ග සමීක්ෂණය, දත්ත සැකසීම සහ වාර්තා සකස් කිරීමට අදාළ සේවාදායක කටයුතු භාර ගැනීම.
- අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් වෙත දත්ත සහ තොරතුරු බෙදා හැරීම.

ප්‍රධාන කාර්යයන්ට අදාළ එක් එක් ක්‍රියාකාරකමෙහි ප්‍රගතිය පහත දැක්වේ.

(අ) සමීක්ෂණ වාහන සහ යන්ත්‍ර මඟින් මාර්ග තත්ත්ව දත්ත එක්රැස් කිරීම

මාර්ග තත්ත්ව දත්ත එක්රැස් කිරීම (දත්ත දිනපතා එක්රැස් කිරීම)

දත්ත එක්රැස් කිරීම, බහු-කාර්ය ජාල සමීක්ෂණ වාහකය (MFNSVs) සහ වැටුම් බර උත්ක්‍රමමානය (FWD) යන යන්ත්‍ර භාවිත කරමින් මාර්ග වත්කම් කළමනාකරණ අංශය විසින් පිළියෙල කරන ලද කාලසටහන් අනුගමනය කරමින් සිදුකරනු ලබන අතර 2024 වර්ෂය තුළදී දත්ත දිනපතා එක්රැස් කිරීමේ ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

2024 වර්ෂය තුළදී දත්ත දිනපතා එක්රැස් කිරීමේ ප්‍රගතිය

සමීක්ෂණ වර්ගය	ජාලය (කිලෝමීටර්)	ව්‍යාපෘතිය (මං තීරු කිලෝමීටර්)	සීසුගාමී මාර්ගවල (මං තීරු කිලෝමීටර්)
බහු-කාර්ය ජාලක සමීක්ෂණ වාහකය (MFNSV)	7629.1	-	1140.3
වැටුම් බර උත්ක්‍රමානය (FWD)	2649.5	92.9	28.5

මාර්ග තත්ත්ව දත්ත එක්රැස් කිරීම (දින පතා නොවන එක්රැස් කිරීම)

දිනපතා නොවන දත්ත එක්රැස් කිරීම, බහු-කාර්ය ජාල සමීක්ෂණ වාහකය (MFNSVs) සහ වැටුම් බර උත්ක්‍රමමානය (FWD) යන යන්ත්‍ර භාවිත කරමින් මාර්ග වත්කම් කළමනාකරණ අංශය විසින් සිදුකරනු ලබයි. විශේෂයෙන්ම මා.සං. අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශය සහ අනිකුත් අංශ මගින් කරනු ලබන ඉල්ලීම් නොමිලේ ඉටුකරනු ලබන අතර මා.සං. අධිකාරියේ ව්‍යාපෘති සහ අනිකුත් ආයතනවලින් කරනු ලබන ඉල්ලීම් මා.සං. අධිකාරියේ අනුමත මිළ ගණන්වලට අනුව ඉටකරනු ලබයි.

- වැටුම් බර උත්ක්‍රමමානය (FWD) භාවිතයෙන් සිදුකරනු ලබන සමීක්ෂණ සඳහා ඉල්ලීම් සාමාන්‍යයෙන් කරනු ලබන්නේ සැලසුම් නිර්මාණ සහ පදිකවේදිකා තත්ත්ව සහතික කිරීමේ කාර්යය පිණිස ය.
- බහු-කාර්ය ජාල සමීක්ෂණ වාහකය (MFNSV) භාවිතයෙන් සිදුකරනු ලබන සමීක්ෂණ සඳහා ඉල්ලීම් කරනු ලබන්නේ පදිකවේදිකා මතුපිට තත්ත්වය පරීක්ෂාව කිරීමේ කාර්යය පිණිස ය.

2024 වර්ෂය තුළ භාහිර ආයතන සඳහා සිදුකරන ලද සමීක්ෂණ සහ එක්රැස් කරගන්නා ලද ආදායම පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

සමීක්ෂණ වර්ගය	ඉන්වොයිසි අංකය	ඉල්ලුම් කරනු ලැබුවේ	සමීක්ෂණයේ මුළු පිරිවැය (වැට් සහිත) රු.
වැටුම් බර උත්ක්‍රමානය (FWD)	RDA/RAM/FWD/01/24	PD(KMTTDP)	271,400.00
වැටුම් බර උත්ක්‍රමානය (FWD)	RDA/RAM/FWD/02/24	PD (MFAP)	271,400.00
වැටුම් බර උත්ක්‍රමානය (FWD)	RDA/RAM/FWD/03/24	PD (MFAP)	271,400.00

2024 වර්ෂය තුළ බහු-කාර්ය ජාල සමීක්ෂණ වාහකය (MFNSV) *භාවිතයෙන් සිදුකරන ලද සමීක්ෂණවලින් ආදායමක් රැස්කර නැත.*

2024 වර්ෂයේ මුළු ආදායම = රු. 814,200.00
2023.12.31 දක්වා මුළු ආදායම = රු. 33,833,214.72
2024.12.31 දක්වා මුළු අදායම = රු. 34,647,414.72

- ***වැටුම් බර උත්ක්‍රමමාන (FWD) දත්ත වාර්තා***

- මහනුවර බහුමාන ප්‍රවාහන ඒකකය සඳහා ප්‍රවේශ මාර්ගය සම්බන්ධ වැටුම් බර උත්ක්‍රමමාන (FWD) දත්ත වාර්තාව (KMTT).
- පිළියන්දල - මහරගම මාර්ග (B 367) කොටසේ කි.මී. 0+000 සිට කි.මී. 5+380 දක්වා වැටුම් බර උත්ක්‍රමමාන (FWD) දත්ත වාර්තාව (MFAP).
- වල්ගම - දියගම මාර්ග (B452) කොටසේ කි.මී. 0+000 සිට කි.මී. 7+000 දක්වා වැටුම් බර උත්ක්‍රමමාන (FWD) දත්ත වාර්තාව (MFAP).
- දක්ෂිණ අධිවේගී මාර්ගයේ (E01) කොට්ටාව සිට දොඩංගොඩ දක්වා වැටුම් බර උත්ක්‍රමමාන (FWD) දත්ත වාර්තාව (EMU ඉල්ලීම).

➢ ***වැටුම් බර උත්ක්‍රමමාන දත්ත ඉදිරිපත් කිරීම***

- ඒකල - කොටදෙණියාව මාර්ගයේ (B0111) කි.මී. 0+000 සිට කි.මී. 27+270 දක්වා WD දත්ත (පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ඉල්ලීම)
- කුලියාපිටිය - පදිවෙල මාර්ගයේ (B244) කි.මී. 1+500 සිට කි.මී. 3+400 දක්වා වැටුම් බර උත්ක්‍රමමාන දත්ත (FWD) (පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ඉල්ලීම)
- පෑලියගොඩ - පුත්තලම මාර්ගයේ (A003) කි.මී. 2+800 සිට කි.මී. 10+450 දක්වා වැටුම් බර උත්ක්‍රමමාන දත්ත (FWD) (පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ඉල්ලීම)
- ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව මාර්ගයේ කි.මී. 0+000 සිට කි.මී. 2+032 දක්වා වැටුම් බර උත්ක්‍රමමාන දත්ත (FWD) (පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ඉල්ලීම)

➢ ***පවතින සමීක්ෂණවලින් දත්ත නිකුත් කිරීම***

- දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට දොඩංගොඩ දක්වා වැටුම් බර උත්ක්‍රමමාන (FWD) දත්ත - මා.සං. අධිකාරියේ පර්යේෂණ සහ සංවර්ධන අංශය.
- ශ්‍රී ලංකා යුධහමුදාව මගින් ඉල්ලා ඇති පරිදි සියලුම ප්‍රධාන මාර්ග සහ පාලම් සම්බන්ධ විස්තර සැපයීම.

(ආ) දළ දත්ත සකස් කිරීම සහ උඩුගත කිරීම

2024 වර්ෂය තුළ දළ දත්ත සකස් කිරීම සහ උඩුගත කිරීම සම්බන්ධ සාරාංශය

අංකය	විස්තරය	දිග (කි.මී.)
1	මාර්ග මතුපිට ආපදා දත්ත රැස් කිරීම සඳහා රූප විශ්ලේෂණය	7692
2	මාර්ග ඉන්වෙන්ටරි දත්ත යාවත්කාලීන කිරීම සඳහා රූප විශ්ලේෂණය සහ සැකසීම (සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති මත පදනම්ව)	972
3	මාර්ග සැකසුම් වර්ග හඳුනා ගැනීම සඳහා රූප විශ්ලේෂණය සහ සැකසීම	150
4	රළුබවට අදාළ දත්ත සැකසීම සහ වලංගු කිරීම	7900
5	වැටුම් බර උත්ක්‍රමමාන (FWD) දත්ත සැකසීම සහ වලංගු කිරීම	2742
6	ඝර්ෂණික දත්ත සැකසීම සහ වලංගු කිරීම (සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති මත පදනම්ව)	972
7	වයනික දත්ත (Texture data) සැකසීම සහ වලංගු කිරීම	11,823
8	රථ වාහන ඉල්ලුම් විශ්ලේෂණය සඳහා පද්ධති (STRADA) දත්ත සැකසීම සහ වලංගු කිරීම	11,823
9	පදික වේදිකා ඉතිහාස දත්ත යාවත්කාලීන කිරීම	11,823

(ඇ) MFNSV සහ වැටුම් බර උත්ක්‍රමමාන (FWD) - මැනුම් උපකරණ/යන්ත්‍රවල වාර්ෂික නඩත්තුව සහ ක්‍රමාංකනය කිරීම

කොන්ත්‍රාත් ගිවිසුම්වලට අනුව, සමීක්ෂණ උපකරණ/යන්ත්‍ර නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සැපයුම්කරුවන් විසින් සිදු කළ යුතුය. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

➢ ඕස්ට්‍රේලියාවේ ඒආර්බීබී සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ විශේෂඥයෙකු ශ්‍රී ලංකාවට පැමිණ මාර්ග වත්කම් කළමනාකරණ (RAM) අංශයේ සමීක්ෂණ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව MFNSV හි අදාළ ක්‍රමාංකන, නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සඳහා සහභාගී විය.

2024 වර්ෂය තුළදී MFNSV සහ වැටුම් බර උත්ක්‍රමමානය (FWD) විසින් සිදු කරන ලද කාර්යයන්.

යන්ත්‍ර වර්ගය	දිනය	සිදුකරන ලද වැඩ	විශේෂඥයාගේ නම	සමාගමේ සම
MFNSV	06.05.2024 to 09.05.2024	(අ) MFNSV උපකරයේ සම්පූර්ණ පරීක්ෂාව (ආ) MFNSV හි ක්‍රමාංකනය (ඇ) අත්හදා බැලීමේ සමීක්ෂණ. (ඈ) පසුපස මතුපිට කැමරාවේ පිටත ආවරණය ප්‍රතිස්ථාපනය කිරීම	**බාඕ න්ගුයෙන් මහතා**	ඒආර්බීබී සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ්, **ඕස්ට්‍රේලියාව**
වැටුම් බර උත්ක්‍රමමානය (FWD)	10.12.2024 to 19.12.2024	(අ) රෝද ඇක්සල් සහ තිරිංග කම්බි ප්‍රතිස්ථාපනය කිරීම (ආ) භූ කම්පන මාපකයේ ද්වාරය අලුත්වැඩියා කිරීම (ඇ) වැටුම් බර උත්ක්‍රමමාන (FWD) යන්ත්‍රය සම්පූර්ණ පරීක්ෂාවකට ලක් කර අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කරන ලදී. (ඈ) භූ කම්පන මාපක පරීක්ෂා කර රබර් ඩැම්පර් ප්‍රතිස්ථාපනය කිරීම. (ඉ) සම්පූර්ණ යන්ත්‍ර ක්‍රමාංකනය සිදු කරන ලදී.	අෆ්ෂින් ලොටිෆි සහතා	කුවාඛ් සමාගම, ස්වීඩනය



MFNSV සහ වැටුම් බර උත්ක්‍රමමානය (FWD) - මැනුම් උපකරණ/යන්ත්‍රවල වාර්ෂික නඩත්තුව සහ ක්‍රමාංකනය

(ඇ) මහාමාර්ග සංවර්ධන සහ කළමනාකරණ (**HDM – 4**) අංශය යටතේ සිදු කරන ලද කාර්යයන්

- පළාත් කොට්ඨාශ සහ ව්‍යාපෘති කොට්ඨාශවලින් ලැබුණු තොරතුරු සහිතව ජාතික මහාමාර්ග ජාලය සඳහා ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ දත්ත (ක්‍රියාත්මක වෙමින් පවතින සහ ක්‍රියාත්මකවීමට නියමිත ව්‍යාපෘති සහිතව) යවත්කාලීන කිරීම.
- ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් ඉල්ලා ඇති පරිදි 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව වෙත ඉදිරිපත් සඳහා මාර්ග පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ සැලැස්ම සකස් කිරීම.

- මාර්ග සංවර්ධන අධිකාරියේ උපායමාර්ගික සැලැස්ම (2025 – 2029) සඳහා පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- ජාතික මාර්ග ප්‍රධාන සැලැස්මට (NRMP) අනුව ක්‍රියාකාරී සැලැස්ම සහ සංයුක්ත සැලැස්ම සංශෝධනය කිරීම.
- ජාතික මාර්ග ප්‍රධාන සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග ලැයිස්තුව සකස් කිරීම.

(ඉ) ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) යටතේ සිදු කරන ලද කාර්යයන්

- වත්කම් තක්සේරු කිරීමේ කාර්යය පිණිස මාර්ග තොරතුරු පද්ධතියට (RIS) නව දත්ත වගුවක් එකතු කිරීම (සැකසුම් විස්තර)
- මොඩියුලයේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම පිණිස නව දත්ත වගු එකතු කරමින් බිඳවැටීම් තොරතුරු කළමනාකරණ පද්ධති (CIMS) මොඩියුලය වැඩි දියුණු කිරීම.
- 2024 වර්ෂය සඳහා මාර්ග නඩත්තු කළමනාකරණ පද්ධති (RMMS) මොඩියුලයේ අධිවේගී මාර්ග ගාස්තු ලේඛනය (HSR) සහ SSR ඒකක මිළ ගණන් යාවත්කාලීන කිරීම සහ, වාර්ෂික අයවැය සඳහා කාණ්ඩ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- ගංවතුර, නායයෑම් සහ බෑදනයවීම් පිළිබඳ තොරතුරු සඳහා පවතින වගු යාවත්කාලීන කිරීම සහ නව වගු එකතු කිරීම මගින් ආපදා තොරතුරු පද්ධති (DIS) මොඩියුලය උසස් තත්ත්වයට ගෙනඒම.
- වත්කම් තක්සේරුකරණ පද්ධති (AVS) මොඩියුලය සහිතව අනුකූලතාව වගබලා ගැනීම පිණිස ගෘහභාණ්ඩ කළමනාකරණ පද්ධතියේ (FMS) සමස්ථ මොඩියුලය පුරා වගු ආකෘති වෙනස් කිරීම.
- පොළොවේ වැඩ, රැඳවුම් බිත්ති, අඩිපාරවල් සහ රථවාහන සංඥා සඳහා AVS හි ඒකක මිළ ගණන් යාවත්කාලීන කිරීම.
- අනෙකුත් වත්කම් පද්ධතියේ (OAS) ක්ෂයවීම් සඳහා වෙනම වගු එකතු කිරීම - අවශ්‍යතා අනුව ගොඩනැගිලි, ගෘහභාණ්ඩ, ලියාපදිංචි/ලියාපදිංචි නොකළ වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා මූල්‍ය මොඩියුලය.
- වාහන කළමනාකරණ පද්ධතියේ (VMS) යාන්ත්‍රික අංශය සඳහා වෙනම මොඩියුලයක් හඳුන්වාදීම.
- RMMS සඳහා දත්ත රැස් කිරීම, SSR පිළියෙල කිරීම සහ, 2025 වාර්ෂික අයවැය සඳහා නඩත්තු වැය ශීර්ෂය යටතේ අයවැය යෝජනාව සකස් කිරීම සඳහා නඩත්තු කළමනාකරණ අංශයට අවශ්‍ය කරනු ලබන සහාය ලබාදීම.
- 2024 වර්ෂය සඳහා DIS සඳහා දත්ත රැස් කිරීම සහ දත්ත සැකසීම.
- යටිතල, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ (IRSTM) අංශයේ දත්ත SLRAMS වේදිකාව ඔස්සේ උඩුගත කිරීම සහ ඉදිරිපත් කිරීම පිණිස එම අංශයට පහසුකම් සැපයීම සඳහා CIMS මොඩියුලයට දත්ත වගු හයක් (06) හඳුන්වාදීමට SLRAMS සහායක සේවාව සැපයීම.
- වර්ෂය තුළදී SLRAMS සඳහා වාණිජ මට්ටමේ වලංගු ආරක්ෂක පහසුකමක් (SSL/TLS සහතිකය) ස්ථාපනය කිරීම සම්පූර්ණ කරන ලදී.

(ඊ) වත්කම් තක්සේරු කිරීම

මා.සං. අධිකාරියේ ප්‍රධාන ස්ථාවර වත්කම වන්නේ ජාතික මහාමාර්ග සහ අධිවේගී මාර්ග ජාලයයි. මෙම ජාලය සැලකිය යුතු පිරිවැයකින් සංවර්ධනය කරමින් සහ නඩත්තු කරමින් ජාතියේ ජාතියේ යටිතල ව්‍යුහයේ තීරණාත්මක අංගයක් නියෝජනය කරයි. මා.සං. අධිකාරිය, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 අනුගමනය කරමින් සියලුම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශ කිරීම පිණිස ශ්‍රී ලංකාවේ පාලක ජනරාල්වරයා විසින් විධිනියෝග (mandated) කරනු ලැබේ. එබැවින්, මෙම මාර්ග යටිතලව්‍යුහ වත්කම් තක්සේරු කිරීමට සහ ප්‍රාග්ධනීකරණය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය බැඳී සිටී.

මාර්ග වත්කම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය TCAMP යටතේ සිදු කරන ලද නියමු ව්‍යාපෘතිය හරහා හඳුනාගෙන තිබුණි. තවද, මාර්ග වත්කම් තක්සේරු කිරීම සඳහා විධිමත් ප්‍රවේශය, SLRAMS හි නව මොඩියුලයක් ලෙස හඳුන්වනු ලබන AVS නමැති මොඩියුලය ලෙස එම ව්‍යාපෘතියම හරහා මා.සං. අධිකාරිය තුළ ස්ථාපනය කරන ලදී.

ඉන්පසුව, වත්කම් ප්‍රාග්ධනීකරණය සඳහා සහායක් ලෙස SLRAMS හි ජාතික මාර්ග ජාලයට අදාළ යටිතලවියුහ වත්කම් ඉන්වෙන්ටරි නඩත්තු කිරීම සහ මා.සං. අධිකාරියේ මාර්ග යටිතලවියුහ වත්කම් තක්සේරු කිරීමේ කාර්යය මා.සං. අධිකාරිය වෙනුවට RAM අංශයට වෙත ඇත. ඒ අනුව, RAM අංශය, ජාතික මාර්ග ජාලය සඳහා තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කළ අතර ජාතික මාර්ග කි.මී. 2000 ක් තක්සේරු කිරීමේ ඉලක්කයක් RAM අංශයේ 2024 ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණි. කි.මී. 2000 ඉලක්කය පහත වගුවෙන් අපේක්ෂා කරන ලදී. වත්කම් තක්සේරු කිරීමේ කාර්යය සඳහා ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ දත්ත RAM අංශයට ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024.08.28 දිනැති විධිමත් ලිපිය මගින් ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMUs) සහ මා.සං. අධිකාරියේ අදාළ සියලුම අංශවලට උපදෙස් දී ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘති නිම කිරීමේ තොරතුරු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ (ADG) (ඉදිකිරීම්, වත්කම් මෙහෙයුම් සහ නඩත්තු) පිටසන සහිතව අර්ධ වශයෙන් ලැබුණි.

මා.සං. අධිකාරිය තුළ ක්‍රමානුකූල වත්කම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා මාර්ග වත්කම් තක්සේරු කිරීමේ රාමුව ස්ථාපිත කර ඇති බැවින්, 2024 වර්ෂය RAM අංශය සඳහා වත්කම් තක්සේරු කිරීමේ මිණුම් සලකුණු වසරක් වී ඇත. ඒ අනුව, RAM අංශය පහත පියවර හරහා ක්‍රමානුකූල මාර්ග වත්කම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කළේය;

1. මාර්ග වත්කම් දත්ත රැස් කිරීම
2. වත්කම් ප්‍රමාණ ගණනය කිරීමේදී භාවිතා කිරීම සඳහා දත්ත සැකසීම
3. HSR ආධාරයෙන් ඒකක අගයන් සකස් කිරීම.
4. සැකස් කරන ලද දත්ත SLRAMS වෙත උඩුගත කිරීම සහ, ස්වයංක්‍රීය වත්කම් තක්සේරුකරණ ගණනය කිරීම් සැකසීම
5. වත්කම් වටිනාකම ප්‍රසිද්ධ කිරීම සඳහා වාර්තා පිළියෙල කිරීම

වත්කම් තක්සේරුකරණ වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම ඇතුළුව ඉහතින් දැක්වූ එක් එක් අයිතමයේ සාක්ෂාත් කරගත් ප්‍රගතියද සහිතව, 2024 වර්ෂය තුළදී RAM විසින් සැලසුම් කළ තක්සේරුකරණ කාර්යයෙන් 75% ක් දක්වා ළඟාවී ඇත.

පළමු කිලෝමීටර 2000 තක්සේරුව සඳහා ඉලක්කගත මාර්ග දිග

ව්‍යාපෘතියේ නම	ඉලක්කගත මාර්ග දිග (කි.මී.)
බදුල්ල - චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP)	126
ප්‍රාදේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද මාර්ග ව්‍යාපෘතිය (LBFP)	785
PRP	369
විදේශාධාර ලබන විවිධ ව්‍යාපෘති (MFAP)	66
NRCP	97
ඉදිකිරීම් අංශය මගින් සිදුකරනු ලබන ව්‍යාපෘති, දේශීය බැංකුවලින් අරමුදල් සපයනු ලබන	263
එක්සිම් බැංකුව මගින් අරමුදල් සපයනු ලබන	75
RSAP	25
දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (SRCP)	10
කොළඹ/ ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් සපයනු ලබන	10
ගම්පහ/ ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් සපයනු ලබන	25
කෑගල්ල/ ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් සපයනු ලබන	49
රත්නපුර/ ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් සපයනු ලබන	50
පොළොන්නරුව/ ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති	42
කුරුණෑගල/ ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් සපයනු ලබන	15
මුළු දිග (කි.මී.)	**2007**

(උ) අනිකුත් තාක්ෂණික වැඩ

- අභිතකර දේශගුණික තත්ත්වය හේතුවෙන් මාර්ග යටිතල පහසුකම් වලට සිදුවන හානිවලට කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිකර්ම පියවර ගැනීම සඳහා ආධාර දෙන ආයතනවලින් සහ ශ්‍රී ලංකා රජයෙන් (GOSL) අවශ්‍ය අරමුදල් ලබා ගනිමින්, මාර්ග නඩත්තු හා කළමනාකරණ (RM&M) අංශයෙන් රැස් කරන ලද දත්ත භාවිතා කරමින්, "ශ්‍රී ලංකාවේ අභිතකර දේශගුණික තත්ත්වය හේතුවෙන් මාර්ග යටිතල පහසුකම් වලට සිදුවන හානි" පිළිබඳ වාර්තාව භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම සඳහා සකස් කිරීම.
- අංශය විසින් බාහිර ආයතන සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අංශ සඳහා සිදුකරනු ලබන සමීක්ෂණ ((වැටුම් බර උත්ක්‍රමමාන (FWD) & MFSNV සමීක්ෂණ)) සහ රූප විශ්ලේෂණය/දත්ත සැකසුම් කටයුතු වෙනුවෙන් කරනු ලබන වර්තමාන ගාස්තු අයකිරීම් සංශෝධනය කිරීම සහ ඒවා 2025 ජනවාරි 01 සිට 2027 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා අදාළ කිරීම.
- සියලුම අධිවේගී මාර්ග/අධිවේගී මාර්ග කොටස් (මාර්ග කොටස් මා.සං. අධිකාරිය විසින් පවරා ගැනීමට පෙර හෝ පවරාගත් වහාම) සම්බන්ධයෙන් අංශය විසින් සිදු කරනු ලබන රළුබව සම්බන්ධ මූලික සමීක්ෂණවලට අදාළව මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 03 සඳහා සාරාංශගත තොරතුරු සැපයීම සහ, රළුබව සම්බන්ධ සමීක්ෂණ ඔස්සේ ලබාගත් ජාත්‍යන්තර රළුබව සම්බන්ධ දර්ශකයේ (IRI) අගයන් මත පදනම්ව ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන මතුපිට ස්ථර භාර ගැනීමට/ප්‍රතික්ෂේප කිරීමට එහි නිර්ණායක ස්ථාපනය කිරීම සඳහා යොමු කරන ලද ව්‍යාපෘතියට පහසුකම් සැලසීමට අංශයේ අදහස් ලබා දීම.
- වැටුම් බර උත්ක්‍රමමානයේ (FWD) සැපයුම්කරු වන ස්වීඩනයේ M/s Konsult & Utveckling AB (KUAB) වෙතින් සම්පූර්ණ රෝද ඇක්සල කට්ටලයක් මිලදී ගැනීම සහ සවිකිරීම වසර තුළ සම්පූර්ණ කරන ලදී.
- සමීක්ෂණ දත්ත" පර්යේෂණ කටයුතු සඳහා විශ්වවිද්‍යාල සිසුන්ට ඉදිරිපත් කිරීම.
    - ඉල්ලා සිටින මාර්ගවලට අදාළ පවතින IRI දත්ත" මොරටුව විශ්ව විද්‍යාලය යටතේ M.Sc. උපාධි වැඩසටහන සඳහා සිදු කරනු ලබන පර්යේෂණවලදී භාවිතා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.
- රැස්වීම්වලට සහභාගිවීම
    - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා (JICA) නායයෑම් වැළැක්වීමේ ව්‍යාපෘතිය - මූලික රැස්වීම්
    - KOICA
    - තාක්ෂණික ඇගයීම් කමිටු
    - ශක්‍යතා සම්බන්ධීකරණ කමිටුව
    - ප්‍රගති සමාලෝචන
    - විගණන සහ කළමනාකරණ කමිටුම

(ඌ) පුහුණු වැඩසටහන්

ගෘහස්ථ

- වරාය ප්‍රවේශය උන්නත අධිවේගී මාර්ගය - Elevating Colombo : සමෘද්ධිය සඳහා සම්බන්ධතාවය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය. (ජූලි) ((සහභාගිවන්නා: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (DDG))
- QGIS පුහුණුව - මානව සම්පත් සංවර්ධනය - 2024 ඔක්තෝබර් 16 වන දින. (සැසිය I) ((සහභාගිවන්නන්: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, S. ඉංජිනේරු, ඉංජිනේරුවන් (3), TSA))
- ඩ්‍රෝන යානා යෙදවීමේ පුහුණුව - 2024 නොවැම්බර් 07 වන දින. (සහභාගිවන්නන්: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, S. ඉංජිනේරු, ඉංජිනේරුවන් (4), TSA)
- ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහන - 2024 නොවැම්බර් 12 වන දින. (සහභාගිවන්නන්: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ඉංජිනේරුවන් (3), TSA)
- ආරක්ෂිත ජාතික මාර්ග ජාලයක් පවත්වාගෙන යාම උදෙසා මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යභාරය 2024 නොවැම්බර් 22 වන දින. (සහභාගිවන්නන්: ඉංජිනේරුවන් (2) සහ TSA)
- විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම පිළිබඳ වැඩමුළුව - 2024 නොවැම්බර් 27 වන දින (සහභාගිවන්නන්: ඉංජිනේරු, MA(G) සහ MA)

භාහිර (දේශීය)

- උපායමාර්ගික සැලසුම්කරණය පිළිබඳ පුහුණුව - ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය. 2024 අගෝස්තු 22 සිට අගෝස්තු 25 දක්වා. (සහභාගිවන්නා: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)
- ජාතික දේශගුණික විපර්යාස දත්ත හුවමාරු ජාලය (NCC DSN) පිළිබඳ පුහුණු සැසිය - 2024 දෙසැම්බර් 10 වන දින - පරිසර අමාත්‍යාංශයේ (සහභාගිවන්නන්: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ TSA)

භාහිර (විදේශීය)

- දකුණු ආසියානු කලාපීය යටිතලවැයුහ සම්බන්ධතාවය (SARIC) - මාර්ග වත්කම් කළමනාකරණ පුහුණුව 2024 මැයි 27 සිට ජුනි 7 දක්වා ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි ජාතික මාර්ග ප්‍රවාහන ආයතනයේ (NTRO) මූලස්ථානයේදී පවත්වන ලද අතර ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව (DFAT) විසින් අරමුදල් සපයන ලදී. (සහභාගිවන්නන්: නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ඉංජිනේරු)

(එ) ගැටළු / ප්‍රතිකර්මීය වැඩපිළිවෙල සහ යෝජනා

***MFNSV** සහ වැටුම්බර උත්ක්‍රමමාන (**FWD**) සමීක්ෂණ කටයුතු සම්බන්ධ ගැටළු*

- ප්‍රමාද සමීක්ෂණ

MFNSV

- පැරණි MFSNV යන්ත්‍රයේ දකුණු පදික වේදිකාවේ කැමරාව ක්‍රියා නොකිරීම හේතුවෙන් සමීක්ෂණ වැඩසටහන් 2024 පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාසවලදී සම්පූර්ණ කිරීමට නොහැකි වීම.

වැටුම් බර උත්ක්‍රමමානය (**FWD**)

වැටුම් බර උත්ක්‍රමමාන (FWD) සමීක්ෂණය පහත සඳහන් හේතූන් මත 2024 දෙසැම්බර් මාසයේ සිට පැවැත්විය නොහැකි විය.

- **වැටුම් බර උත්ක්‍රමමාන (FWD) යන්ත්‍රයේ ෆියුස් රඳවනය පිළිස්සී ඇති අතර, ට්‍රේලරයේ තිරිංග පද්ධතියට හානි සිදුවිය.**

ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග

- දෝෂ සහිත පදික වේදිකා කැමරාව ඕස්ට්‍රේලියාවේ සැපයුම්කරු වෙත යවන ලද අත නිවැරදි කිරීමේ කටයුතු වාර්ෂික නඩත්තු කොන්ත්‍රාත්තුවට අනුව සිදු කරන ලදී.
- වැටුම් බර උත්ක්‍රමමාන (**FWD**) ට්‍රේලරයේ ඇක්සල් ඒකකය ප්‍රතිස්ථාපනය කරන ලද අතර අනෙකුත් දෝෂ වාර්ෂික නඩත්තු කොන්ත්‍රාත්තුවට අනුව නිවැරදි කරන ලදී.

ගැටළු - පොදු

- මාර්ග වත්කම් කළමනාකරණ අංශයේ කාර්ය මණ්ඩලයට සිය වැඩකටයුතු කිරීමට ඇත්තේ සීමිත කාර්යාල ඉඩකඩකි.
- ඉදිරිපත් කිරීම් සඳහා සම්මත ආකෘති නොමැතිවීම සහ මධ්‍යම ගබඩාවක් නොමැතිවීම හේතුකොට ගෙන තොරතුරු රැස් කිරීමේ දුෂ්කරතා නිසා පවතින ව්‍යාපෘති තොරතුරුවල අනුකූලතාවයක් නොමැතිවීම.
- ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) සම්පූර්ණ කිරීමෙන් පසුව ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියෙහි (SLRAMS) හි භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) ආශ්‍රිත කටයුතු හැසිරවීමට දක්ෂ නිලධාරීන් නොමැතිවීම.
- නම් කරන ලද කාර්යයන් සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැතිවීම සහ වර්තමාන අර්බුදය හේතුකොට ගෙන පුහුණු කාර්ය මණ්ඩලය රඳවා ගැනීමේ දුෂ්කරතා නිසා බොහෝ කාර්යමණ්ඩලයේ වැඩි පිරිසක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉවත් වීමේ නැඹුරුතාවක් දක්වයි. ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ පුහුණු කරන ලද ඉංජිනේරුවන් දෙදෙනෙකු විදෙස්ගත වී ඇති අතර තවත් ඉංජිනේරුවන් දෙදෙනෙකු සැලසුම් නිර්මාණ පුහුණු අංශයට මාරු කරන ලදී.
- අංශයේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අනුමැතිය නොලැබීම නිසා හේතුවෙන් රාජකාරි පැවරීමේ දුෂ්කරතා.

(ඒ) ලබාගත් ජයග්‍රහණ

- මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග තක්සේරු කළමනාකරණ (**RAM**) අංශය පිහිටුවීම. ඒ අනුව, සැලසුම් අංශයේ **IV** වන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් **2024** වර්ෂයේ සිට වැඩිදියුණු කළ ක්‍රියාකාරීත්වයන් සමඟ නව අංශය යටතේ සිදු කිරීමට පවරන ලදී.
- 2025 වසර සඳහා මාර්ග නඩත්තු අයවැය ප්‍රථම වරට ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියේ (SLRAMS) RMMS මොඩියුලය මගින් ඉදිරිපත් කරන ලදී.
- බහුකාර්ය ජාල සමීක්ෂණ වාහනය (MFNSV) සහ වැටුම්බර උත්ක්‍රමමාන (FWD) සමීක්ෂණවල නියැලී සිටින සේවකයින් සඳහා රු. 10,000/= (මාසිකව) තාක්ෂණික දීමනාවක් ගෙවීමට මා.සං. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.

(ඔ) අංශයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා යෝජනා

- මාර්ග වත්කම් කළමනාකරණය (RAM) අංශය සඳහා යෝජිත නව තනතුරු සඳහා අනුමැතිය හැකි ඉක්මනින් ලබා ගැනීම.
- අංශයේ රාජකාරි සුමටව කරගෙන යාම පිණිස කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් ඉඩක් ලබා දීම.
- දත්ත රැස් කිරීම, පද්ධති උඩුගත කිරීම, සැකසීම සහ විශ්ලේෂණයට අදාළ කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම.
- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සඳහා ArcGIS සේවාදායක පහසුකම් ලබා ගැනීම.
- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සතු තොරතුරු; ජාතික අවකාශ දත්ත යටිතල ව්‍යුහය (NSDI), ශ්‍රී ලංකා රථ වාහන දත්ත ගබඩාව කළමනාකරණ පද්ධතිය (SLTDBMS), ජාතික දේශගුණික වෙනස්වීමේ දත්ත හුවමාරු කරගැනීමේ ජාලය වැනි අභ්‍යන්තර/බාහිර ආයතන සමඟ හුවමාරු කරගැනීම.
- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සඳහා නඩත්තු සහාය අඛණ්ඩව පවත්වාගෙන යාම.
- මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මාර්ග වත්කම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ස්ථාපනය කිරීම සහ, ඒ අනුව මාර්ග වත්කම් කළමනාකරණය සඳහා අත්පොතක් පිළියෙල කිරීම.
- සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) හරහා පොළොව විනිවිද යන රේඩාර් (GPR) යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීම.
- ආයතනික අවශ්‍යතාවයට අනුව මාර්ග වත්කම් දත්ත රැස් කිරීම සඳහා ඩ්‍රෝන සමීක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම.
- සමීක්ෂණ වාහන නැවැත්වීමට සහ කාර්ය මණ්ඩල පහසුකම් සම්බන්ධ ගැටළු සඳහා විසඳුම් සෙවීම.

2.2.12 සීඝ්‍රගාමී මාර්ග කළමනාකරණය



අ. සීඝ්‍රගාමී මාර්ග මෙහෙයුම්, නඩත්තුව සහ කළමනාකරණය

ක්‍රියාත්මක වෙමින් පවතින වන අධිවේගී මාර්ග ජාලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණය යන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සීඝ්‍රගාමී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ (EOM&M) අංශය විසින් සිදු කරනු ලැබේ. 2024 වර්ෂය තුළ, දක්ෂිණ අධිවේගී මාර්ගය (E01), පිටත වටරවුම් අධිවේගී මාර්ගය (E02), කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (E03), මධ්‍යම අධිවේගී මාර්ගය (E04) (මීරිගම සිට කුරුණෑගල දක්වා) සහ අන්දරවැව - හම්බන්තොට අධිවේගී මාර්ගය (E06) ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකාවේ සීඝ්‍රගාමී මාර්ග ජාලය

1.	E01 – දක්ෂිණ අධිවේගී මාර්ගය (කොට්ටාව සිට මත්තල දක්වා)	200.45 km
2.	E02 – පිටත වටරවුම් අධිවේගී මාර්ගය (කොට්ටාව සිට කෙරවලපිටිය දක්වා)	28.86 km
3.	E03 – කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (පැලියගොඩ සිට සීදුව දක්වා)	25.80 km
4.	E04 – මධ්‍යම අධිවේගී මාර්ගය (මීරිගම සිට – කුරුණෑගල/ යග්ගහපිටිය දක්වා)	40.91 km
5.	E06 – දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම (අන්දරවැව සිට හම්බන්තොට දක්වා)	16.55 km

මෙහෙයුම් මට්ටමේ පවතින මාර්ගවල මුළු දිග *312.57km*
මෙහෙයුම් මට්ටමේ පවතින අන්තර් ඡේදන ගණන *3*


1. අධිවේගී මාර්ගවල රථවාහන ධාරිතාවය

සාමාන්‍ය වාර්ෂික ආදායම සහ රථවාහන (AADT) පිළිබඳ විස්තර


සාමාන්‍ය වාර්ෂික දෛනික ආදායම – රු. මිලියන
සාමාන්‍ය වාර්ෂික දෛනික රථවාහන – 115,853

එක් එක් අධිවේගී මාර්ග කොටසේ සාමාන්‍ය වාර්ෂික ආදායම සහ රථවාහන (AADT)

දක්ෂිණ අධිවේගී මාර්ගය (කොට්ටාව සිට ගොඩගම දක්වා)	- 32,332
පිටත වටරවුම් අධිවේගී මාර්ගය (කොට්ටාව සිට කෙරවලපිටිය දක්වා)	- 29,174
කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (පැලියගොඩ සිට සීදුව දක්වා)	- 34,292
මධ්‍යම අධිවේගී මාර්ගය (මීරිගම සිට – කුරුණෑගල/ යග්ගහපිටිය දක්වා)	- 12,341
දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම (පාලටුව සිට මත්තල/ හම්බන්තොට දක්වා)	- 7,714



2024 වර්ෂය තුළ එක් එක් අධිවේගී මාර්ග කොටසෙහි මාසික රථවාහන පරිමාව පිළිබඳ ප්‍රස්තාරික නිදර්ශනය.



2024 වර්ෂය තුළ එක් එක් අධිවේගී මාර්ග අංශයේ මාසික ආදායම පිළිබඳ ප්‍රස්තාරික නිදර්ශනය.

2024 වර්ෂය තුළ එක් එක් සීඝ්‍රගාමී මාර්ග කොටසේ මාසික රථවාහන ධාරිතාව

මාසය	දක්ෂිණ අධිවේගී මාර්ගය	OCHP	CKE	මධ්‍යම අධිවේගී මාර්ගය - II කොටස	ESEP	මාසික එකතුව
ජනවාරි	1,006,054	809,448	1,059,778	387,270	246,916	3,509,466
පෙබරවාරි	904,317	881,640	966,611	330,545	217,891	3,301,004
මාර්තු	980,782	825,797	1,040,918	353,635	233,288	3,434,420
අප්‍රේල්	971,638	786,792	958,500	369,427	255,830	3,342,187
මැයි	938,703	812,932	980,805	359,460	224,361	3,316,261
ජූනි	934,030	965,231	991,013	365,399	216,396	3,472,069
ජූලි	992,083	863,237	1,087,325	388,379	184,668	3,515,692
අගෝස්තු	1,038,223	1,060,069	1,126,468	416,812	251,792	3,893,364
සැප්තැම්බර්	938,703	812,932	980,805	359,460	224,361	3,316,261
ඔක්තෝම්බර්	972,695	881,922	1,067,418	375,033	228,019	3,525,087
නොවැම්බර්	970,584	983,763	1,030,498	356,815	235,827	3,577,487
දෙසැම්බර්	1,153,342	964,592	1,226,116	442,128	295,994	4,082,172
එකතුව	**11,801,154.00**	**10,648,355**	**12,516,255**	**4,504,363**	**2,815,343**	
සීඝ්‍රගාමී මාර්ග ජාලයේ මුළු රථවාහන ගණන						**42,285,470**

සටහන: ESE – පාලටුව සිට මත්තල සහ මාගම්පුර දක්වා

2024 වර්ෂය තුළ එක් එක් සීඝ්‍රගාමී මාර්ග කොටසේ මාසික ආදායම (රේන්ද බදු, Towing සහ හදිසි අනතුරු හිමිකම් ඇතුළුව)

මාසය	දක්ෂිණ අධිවේගී මාර්ගය	OCHP	CKE	මධ්‍යම අධිවේගී මාර්ගය - II කොටස	ESEP	මාසික එකතුව
ජනවාරි	384,919,199.00	313,081,141.00	303,114,430.00	106,200,600.00	145,898,527.00	1,253,213,897.00
පෙබරවාරි	348,241,713.00	292,081,062.00	282,956,771.00	98,818,229.00	132,056,384.00	1,154,154,159.00
මාර්තු	377,332,722.00	320,971,739.00	301,103,910.00	107,191,474.00	139,525,108.00	1,246,124,953.00
අප්‍රේල්	373,532,686.00	304,698,224.00	272,000,844.00	109,782,750.00	150,880,297.00	1,210,894,801.00
මැයි	351,019,366.00	300,031,487.00	287,688,086.00	107,420,483.00	132,268,328.00	1,178,427,750.00
ජූනි	343,517,365.00	298,292,699.00	290,473,530.00	109,622,459.00	131,063,652.00	1,172,969,705.00
ජූලි	373,714,725.00	322,564,527.00	319,213,006.00	117,278,958.00	142,700,884.00	1,275,472,100.00
අගෝස්තු	397,812,490.00	341,103,893.00	331,735,482.00	126,382,168.00	153,134,344.00	1,350,168,377.00
සැප්තැම්බර්	363,216,365.95	309,782,430.00	290,633,528.00	116,683,917.00	141,633,525.00	1,221,949,765.95
ඔක්තෝම්බර්	368,487,518.00	325,990,416.00	256,205,768.00	113,684,038.00	138,377,106.00	1,202,744,846.00
නොවැම්බර්	372,283,821.00	316,491,265.00	299,628,837.00	108,589,316.00	142,257,231.82	1,239,250,470.82
දෙසැම්බර්	448,498,388.33	374,305,347.00	353,452,675.00	133,011,048.00	177,703,750.00	1,486,971,208.33
මුළු එකතුව	**4,502,576,359.28**	**3,819,394,230.00**	**3,588,206,867.00**	**1,354,665,440.00**	**1,727,499,136.82**	
සීඝ්‍රගාමී මාර්ග ජාලයේ මුළු ආදායම						**14,992,342,033.10**


සටහන්: ESE - පාලටුව සිය මන්තල සහ මාගම්පුර දක්වා

2024 වර්ෂය තුළ එක් එක් සිසුගාමී මාර්ග කොටසේ මාසික වියදම

මාසය	දක්ෂිණ	OCHP	CKE	මධ්‍යම අධිවේගී මාර්ගය - II කොටස	ESEP
ජනවාරි	155,301,602.58	49,779,670.04	59,492,221.07	28,403,086.14	100,454,718.73
පෙබරවාරි	192,064,301.11	53,641,109.89	68,013,416.36	57,163,746.12	111,948,226.06
මාර්තු	143,831,678.59	46,640,737.41	53,699,221.89	43,995,855.52	96,810,942.30
අප්‍රේල්	152,321,895.39	38,192,056.69	56,969,432.07	32,733,949.21	88,101,740.71
මැයි	169,667,682.78	52,360,429.84	60,511,605.51	46,125,996.68	87,803,752.47
ජූනි	190,169,437.85	34,731,962.56	50,387,461.25	58,656,857.34	91,484,873.42
ජූලි	429,147,073.67	62,109,898.62	54,666,338.57	57,511,672.93	98,156,857.27
අගෝස්තු	190,080,017.30	35,054,551.29	58,141,063.78	50,319,884.28	93,477,199.68
සැප්තැම්බර්	170,486,199.16	34,365,840.58	65,790,688.29	48,977,344.42	93,055,506.70
ඔක්තෝම්බර්	187,759,961.40	32,775,833.33	62,876,537.37	41,253,102.80	92,097,346.83
නොවැම්බර්	142,807,342.63	36,790,227.00	66,570,142.00	35,111,017.50	97,583,877.70
දෙසැම්බර්	200,576,363.66	84,292,329.32	90,589,253.60	50,558,283.02	108,080,279.00
මුළු එකතුව	**2,324,213,556.12**	**560,734,646.57**	**747,707,381.76**	**550,810,795.96**	**1,159,055,320.87**

2024 වර්ෂ තුළ එක් එක් සිසුගාමී මාර්ග කොටසේ සිදුවූ අනතුරු බෙදීයාම

අනතුරේ බලපතලකම	භයානක	බරපතල	බරපතල නොවන	දේපල හානිවීම්
දක්ෂිණ අධිවේගී මාර්ගය (කොට්ටාව සිට ගොඩගම දක්වා)	7	31	41	1348
පිටත වටරවුම් අධිවේගී මාර්ගය	2	6	5	228
කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය	1	5	2	315
මධ්‍යම අධිවේගී මාර්ගය	0	10	10	180
දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම	2	4	14	376
මුළු හදිසි අනතුරු ගණන	12	56	72	2447



අධිවේගී මාර්ගයේ මුළු ආදායම, මුළු වියදම, අතිරික්තය සහ වියදම

ආ. අධිවේගී මාර්ග වත්කම් ඉහළ ශ්‍රේණියට ගෙනඒම සහ වැඩිදියුණු කිරීම

අධිවේගී මාර්ග වත්කම් වැඩිදියුණු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ අංශය 2024 දී අලුතින් පිහිටුවන ලද අංශයකි. එය එය තවමත් ස්ථාපනය වෙමින් පවතින අතර ADG (EM&P) යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශය, අධිවේගී මාර්ග ජාලය සඳහා වන සියලුම ප්‍රධාන වැඩිදියුණු කිරීම් සහ ඉහළ තත්ත්වයට ගෙනඒම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට පිහිටුවන ලදී.

ඉදිරියේදී සම්බන්ධ කිරීමට නියමිත අධිවේගී මාර්ග

1. වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ගය 6.0km
2. මධ්‍යම අධිවේගී මාර්ගය - 03 කොටස 13.8km
3. මධ්‍යම අධිවේගී මාර්ගය - 01 කොටස 36.5km

අංශයේ වගකීම්

- පහත සඳහන් දෑ ප්‍රසම්පාදනය කිරීම
  - පුනරුත්ථාපන කටයුතුවල ප්‍රධාන සිවිල් වැඩ.
  - කාලීය නඩත්තු කටයුතු.
  - තොරතුරු තාක්ෂණ පද්ධති ඉහළ තත්ත්වයට ගෙනඒම
  - විදුලි පද්ධති ඉහළ තත්ත්වයට ගෙනඒම
  - විභව වැඩිදියුණු කිරීම්
  - අනිකුත් ප්‍රදේශ ඉදිකිරීම්

නව අධිවේගී මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය.

- සේවා මට්ටම වැඩිදියුණු කිරීම සඳහා අධිවේගී මාර්ග වත්කම් සඳහා කළ යුතු වැඩිදියුණු කිරීම් සහ ඉහළ තත්ත්වයට ගෙනඒම් හඳුනා ගැනීම.

වසර තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම්

- දක්ෂිණ අධිවේගී මාර්ගයේ උඩුකාව (කි.මී. **119)** හි නව විවේක ස්ථානයක් ඉදිකෙරෙමින් පවතී. දකුණු පැත්තේ **(RHS)** සිවිල් කටයුතු අවසන් කර ඇති අතර, එම කටයුතු මා.සං. අධිකාරියේ විශේෂ ව්‍යාපෘති අංශයට පවරා ඇත.

- මෙම ඉතිරි ප්‍රෙද්ශ සඳහා මූලික පහසුකම් සංවර්ධනය කිරීමට යෝජනාවක් මෙම අංශය විසින් සකස් කළ යුතුය.

ඉතිරිව පවතින වැඩ සහ වත්මන් තත්ත්වය

වැඩය	ඉංජිනේරුගේ ඇස්තමේන්තුව	තාවකාලික ප්‍රසම්පාදන ආරම්භක දිනය	තාවකාලික ව්‍යාපෘති ආරම්භක දිනය	තාවකාලික ව්‍යාපෘති සම්පූර්ණ කළ දිනය
දක්ෂිණ අධිවේගී මාර්ගයේ මූලික බිඳවැටීම් සහ පිටිතල කිරීම ප්‍රතිසංස්කරණය කිරීම සහ නිවැරදි කිරීම පැකේජය 01 ඉදිකිරීම - (Ch. 19+000 කි.මී. සිට Ch. 34+000 කි.මී. දක්වා)	බි. 2.7	2025 ජනවාරි	2025 ජූලි	2026 ජනවාරි අග
දක්ෂිණ අධිවේගී මාර්ගයේ මූලික බිඳවැටීම් සහ පිටිතල කිරීම ප්‍රතිසංස්කරණය කිරීම සහ නිවැරදි කිරීම	බි. 3.4	2025 අප්‍රේල්	2025 අගෝස්තු	2026 මාර්තු අග

වැඩය	ඉංජිනේරුගේ ඇස්තමේන්තුව	තාවකාලික ප්‍රසම්පාදන ආරම්භක දිනය	තාවකාලික ව්‍යාපෘති ආරම්භක දිනය	තාවකාලික ව්‍යාපෘති සම්පූර්ණ කළ දිනය
පැකේජය 02 ඉදිකිරීම - (Ch. 00+000 කි.මී. සිට Ch. 19+000 කි.මී. දක්වා)				
කෙරවලපිටිය අන්තර් රඡ්දනයේ - පළමු අදියර ඇතුළුව කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ කි.මී. 0+585 සිට 10+715 කි.මී. දක්වා මාර්ග ආලෝකකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.	මි. 600	2025 ජනවාරි	2025 මැයි	2025 ඔක්තෝම්බර් අග
දක්ෂිණ අධිවේගී මාර්ගයේ කුරුදුගහහැකැක්ම සිට ගොඩගම කොටස දක්වා මැකී ගිය මාර්ග සලකුණු නැවත යෙදීම.	මි. 126	2025 පෙබරවාරි	2025 මාර්තු	2025 අගෝස්තු අග
පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ බෝක්කු මාර්ගවල ගොඩැලි නිවැරදි කිරීම.	මි. 372	2025 මාර්තු	2025 ජූනි	සැප්තැම්බර්
කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ - 2 වන අදියරෙහි කිලෝමීටර කි.මී. 10+715 සිට කි.මී. 25+800 දක්වා මාර්ග ආලෝකකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.	මි. 400	2025 අප්‍රේල්	2025 අගෝස්තු	2026 ජනවාරි
කඩවත අන්තර් ඡේදනයේ මහහැර යාමේ මාර්ගයේ ආලෝකකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.	මි. 23.4	2025 ජනවාරි	2025 මාර්තු	2025 ජූනි අග
අධිවේගී මාර්ගයේ පවතින ගාස්තු පද්ධතිය සඳහා කාඩ්පත් මගින ගෙවීමේ කටයුතු ඒකාබද්ධ කිරීම.	මූලික ආයෝජනයක් නැත	2025 ජනවාරි	2025 අප්‍රේල්	2025 මැයි
අන්තර් ඡේදන සඳහා අන්තර් සම්බන්ධතා ජාලය	මි. 200	2025 ජනවාරි	2025 අප්‍රේල්	2025 ජූනි අග
අධිවේගී මාර්ග ජාලය සඳහා පූර්ණ පරිමාණ විද්‍යුත් ගාස්තු අයකිරීම් (ETC) සංවර්ධනය කිරීම	බි. 3	2025 ජනවාරි	2025 ජූනි	2026 මැයි අග
අන්තර් වේදනවල සේදුම් කාමර පහසුකම් වැඩිදියුණු කිරීම	සංකල්පිත අදියරේ			
අධිවේගී මාර්ග ජාලය ඔස්සේ විවේක ගැනීමේ සංවර්ධනය කිරීම.	සංකල්පිත අදියරේ			

2.1.13 දේපළ කළමනාකරණය සහ ආදායම් එකතු කිරීම

මා.සං. අධිකාරියේ දේපළ කළමනාකරණ හා ආදායම් අංශය ස්ථාපනය කරනු ලැබුවේ මාර්ග සංවර්ධ අධිකාරිය සතු සම්පත්වලින් එයට ආදායම් උත්පාදනය කිරීම සඳහාය. මෙම ආදායම මා.සං. අධිකාරියේ මෙහෙවර වන ජාතික මහා මාර්ග ජාලය උසස් තත්ත්වයට ගෙනඒම, නඩත්තු කිරීම සහ ඉදිකිරීම යන කාර්යයන් සිදුකිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල්වලට එකතු කරනු ලබයි.

මෙම අංශය විසින් දැන්වීම් ලැලි / වෙළඳ දැන්වීම් සඳහා එළිමහනේ ඇති පුවරු / ගැන්ට්‍රිස්/ කැන්ටලීවර / දුරකථන කුටි / බස් මගී ආවරණ / ලොතරැයි වෙළඳ කුටි / වටරවුම් / රූපවාහිනී කේබල් ධ්‍රුව / කේබල් ඇතිරීම් ආදියෙන් ලැබෙන කුලී මුදල්වලට බදු අයකිරීම මගින් අදායම් උත්පාදනය කරනු ලැබේ. තවද, මෙම අංශ විසින් මා.සං. අධිකාරිය සතු අත්හැර දමනු ලබන හෝ පාවිච්චි නොකරනු ලබන මාර්ග අවශේෂිත, ජාතික මහා මාර්ග ස්ථාන වාණිජමය කාර්යයන් සඳහා තාවකාලිකව බද්දට දෙනු ලැබේ. මාර්ග අවශේෂිත, සිය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලබන උපයෝගිතා සේවා සැපයුම්කරුවන්ගෙන් (ශ්‍රී ලංකා ටෙලිකොම්, ජා.ජ.ස.ජ.ම. සහ ලං.වි.බ. මණ්ඩලය) කුලී මුදල් සඳහා බදු අයකිරීමේ හැකියාව සොයාබැලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

තවදුරටත්, මා.සං. අධිකාරියේ සෘජු කම්කරු ශ්‍රමය යොදා ගනිමින් වැදගත් ස්ථානවල පිහිටා ඇති මධ්‍ය කොදෙව්, වටරවුම්, මාර්ග අවශේෂිත අලංකරණය කිරීමේ කටයුතු මෙම දේපළ කළමනාකරණ හා ආදායම් අංශය විසින් මෙහෙයවනු ලබයි. මෙම වැඩ සඳහා අවශ්‍ය කරනු ලබන පිරිවැය ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ අනුග්‍රාහකත්වයෙන් ලබාගන්නා අතර ඔවුන්ගේ නිෂ්පාදන වෙළඳ ප්‍රචාරණය කිරීම සඳහා එකී ස්ථාන භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

දේපළ කළමනාකරණ හා අදායම් අංශයේ 2024 වර්ෂයේ කාර්යසාධනය
PM&R අංශය විසින් 2024 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

1) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා *මාර්ග අයිනේ ඇති දැන්වීම් ලැලි / ගැන්ට්‍රිස් / කැන්ටලීවර/ බැනර්/ බස් මගී ආවරණ සහ අනිකුත් වෙළඳදැන්වීම් මෙවලම්/උපකරණ සඳහා බලපත් නිකුත් කිරීම*

මා.සං. අධිකාරියේ මාර්ගෝපදේශවලට අනුව අනුමත දැන්වීම් ලැලි / බැනර්වල විස්තර මා.සං. අධිකාරියේ අදාළ විධායක ඉංජිනේරුවරයාට / ප්‍රධාන ඉංජිනේරුවරයාට සහ අදාළ අංශ ප්‍රධානියාට යවනු ලැබේ. විවිධ අනුමැතීන්හි සාරාංශයක් අදාළ අධිකාරීන් වෙත කලින් කලට යවනු ලැබේ.

2024 වර්ෂය සඳහා ලබා දී ඇති අනුමැතීන්/අලුත් කිරීම් පිළිබඳ විස්තර

ආදායම් උත්පාදක මූලාශ්‍ර	2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිකුත් කරන ලද අනුමැතීන් ගණන (නව අනුමැතීන් සහ අලුත් කිරීම්) (no's/m)
බැනර්	3,826
දැන්වීම් ලැලි	2,742
දැන්වීම් ලැලි (නොමිළේ)	13
ගැන්ට්‍රිස් / කැන්ටලීවර	11
බස් මගී ආවරණ	157
ලොරිරථ ආවරණ	266
වටරවුම් සහ මධ්‍ය දූපත්	47
වෙළඳසැල්	35
ෆයිබර් ඔප්ටිකල් පෝල්ස්	62,331
කේබල් ටෙලිවිෂන් පෝල්ස්	3,068
බහුකාර්ය ලම්පු ධ්‍රුව	31
පොළොව යට කේබල් ඇතිරම	223,743.06
බෝක්කු	02
මැන්හෝල්ස්	165
සාප්පු	18
කැබිනට්	26

2) 2023 වර්ෂයේදී උපයන ලද ආදායම

2024 වර්ෂය තුළ මා.සං. අධිකාරිය සතු දේපළ කළමනාකරණය කරමින් විවිධ සම්පත්වලින් දේපළ කළමනාකරණ හා ආදායම් අංශය සඳහා උපයන ලද මුළු මුදල වන රු. 382,439,083.23 සහ 2021 සිට 2024 දක්වා වර්ෂවල උපයන ලද මුළු මුදල් පහත වගුවේ සංසන්දනාත්මකව දක්වා ඇත.

2021 – 2024 PM&R ආදායම් එකතු කිරීම වර්ගීකරණය කිරීම

2020 සිට 2023 දක්වා වර්ෂවල දේපළ කළමනාකරණ හා ආදායම් අංශයේ (PM&R) දේපළ කළමනාකරණ හා ආදායම් අංශයේ ආදායම් එක්රැස් කිරීම වර්ගීකරණය කිරීම

අයිතම විස්තරය	2021 රු. ශත	2022 රු. ශත	2023 රු. ශත	2024 රු. ශත
බැනර්	1,793,361.11	2,810,917.52	3,912,945.85	4,882,882.30
දැන්වීම් ලැලි	59,051,125.84	73,206,763.83	98,386,024.50	118,078,504.56
බස් මගී ආවරණ	3,875,393.16	4,357,133.32	7,773,672.68	7,303,999.62
ගැන්ට්‍රිස් / කැන්ටලීවර	35,603,865.00	24,818,912.56	45,746,827.21	73,171,124.25
වෙළඳ හා ලොරියි වෙළඳ කුටි	934,821.29	2,180,091.37	1,345,799.47	13,712,217.41
වටරවුම්, රථවාහන කොදෙව් නඩත්තු කිරීම සහ අලංකරණය	793,830.29	1,321,899.71	1,153,894.21	1,489,087.02
ෆයිබර් ඔප්ටිකල් ධ්‍රැව/ටෙලිවිෂන් කේබල් ජාල සහ දුරකථන හුවමාරු පොළවල්	130,668,258.35	198,977,060.36	232,345,195.59	105,005,476.21
අගල් කැපීම	28,418,643.48	164,394,611.05	86,125,172.79	47,618,098.50
ඉඩම්	2,335,952.00	3,861,738.90	11,321,008.66	960,689.20
මල්ටි ලැම්ප් පෝල්ස් (Multi Lamp Poles)	965,484.00	655,687.69	1,397,235.88	1,629,516.54
ඉහළින් යන පාලම් මාර්ග (ටෙන්ඩර් ගාස්තු)	-	-	1,300,000.00	-
බෝක්කු	330,263.65	245,891.19	210,192.09	239,193.74
උප මාර්ග	2,571,513.83	5,281,316.29	8,522,205.66	6,649,682.56
නැවතුම් ස්ථාන	143,026.96	27,562.50	116,155.58	765,371.71
රූට් බෝල් (Root ball) පැල සහ අනිකුත් පැල විකිණීම	121,340.00	23,000.00	220,160.43	380,085.00
ගොඩනැගිලි කුලී	-	-	1,864,535.90	134,120.62
කැමරාගත කිරීම්	-	-	21,230.77	29,115.39
වාහන නැවතුම් ස්ථාන	-	-	129,833.50	342,639.36
බර මැනුම් පාලම් ගාස්තු	-	-	-	47,279.24
අයවිය යුතු මුදල්	114,608,092.88	19,755,304.79	22,579,851.65	
එක තුව	**382,214,971.84**	**501,917,891.08**	**524,471,942.42**	**382,439,083.23**

3) *මාර්ග අලංකරණ වැඩ*

මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කරනු ලබන්නේ මධ්‍ය කොදෙව්, වටරවුම් සහ මාර්ග අවශේෂ වැනි වැදගත් ස්ථානවල පෙනුම අනුග්‍රාහකත්වය තුළින් වැඩිදියුණු කිරීම සහ ඒවා නඩත්තු කිරීම ය. මෙය අනුග්‍රාහකයින්ගේ කුඩා ප්‍රමාණයේ වෙළඳ දැන්වීම් මා.සං. අධිකාරියේ අනුමත ගාස්තුවලට අනුව ප්‍රදර්ශනය කිරීමට ඉඩ ලබාදෙමින් මා.සං. අධිකාරියේ ආදායම් මූලාශ්‍රයක් ලෙස හඳුනාගන්නා ලදි. මෙම ගාස්තු කලින් කලට සංශෝධනය කරනු ලබන අතර අලංකරණ කටයුතු සඳහා අනුග්‍රාහකයින් වැඩි වැඩියෙන් ආකර්ෂණය කරගැනීම පිණිස අදාළ රෙගුලාසිද සංශෝධනය කරනු ලැබේ.

- *පැල තවාන්*

ශාක තවාන්, PM&R අංශය විසින් සිදු කරනු ලබන ශාක සිටුවීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය කරනු ලබන ශාක අවශ්‍යතා සපුරාලීම සඳහා ශාක පවත්වාගෙන යනු ලැබේ. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් හෝමාගම ඩිපෝවේ, ගලගෙදර, තල්දූව සහ අම්තිරිගල යන ස්ථානවල මල් පැල තවානක් ස්ථාපිත කර ඇත. 2024 වර්ෂයේදී, අංශය නා,

මී, කුඹුක්, ලෙමන්, ජම්බු, අනෝදා, මාදන්, කොහොඹ, දිවුල්, අඹ, පේර, දෙළුම්, කරඳ, ගම්මාලු සහ සියඹලා ඇතුළු විදේශීය සහ අනෙකුත් ශාක වර්ග 27,280 ක් ගබඩා කර ඇත.

- ගලගෙදර පැල තවාන - විශාල ප්‍රමාණයේ පොලිතීන් බෑග්වල නැවත සිටුවීම. කොළඹ විධායක ඉංජිනේරු කාර්යාලය සඳහා පැල 9,404 ක්, ලෙමන් පැල 01 ක් සහ කරඳ පැල 02 ක් නිකුත් කරන ලදී.

- රෑට බෝල් තාක්ෂණයට අනුව පැල සකස් කිරීම පහත පරිදි වේ:

  අම්තිරිගල පැල තවාන - පැල 40.
  ගලගෙදර පැල තවාන - පැල 576.
  හෝමාගම පැල තවාන - පැල සහ ගස් 110ක් විකිණීමට සූදානම්.





කෝට්ටේ-බෝපේ පාරේ ටිම්බිරි පැළ 20 ක් නැවත සිටුවා ඇත.

- පැළ අලෙවියෙන් ලැබුණු මුළු ආදායම රු. 373,435.00 කි.
- ජාතික මහාමාර්ගවල "තුරු මංපෙත්" රුක් රෝපණ වැඩසටහන - 2024

මහා මාර්ග අමාත්‍යාංශයේ "තුරු මංපෙත්" රුක් රෝපණ වැඩසටහන යටතේ ජාතික මහා මාර්ගයන්හි මාර්ග රක්ෂිතවල පැළ 10,844ක් සිටුවා ඇත.

2.1.14 යාන්ත්‍රික සේවා

යාන්ත්‍රික අංශය විසින් මාර්ග ඉදිකිරීමට අවශ්‍ය කරනු ලබන වාහන, ඉදිකිරීම් යන්ත්‍ර සහ උපකරණ සපයනු ලබන අතර පවතින සම්පත් භාවිතයෙන් ඒවා නඩත්තු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම්ද සිදුකරයි. ඊට අමතරව, මාර්ග ඉදිකිරීමට නඩත්තු කිරීමට අවශ්‍ය කරන සමූහයන්/කුඩු කරන ලද ගල් සහ පූර්ව-මිශ්‍රිත ඇස්පෝල්ට් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනාගාර ක්‍රියාත්මක කිරීම කළමනාකරණයද යාන්ත්‍රික අංශය විසින් සිදුකරනු ලැබේ. එසේම යාපනය අර්ධද්වීපයේ ක්‍රියාත්මක කරනු ලබන මඟී යාත්‍රා සහ පාලම් පාරු නඩත්තු කිරීමට අවශ්‍ය පහසුකම්ද යාන්ත්‍රික අංශය මගින් සිදුකරනු ලැබේ.

යාන්ත්‍රික අංශය ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂකගේ කාර්යාලය, යන්ත්‍රාගාර අංශය සහ අභුලාන, උඩුකාව සහ අනුරාධපුර යන ස්ථානවල පිහිටි නඩත්තු වැඩපළවල්වලින් සමන්විත වේ. සෑම ස්ථානයකම තිබෙන වාහන සහ රට තුළ විවිධ ස්ථානවල සවිකර තිබෙන මා.සං. අධිකාරිය සතු යන්ත්‍රසූත්‍ර, ඇස්පෝල්ට් පූර්ව-මිශ්‍ර යන්ත්‍රාගාර, කුඩු කරන යන්ත්‍රාගාර එකී වැඩපලවල්වල තිබෙන පහසුකම් භාවිතා කරමින් නඩත්තු කිරීමේ වගකීම යාන්ත්‍රික අංශය වෙත පැවරේ. එසේම සෙත්සිරිපායේ පිහිටා ඇති ප්‍රවාහන අංශයේ පරිපාලන කටයුතුද යාන්ත්‍රික අංශය විසින් සිදුකරනු ලබයි. තවද සීඝ්‍රගාමී මාර්ගවල මෙහෙයුම් නඩත්තුව, කළමනාකරණ අංශය සහ ව්‍යාපෘති අංශය යන අංශවල ප්‍රධාන

වාහන සහ යන්ත්‍ර නඩත්තුවට අවශ්‍ය සහයෝගය සහ උපදේශනය මෙම යාන්ත්‍රික අංශය මගින් සපයනු ලබයි. එසේම යාපනය අර්ධද්වීපයේ ක්‍රියාත්මක පාරු පාලම්වල නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවය ලබාගනී.

වත්කම් පිළිබඳ කෙටි විස්තරයක්

වර්ගය	ප්‍රමාණය
මෝටර් රථ සහ සමීක්ෂණ වාහන	303
ද්විත්ව කැබින් පිකප් ට්‍රක් රථ	658
වෑන් (පුහුණු සහ ද්විත්ව කාර්ය)	92
බර වාහන (ට්‍රක් රථ සහ ප්‍රයිම් මූවර් සහ බවුසර්)	242
විශේෂ කාර්ය වාහන (ගිලන් රථ, මාර්ග අතුගාන ට්‍රක් රථ, අධි පීඩන ජල විදුම් ට්‍රක්, පාලම් පරීක්ෂණ වාහන, සංඥා පුවරු වාහන ආදිය)	58
බර යන්ත්‍රෝපකරණ	162
ඇස්පෝල් සහ කුඩු කරන යන්ත්‍ර සහ, De-Canting Plants	15
ඉමල්ෂන් කම්හල	01
ට්‍රැක්ටර්	26

2024 වසර තුළ ප්‍රගතිය සහ කාර්යසාධනය

- ව්‍යාපෘති වලින් ලැබුණු වාහන - පහත සඳහන් වාහන ව්‍යාපෘති මගින් මාර්ග සංවර්ධන අධිකාරියට භාර දෙන ලද අතර, ඒවා අංශ සහ අනෙකුත් අය අතර බෙදා දෙන ලදී.

මෝටර් රථ (ජීප් රථ) - සමීක්ෂණ රථ	- 02 Nos.
ද්විත්ව කැබින් පිකප් ට්‍රක් රථ	- 06 Nos.
යතුරු පැදි	- 14 Nos.

- **ආදායම් බලපත්‍ර 2024**

බලපත්‍ර අධිකාරිය	**මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්**
වාහන ගණන	1520
බලපත්‍ර පිරිවැය	Rs. 9,500,000.00

- **මෝටර් රථ ඇණිය රක්ෂණය/හදිසි අනතුරු**

රක්ෂණ සැපයුම්කරු	ජාතික රක්ෂණ භාර අරමුදල
රක්ෂණය කරන ලද මුළු වාහන සංඛ්‍යාව	1533
ගෙවන ලද මුළු රක්ෂණ වාරිකය	රු. 10,313,074.33
මුළු හදිසි අනතුරු සංඛ්‍යාව	172
හදිසි අනතුරුවලින් හානියට ත් වාහන 80 ක් අලුත්වැඩියා කිරීමට වියදම් වූ මුළු පිරිවැය	රු. 16,435,274.43
202-12-31 දක්වා ලැබූ රක්ෂණ වන්දි හිමිකම්	රු. 15,422,011.05
අනුමැතිය සහ හිමිකම් සඳහා ගෙවීමට තිබෙන අවස්ථා	අවස්ථා 92 යි

- **ආරක්ෂක සේවාවන්**

පරිශ්‍රය	සේවා සැපයුම්කරු	වියදම (රු.)
අහුලාන වැඩපොළ	නෙවර් බැක් සිකියුරිටි සර්විසස් සහ පයෝනීර් සිකියුරිටි සර්විසස්	5,587,523.70
අනුරාධපුර වැඩපොළ	නෙවර් බැක් සිකියුරිටි සර්විසස් සහ පයෝනීර් සිකියුරිටි සර්විසස්	2,266,188.00

උඩුකාව වැඩපොළ	නෙවර් බැක් සිකියුරිටි සර්විසස් සහ පයෝනීර් සිකියුරිටි සර්විසස්	2,266,188.00
අහුලාන ඉමල්ෂන් කම්හල	පයෝනීර් සිකියුරිටි සර්විසස්	794,931.90
එකතුව		10,914,831.60

- **අහුලාන වැඩපොළ සඳහා පවිත්‍රතා සේවාව**

සේවා සැපයුම්කරු	ජයසිං ක්ලීනිං සර්විස්
2024 වර්ෂය සඳහා වියදම	රු. 2,824,349.98

- **වාහන සහ යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම**

පරිශ්‍රය	කාර්යයන් ගණන	වියදම (රු.)
ප්‍රධාන කාර්යාලය (outsourced)	403	39,299,610.34
අහුලාන වැඩපොළ - අලුත්වැඩියාවන්	1356	58,507,482.55
අනුරාධපුර වැඩපොළ - අලුත්වැඩියාවන්	57	4,377,311.72
අනුරාධපුර වැඩපොළ - අලුත්වැඩියාවන් - Sourced	11	962,560.00
අනුරාධපුර වැඩපොළ - සේවාවන්	21	472,209.05
උඩුකාව වැඩපොළ - අලුත්වැඩියාවන්	193	8,390,347.01
උඩුකාව වැඩපොළ - සේවාවන්	133	3,237,757.10
යන්ත්‍රාගාර අංශය		41,604,573.77
Total		156,851,851.54

- **මාර්ග ඇඹරුම් යන්ත්‍ර භාවිතය**

ක්‍රියාත්මක වූ මුළු පැය ගණන	449.00
අඹරණ මුළු ප්‍රදේශය - මා.සං. අධිකාරිය සඳහා	ව.මී. 100,288.1
කුලී පදනම මත මුළු ආදායම - මා.සං. අධිකාරියෙන්	රු. 80,148,285.00 (අයකර නොගත්)
අඹරණ ලද මුළු ප්‍රදේශය - භාහිර පාර්ශවවලින්	ව.මී. 5996
කුලී පදනම මත මුළු ආදායම - භාහිර පාර්ශවවලින්	රු. 5,096,000.00

- **ට්‍රක් රථ භාවිතය**

ට්‍රක් රථ වර්ගය	ගමන් කළ දුර ප්‍රමාණය (කි.මී.)	මෙහෙයුම් සිදුකළ පැය ගනන
නැව් භාණ්ඩ ට්‍රක් රථ (04)	67,415	-----
බූම් දොඹකර ට්‍රක් රථ (02)	29,671	453
ගුවන් වැඩ වේදිකා ට්‍රක් රථය	3922	546
ලෝ බෙඩ් ට්‍රේලරයක් සහිත ප්‍රයිම් මූවර් රථ	4376	-----
අධි පීඩන ජල විදුම් ට්‍රක් රථ (අංක 02)	1473.6	3412.6

➢ **ඇස්පෝල්ට් කම්හල් භාවිතය**

#	කම්හල	මුළු නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	ආදායම (රු.)	ලාභය (රු.)
1	ඉංගිරිය	25,893.59	476,914,960.88	40,460,510.74
2	කොටදෙණියාව	29,539.76	532,393,963.40	66,270,724.78
3	කැරගල	34,779.60	648,243,066.21	69,464,586.92
4	මැදයාය	18,515.52	399,786,505.45	29,744,323.44
5	කොත්මලේ	27,519.64	543,666,525.93	81,677,163.82
6	සූරියවැව	21,155.71	414,535,180.60	37,263,266.24
7	අඹන්පොල	28,082.54	516,928,314.78	66,335,065.85
8	මැදවච්චිය	33,422.77	648,389,705.23	60,052,059.45
9	පොළොන්නරුව	22,343.02	422,955,084.70	56,115,032.02
10	බලංගොඩ	19,755.36	377,730,687.75	34,305,008.86
එකතුව		261,007.51	4,981,543,994.93	541,687,742.12

➢ **තලන යන්ත්‍ර කම්හල් භාවිතය**

#	කම්හල	මුළු නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	ආදායම (රු.)	ලාභය (රු.)
1	සූරියවැව	7,165.65	24,282,994.88	1,741,927.64
2	අඹන්පොල	22,456.04	53,335,141.10	981,261.56
එකතුව		29,621.69	77,618,135.98	2,723,189.20

ඩී-කැන්ටින් (De-Canting) කම්හල් – බිටුමන් අලෙවිය

#	කම්හල	මුළු අලෙවිය (කි.ග්‍රෑ.)	ආදායම (රු.)	ලාභය (රු.)
1	සූරියවැව	345,045.00	2,760,360.00	158,458.36
2	අඹන්පොල	289,010.00	2,312,080.00	767,017.53
3	මැදවච්චිය	234,740.00	1,877,920.00	236,559.21
එකතුව		868,795.00	6,950,360.00	1,162,035.10

ප්‍රගතියට පවතින බාධා සහිත කරුණු

- මාර්ග නඩත්තුවට අවශ්‍ය කරනු ලබන නව උපකරණ ප්‍රසම්පාදනය කිරීමට ප්‍රමාණවත් අරමුදල් වෙන් නොකිරීම නිසා අවශ්‍ය කරනු ලබන යන්ත්‍රසූත්‍ර ප්‍රසම්පාදනය කිරීමට අපට නොහැකි විය. එබැවින් අවශ්‍ය කරනු ලබන ප්‍රමිතීන්ට යටත්ව මාර්ග නඩත්තු කිරීමේදී ප්‍රාදේශීය කාර්යාලවලට අපහසුතාවලට මුහුණදීමට සිදු වේ.
- අලුත්වැඩියා කිරීම් සහ මිළදී ගැනීම් සම්බන්ධ ගෙවීම් ප්‍රමාදවී සිදුකිරීම.
- වාහන සහ යන්ත්‍රසූත්‍ර ඒකක 2000 කට අධික ගණනක අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදුකිරීමට තිබෙන ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය පහත සඳහන් පහසුකම් ප්‍රමාණවත් නොවීම.
    - ඉහළින් වූ ගැන්ට්‍රි දොඹකර , හයිඩ්‍රොලික් ඔසවන, සංජානනාත්මක උපකරණ වැනි විශේෂිත උපකරණ.
    - අඟුලාන වැඩපොලේ ගබඩා පහසුකම්.
    - අඟුලාන වැඩපොලේ වැඩමුළු ගොඩනැගිලි ඉඩ.
    - වැඩපොලවල් සඳහා පරිපාලන කාර්යමණ්ඩලය සහ දක්ෂ සේවයින්
- ප්‍රවාහන අංශයේ වාහනවල සුළු අලුත්වැඩියාවන් සහ සාමාන්‍ය නඩත්තු කටයුතු හැසිරවීම සඳහා ප්‍රවාහන අංශයට එක් යාන්ත්‍රික අධිකාරීවරයෙකු අවශ්‍ය වේ.

- විධායක ඉංජිනේරු අංශයේ තිබෙන පදික රෝලර්, තළන යන්ත්‍ර සහ තැටි හිරකරන යන්ත්‍ර වැනි සැහැල්ලු යන්ත්‍රසූත්‍ර ක්‍රියාකරවීමට යොදවා ඇති සේවකයින් නිතර නිතර වෙනස් කරන අතර එම හේතුව නිසා එකී යන්ත්‍ර භාවිතා කිරීම අඩුවන අතර බැවින් ඒවායේ අමතර වශයෙන් අලුත්වැඩියා කටයුතු කිරීමට සිදුවීම.
- අභුලාන වැඩපොල: මළ බැඳුනු යකඩ ඔක්සයිඩ් අංශු වැටෙන අතර වැඩබිමේ සේවය කරන සේවකයින් සිටින්නේ අනතුරුදායක තත්ත්වයකය. එබැවින් අභුලාන වැඩපොල ගොඩනැගිල්ල ඉක්මනින්ම පිළිසකර කළ යුතුව ඇත.
- අභුලාන වැඩපොලෙහි තිබෙන විදුලිබලයෙන් ක්‍රියාකරවනු ලබන සහ වායුරෝධක උපකරණ බලගැන්වීම පිණිස සහ, පවිත්‍රතා කටයුතු සිදුකිරීම සඳහා එම වැඩපොලෙහි විදුලි රැහන් නැවත ඇදිය යුතුව ඇත.
- කාර්යමණ්ඩලය සහ ලේඛනාගාරය වෙනුවෙන් වැඩස්ථාන සවිකිරීමට කාර්මික අංශය තුළ ප්‍රමාණවත් ඉඩ නොතිබීම.
- අනුරාධපුර සහ උඩුකාව වැඩපොළවල් සඳහා අවශ්‍ය කරනු ලබන කාර්යමණ්ඩලය බඳවා ගැනීමට පරිපාලන අංශය විසින් කටයුතු කර නොමැති නිසා අලුත්වැඩියා කටයුතු ප්‍රමාදවී සිදුවීම.

ගනු ලැබූ ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ යෝජිත ක්‍රියාමාර්ග

- මාර්ග නඩත්තු කටයුතු සඳහා උපකරණ ප්‍රසම්පාදනය කිරීමට සහ වැඩපොලවල්හි තිබෙන පහසුකම් උසස් තත්ත්වයට ගෙනඒමට ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම.
- යාන්ත්‍රික අංශයට (අලුත්වැඩියා සහ නඩත්තු) අදාළ ගෙවීම් කටයුතු වඩාත් සුමට ලෙස සිදුකිරීමට මූල්‍ය අංශය සඳහා ගණකාධිකාරිවරයෙකු යෙදවීමට යෝජනා කරනු ලැබේ.
    - භුලාන වැඩපොලේ කටයුතු ශක්තිමත් කිරීමට පහත සඳහන් කාර්යමණ්ඩලය බඳවා ගැනීමට යෝජනා කරනු ලැබේ. (අනුමත සේවක සංඛ්‍යාව අනුව පවතින ඇබෑර්තු):
    - යාන්ත්‍රික ඉංජිනේරුවන් 02
    - 03 යාන්ත්‍රික පාලකයින් 03
    - කළමනාකාර සහකාරවරුන් 03
    - කාර්යාල කාර්ය සහායකයින් 01
    - කාර්මිකයින් 10
    - මෝටර් රථ විදුලි කාර්මිකයින් 02
    - වෑද්දුම්කරුවන් 02
    - සේවා කරුවන් 06
    - අත් උදවුකරුවන් 20 (ට්‍රක් රථ, වැඩපොළ සහ සේවා ස්ථාන)
    - 01 Office Aid

- අනුරාධපුර සහ උඩුකාව වැඩපොලවල වැඩ කටයුතු ශක්තිමත් කිරීමට අවශ්‍ය කරනු ලබන කාර්යමණ්ඩලය බඳවා ගැනීමට ඉක්මන් ක්‍රියාමාර්ගය ගත යුතුය.
- ප්‍රවාහන අංශයේ තිබෙන සංචිත වාහනවල සුළු අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට යාන්ත්‍රික අධිකාරිවරයෙකු යෙදවීමට අපි යෝජනා කරමු.
- අවශ්‍ය කරනු ලබන අරමුදල් වෙන් කරමින් අභුලාන සහ අනුරාධපුර වැඩපොල ගොඩනැගිලිවල පිළිසකර කිරීම් ඉක්මනින් සිදුකිරීම.
- කාර්යමණ්ඩලය සඳහා වැඩ ස්ථාන සහ ලේඛනාගාරය සඳහා පහසුකම් ලබාදීමට ප්‍රධාන කාර්යාලයේ යාන්ත්‍රික අංශයට වර්ග අඩි 1000 ක අමතර ඉඩ ප්‍රමාණයක් ලබාදීම.
- වැඩපොලවල් සඳහා අභ්‍යාසලාභී ආධුනිකයින් ලබාදීම: මේ සඳහා අවශ්‍ය අභ්‍යාසලාභී ආධුනිකයින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියෙන් ලබාගැනීමට පුහුණු අංශය විසින් කටයුතු කළ යුතු අතර එය මා.සං. අධිකාරියට මෙන්ම අභ්‍යාසලාභීන්ටද ප්‍රතිලාභ ගෙනදෙනු ඇත.
- දැනට තිබෙන සැහැල්ලු වාහන ගණන සැලකිල්ලට ගැනීමේදී සැහැල්ලු වාහන රියදුරන් සංඛ්‍යාවේ අඩුවක් පවතින බැවින් ඒ අනුව රියදුරන් ගණන වැඩිකිරීමට අවශ්‍ය පියවර ගැනීමට පරිපාලන අංශය කටයුතු කළ යුතුය.
- ඩෙල්ෆ්ට් සහ යාපනය අර්ධද්වීපයේ අනෙකුත් දූපත් වෙත භාණ්ඩ ප්‍රවාහනය (වාහන, යන්ත්‍රෝපකරණ සහ ඉදිකිරීම් ද්‍රව්‍ය සහ අනෙකුත් සාමාන්‍ය භාණ්ඩ) සඳහා ගොඩබෑමේ Landing Craft-Mechanised (LCM) යෙදවීම අවශ්‍ය වේ. මෙය, දූපත් වල යටිතලවාසුහය සංවර්ධනය සඳහා අතිශයින් වැදගත් වේ.

2.1.15 මානව සම්පත් සංවර්ධනය



ආයතනයට පැවරී ඇති වැඩ කටයුතු කරගෙන යාමට සහ මහා මාර්ග ඉදිකිරීමේ ගතික ආයතනයක් වැඩිදියුණු කිරීමට ප්‍රමාණවත් ලෙස දක්ෂ සහ තෘප්ත ශ්‍රම බලකායක් තිබිය යුතු අතර ඔවුන් නව තාක්ෂණය සහ නවීන ක්‍රමවලින් යවත්කාලීන කළ යුතුය. එබැවින් ආයතනයට ඉතා වැදගත් කාර්යයක් සහ ආයෝජනයක් වන මානව සම්පත සංවර්ධනය කළ යුතු බවට මා.සං. අධිකාරිය සලකන අතර එමගින් අපේක්ෂිත ප්‍රතිඵල වැඩිකර ගැනීමටත් දේශයේ අනාගත අවශ්‍යතා සපුරා ගැනීමටත් හැකිවනු ඇත. එබැවින් ආයතනයේ පුහුණු කටයුතු පවත්වාගෙන යාමේ වගකීම පුහුණු අංශයට පැවරේ.

2024 වර්ෂය තුළ සිදුකරන ලද පුහුණු ක්‍රියාකාරකම්

1) ***ආයතනය තුළ පවත්වන ලද පුහුණු කටයුතු***

මානව සම්පත් සංවර්ධන අංශය විසින් 2024 වර්ෂය තුළදී සිදු කරන ලද ගෘහස්ථ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

ගෘහස්ථ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර

අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	
පුහුණු වැඩසටහන් ගණන	44
සහභාගිවූ ගණන	4455
පුහුණු කරන ලද දින ගණන	27
කණ්ඩායම් ගණන	44

2) බාහිර ආයතනවල පුහුණුව

ඉහත විස්තර කර ඇති ගෘහස්ථ පුහුණු ක්‍රියාකාරකම් වලට අමතරව, මානව සම්පත් සංවර්ධන අංශය 2024 වර්ෂය තුළදී බාහිර ආයතන විසින් සංවිධානය කරන ලද පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කර ඇත. විස්තර පහත දැක්වේ.

බාහිර ආයතන මගින් සිදුකරන ලද පුහුණුව

අංකය	ආයතනයේ නම	පුහුණුණුව පිළිබඳ විස්තර	පුහුණු කරන ලද නිලධාරීන් ගණන	පුහුණු කරන ලද දින ගණන
1	ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය	කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා පුහුණු පාඨමාලාව -2024 (අදියර 1 සහ 2)	1	8
2	සෞඛ්‍ය අමාත්‍යාංශය	තුවාල සිදුවීම් වැළැක්වීම් සහ මූලික ප්‍රථමාධාර පිළිබඳ උපදේශන වැඩමුළුව	2	1
3	පරිසර අමාත්‍යාංශය	හරිත දේශගුණික අරමුදල් (GCE) ව්‍යාපෘති 3ක් සංවර්ධනය කිරීමේ සංකල්ප සටහන්: සංකල්ප සටහන් පරීක්ෂණ වැඩමුළුව	1	1

අංකය	ආයතනයේ නම	පුහුණුවට පිළිබඳ විස්තර	පුහුණු කරන ලද නිලධාරීන් ගණන	පුහුණු කරන ලද දින ගණන
4	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	ආබාධිතභාවය ඇතුළත් සංවර්ධනය සඳහා හරස්-කැපුම් ප්‍රවේශයන් සහ පූර්ව කොන්දේසි	1	1
5	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	අධිකරණ වෛද්‍ය ගිණුම්කරණය පිළිබඳ වෘත්තීය සහතිකය	1	14
		45 වන ජාතික වරලත් ගණකාධිකාරීන්ගේ සමුළුව	2	3
6	CIDA	CIDA සම්මත ලංසු ලේඛන හා සම්බන්ධ කොන්ත්‍රාත් ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	5	1
7	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)	ඉදිකිරීම් සහ සේවා සඳහා ලංසු ලේඛන සකස් කිරීම.	1	3
8	IESL	ඉදිකිරීම් කර්මාන්තය දහා ඩිජිටල් නිවුන් ආකෘති යෙදීම	10	1
		කොන්ක්‍රීට් මිශ්‍ර නිර්මාණය පිළිබඳ CPD පාඨමාලාව	2	2
9	ආරක්ෂාව පිළිබඳ ආසියානු සංවර්ධන බැංකු කාර්යාලය	කොළඹ පිහිටි දකුණු ආසියානු කලාපයේ කලාපීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා පුහුණුව	6	4
10	ශ්‍රී ලංකා භූ තාක්ෂණ සංගමය	“අධිවේගී මාර්ග ඉදිකිරීම්වල භූ තාක්ෂණික ඉංජිනේරු අභියෝග” පිළිබඳ SLGS වාර්ෂික සමුළුව	19	1
11	ශ්‍රී ලංකා පරිගණක සංගමය	ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව (NITC) - 2024	3	2
12	පාරිසරික වෘත්තිකයන්ගේ ආයතනය	මූලික කරුණුවල සිට ජයග්‍රාහී යෝජනා දක්වා දේශගුණික මූල්‍ය වැඩමුළුව	2	1
13	ජාතික සමුපකාර සංවර්ධන ආයතනය	තොරතුරු පනත පිළිබඳ පුහුණු වැඩසටහන (මාර්ගගත)	12	1
14	පරිසර අමාත්‍යාංශය	ජාතික දේශගුණික විපර්යාස දත්ත හුවමාරු ජාලය (NCC_DSN) පිළිබඳ පුහුණුව	3	1/2
15	මොරටුව විශ්වවිද්‍යාලය	මහාමාර්ග ඉංජිනේරු සහ ප්‍රවාහන පද්ධතිවල දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICAHETS 2024) ප්‍රවාහන පර්යේෂණ සංසදය 2024 (TRF 2024)	9	1
එකතුව			80	45

3) දේශීය විශ්වවිද්‍යාල/ආයතනවල දිගුකාලීන පාඨමාලා හැදෑරීමේ අවස්ථා.

2024 දී මානව සම්පත් සංවර්ධන අංශය විසින් සංවිධානය කරන ලද දේශීය විශ්ව විද්‍යාල හෝ ආයතනවල Meng \ විද්‍යාවේදී උසස් උපාධිය \ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව වැනි දිගුකාලීන පාඨමාලා පිළිබඳ විස්තර පහත දැක්වේ.

අංතය	ආයතනයේ නම	පුහුණුවට පිළිබඳ විස්තර	පුහුණු කරන ලද දින ගණන
1	මොරටුව විශ්වවිද්‍යාලය	ප්‍රවාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උසස් උපාධිය/ ශාස්ත්‍රපති/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	4
2	කොළඹ විශ්වවිද්‍යාලය	කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2024/2025	3
3	රුහුණු විශ්වවිද්‍යාලය	ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	1
එකතුව			8

4) විදේශ පුහුණුව

2024 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ තෝරාගත් නිලධාරීන් විදේශීය පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූහ. වැඩසටහන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සහාය සහ මග පෙන්වීම මානව සම්පත් සංවර්ධන අංශය විසින් ලබා දී ඇත.

2024 වසර පුරා සම්බන්ධීකරණය කරන ලද විදේශ පුහුණු වැඩසටහන්

අංකය	රට	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු කරන ලද නිලධාරීන් ගණන	පුහුණු කරන ලද දින ගණන	සංක්ෂිප්ත වාර්තාව ඉදිරිපත් කළේද නැද්ද යන වග (දිගු කාලීනව)
1	ඔස්ට්‍රේලියාව	"මාර්ග වත්කම් කළමනාකරණය" පිළිබඳ කෙටි පාඨමාලාව - ඕස්ට්‍රේලියාවේ	2	12	ඉදිරිපත් කර නැත
2	ජපානය	JICA දේශය කේන්ද්‍ර කරගත් පුහුණුව - ශ්‍රී ලංකාවේ පාලම් කළමනාකරණය පිළිබඳ ධාරිතා සංවර්ධනය (II කොටස)	10	16	ඉදිරිපත් කරන ලදි
3	ජපානය	JICA දැනුම සහ-නිර්මාණ වැඩසටහන මාර්ග පරිපාලනය	1	27	ඉදිරිපත් කර නැත
4	සිංගප්පූරුව	තිරසාර යටිතල ව්‍යුහ ව්‍යාපෘති සංවර්ධනය සහ මූල්‍යකරණය	1	05	කෙටිකාලීන (අවශ්‍ය නැත)
5	ජපානය	JICA දැනුම සහ-නිර්මාණ වැඩසටහන: යටිතල ව්‍යුහ (ගංගා, මාර්ග සහ වරාය) පිළිබඳ ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය (ජපානය - මාර්ගගතව සහ මුහුණට මුහුණ)	1	29	ඉදිරිපත් කරන ලදි
6	කොරියාව	ජාතික රථවාහන දත්ත ගබඩාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2024-KOICA ආරාධිත පුහුණු වැඩසටහන	7	15	ඉදිරිපත් කර නැත
7	ජපානය	JICA දැනුම සහ-නිර්මාණ වැඩසටහන: රථවාහන ආරක්ෂාව (ජපානයේදී)	1	20	ඉදිරිපත් කර නැත
8	තායිලන්තය	"දේශගුණික ප්‍රතිරෝධී මාර්ග යටිතල ව්‍යුහ සහ CRB රාමුව සඳහා සැලසුම් ප්‍රමිතීන්, මෙවලම් සහ තාක්ෂණයන්" පිළිබඳ දෙදින කලාපීය පුහුණුවක් සඳහා සහභාගිවන්නන් නම් කිරීම, ශ්‍රී ලංකාව	3	02	කෙටිකාලීන (අවශ්‍ය නැත)
9	චීනය	චීනයේ හැංෂෝ හි පැවැත්වෙන කැම්පස් ජාල පුහුණුව සඳහා සුවිශේෂී ආරාධනාව	3	06	කෙටිකාලීන (අවශ්‍ය නැත)
10	ජපානය	මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන (JDS) සඳහා ජපන් ප්‍රදාන ආධාර – 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම	0	-	
11	තායිලන්තය	වාර්ෂික ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව: මාර්ග වත්කම් කළමනාකරණය	2	19	ඉදිරිපත් කර නැත
12	බංග්ලාදේශය	BIMSTEC සඳහා ප්‍රවාහන යටිතල ව්‍යාපෘති සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ පුහුණු වැඩසටහන (2024 නොවැම්බර් 12 සිට 14 දක්වා බංග්ලාදේශයේ ඩකා හිදී)	1	03	කෙටිකාලීන (අවශ්‍ය නැත)- ඉදිරිපත් කරන ලදි
13	තායිලන්තයේ පැවැත්වූයේ නැත. මාර්ගග සහභාගීත්වය	තිරසාර අභ්‍යන්තර ජල මාර්ග ප්‍රවාහන සංවර්ධනය පිළිබඳ ධාරිතා වර්ධන වැඩමුළුව - UNCC, බැංකොක්, තායිලන්තය (2024 නොවැම්බර් 26-27)	1	02	
14	ජපානය	JICA දැනුම සහ-නිර්මාණ වැඩසටහන (දිගු කාලීන පුහුණුව) "ති.ස. අරමුණුවල' ගෝලීය නායක වැඩසටහන" JFY 2025 (ජපානයේ ශාස්ත්‍රපති/ ආචාර්ය උපාධි) සඳහා නාමයෝජනා ඉල්ලීම.	තහවුරු කිරීම අපේක්ෂාවෙන් සිටී		
15	ජපානය	JICA දැනුම සහ-නිර්මාණ වැඩසටහන: තිරසාර සංචාරක සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය (ස්වභාවික සම්පත්) (A) (ජපානයේදී) 2025 ජනවාරි 28 සිට 2025 පෙබරවාරි 27 දක්වා	තහවුරු කිරීම අපේක්ෂාවෙන් සිටී	31	

අංකය	රට	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු කරන ලද නිලධාරීන් ගණන	පුහුණු කරන ලද දින ගණන	සංක්ෂිප්ත වාර්තාව ඉදිරිපත් කළේද නැද්ද යන වග (දිගු කාලීනව)
16	ඇ.එ.ජ.	ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය _ විලියම්ස් විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය (2025 අගෝස්තු සිට 2026 ජූනි දක්වා)	තහවුරු කිරීම අපේක්ෂාවෙන් සිටී		
17	නේපාලය	2025 පෙබරවාරි 10-14 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවර, නාගරික ප්‍රවාහන සැලසුම්කරණ (LUTP) නායකයින්ගේ වැඩමුළුව	තහවුරු කිරීම අපේක්ෂාවෙන් සිටී	05	කෙටිකාලීන (අවශ්‍ය නැත)
එකතුව			33	192	

5) වෘත්තීය සමාලෝචනය සඳහා ඉංජිනේරුවන් පුහුණු කිරීම

සැලසුම් නිර්මාණ කාර්යාල පුහුණුව සඳහා ඉංජිනේරුවන් නම් කිරීම, මානව සම්පත් සංවර්ධන අංශයේ පවත්වාගෙන යනු ලබන කාර්යාල ප්‍රමුඛතා ලැයිස්තුව යටතට වැටේ. ඒ අනුව, 2024 වර්ෂය තුළ නිර්මාණ පුහුණුව සඳහා ඉංජිනේරුවන් 53 දෙනෙකු පහත පරිදි නම් කරන ලදී.

වෘත්තීය සමාලෝචනය සඳහා ඉංජිනේරුවන් පුහුණු කිරීම

සැලසුම් නිර්මාණ කාර්යාලය	ඉංජිනේරුවන් ගණන
අධිවේගී මාර්ගය	12
පාලම	11
මහනුවර	10
කුරුණෑගල	6
රත්නපුරය	7
මාතර	3
අනුරාධපුරය	4
එකතුව	**53**

6) උපාධි අපේක්ෂකයින් සහ ආධුනිකයින් සඳහා පුහුණු අවස්ථා

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ එක්ව, විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ ආයතනවල උපාධි අපේක්ෂකයින්ට සහ ආධුනිකයින්ට මාර්ග සංවර්ධන අධිකාරිය තුළ සිය කර්මාන්තශාලා පුහුණුව සම්පූර්ණ කිරීමට මානව සම්පත් සංවර්ධන අංශය විසින් අවස්ථා ලබා දෙන ලදී.

දේශීය විශ්වවිද්‍යාල / ආයතනවල උපාධි අපේක්ෂකයින් සහ ආධුනිකයින් සඳහා පුහුණු අවස්ථා (2024)

අංකය	දේශීය විශ්වවිද්‍යාල සහ ආයතන		සිසුන් ගණන
1	විශ්වවිද්‍යාල		
	1.1	ජනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	4
	1.2	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	8
	1.3	තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	12
	1.4	සබරගමුව විශ්වවිද්‍යාලය - භූ විද්‍යා පීඨය	10
	1.5	ඉංජිනේරු පීඨය - යාපනය විශ්වවිද්‍යාලය	1
	1.6	තාක්ෂණ පීඨය - යාපනය විශ්වවිද්‍යාලය	3

අංකය	දේශීය විශ්වවිද්‍යාල සහ ආයතන		සිසුන් ගණන
	1.7	යාපනය විශ්වවිද්‍යාලය	2
	1.8	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය - වෙන්කලඩි	2
	1.9	මොරටුව විශ්වවිද්‍යාලය	18
	1.10	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	7
	1.11	රුහුණ විශ්වවිද්‍යාලය	11
	1.12	රජරට විශ්වවිද්‍යාලය	2
	1.13	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය	2
	1.14	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	24
	1.15	කැලණිය විශ්වවිද්‍යාලය	2
	1.16	වවුනියා විශ්ව විද්‍යාලය	5
2	කාර්මික විද්‍යාල		
	2.1	කළුතර	3
	2.2	වරකාපොල	3
	2.3	රත්මලාන	1
	2.4	මාතර	2
	2.5	මඩකලපුව	7
	2.6	කුරුණෑගල	1
	2.7	අක්කරෙයිපත්තු	1
	2.8	වයඹ	1
	2.9	බලපිටිය	1
	3.0	ගම්පහ	1
3	පාර කළමනාකරණ පිළිබඳ ආයතනය (NIBM) (NIBM)		1
4	CINEC කැම්පස්		2
5	BCAS කැම්පස්		1
6	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය - NAITA		
	6.1	අම්පාර	2
	6.2	මහනුවර	1
	6.3	වැලිකඩ රාජගිරිය	4
	6.4	කෑගල්ල	1
	6.5	ත්‍රිකුණාමලය	1
7	තාක්ෂණික විද්‍යාල		
	7.1	අනුරාධපුරය	3
	7.2	ගාල්ල	1
	7.3	බදුල්ල	1
	7.4	කුරුණෑගල	1
8	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)		17
9	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය		
	9.1	රත්මලාන	2
	9.2	තංගල්ල	2
	9.3	අනුරාධපුරය	1
10	සමුපකාර සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනය		1
11	ESoft Metro College - කළුතර		1
12	SNAP Ferd (Pvt) Ltd.,		1
13	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය		
	13.1	මහනුවර	2
	13.2	කෑගල්ල දිස්ත්‍රික්කය	1
	13.3	පුත්තලම	1
14	ICBT කැම්පස්		
	14.1	කොළඹ	2
	14.2	මහනුවර	1
15	ඉංජිනේරු තාක්ෂණ ආයතනය		3
16	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - මඩකලපුව		1
17	කොළඹ ඉදිකිරීම් තාක්ෂණ පාසල		1
18	විශ්වවිද්‍යාල ආයතන		
	18.1	බටංගල විශ්වවිද්‍යාල ආයතනය	3
	18.2	අනුරාධපාර විශ්වවිද්‍යාල ආයතනය	2


අංකය	දේශීය විශ්වවිද්‍යාල සහ ආයතන		සිසුන් ගණන
	18.3	කුලියාපිටිය විශ්වවිද්‍යාල ආයතනය	1
	18.4	කුරුණෑගල විශ්වවිද්‍යාල ආයතනය	1
	18.5	මාතර විශ්වවිද්‍යාල ආයතනය	1
19	උසස් තාක්ෂණ ආයතනය		
	19.1	යාපනය	1
	19.2	මහනුවර	1
	19.3	තංගල්ල	2
20	KIU විශ්වවිද්‍යාලය		1
21	Saegis කැම්පස්		1
22	SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලය		2
23	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය		1
24	ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික පාසල		1
එකතුව			208

ඉහත විස්තර කර ඇති අභ්‍යන්තර පුහුණු ක්‍රියාකාරකම් වලට අමතරව, මානව සම්පත් සංවර්ධන අංශය 2024 වර්ෂය තුළ බාහිර සංවිධාන සඳහා සංවිධානය කරන ලද පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කර ඇත. විස්තර පහත දැක්වේ.

බාහිර ආයතන සඳහා සංවිධානය කරන ලද වැඩමුළු සහ සම්මන්ත්‍රණ

අංකය	ආයතනයේ නම	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු කරන ලද නිලධාරීන් ගණන
1	ලංකා ධීවර වරාය සංස්ථාව	තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා මාර්ග නඩත්තුව පිළිබඳ පුහුණුවක්	20
2	ශ්‍රී ලංකා දුම්රිය සේවය	ඇස්පෝල්ට් ඇතිරීම	25
එකතුව			45





2024 වර්ෂයේදී පවත්වන ලද ගෘහස්ථ පුහුණු වැඩසටහන්



2.1.16 නීති සේවාවන්



අධිකාරියේ සහ මහා මාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකවලට අදාල සියලුම නෛතික කරුණු සම්බන්ධව කටයුතු කිරීමේ මූලික වගකීම පැවරෙන්නේ නීති අංශයට ය. උසාවියේ පෙනී සිටීමට අමතරව සියලුම නෛතික කරුණු සම්බන්ධයෙන් සභාපතිට, අධ්‍යක්ෂ මණ්ඩලයට, සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට, ඉංජිනේරුවන්ට සහ සමස්ථ කාර්යමණ්ඩලයට උපදෙස් දීමේ වගකීම මෙම අංශයට පැවරේ.

ගිවිසුම්, ගැසට්, අමාත්‍යමණ්ඩල පත්‍රිකා, අබෝධනා ගිවිසුම්වල කෙටුම්පත් මෙම අංශය විසින් විශ්ලේෂණය කොට ඊට අදාළ නෛතික දෘෂ්ටිකෝණය සම්බන්ධ මත කළමනාකරණයට ලබා දෙයි. එය මා.සං. අධිකාරිය පාර්ශවකරුවෙකු වන, මහේස්ත්‍රාත් අධිකරණයෙන් පටන් ගෙන ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා වන සියලුම උපවාරාලයන්වලදී මෙන්ම බේරුම්කරණවලදී මාර්ග මා.සං. අධිකාරියේ කළමනාකරණය නියෝජනය කරනු ලබයි.

නීති අංශය, නෛතික කරුණු සහ නඩු කටයුතුවලදී මා.සං. අධිකාරිය නියෝජනය කිරීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරයි. නෛතික අංශය හා බැඳුණු කරුණු සම්බන්ධයෙන් කාර්යමණ්ඩලය සියලුම දෙනාට අධ්‍යාපනය ලබාදීමද මෙම අංශයේ ප්‍රමුඛ වගකීමක් වේ.

වසරවල ක්‍රියාකාරකම්වල ප්‍රගතිය.

1. ගොඩනැගිලි සීමාවන් උල්ලංඝනය කර ඇති අවස්ථා විශාල සංඛ්‍යාවක් විධායක ඉංජිනේරුවන් විසින් නිරීක්ෂණය කරති. එබැවින් 2008 අංක 40 දරන මංමාවත් පනතේ 45(3) සහ 50(3) වගන්ති යටතේ නඩු පැවරීමේ කාර්යය නීති අංශයට පවරා ඇත. ඒ අනුව, නීති අංශය විවිධ පළාත්වල මහේස්ත්‍රාත් අධිකරණවල නඩු 272 ක් ගොනු කර ඇති අතර එමගින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා නියෝග ලබා ගැනීමට සමත් වී ඇත.
2. මහාධිකරණ සහ දිස්ත්‍රික් අධිකරණ කටයුතුවලදී පෙත්සම්, පැමිණිලි, විරෝධතා, ඉදිරිපත් කිරීම් සහ පිළිතුරු කෙටුම්පත් කිරීම.
3. ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, සිවිල් අභියාචනා සහ වාණිජ මහාධිකරණයන්හි අභියාචනා ගොනු කිරීම සඳහා අභියාචනා සංක්ෂිප්තව සකස් කිරීම.
4. මාර්ග සංවර්ධන අධිකාරියේ (රජයේ ඉඩම්) මෙන්ම රජයේ නිල නිවාසවල ඉඩම් නැවත ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල ලේඛන සකස් කිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
5. ඉහත සඳහන් ක්‍රියාකාරකම් මාර්ග සංවර්ධන අධිකාරියට මාර්ග රක්ෂිත ඉවත් කිරීමට සහ ගොඩනැගිලි සීමාවන්හි අනවසර ව්‍යුහයන් ඉවත් කිරීමට උපකාරී වන අතර එමඟින් මාර්ග සංවර්ධනයට පහසුකම් සපයයි.
6. සාමාන්‍යයෙන්, මාර්ග ඉදිකිරීම් සඳහා අත්පත් කරගත් ඉඩම්වල හිස් සන්තකය ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත තිබිය යුතුය. එහෙත් ඇතැම් අවස්ථාවලදී, ඉඩම් හිමිකරුවන් සන්තකය භාරදීම ප්‍රතික්ෂේප කරති. ඉන්පසු නීති අංශයේ නීතිඥයින් විසින් අධිකරණයේ නඩු පවරා සේවයේ අවශ්‍යතාවය මත නෙරපා හැරීමේ නියෝග ලබා ගනිති.
7. රියදුරන්ගෙන් බහුතරයක් මාර්ග ගෘහ භාණ්ඩවලට සිදුවන හානි සඳහා ගෙවීම් පැහැර හැරීමට හුරු වෙති. රථවාහන අනතුරු හේතුවෙන් සිදුවන හානි සඳහා වන්දි ගෙවීම සඳහා හිමිකරුවන්, රියදුරන් සහ රක්ෂණකරුවන් ලුහුබැඳීමට නීති අංශයට හැකි වී තිබේ.

2024 වර්ෂයේදී නීති අංශය විසින් මෙහෙයවන ලද නඩු වල සාරාංශය.

විස්තරය	2023 *අවසානය දක්වා නඩු ගණන*	2024 වර්ෂයේදී මා.සං. අධිකාරියට එරෙහිව පවරන ලද නඩු ගණන	2024 වර්ෂයේදී මා.සං. අධිකාරිය විසින් බාහිර පුද්ගලයින්ට එරෙහිව පවරන ලද නඩු ගණන	*2024* වර්ෂයේදී අවසන් කරන ලද නඩු ගණන	*එකතුව*
ශ්‍රේෂ්ඨාධිකරණය	31	05	03	04	35
අභියාචනාධිකරණය	40	05	04	07	42
මහාධිකරණය	37	08	02	07	40
දිස්ත්‍රික් උසාවිය	127	06	03	19	117
මහේස්ත්‍රාත් අධිකරණය	271	0	51	187	135
කම්කරු විනිශ්චය සභාව	16	02	0	03	15
බේරුම්කරණය	6	0	0	01	05

2.1.17 ප්‍රසම්පාදන කළමනාකරණ සේවා



මා.සං. අධිකාරියේ ප්‍රසම්පාදන අංශය සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන්, මිළදී ගැනීමේ ක්‍රියාවලිය සහ වත්කම් අත්පත් කරගැනීමේ ප්‍රම්පාදන ක්‍රියාවලියේ තීරණාත්මක භූමිකාවක් ඉටුකරනු ලබන ආයතනයේම අනුකලන කොටසකි. ආයතනයේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය කරනු ලබන භාණ්ඩ, සේවා සහ වැඩ තෝරාගැනීම මෙම අංශය විසින් කළමනාකරණය කරනු ලැබේ. ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන වගකීම වන්නේ ගුණාත්මක බවින් යුත් භාණ්ඩ, සේවා සහ වැඩ තරහකාරී මිළට ලබාගැනීමය. ප්‍රසම්පාදන අංශය විසින් භාහිර සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ, සේවා සහ වැඩ අත්පත් කරගැනීමට අදාළ සියලුම පියවරයන් ආවරණය කරනු ලබන අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය කළමනාකරණය කිරීම, භාහිර පාර්ශවයන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවක් වර්ධනය කිරීම සහ කොන්ත්‍රාත් පිළිබඳව කතිකා කිරීම වැනි විවිධ කාර්යයන් ඉටුකරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ අරමුදල යටතේ ක්‍රියාකාරකම් සහිත ප්‍රසම්පාදන අංශයට ලබාදී ඇති විධිනියෝගය සහ වැඩ, ලිපිද්‍රව්‍ය, භාණ්ඩ හා සේවාවන් සහ, ඒ අනුව ප්‍රසම්පාදන අංශයේ ක්‍රියාකාරකම් පහත පරිදි වේ;

- ✧ හැකි හොඳම කොන්දේසි සහ නියමයන්ට අනුව වැඩ කටයුතු සඳහා හොඳම භාණ්ඩ, සේවාවන් සහ තරහකාරී කොන්ත්‍රාත්කරුවන් ලබාගත හැකිවන පරිදි හොඳම සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් හඳුනා ගැනීම, ඇගයීම සහ තෝරා ගැනීම.
- ✧ සියලුම ප්‍රසම්පාදන ක්‍රියාවලීන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්තිවලට අනුගතව සිදුකරන බවට වගබලා ගැනීම.
- ✧ මාර්ග/අධිවේගී මාර්ග/පාලම් ඉදිකිරීම්/වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදනය කිරීම සහ ලංසුකරුවන්ට උපදෙස්, ලංසු දත්ත, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි, විශේෂ සම්බන්ධතා කොන්දේසි, තාක්ෂණික පිරිවිතර, ප්‍රමාණ පත්‍ර, ඉදිකිරීම් සිතියම් ඇතුළත් කෙටුම්පත්, ලංසු ලේඛන සකස් කිරීම සහ ස්ථානීය පරීක්ෂාවන් සහ පූර්ව ලංසු රැස්වීම් පැවැත්වීම, පරිශිෂ්ඨ සකස් කිරීම සහ නිකුත් කිරීම, පැහැදිළි කිරීම් ඉල්ලා සිටින අවස්ථාවලදී ඒවාට ප්‍රතිචාර දැක්වීම, ලංසු ඇගයීම සඳහා තාක්ෂණික කමිටුවට සහායවීම, ප්‍රසම්පාදන කමිටුවලට තාක්ෂණික කමිටු වාර්තා ඉදිරිපත් කිරීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම, සාකච්ඡා සහ අභියාචනා ක්‍රියාවලිය පැවැත්වීම, කොන්ත්‍රාත් ගිවිසුම ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සඳහා කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීම ඇතුළත් වේ.
- ✧ ආයතනයේ අනෙකුත් සේවා අවශ්‍යතා සඳහා කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදනය කිරීම සහ භාණ්ඩ සැපයීම සඳහා වෙළෙන්දන් ප්‍රසම්පාදනය කිරීම සිදු කෙරේ.
- ✧ පූර්ව සූදුසුකම් ලේඛන පිළියෙල කිරීම, උනන්දුව දැක්වීමේ ලේඛණ බැලීම, පූර්ව සූදුසුකම් සඳහා ඇගයීම සහ, මාර්ග/මහා මාර්ග, පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා කෙටි ලැයිස්තු පිළියෙල කිරීම.
- ✧ ඉදිකිරීම් අධීක්ෂණය, මහාමාර්ග සැලසුම් කිරීම, පාලම් සහ අනෙකුත් මාර්ග ව්‍යුහකරුවන්ගේ ව්‍යුහාත්මක සැලසුම්, මාර්ග/අධිවේගී මාර්ග/පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයන සඳහා උපදේශකයින් ප්‍රසම්පාදනය කිරීම සහ උපදේශකයින් සඳහා උපදෙස්, යොමු නියමයන්, තාක්ෂණික යෝජනාව, මූල්‍ය යෝජනාව, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි, කොන්ත්‍රාත් ඇගයීමේ නිර්ණායකවල විශේෂ කොන්දේසි සහ පූර්ව යෝජනා රැස්වීම් පැවැත්වීම, පරිශිෂ්ඨ සකස් කිරීම සහ නිකුත් කිරීම, පැහැදිලි කිරීම් වලට ප්‍රතිචාර දැක්වීම, මිළ ගණන් ඇගයීම සඳහා උපදේශන ප්‍රසම්පාදන කමිටුවලට (CPC) සහායවීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම, කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සංවිධානය කිරීම සඳහා සාකච්ඡා සහ අභියාචනා ක්‍රියාවලිය පැවැත්වීම, කොන්ත්‍රාත් ලේඛනය සකස් කිරීම.

  උපදේශන සේවා හැර අනෙකුත් සේවාවන් සඳහා කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදනය කිරීම, ඒ සඳහා ලංසුකරුවන්ට උපදෙස්, ලංසු දත්ත, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි, විශේෂ සම්බන්ධතා කොන්දේසි, සේවායෝජක අවශ්‍යතා, මිල කාලසටහන, තාක්ෂණික කමිටුවලට සහාය වීම, ප්‍රසම්පාදන කමිටුවලට තාක්ෂණික කමිටු වාර්තා ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන කමිටුවලට සහායවීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම, සාකච්ඡා පැවැත්වීම සහ අභියාචනා ක්‍රියාවලිය, කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සංවිධානය කිරීම, කොන්ත්‍රාත් ලේඛනය සකස් කිරීම සහ ලංසු ලේඛන සකස් කිරීම ඇතුළත් වේ.

- ✧ සැපයුම් භාණ්ඩ සඳහා වෙළෙන්දන් ප්‍රසම්පාදනය කිරීම සහ ඒ සඳහා වෙළෙන්දන්ට උපදෙස්, ලංසු දත්ත, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි, විශේෂ සම්බන්ධතා කොන්දේසි, සේවායෝජක අවශ්‍යතා, මිල කාලසටහන ඇතුළත් ලංසු ලේඛන සකස් කිරීම ඇතුළත් වේ. භාණ්ඩ භාරදීමේ කාලසටහන සහ තාක්ෂණික කමිටු සඳහා සහාය වීම, තාක්ෂණ කමිටු වාර්තා ප්‍රසම්පාදන කමිටුවලට ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන කමිටුවලට සහායවීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම, කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සංවිධානය කිරීම සඳහා සාකච්ඡා සහ අභියාචනා ක්‍රියාවලීන් පැවැත්වීම, කොන්ත්‍රාත් ලේඛනය සකස් කිරීම.
- ✧ අනෙකුත් සියලුම අංශ සමඟ ඔවුන්ගේ ප්‍රසම්පාදන අවශ්‍යතා පිළිබඳව සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය සහාය සහ මඟ පෙන්වීම ලබා දීම.
- ✧ ප්‍රසම්පාදනය ආශ්‍රිත ප්‍රශ්න, පුහුණුව, රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සඳහා ප්‍රාථමික සම්බන්ධතාවය ලෙස කටයුතු කිරීම.
- ✧ මාර්ග සංවර්ධන අධිකාරියේ මානව සම්පත් සංවර්ධන අංශයේ සහාය ඇතිව ප්‍රසම්පාදනය ආශ්‍රිත පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම සහ පැවැත්වීම.
- ✧ මාර්ග සංවර්ධන අධිකාරිය තුළ විද්‍යුත් රජයේ ප්‍රසම්පාදන (e-GP) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කිරීම.

2024 වර්ෂය තුළ ප්‍රගතිය සහ ක්‍රියාකාරකම්

ප්‍රසම්පාදන අංශය විසින් සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ සාරාංශය - 2024

අංකය	අයිතම විස්තරය	සිදුකරන ලද කාර්යයේ මුළු වටිනාකම (රු.)
1.	වත්කම්, ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය	56,640,191.13
2.	භාණ්ඩ, වැඩ සහ සේවාවන්	5,207,955,866.05
සිදු කරන ලද වැඩවල මුළු වටිනාකම (වැට් රහිත)		5,264,596,057.18

සිදු කරන ලද විවිධ කාර්යයන් පිළිබඳ සාරාංශය

- සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024 වර්ෂය
- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම - 2024වර්ෂය
- කොන්ත්‍රාත් ප්‍රදානය කඅරීම් සම්මාන වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කිරීම.
- ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම (2024-2027)
- මා.සං. අධිකාරියේ සියලුම අංශ සඳහා ලංසු සඳහා ආරාධනාවක් මා.සං. අධිකාරයේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරීම.

2.1.18 මානව සම්පත් කළමනාකරණය



මානව සම්පත් කළමනාකරණයේ (HRM) අරමුණ වන්නේ සේවක තෘප්තිය වැඩි කරන සහ ඵලදායිතාව වැඩි දියුණු කරන වැඩ පරිසරයක් ඇති කිරීමයි. එය ආයතනික වර්ධනයට මහ පාදන කුසලතා ආකර්ෂණය කර ගැනීමට, සේවකයින් රඳවා ගැනීමට සහ ඔවුන්ව උත්තේජනය කිරීමට උපකාරී වන වැඩපිළිවෙලක් නිර්මාණය කිරීමට උපකාරී වේ.

මානව සම්පත් යනු කුසලතා, දැනුම, කුසලතා, නිර්මාණශීලිත්වය සහ හැකියාවන් ඇති ආයතනයක් තුළ සේවය කරන පුද්ගලයින්ය. යන්ත්‍ර හෝ මූල්‍ය වත්කම් මෙන් නොව, මානව සම්පත්වලට නවෝත්පාදනය කිරීමට, ගැටළු විසඳීමට සහ ඔවුන්ගේ කාර්යයට පෞද්ගලික බැඳීමක් ඇති කළ හැකිය.

මා.සං. අධිකාරිය; මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන (HRM සහ පරිපාලන) අංශය, ආයතනයේ මෙහෙවර සාක්ෂා කරගැනීම සඳහා කුසලතා ඇති, අභිප්‍රේරිත සහ කාර්යක්ෂම ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීමට සහ රඳවා තබා ගැනීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. උපායමාර්ගික සහ ව්‍යුහගත ප්‍රවේශයක් ඔස්සේ ඵලදායිතාව සහ රැකියා තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් මානව සම්පත් අංශය සහ පරිපාලන අංශය විසින් සිදුකරනු ලැබේ.

- ✧ වත්මන් ශ්‍රම බලකායේ හැකියාවන් සහ අනාගත මානව සම්පත් විශ්ලේෂණය කිරීම සඳහා මා.සං. අධිකාරියේ ඉලක්ක සමඟ පෙළගැස්වීම.
- ✧ රැකියා විස්තර සහ අවශ්‍යතා පැහැදිළි, අදාළ සහ ආයතනයේ ඉලක්ක සහ කාර්යභාරයට අනුකූල බවට වගබලාගැනීම සඳහා ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීම.
- ✧ රැකියා ප්‍රසිද්ධ කිරීම්, සම්මුඛ පරීක්ෂණ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලි ඔස්සේ සුදුසුකම්ලත් අපේක්ෂකයින් ආකර්ෂණය කර ගැනීම සහ බඳවා ගැනීමේ වගකීම ඇත.
- ✧ නව සේවකයින් ආයතනයට විධිමත්ව ඒකාබද්ධ කර, ආයතනයේ දිශානතිය සහ අපේක්ෂාවන් සකස් කිරීමට වගබලා ගැනීම.
- ✧ සේවකයින්ට උසස්වීම්, කුසලතා වැඩිදියුණු කිරීමට හෝ අධ්‍යාපනික වැඩසටහන් සඳහා අවස්ථා ලබා දීමෙන් වෘත්තීය වර්ධනයට උපකාර කරයි.
- ✧ වේතන හා පරිපාලනය.
- ✧ ප්‍රතිලාභ කළමනාකරණය: සෞඛ්‍ය රක්ෂණය, නිවාඩු ප්‍රතිපත්ති සහ ප්‍රසාද දීමනා ඇතුළු ප්‍රතිලාභ පැකේජ අධීක්ෂණය කිරීම.
- ✧ ධනාත්මක වැඩ පරිසරයක් පවත්වා ගැනීම පිණිස සේවකයින් අතර හෝ සේවකයින් සහ කළමනාකාරිත්වය අතර ආරවුල් සහ දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම.
- ✧ සේවකයින් අභිප්‍රේරණය කර, තෘප්තිමත් කර, සංවිධානය කෙරෙහි කැපවීමෙන් කටයුතු කිරීමට අදාළ වැඩසටහන් සංවර්ධනය කිරීම.
- ✧ විනය ක්‍රියාමාර්ග: හැසිරීම් ගැටළු, දුර්වල කාර්යසාධනය, නොසැලකිල්ල ආදියට අදාළ ගැටළු සතුටුදායක ලෙස සහ නීත්‍යානුකූලව විසඳීම.
- ✧ වෙනස්කම් කිරීම, හිරිහැර කිරීම, වැටුප් සහ ආරක්ෂාවට අදාළ රැකියා නීති ඇතුළුව ආයතනය රැකියා නීතිවලට අනුකූල වන බවට වගබලා ගැනීම.
- ✧ සියලුම සේවකයින්ට නීත්‍යානුකූල විධිමත් කොන්ත්‍රාත්තු ඇති බවටත් ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව දැනුවත් බවටත් වගබලා ගැනීම.

මානව සම්පත් කළමනාකරණය සේවකයින්ට සහාය වන එදිනෙදා කාර්යයන් කළමනාකරණය කරනවා පමණක් නොව, ආයතනයේ දීර්ඝකාලීන කාලීන ඉලක්ක සපුරා ගැනීමට සහායවීමේදී උපායමාර්ගික හවුල්කරුවෙකු ලෙසද ක්‍රියා කරයි. ධනාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීමෙන් සහ කර්මාන්තයේ හොඳම භාවිතයන් සහ නීති රාමු සමඟ පෙළගැස්වීම සහතික කිරීම මගින්, මානව සම්පත් කළමනාකරණය සහ පරිපාලන අංශය මා.සං. අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී සමස්ත කාර්යක්ෂමතාව, තිරසාරභාවය සහ සාර්ථකත්වයට සැලකිය යුතු දායකත්වයක් සපයයි.

2024 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රම බලකාය පිළිබඳ දළ විශ්ලේෂණය

කාර්යමණ්ඩල වර්ගය		ක.සේ.දෙ. විසින් අනුමත සේවක සංඛ්‍යාව			2024.12.31 දිනට මුළු සේවක සංඛ්‍යාව		
		ස්ථිර	Personal to Holders	කොන්ත්‍රාත්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්
ඉහළ කළමනාකරණය (HM)	ඉංජිනේරු	116	-	-	99	-	-
	ඉංජිනේරු නොවන	22	-	-	06	-	-
	අනු එකතුව	138	-	-	105	-	-
මැද කළමනාකරණය (MM)	ඉංජිනේරු	444	159	-	540	-	-
	අනිකුත් තාක්ෂණික	34					
	පරිපාලන	19					
	ගිණුම්/විගණන	31					
	වෙනත්	17	4	-	68	10	-
	අනු එකතුව	545	163	-	608	10	
කණිෂ්ඨ කළමනාකරණය (JM)	පරිපාලන	47	79	-	25	-	-
	ගිණුම්/විගණන	70	-	-	43	-	-
	තාක්ෂණික/සමාන්තර	83	-	-	54	-	-
	වෙනත්	61	-	-	114	-	-
	උප එකතුව	261	79	-	236	-	-
කළමනාකාර සහකාර (MA)	ලිපිකාර / සමාන්තර	1,083	24	6	1,062	52	-
	තාක්ෂණික/සමාන්තර	766	209	4	883	18	-
	ප්‍රධාන අයකම් සහ අයකැමි	869	-	87	843	100	-
	වෙනත්	179	74	8	200	16	-
	උප එකතුව	2897	307	105	2988	186	-
ප්‍රාථමික (PL)	තාක්ෂණික කාර්යමණ්ඩලය	597	-	-	421	3	-
	රියදුරු සහ සමාන්තර	841	-	2	731	49	-
	කාර්යල කාර්ය සහායක සහ සමාන්තර	301	-	-	268	4	-
	නඩත්තු කම්කරු	2,800	-	-	1,994	-	1,025
	වෙනත්	407	161	-	634	12	-
	උප එකතුව	4,946	161	2	4,048	68	1,025
එකතුව		**8,787**	**710**	**107**	**7,985**	**264**	**1,025**

2024 වර්ෂයේදී බඳවා ගැනීම් ඉතා සීමිත වූ අතර, විවිධ හේතූන් මත සේවකයින් ආයතනය හැරයාම සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුනි.

පසුගිය වසර පහ තුළ (2020-2024) සේවකයින් බඳවා ගැනීමට සහ සේවය හැරයාම පිළිබඳ සාරාංශය

විස්තරය	වර්ෂය				
	2024	2023	2022	2021	2020
බාහිර බඳවා ගැනීම්	3	5	308	321	289
බඳවා ගැනීම්	121	137	123	93	14
ඉල්ලා අස්වීම්	135	104	78	21	12
සේවය හැර යෑම්	56	86	55	20	11
සේවය අවසන් කිරීම්	5	5	1	1	2
මරණ	12	13	16	16	3
Total	329	345	273	151	42

මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන අංශය මුහුණ දෙන ගැටළු

මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන අංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය අභියෝග කිහිපයකට මුහුණ දුන් අතර, එය ආයතනයේ ඵලදායී ප්‍රගමනයට බලපෑවේය:

- විධිමත් මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිකම: ඒකාබද්ධ මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිකම, කාර්යක්ෂම දත්ත කළමනාකරණයට සහ ක්‍රියාවලි ස්වයංක්‍රියකරණයට බාධාවකි.
- බඳවා ගැනීම් අත්හිටුවීම: පසුගිය වසර කිහිපය තුළ බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීම, කාර්ය මණ්ඩලයේ අනෘජුතියට මෙන්ම බොහෝ තනතුරුවල ශ්‍රම හිඟයකට ද හේතු වී තිබේ.
- මානව හා ද්‍රව්‍යමය සම්පත් නොමැතිකම: අංශය, සම්පත් හිඟකමට මුහුණ දුන් අතර, එය එහි අරමුණු සපුරා ගැනීමේ හැකියාවට බලපාන ලදි.
- වෙනස් වීමට ඇති ප්‍රතිරෝධතාව: නව කළමනාකරණ තීරණ සහ ක්‍රියාවලීන් අනුගමනය කිරීමට සේවකයින් දැක්වූ ප්‍රතිරෝධය, නවීකරණ ප්‍රයත්නයන්ට බාධාවක් විය.
- සන්නිවේදන හිඩැස්: අකාර්යක්ෂම අභ්‍යන්තර සන්නිවේදන මාර්ග සමහර විට වැරදි වැටහීම් ඇතිවීමට සහ තීරණ ගැනීමේදී ප්‍රමාදයන් ඇති කරයි.
- ප්‍රමාණවත් නොවන කාර්යසාධන කළමනාකරණ පද්ධති: පුළුල් කාර්යසාධන ඇගයීම් රාමුවක් නොමැතිකම සේවක ඵලදායිතාව නිවැරදිව තක්සේරු කිරීමට සහ වැඩි දියුණු කිරීමට ඇති හැකියාව සීමා කරයි.

මෙම අතිරේක සීමාවන්ට මුහුණ දීම, එහි සමස්ත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සහ මාර්ග සංවර්ධන අධිකාරියේ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීමට උපකාරීවීමේදී අත්‍යවශ්‍ය වනු ඇත.

අනාගතය සඳහා යෝජිත ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග

මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන අංශය මුහුණ දෙන අභියෝගවලට මුහුණදීම සහ අඛණ්ඩ ප්‍රගතිය සඳහා වගබලා ගැනීමට පහත සඳහන් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග යෝජනා කෙරේ:

- මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (HRMIS) ක්‍රියාත්මක කිරීම: මානව සම්පත් ක්‍රියාවලීන් විධිමත් කිරීම, දත්ත නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සහ තීරණ ගැනීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ HRMIS සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- E-HRM පහසුකම් හඳුන්වාදීම: සමස්ත වැඩ ප්‍රවාහය වැඩිදියුණු කිරීම සඳහා සේවක වාර්තා, වැටුප් ලේඛන, කාර්යසාධන ඇගයීම් ආදිය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා විද්‍යුත් මානව සම්පත් වේදිකා ස්ථාපිත කිරීම.

- සේවක සහභාගීත්ව ආරම්භ කිරීම: නිතිපතා ප්‍රතිචාර යාන්ත්‍රණ, පිළිගැනීමේ වැඩසටහන් සහ ධනාත්මක වැඩ සංස්කෘතියක් ඇතිකිරීමට කරනු ලබන ක්‍රියාකාරකම් හරහා සේවක සහභාගීත්වය ශක්තිමත් කිරීම.

- ප්‍රතිපත්ති ප්‍රමිතිකරණය සහ බලාත්මක කිරීම: ආයතනය පුරා මානව සම්පත් ප්‍රතිපත්ති ප්‍රමිතිකරණය කිරීම සහ ස්ථාවරව බලාත්මක කිරීමට වගබලා ගැනීම, සාධාරණත්වය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම.

- සෞඛ්‍ය සම්පන්න කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම: පුළුල් කාර්යසාධන ඇගයීම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා, සේවක කාර්යසාධනය නිතිපතා තක්සේරු කිරීම, ප්‍රතිචාර ලබාදීම සහ සංවර්ධනය සඳහා ක්ෂේත්‍ර හඳුනාගැනීම. මෙම පද්ධතිය ඉහළ කාර්යසාධකයින් හඳුනා ගැනීමට සහ අකාර්යක්ෂමතා ආමන්ත්‍රණය කිරීමට උපකාරී වනු ඇත.

- සේවක සන්නිවේදන මාර්ග ශක්තිමත් කිරීම: ඩිජිටල් වේදිකා, නිතිපතා කණ්ඩායම් රැස්වීම් සහ ප්‍රතිචාරාත්මක සමීක්ෂණ හඳුන්වාදීම මගින් අභ්‍යන්තර සන්නිවේදන යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම. විනිවිද සහ විවෘත සන්නිවේදනය, සංවිධානය තුළ විශ්වාසය සහ සහයෝගිතාවය වර්ධනය කරනු ඇත.

2.1.19 මූල්‍ය කළමනාකරණය



මා.සං. අධිකාරියේ මූල්‍ය අංශය, මනා මූල්‍ය කළමනාකරණයක්, වගවීම සහ විනිවිදභාවය වගබලා ගැනීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශය විශේෂිත අංශ නවයක් (9) ආවරණය කරන අතර, ඒ සෑම අංශයක්ම ආදායම් එකතු කිරීම සහ අයවැයකරණයේ සිට වැටුප් ගෙවීම, වත්කම් කළමනාකරණය සහ අවසන් ගිණුම් සකස් කිරීම දක්වා ප්‍රධාන මූල්‍ය කාර්යයන් කෙරෙහි අවධානය යොමු කරයි. එය ක්‍රියාත්මක වන්නේ දක්ෂ ගණකාධිකාරීවරුන් සහ සහායක කාර්යමණ්ඩලයක දායකත්වයෙනි. මූල්‍ය ප්‍රතිපත්ති, මහ පෙන්වීම සහ උපායමාර්ගික අරමුණු සමඟ අරමුදල් කළමනාකරණය කිරීම සඳහාද මෙම අංශය දායක වේ.

ව්‍යුහය සහ වගකීම්

මූල්‍ය අංශයේ ප්‍රධානත්වය දරනු ලබන්නේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය සහ දේපළ කළමනාකරණ) විසින් වන අතර, ඔහු යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනෙකු (මෙහෙයුම්, මූල්‍ය සහ ආයතනික මූල්‍ය) ක්‍රියාත්මක වේ. සෑම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුම විසින්ස අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු අධීක්ෂණය කරනු ලබන, සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ ගණකාධිකාරී කණ්ඩායමක් අධීක්ෂණය කරනු ලබයි

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය (ආයතනික මූල්‍ය) - ඒකක සහ මූලික කාර්යයන් පිළිබඳ සාරාංශ වගුව

අංකය	ඒකකය	ප්‍රධාන කාර්යයන්
1	අයවැය සහ බදු ඒකකය	✧ පොදුකාර්ය අයවැය සකස් කිරීම සහ, අංශ සහ කලාප සඳහා අරමුදල් වෙන් කිරීම.
		✧ මුදල් පනතට අනුකූලව සමස්ත අයවැය සම්පාදනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම.
		✧ ගණනය කිරීම, වාර්තා ඉදිරිපත් කිරීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය ඇතුළු බදු සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීම.
2	අවසන් ගිණුම් ඒකකය	✧ මාසික ගිණුම් සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.
		✧ පොදු ලෙජර පවත්වාගෙන යාම සහ ප්‍රාදේශීය ගිණුම්කරණ අංශ සමඟ සම්බන්ධීකරණය කිරීම.
		✧ විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීමට පහසුකම් සැලසීම.
		✧ මා.සං. අධිකාරිය අනුබද්ධ සමාගම් සමඟ සැසඳුම් කළමනාකරණය කිරීම.
3	ආදායම් ඒකකය	✧ අධිවේගී මාර්ග ගාස්තු, සේවාදායක තැන්පතු, කුලී ගාස්තු, ගෑන්ට්‍රි සහ පරීක්ෂණ සේවා වැනි ප්‍රභවයන්ගෙන් ආදායම් රැස් කිරීම.
		✧ අංශ හරහා ආදායම් කාර්යක්ෂමව වෙන් කිරීම සහ බෙදා හැරීම.
		✧ යටිතල පහසුකම් නඩත්තුව සහ සංවර්ධනය සඳහා භාණ්ඩාගාර අරමුදල් බෙදා හැරීම.
4	කලාපීය ගිණුම් ඒකකය	✧ ප්‍රාදේශීය සහ අධිවේගී මාර්ග ගණකාධිකාරීවරුන්ට අග්‍රිම නිදහස් කිරීම.
		✧ මූල්‍ය වාර්තාකරණය සඳහා පළාත් ගිණුම්කරණ දත්ත ඒකාබද්ධ කිරීම.

ඒකක සහ මූලික කාර්යයන් පිළිබඳ සාරාංශ වගුව - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය (මෙහෙයුම් මූල්‍ය)

අංකය	ඒකකය	ප්‍රධාන කාර්යයන්
1	වැටුප් ඒකකය	✧ මාසික වැටුප් හා වැටුප් ගෙවීම් සැකසීම.
		✧ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) වැනි ව්‍යවස්ථාපිත අයකිරීම් කිරීම් කළමනාකරණය කිරීම.
		✧ කාර්ය මණ්ඩල ණය පරිපාලනය කිරීම සහ ඒවා අයකර ගැනීම නිරීක්ෂණය කිරීම.
2	ගෙවීම් ඒකකය	✧ වැටුප්, ණය, ඉන්ධන, කුලිය, නඩත්තුව සහ කාර්යාල අවශ්‍යතා වැනි පොදුකාර්ය වියදම්වලට අදාළ ගෙවීම් සැකසීම.
		✧ අග්‍රිම නිකුතු කළමනාකරණය කිරීම සහ ඵලදායී මූල්‍ය පාලනය සහතික කිරීම.
3	වත්කම් සහ ගබඩා ඒකකය	✧ ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාලවලට කාර්යාල උපකරණ සහ ලිපි ද්‍රව්‍ය සැපයීම.
		✧ යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි, ඉඩම් සහ වාහන ඇතුළු වත්කම් සඳහා ලේඛන පවත්වාගෙන යාම.
		✧ වාර්ෂිකව, දිවයින පුරා භෞතික සත්‍යාපන පැවැත්වීම.
		✧ නිම කරන ලද ව්‍යාපෘති වලින් වත්කම් මාරු කිරීම සහ සේවා කළ නොහැකි අයිතම බැහැර කිරීම කළමනාකරණය කිරීම.
4	විවිධ ගෙවීම් ඒකකය	✧ සහභාගීත්ව වෛද්‍ය යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම.
		✧ ඒකාබද්ධ සහ පරිවර්තිත දීමනා, අතිකාල, නිවාඩු වැටුප් සහ සහනදායී ණය සඳහා පොලී ප්‍රතිපූරණ වැනි ගෙවීම් සැකසීම.
5	දේපළ කළමනාකරණ සහ ආදයම් ඒකකය	✧ කුලී ප්‍රතිපත්ති සහ ගාස්තු සංවර්ධනය කිරීම සහ නිර්දේශ කිරීම.
		✧ මාර්ග සංවර්ධන අධිකාරිය සතු දේපළෙහි තිබෙන පුවරු, දැන්වීම් පුවරු, ගැන්ට්‍රි සහ අනෙකුත් ව්‍යුහයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
		✧ මාර්ග අද්දර විවේක ස්ථාන, වාහන නැවැත්වීමේ පහසුකම් සහ වීදි ආහාර උත්සව වැනි ආදායම් උත්පාදන ප්‍රයත්නයන් ප්‍රවර්ධනය කිරීම.

මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මූල්‍ය අංශයේ දායකත්වය

මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය ස්ථාවරත්වය ලබා දීමෙන්, මාර්ග සංවර්ධන අධිකාරියේ සාර්ථකත්වය වගබලා ගැනීමට මූල්‍ය අංශය මූලික කාර්යභාරයක් ඉටු කරයි. ඵලදායී මූල්‍ය කළමනාකරණ පිළිවෙත් පවත්වා ගැනීමෙන්, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන, ජාතික සම්බන්ධතාවය වැඩිදියුණු කරන සහ ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරන අත්‍යවශ්‍ය මාර්ග යටිතල පහසුකම් ව්‍යාපෘති සැපයීමට මෙම අංශය මාර්ග සංවර්ධන අධිකාරියට සහාය වේ.

2024 දී, ණය කළමනාකරණය, අරමුදල් සුරක්ෂිත කිරීම සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට වගබලා ගැනීම සඳහා මූල්‍ය අංශයේ උත්සාහයන් මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය විය. මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීමට, මූල්‍ය අවශ්‍යතා පුරෝකථනය කිරීමට සහ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලවීම වගබලා ගැනීමට අංශයට ඇති හැකියාව, දිගුකාලීන වර්ධනය සහ තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කිරීමට මා.සං. අධිකාරියට ඉඩ සලසන ලදි.

මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශය එහි මූල්‍ය මෙහෙයුම්වල හදවත වන අතර, එමඟින් සංවිධානයට මාර්ග සංවර්ධන ව්‍යාපෘති ඵලදායීව සහ විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කළ හැකි බවට වගබලා ගනී. ප්‍රවේශමෙන් සැලසුම් කිරීම, අයවැයකරණය සහ මූල්‍ය කළමනාකරණය තුළින්, රටේ සමස්ත ආර්ථික ප්‍රගතියට දායක වෙමින් මාර්ග සංවර්ධන අධිකාරියට එහි යටිතල පහසුකම් ඉලක්ක සපුරා ගත හැකි බවට අංශය වගබලා ගනී.

අභියෝග සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර

පද්ධති ඒකාබද්ධ කිරීම: අංශ හරහා ඩිජිටල් ඒකාබද්ධ කිරීමක් නොමැති අතර, එය කාර්යක්ෂමතාවයට සහ තත්‍ය කාලීන දත්ත දෘශ්‍යතාවයට බාධාවක් විය හැකිය.

සාමාන්‍ය ක්‍රියාවලි: සාමාන්‍ය ක්‍රියාවලි මත දැඩි ලෙස එල්බගෙන සිටීම, ප්‍රමාදයන් සහ දෝෂ වලට හේතු වේ.

සම්පත් වෙන් කිරීම: කලාපවල වැඩිවන වැඩ ප්‍රමාණය සඳහා වැඩි මානව හා තාක්ෂණික සම්පත් අවශ්‍ය වේ.

වසරක සමාලෝචනය

2024 දී, ශ්‍රී ලංකාවේ මා.සං. අධිකාරිය යටිතල පහසුකම් සංවර්ධනය, මූල්‍ය කළමනාකරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගත්තේය.

මූල්‍ය කළමනාකරණය සහ ණය පියවීම

මාර්ග සංවර්ධන කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුව තිබූ ණයවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පියවීම හැකිවීම මූල්‍ය අංශය ලැබූ වැදගත් ජයග්‍රහණයකි. මෙම ගෙවීම් සිදු කරන ලද්දේ ණය මත පදනම් වූ කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම් නතර කිරීම සඳහා අවශ්‍ය වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කොන්දේසිවලට අනුකූලවීම සඳහා ය. රජයේ කැපවීම තුළින් කොන්ත්‍රාත්කරුවන්ට කලට වේලාවට ගෙවීම් ලැබෙන බවට වගබලා ගන්නා අතර, එමඟින් ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ පරිසරයක් නිර්මාණය විය.

අධිවේගී මාර්ගවලින් ආදායම් උත්පාදනය

විශේෂයෙන් උපරිම ධාවන කාලවලදී මාර්ග සංවර්ධන අධිකාරියේ අධිවේගී මාර්ග ආදායමේ සැලකිය යුතු වැඩිවීමක් පෙන්වන ලදී.

උත්සව සමයේදී රථවාහන ධාවනය වැඩිවීම හේතුවෙන් මෙම ආදායමේ වැඩිවීම සිදුවූ අතර, එමඟින් ජාතික සම්බන්ධතාවය සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අධිවේගී මාර්ගවල කාර්යභාරය කැපී පෙනෙන්නට විය.

සංවර්ධන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සහ ආරම්භ කිරීම

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් අවසන් කිරීමෙන් සහ අවශ්‍ය අරමුදල් ලබා ගැනීමෙන් පසු, ඇණහිට තිබූ සංවර්ධන ව්‍යාපෘති නැවත ආරම්භ කරන බව රජය නිවේදනය කළේය. ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීම සහ රට පුරා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් මාර්ග සංවර්ධනය සඳහා මෙන්ම කුඩා මාර්ග ව්‍යාපෘති සඳහා ද ප්‍රතිපාදන වෙන් කරන ලදී.

සමස්තයක් වශයෙන්, 2024 වසර මා.සං. අධිකාරිය සැලකිය යුතු ප්‍රගතියක් ලැබූ වසරක් වූ අතර, එය මූල්‍ය විචක්ෂණභාවය, මහජන ආරක්ෂාව සහ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම මගින් පෙන්වන ලදී.

මූල්‍ය ඉස්මතු කිරීම්

අනුපාතය	2023	2024	නැඹුරුව
ශුද්ධ අතිරික්ත ආන්තිකය	34.44%	19.21%	↓
ජිගම අනුපාතය	0.89	0.99	↑
ක්ෂණ අනුපාතය	0.87	0.96	↑
ණය ස්කන්ධ අනුපාතය	0.46	0.40	↓
මෙයෙහුම් වියදම් අනුපාතය	4%	6%	↑
ප්‍රදාන යැපුම් අනුපාතය	94%	90%	↓
ස්වයං මූල්‍යකරණ අනුපාතය	28.6%	33%	↑

2024 දී, ආයතනය ප්‍රධාන මූල්‍ය දර්ශක කිහිපයක කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කළ අතර, එය වැඩිදියුණු කළ මූල්‍ය තිරසාරභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබිඹු කරයි.

2023 දී 34.44% ක් වූ ශුද්ධ අතිරික්ත ආන්තිකය 19.21% දක්වා පහත වැටුණු අතර, බොහෝ දුරට එය, මෙහෙයුම් වියදම්වල සාපේක්ෂ වැඩිවීම හේතුවෙන් සිදු වූ බව මෙහෙයුම් අංශය පෙන්වා දෙයි. වියදම් අනුපාතය 4% සිට 6% දක්වා ඉහළ ගියේය.

කෙසේ වෙතත්, ස්වයං-මූල්‍යකරණ අනුපාතය ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, 2023 දී 28.6% සිට 2024 දී 33% දක්වා ඉහළ ගොස් ඇති අතර, අභ්‍යන්තරව උත්පාදනය කරන ලද අරමුදල් හරහා වියදම් ආවරණය කිරීමේ ධාරිතාව වැඩි දියුණුවී ඇති බව පෙන්නුම් කරයි.


ඒ හා සමානව, ප්‍රදාන යැපුම් අනුපාතය 94% සිට 90% දක්වා අඩු වූ අතර, එය ආදායම් විවිධාංගීකරණය උදෙසා ප්‍රගතියක් සනිටුහන් කරයි.

ද්‍රවශීලතාවයද වැඩිදියුණු වූ අතර, වත්මන් අනුපාතය 0.89 සිට 0.99 දක්වා සහ ක්ෂණික අනුපාතය 0.87 සිට 0.96 දක්වා ඉහළ ගිය අතර, එය කෙටි කාලීන මූල්‍ය තත්තවයේ ශක්තිමත් බවක් පෙන්නුම් කරයි.

තවද, ණයට ගත් අරමුදල් මත යැපීම අඩුවීම සහ වඩාත් ස්ථාවර ප්‍රාග්ධන ව්‍යුහයක් පිළිබිඹු කරමින් ණය-කොටස් අනුපාතය 0.46 සිට 0.40 දක්වා අඩු විය.

සමස්තයක් වශයෙන්, 2024 වසරේ මූල්‍ය කාර්යසාධනය වැඩි ස්වයං විශ්වාසයක්, ශක්තිමත් ද්‍රවශීලතාවයක් සහ විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණයක් කරා ධනාත්මක මාරුවක් පෙන්නුම් කරයි. මෙම වර්ධනයන් ආයතනයේ තිරසාර වර්ධනය සඳහා ශක්තිමත් පදනමක් මත පවතින අතර බාහිර අරමුදල් මත යැපීම අඩු කරයි.


රජයේ ආදායමට දායකත්වය



බදු, වැට් බදු, SSCl සහ ආදායම් බදු ගෙවීම්


භාණ්ඩාගාරයට බදු ගෙවීම් හරහා මා.සං. අධිකාරිය විසින් රජයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. 2020 සහ 2021 සංඛ්‍යාලේඛන සලකා බැලීමේදී, මා.සං. අධිකාරිය සෑම වසරකම රුපියල් මිලියන 4,000 ක් අඛණ්ඩව ගෙවා ඇත. කෙසේ වෙතත්, 2022 දී බදු ගෙවීම් රුපියල් මිලියන 325.35 දක්වා පහත වැටුණි. ඉන් පසුව 2023 දී කැපී පෙනෙන වැඩිවීමක් සිදු වූ අතර, බදු මුදල් රුපියල් මිලියන 1,748 දක්වා ඉහළ ගිය අතර, 2024 දී තවදුරටත් එය රුපියල් මිලියන 2,044 දක්වා වැඩිවිය. මෙම දායකත්වයන්, විශේෂයෙන් යටිතල පහසුකම් සංවර්ධනය සහ පොදු සේවා ක්ෂේත්‍රවල රජයේ මූලපිරීම් සඳහා සහාය වීමට මා.සං. අධිකාරියේ අඛණ්ඩ කැපවීම කැපී පෙනේ.

මූල්‍ය කාර්යසාධනයේ කෙටි ඡායාරූපයක්



වත්කම් වර්ධනය

2020 දී රුපියල් බිලියන 974 ක් වූ ජංගම නොවන වත්කම් 2024 දී රුපියල් බිලියන 1,274 දක්වා ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති අතර, එය යටිතල පහසුකම් සහ ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ශක්තිමත් දිගුකාලීන ආයෝජන පෙන්නුම් කරයි. මේ අතර, ජංගම වත්කම් 2020 දී රුපියල් බිලියන 43 සිට 2024 දී රුපියල් බිලියන 65 දක්වා වර්ධනය වී ඇති අතර, එමඟින් සංවිධානයේ පවතින සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම අවධාරණය කෙරේ. රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ජංගම නොවන සහ ජංගම වත්කම් දෙකෙහිම වැඩිවීම, ආයතනයේ ස්ථාවර මූල්‍ය තත්ත්වය සහ එහි රාජ්‍ය සේවා මැන්ඩේටය සහ උපායමාර්ගික අරමුණු ඉටු කිරීමට ඇති අඛණ්ඩ හැකියාව පෙන්නුම් කරයි.



ස්ව ආදායම් ව්‍යුහය


2024 මූල්‍ය වර්ෂයේදී, ආයතනය තම ආදායම් උත්පාදනය කිරීමේදී ශක්තිමත් ප්‍රතිඵල අත්කර ගත් අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ මූල්‍ය තිරසාරභාවය සඳහා කැපවීම පෙන්නුම් කළේය.

ව්‍යාපෘති ධාරිතාවන්හි වෙනස්කම් පෙන්නුම් කරමින්, සේවාදායක වැඩවලින් ලැබුණු අතිරික්තය පෙර වසරට සාපේක්ෂව සුළු අඩුවීමක් පෙන්නුම් කළේය.

අධිවේගී මාර්ගවලින් ලැබෙන ආදායම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, ඒ සඳහා ගාස්තු එකතු කිරීම සහ යටිතල ව්‍යුහ භාවිතය වැඩිදියුණු විය.

කෙසේ වෙතත්, වෙළඳපොළ තත්ත්වයන්හි සිදු වූ වෙනස්වීම් හේතුවෙන් පොලී ආදායම පහත වැටුණි. අනෙකුත් ආදායම් ද ධනාත්මක ලෙස ඉහළ ගිය අතර, එය ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීමේ සාර්ථකත්වය පෙන්නුම් කරයි.

මෙම ප්‍රතිඵල මගින් ආයතනයට සැලකිය යුතු ආදායමක් උපයා ගැනීමට ඇති හැකියාව පෙන්නුම් කරමින් මූල්‍ය ස්ථාවරත්වය ඇති කොට අඛණ්ඩ සහ අනාගත මෙහෙයුම් සඳහා සහාය වේ.



PPE ව්‍යුහය

2024 දී, ආයතනයේ දේපළ, කම්හල් සහ උපකරණ (PPE) සංයුතිය පෙර වසරට බොහෝ දුරට අනුකූල වූ අතර, එය මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි එහි අඛණ්ඩ අවධානය පෙන්නුම් කරයි.

සම්පූර්ණ අධිවේගී මාර්ගවල PPE වලින් වැඩි ප්‍රමාණයක් (67%) (2023: 68%), මාර්ග 16% (2023: 18%) සහ පාලම් 15% (2023: 14%) විය. අනෙකුත් වත්කම්, මුළු PPE වලින් 1% ක් නියෝජනය කළ අතර එය 2023 දී 0% සිට සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම බෙදීයාම මාර්ග සහ පාලම් යටිතල පහසුකම් සඳහා සමබර ආයෝජනයක් පවත්වා ගනිමින් ඉහළ ධාරිතාවයකින් යුත් ප්‍රවාහන මාවත් පුළුල් කිරීම සහ නඩත්තු කිරීම සඳහා ආයතනයේ උපායමාර්ගික ප්‍රමුඛතාවය අවධාරණය කරයි.

2024 දී, මාර්ග සංවර්ධන අධිකාරිය එහි මූල්‍ය අංශයේ සහාය ඇතිව යටිතල පහසුකම් සංවර්ධනය සහ මූල්‍ය තිරසාරභාවය සම්බන්ධයෙන් වැදගත් ප්‍රගතියක් ලබා ගත්තේය. මාර්ග සංවර්ධන අධිකාරියේ පුළුල් සාර්ථකත්වයට පාදක වූ ප්‍රධාන ජයග්‍රහණ වන ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීම, ස්වයං-මූල්‍යකරණ ධාරිතාව වැඩි කිරීම සහ ප්‍රදානයන් මත යැපීම අඩු කිරීම සඳහා මූල්‍ය අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

කලට වේලාවට ණය පියවීම්, අධිවේගී මාර්ග ආදායම වැඩිවීම සහ ඇණහිට ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම මගින් අංශයේ ක්‍රියාකාරී මූල්‍ය කළමනාකරණය පෙන්නුම් කළ අතර, මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික සම්බන්ධතාවය සහ ආර්ථික ප්‍රගතිය පිළිබඳ එහි වගකීම අඛණ්ඩව ඉටු කළේය. සීමිත පද්ධති ඒකාබද්ධ කිරීම සහ සම්පත් සීමාවීම වැනි අභියෝග මධ්‍යයේ වුවද, අංශය සහ අධිකාරිය යන දෙකම ශක්තිමත් මූල්‍ය හා මෙහෙයුම් පදනමක් පවත්වා ගෙන ගියේය.

අනාගතය දෙස බලන විට, ඩිජිටල් පද්ධති ශක්තිමත් කිරීම, සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සහ කලාපීය ධාරිතා අවශ්‍යතා සපුරාලීම අත්‍යවශ්‍ය වනු ඇත. කැපවූ කණ්ඩායම් සහ පැහැදිලි උපායමාර්ගික අවධානයක් සහිතව, මා.සං. අධිකාරිය සහ එහි මූල්‍ය අංශය ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සහායවීම සඳහා හොඳින් ස්ථානගත වී සිටී.

2.1.20 අභ්‍යන්තර විගණන කටයුතුවල කාර්යසාධනය



මාර්ග සංවර්ධන අධිකාරියේ ගණන් දීමේ නිලධාරි වන සභාපතිට වාර්තා කරනු ලබන අභ්‍යන්තර විගණන අංශය ස්ථාපනය කර ඇත්තේ සහ ක්‍රියා කරනු ලබන්නේ මු.රෙ. 133 ප්‍රකාරවය. එමගින් අභ්‍යන්තර විගණන කාර්යයේ යෙදෙන නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහ වෘත්තීයමය බව නියාමකයින් විසින් සුරක්ෂිත කර ඇත.

අභ්‍යන්තර විගණනය වෙත සාමාන්‍යයෙන් පවරනු ලබන වගකීම වන්නේ පද්ධති සමාලෝචනය, ඒවායේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම සහ ඒ සඳහා වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීම ය. අභ්‍යන්තර විගණන අංශයේ විෂයපථය මා.සං. අධිකාරියේ පරිපාලිත සමාගම්වල අභ්‍යන්තර විගණක වශයෙන්ද පුළුල් කර ඇත. කෙසේ වෙතත් 2023 වර්ෂය තුළදී මා.සං. අධිකාරියේ පරිපාලිත සමාගම් ඇවර කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව එකී පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍යාපනය කරන ලෙසට අභ්‍යන්තර විගණන අංශය වෙත දැනුම් දෙන ලදි.

අභ්‍යන්තර විගණන අරමුණු වන්නේ,

- මා.සං. අධිකාරියට මුහුණදීම සිදුවන අවදානම් සාධක තක්සේරු කිරීම සහ ඒවා අඩුකළ හැකි උපායමාර්ග නිර්දේශ කිරීම.
- මා.සං. අධිකාරිය සතු සම්පත් (මිනිසුන්, යන්ත්‍රසූත්‍ර, මුදල්, ද්‍රව්‍ය සහ ක්‍රම) ආරක්ෂා කිරීම සහ ඒවා කාර්යක්ෂමව සහ ඵලදායි ලෙසින් භාවිතා කිරීම.
- නීතිය සහ විනයට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් හඳුන්වා දී ඇති ආචාරධර්ම නීති සංග්‍රහය පවත්වාගෙන යාම.

අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම්වලට පහත කරුණු ඇතුළත් වේ,

- මා.සං. අධිකාරිය විසින් අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න ඉහළ කළමනාකරණයට සහතිකවීමක් ලබාදීම.
- මා.සං. අධිකාරියේ ගිණුම් හා අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම.
- මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරු පරීක්ෂා කිරීම.
- ගනුදෙනු හා අවස්ථාවන් ආර්ථිකමය වශයෙන් සිදුකර ඇති බවට වගබලා ගැනීමට මෙහෙයුම් කටයුතු සමාලෝචනය කිරීම.
- මා.සං. අධිකාරිය අදාළ නීතියට, රෙගුලාසිවලට සහ එහි අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛවලට, කළමනාකරණ ප්‍රතිපත්ති සහ අනිකුත් අභ්‍යන්තර අවශ්‍යතාවන්ට අනුගතව කටයුතු කරනු ලබන බවට වගබලා ගැනීම පිණිස අනුකූලතා විගණන සිදුකිරීම.
- මා.සං. අධිකාරියේ සභාපති විසින් යොමුකර ඇති විශේෂ විමර්ශන පැවැත්වීම.

කාර්තුමය විගණන හා කළමනාකරණ රැස්වීම් කැඳවීමේ වගකීම අභ්‍යන්තර විගණන අංශයට පැවරෙන අතර එය මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. විගණන හා කළමනාකරණ රැස්වීම් සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය මහා මාර්ග අමාත්‍යාංශය වෙත කාර්තුමය වශයෙන් වාර්තා කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන, මෙහෙයුම් අවදානම් සැලකිල්ලට ගනිමින් පිළියෙල කරනු ලබන අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුව සිදුකරනු ලැබේ. අනුමත අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව පිළියෙල කරනු ලබන විස්තරාත්මක අභ්‍යන්තර විගණන වැඩසටහන, අභ්‍යන්තර විගණන මාසිකව පැවැත්වීමේ ලේඛනය වේ.

වාර්ෂික විගණන සැලැසුම් ක්‍රියාත්මක කිරීමට අමතරව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සඳහා විමර්ශන සහ ප්‍රතිචාරාත්මක විගණන පැවැත්වීම සිදුකරයි. 2024 වර්ෂයේ ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

විගණන කාර්යය / කාර්යාලය	සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් ගණන	ආවරණය කරන ලද ක්‍රියාකාරකම් ගනන	ප්‍රතිශතය (%)
පළාත් අධ්‍යක්ෂගේ කාර්යාලය	10	05	50.00
ප්‍රධාන ඉංජිනේරුගේ කාර්යාලය	19	09	47.36
විධායක ඉංජිනේරුගේ කාර්යාලය	30	15	50.00
PD බටහිර ව්‍යාපෘති කාර්යාලය	01	01	100.00
ඇස්පෝල්ට් කම්හල් සහ කුඩු කරන කම්හල්	08	05	62.50
සිදුගාමී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය **(EOM&M)** මූල්‍ය අංශය මා.සං. අධිකාරියේ අනිකුත් ප්‍රධාන අංශ	17	**1**3	76.47
සැලසුම් නිර්මාණ කාර්යාලය	01	-	00.00
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	01	-	00.00
ව්‍යාපෘති කළමනාකරණ ඒකකය **LBFP -100,000 (**මාවඩියෝඩෙයි – අනෙයික්කට්ටු මාර්ගය**)**	01	01	100.00
වාත්තු අංගනය	01	01	100.00
එකතුව	89	47	52.80

2.1.21 තොරතුරු පද්ධති සහ ජාල කළමනාකරණය



තොරතුරු පද්ධති සහ ජාල කළමනාකරණ (IS&NM) අංශය 2024 ජුනි මාසයේදී අතිරේක අධ්‍යක්ෂකවරයෙකු (ආවරණය කිරීම) යටතේ පිහිටුවන ලදී. මීට පෙර, එය අධ්‍යක්ෂ (සැලසුම්) ගේ විෂයපථය යටතේ සැලසුම් අංශය තුළ කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) ඒකකය ලෙස ක්‍රියාත්මක විය.

මා.සං. අධිකාරියේ IS&NM අංශය යටතේ සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වන්නේ ජාල පරිපාලනය, මා.සං. අධිකාරියේ වෙබ් අඩවිය සහ කාර්ය මණ්ඩල ද්වාර පරිපාලනය, මා.සං. අධිකාරියේ අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම් නඩත්තු කිරීම, තොරතුරු පද්ධති කළමනාකරණය, අවශ්‍ය විටෙක මා.සං. අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණු පැවැත්වීම සහ මා.සං. අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සේවාදායකයින් සඳහා තාක්ෂණික සහාය ලබාදීම යන කාර්යයන් ය.

ජාල පරිපාලනය

මා.සං. අධිකාරිය සතුව පරිගණක 455 ක් පමණ සම්බන්ධ කරන පරිගණක ජාලයක්, ඩොමේන් සර්වර් දෙකක් (02) (මූල්‍ය අංශයට සඳහා වෙනම සර්වර් එකක් සහ අනෙක් සර්වර් එක සියලුම අංශ සඳහා), ශ්‍රී ලංකා ටෙලිකොම් අන්තර්ජාල දත්ත මධ්‍යස්ථානයේ විද්‍යුත් තැපැල් සර්වර් එකක් සහ වෙබ් සර්වර් එකක් පවතී. පරිගණක 455 න් 255 කට විද්‍යුත් තැපැල් පහසුකම ලබාදී ඇත. එම සියලුම පරිගණක අභ්‍යන්තර ජාලයක් (LAN) එකකින් එකිනෙකට සම්බන්ධ කර ඇත. එකී පරිගණක පද්ධතියට නව පරිගණක එකතු කිරීම, පරිගණක ජාල ඩොමේන් එකට පරිශීලකයින් එකතු කිරීම එසේම ඩොමේන් එකෙන් පරිගණක සහ පරිශීලකයින් ඉවත් කිරීම සහ වෙනස් කිරීම අඛණ්ඩව සිදු වේ.

ප්‍රධාන servers වලට ප්‍රවේශවීමේ විවිධ මට්ටමේ වරප්‍රසාදය එක් එක් සහ සෑම අංශ පරිශීලකයෙකුටම ඇත. පරිශීලක විනාශය සහ පරිගණක ජාලය සම්බන්ධ ඔවුන්ගේ වරප්‍රසාද අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ. ජාලගත කරන ලද මුද්‍රණ යන්ත්‍ර එක් එක් සහ සෑම අංශයක් සඳහාම තිබෙන අතර ඒවා සිය අංශය තුල බෙදාහදා ගනී. අන්තර්ජාල පහසුකම් ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලයේ තෝරාගත් පිරිසක් සඳහා පමණක් සපයා ඇත. එසේම, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාල සම්බන්ධයෙන් අවශ්‍ය සහාය සහ නිර්දේශ ලබා දීම IS&NM අංශය විසින් සිදු කරනු ලැබේ.

විද්‍යුත් තැපැල් පහසුකම සහ මේල් සර්වර් එක නඩත්තු කිරීම

වර්තමානයේ මා.සං. අධිකාරියේ විද්‍යුත් තැපැල් සර්වර් එක විසින් ප්‍රධාන කාර්යාලය සහ සියලුම පළාත්වල කලාපීය කාර්මණ්ඩලය සඳහා ආසන්න වශයෙන් විද්‍යුත් තැපැල් ගිණුම් 253 ක් පමණ පවත්වාගෙන යනු ලබන අතර විහිදුම් නිශ්කාශන විසඳුම මගින් විද්‍යුත් තැපැල් විහිදුවනු ලබන අතර පද්ධතියට භාහිර අනවසරයෙන් ඇතුල් වන්නන්ගෙන් බොහෝ ගණනක් අවහිර කරනු ලැබේ.

මා.සං. අධිකාරියේ වෙබ් අඩවිය නඩත්තු කිරීම

මා.සං. අධිකාරියේ නව වෙබ් අඩවිය, 2024 අගෝස්තු මාසයේදී කාර්ය මණ්ඩල ද්වාරයක් (www.rda.gov.lk) සමඟ දියත් කරන ලදී. IS&NM අංශය මා.සං. අධිකාරියේ අදාළ අංශ විසින් සපයන ලද විස්තර සමඟ මා.සං. අධිකාරියේ වෙබ් අඩවියේ සමහර කොටස් යාවත්කාලීන කරනු ලැබේ. (උදා: අපගේ සේවාවන්, සිතියම් සහ අනෙකුත් ප්‍රකාශන ආදිය). මා.සං. අධිකාරියේ වෙබ් අඩවිය හරහා ලැබෙන අදාළ වෙබ් ප්‍රකාශන සහ විමසීම් පිළිබඳව කටයුතු කිරීමට ප්‍රසම්පාදන කළමනාකරණ අංශය, තොරතුරු මධ්‍යස්ථානය (1968), අභ්‍යන්තර විගණන අංශය සහ පාරිසරික සහ සමාජ සංවර්ධන අංශය සඳහා අවශ්‍ය සහාය ලබා දෙයි. කාර්ය මණ්ඩල ද්වාරයෙහි කොටස්කරුවන්ට (ප්‍රසම්පාදන කළමනාකරණ අංශය, පුහුණු අංශය, දේපළ කළමනාකරණ සහ ආදායම් අංශය, මානව සම්පත් කළමනාකරණ අංශය, ආදිය) ලේඛන ප්‍රකාශයට පත් කිරීමට සහ කාර්ය මණ්ඩල ද්වාරය යාවත්කාලීන කිරීමට සහාය ලබා දෙයි.

තොරතුරු පද්ධති කළමනාකරණය

- **මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ඉලෙක්ට්‍රොනික ලේඛන කළමනාකරණ පද්ධතිය (EDMS).**

ආයතනයේ ඩිජිටල් ලේඛන පවත්වාගෙන යාම සඳහා ඉලෙක්ට්‍රොනික ලේඛන කළමනාකරණ පද්ධතිය (EDMS) ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා IS&NM අංශය අවශ්‍ය තාක්ෂණික සහාය සපයයි. අනාගතයට සූදානම් කර්මාන්ත තාක්ෂණයන් සහ ප්‍රමිතීන් සහිත පරිශීලක-හිතකාමී පරිසරයක් සහිත කඩදාසිවලින් තොර කාර්යාල සංකල්පයක් තිබීම මා.සං. අධිකාරිය සඳහා ඉතා කාලෝචිත ප්‍රවේශයකි. මා.සං. අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පරිශීලකයින් 1000 කට වඩා සිටින අතර, ක්‍රියාකාරී අංශවලට අධිවේගී ස්කෑනර් 09 ක් ලබාදී ඇත.

- **KOICA හරහා ජාතික රථවාහන දත්ත ගබඩා කළමනාකරණ පද්ධතිය (NTDBMS)**

KOICA හි ප්‍රදානයක් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන ජාතික රථවාහන දත්ත ගබඩා කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා IS සහ NM අංශය විසින් තොරතුරු තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික සහාය සපයයි.

- **ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS)**

IS&NM අංශය SLRAMS සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික සහාය ලබා දෙයි. එය පදික වේදිකාව, සාමාන්‍ය නඩත්තුව, බෑවුම්, ආපදා සැලසුම් කිරීම සහ ස්ථාන යොමු කිරීම සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම, රථවාහන තොරතුරු, අනතුරු තොරතුරු ආදිය සඳහා මොඩියුල 16 කින් සමන්විත වේ.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ (මහා භාණ්ඩාගාරය යටතේ - මුදල් අමාත්‍යාංශය) වෙබ් අඩවිය පවත්වාගෙන යාම.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ (සාමාන්‍ය භාණ්ඩාගාරය යටතේ - මුදල් අමාත්‍යාංශය) වෙබ් අඩවියේ (https://pedmis.gov.lk) මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් පිටුව, අදාළ තොරතුරු මහජනතාවට ලබා දීම සඳහා IS&NM අංශය විසින් පවත්වාගෙන යනු ලැබේ.

ජාල ආරක්ෂාව නිරීක්ෂණය කිරීම

පරිගණක ජාලයේ පවතින ජාල ආරක්ෂාවට තිබෙන තර්ජනයට එරෙහිව ගනු ලබන ප්‍රධාන පූර්වාරක්ෂක ක්‍රියාමාර්ගයක් වශයෙන් MIS ඒකකය මගින් network firewall එකක් සහ ප්‍රති-වෛරස මෘදුකාංග පැකේජයක ව්‍යවසාය අනුවාදයක් සපයා ඇත. මෙම ප්‍රති-වෛරස පැකේජය ජාලයේ තෝරාගත් පරිගණක 425 ක ස්ථාපනය කර ඇත. විද්‍යුත් තැපෑල සහ අන්තර්ජාල පහසුකම් සපයා ඇති පරීශීලකයින් නිතරම යම් ජාල ප්‍රහාරයකට හෝ බලාත්ප්‍රවේශයකට භාජනය විය හැකි බැවින් ඔවුන් සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත.

තාක්ෂණය පදනම් කරගත් විසඳුම්:

මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුනා ගැනීම සහ ICDP හරහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන උපදේශනය සඳහා IS&NM අංශය තොරතුරු තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික සහාය ලබා දෙයි. මෙම ව්‍යාපෘතිය යටතේ, උපදේශකවරයා විසින් යෝජනා කරන ලද නිර්දේශ සහ විසඳුම් මත පදනම්ව, ඉදිරි වසර පහ (05) සඳහා තොරතුරු තාක්ෂණ මාර්ග සිතියමක් සංවර්ධනය කිරීම සහ විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ උපකරණ ලබා ගැනීම සඳහා ICDP හරහා උපදේශකයෙකු බඳවා ගැනීමට IS&NM අංශය සැලසුම් කරයි.

2.1.22 විශේෂ ව්‍යාපෘති

2023 දී, මා.සං. අධිකාරිය තුළ විශේෂ ව්‍යාපෘති අංශයක් පිහිටුවන ලද්දේ, සේවාලාභීන් විසින් අරමුදල් සපයන ලද විවිධ ව්‍යාපෘති සහ හදිසි කාර්යයන් කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ය. මෙම අංශය RWI (මාර්ග වැඩ වැඩිදියුණු කිරීම), RMTF (මාර්ග නඩත්තු භාර අරමුදල), කිලෝමීටර් 1500 ව්‍යාපෘතිය සහ බස්නාහිර පළාත් ව්‍යාපෘතියේ පවතින ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති සිදු කළේය. හදිසි යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතරම, මාර්ග සංවර්ධන අධිකාරියේ ආදායම් උත්පාදනයට ද සැලකිය යුතු දායකත්වයක් සපයයි. මෙම විශේෂිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් තීරණාත්මක මාර්ග ජාල අඛණ්ඩව සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීමට වගබලාගන්නා අතර, කලාපයේ ප්‍රවාහන අංශයේ සමස්ත කාර්යක්ෂමතාව සහ වර්ධනය වැඩි දියුණු කරයි.

ප්‍රධාන වශයෙන්, මෙම විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාල තුනක් ක්‍රියාත්මක වේ;

1) ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, කොළඹ (ව්‍යාපෘතිය)
2) ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, ගම්පහ (ව්‍යාපෘතිය)
3) ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, කළුතර (ව්‍යාපෘතිය)

2024 දී, විශේෂ ව්‍යාපෘති අංශය RWI අරමුදල, RMTF, සේවාදායක අරමුදල සහ ශ්‍රී ලංකා රජයේ (GOSL) අරමුදල ඇතුළු බහු අරමුදල් ප්‍රභවයන් යටතේ ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව ක්‍රියාත්මක කළේය. මෙම ව්‍යාපෘති මගින් රට පුරා ප්‍රධාන යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලමින් මා.සං. අධිකාරියේ සහ මා.සං. අධිකාරියේ නොවන මාර්ග සහ පාලම් යන දෙකම ආවරණය විය.

ප්‍රධාන ඉංජිනේරු (ව්‍යාපෘති) කොළඹ කාර්යාලය විසින් සිදු කරන ලද පාලම් ව්‍යාපෘති

පාලම් අංකය	මාර්ග අංකය	මාර්ගයේ නම	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.)	ආරම්භ කළ දිනය	*සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය / සම්පූර්ණ කළ දිනය	2023 වර්ෂාවසානය දක්වා භෞතික ප්‍රගතිය (%)	2023 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)	2024 වර්ෂාවසානය වනවිට භෞතික ප්‍රගතිය (%)	2024 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)
මැරින් ඩ්‍රයිව් දිගු කිරීම සඳහා දෙහිවල ඇළ හරහා පාලම ප්‍රතිසංස්කරණය කිරීම.		මැරින් ඩ්‍රයිව් (කොළඹ සැලසුම් මාර්ගය)	232	15/06/2020	27-02-2025	85	204.96	99	218.12
රාජගිරිය මැක්ඩොනල්ඩ්ස් අසල අංක 5/1 දරණ පාලම පළල් කිරීම.	A000	කොල්ලුපිටිය - ශ්‍රී ජයවර්ධනපුර පාර	93.17	25/05/2020	තොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුය	54	51.58	54	57.06

ප්‍රධාන ඉංජිනේරු කොළඹ (ව්‍යාපෘති) කාර්යාලය විසින් සිදු කරන ලද මාර්ග ව්‍යාපෘති

මාර්ගයේ නම	මාර්ග කොටස		මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.)	ආරම්භ කළ දිනය	* සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය / සම්පූර්ණ කළ දිනය	2023 වර්ෂාවසානය දක්වා භෞතික ප්‍රගතිය (%)	2023 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)	2024 වර්ෂාවසානය වනවිට භෞතික ප්‍රගතිය (%)	2024 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)
	සිට	To							
පළල් කිරීම සහ වැඩිදියුණු කිරීම									
අංගොඩ හන්දියේ සිට සංවර්ධන ව්‍යාපෘතිය දක්වා (B435) වැඩිදියුණු කිරීම.	5+440	5+590	184.00	15/01/2021	මෙම ව්‍යාපෘතිය MFAP විසින් දිගටම කරගෙන යනු ලැබේ.	90	50	90	50.00
අලුත් මාවත (1+570 - 2+340) කි.මී. දක්වා පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම - ඉහළ ශාන්ත ඇන්ඩෘස් පාර සිට දුම්කොළ සමාගම දක්වා	1+570	2+340	159.40	25/05/2020	තොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුය	67	62.95	67	62.95
HSBC පරිශ්‍රය අසල පාර්ලිමේන්තු මාර්ගය සහ බුත්ගමුව මාර්ගය සම්බන්ධ කරන සම්බන්ධක මාර්ගයේ	0+000	0+400	16.49	25/06/2019	නාගරික සංවර්ධන අධිකාරියට වගුඩම්	95	7.59	95	7.59

මාර්ගයේ නම	මාර්ග කොටස		මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.)	ආරම්භ කළ දිනය	* සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය / සම්පූර්ණ කළ දිනය	2023 වර්ෂාවසානය දක්වා භෞතික ප්‍රගතිය (%)	2023 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)	2024 වර්ෂාවසානය වනවිට භෞතික ප්‍රගතිය (%)	2024 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)
	සිට	To							
ඉතිරි වැඩ (0+000-0+400) කි.මී. (මාර්ග සංවර්ධන අධිකාරියේ නොවන)					අත්පත් කර ගැනීමට අවශ්‍යව ඇත.				
කවුඩාන - අත්තිඩිය මාර්ගය පළල් කිරීම සහ වැඩිදියුණු කිරීම - උප-පාදම, පාදම මතුපිට සහ ඉතිරි ව්‍යුහයන් (CH-0+000-1+300) කි.මී. (B547) ඉදිකිරීම.	0+000	1+300	134.45	28/08/2018	2024-12-02 දින සම්පූර්ණ කරන ලද Up-to-Wearing පාඨමාලාව. මාර්ග සලකුණු කිරීම සහ සංඥා පුවරු සම්පූර්ණ කිරීම අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත රඳා පවතී.	90	60.16	95	113.37
කවුඩාන - අත්තිඩිය මාර්ගය පළළල් කිරීම සහ වැඩිදියුණු කිරීම - උප-පාදම, පාදම මතුපිට සහ ඉතිරි ව්‍යුහයන් (CH1+300 - 2+500) කි.මී. (B547) ඉදිකිරීම.	1+300	2+500	125.55	20/08/2018	Wearing course එක 2025 01.01.30 දින සම්පූර්ණ කළා. මාර්ග සලකුණු කිරීම සහ සංඥා පුවරු සම්පූර්ණ කිරීම අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත රඳා පවතී.	80	46.16	90	46.16 බිල්පත් 2025.12.31 ට පසුව පිළියෙල කරනු ලැබේ
කැළණිමුල්ල - අංගොඩ හන්දිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (B644) පළල් කිරීම සහ වැඩිදියුණු කිරීම.	0+000	0+260	184.00	20/07/2020	29/07/2024	92	146.21	100	146.83
බුත්ගමුව මාර්ගය (B469) පළල් කිරීම සහ වැඩිදියුණු කිරීම	0+000	0+640	255.41	15/08/2020	Wearing course එක සම්පූර්ණ කළා. අරමුදල් තිබේ නම් කාණු සහ ඇවිදීමේ මාර්ග සම්පූර්ණ කිරීමට නියමිතය.	46	50.67	75	112.17
මාර්ග නඩත්තු භාර අරමුදල (RMTF)									
පිටිපන හන්දියේ සිට හෝමාගම හන්දිය දක්වා CRWB (AA004) වැඩිදියුණු කිරීම (16+720 සිට 17+120 දක්වා) (A004)	16+720	17+120	249.24	16-05-2024	30/04/2025	0	0	35	33.03

මාර්ගයේ නම	මාර්ග කොටස		මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.)	ආරම්භ කළ දිනය	* සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය / සම්පූර්ණ කළ දිනය	2023 වර්ෂාවසානය දක්වා භෞතික ප්‍රගතිය (%)	2023 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)	2024 වර්ෂාවසානය වනවිට භෞතික ප්‍රගතිය (%)	2024 වර්ෂාවසානය දක්වා සමුච්චිත වියදම (රු.මි.)
	සිට	To							
කඩුවෙල අතුරුගිරිය පාර (B174) සහ කෝට්ටේ බෝපේ පාර (B240) අතුරුගිරිය හන්දියේ මංසන්ධිය වැඩිදියුණු කිරීම.			238.48	23/07/2024	30/04/2025	0	0	25	40.95
ගොඩගම සිතුම්ණ මාවතේ කෙරමුල්ල පාර දක්වා කොටස 0+650- 0+800 (මා.සං. අධිකාරියේ නොවන)	0+650	0+800	3.29	2024-08-29	2024-09-06	0	0	100	104.56
හෙට්ටිගොඩ සිට මන්ත්‍රීදාස මාවත දක්වා මාර්ගය CH: -0+000- 0+600- මා.සං. අධිකාරියේ නොවන	0+000	0+650	10.96	2024-08-12	2024-08-30	0	0	100	
ජල්තර දිගල වත්ත ප්‍රධාන මාර්ගය හා අතුරු මාර්ගය 0+000- 1+950-RADA නොවන	0+000	1+150	20.41	2024-08-02	2024-08-28	0	0	100	
(ග) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 50 වගන්තියට පටහැනිව මූල්‍ය ප්‍රකාශනයේ මාර්ග වත්කම් ලෙස සටහන්කර තිබූ රු. මිලියන 381,641 ක වටිනාකම් තුළ පිළිවෙලින් රු.මිලියන 214.74 ක් හා රු. මිලියන 1,328.34 ක් වූ ඉඩම් හා පාලම් වත්කම් වටිනාකම් ඇතුළත්කර තිබීම හේතුවෙන් ඊට සමාන වටිනාකමින් මාර්ග වත්කම් අඩි ගණනය කර ඉඩම් හා පාලම් වත්කම් වටිනාකම් උනා ගණනය කර නිබුණි. තවද, අදාළ ඉඩම් හා පාලම් වටිනාකම් මාර්ග වත්කමක් ලෙස ක්ෂය කිරීම් හේතුවෙන් වාර්ෂික ක්ෂය වියදම් රු.මිලියන 103.72 ක් වැඩියෙන් හා අදාළ වත්කම් වටිනාකම් අඩුවෙන් සටහන්කර තිබුණි.

(ඩ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 58 වගන්තිය අනුව අස්ථිත්වයක් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් සඳහා මුලින් හඳුනාගත් වටිනාකම් එහි වැදගත් කොටස් වලට වෙන්කර ක්ෂය කළ යුතු වුවත්, අධිකාරියේ මූල වත්කම් වලින් සියයට 82 ක් හෙවත් රු.මිලියන 1,140,180 ක් නියෝජනය කරන අධිවේගී මාර්ග පිරිවැය සහ ව්‍යාපෘති 04 ක් මගින් ඉදි කරන ලද මහාමාර්ග 42 කට අදාළ රු. මිලියන 71,982.01 ක් වූ පිරිවැය, බෝක්කු, පාලම්, පදික වේදිකාව, ආලෝකය සැපයීම් යනාදී වැදගත් කොටස් වලට වෙන්කර ක්ෂය නොකර, සියයට 03 ක පොදු අනුපාතයකින් ක්ෂය කිරීම් හේතුවෙන් අධිවේගී හා මහාමාර්ග වත්කම් සහ ඊට අදාළ එකතුව රු.මිලියන 29,567 ක ක්ෂය වියදම් නිවැරදිව ගිණුම්ගතකර නොතිබුණි.

(ච) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 87, 90 හා 92 ඡේදයන්ට අනුකූලව අයිතිය මත පැනවී ඇති සීමාවන් සහ වගකීම් සඳහා ආරක්ෂණයන් ලෙස ප්‍රතිඥා දී ඇති ස්ථාවර වත්කම් අගය, අත්පත්කර ගැනීම් සඳහා වූ ගිවිසුම්ගත බැඳීම් ප්‍රමාණය, ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනයන්, තාවකාලිකව අක්‍රීයව ඇති දේපළ වල ධාරණ අගය, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතාකරන වත්කම් වල ධාරණ අගය සහ ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගත්වා ඇති සහ බැහැර කිරීම් සඳහා තබා ඇති සේ වර්ගීකරණය කළ වත්කම් පිලිබඳ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන මගින් සිදුකර නොතිබුණි.

(ඡ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදය ප්‍රකාරව නොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්විය යුතු වුව ද, අධිකාරියේ අංශ 03 ක වර්ෂ අවසානයට පැවති නොග වටිනාකම් ප්‍රමිතය අනුව අගය නොකර එහි පිරිවැය වටිනාකම් වූ රු.මිලියන 286.89 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඣ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 හි අනිවේකය යටතේ ප්‍රාග්ධන ප්‍රදාන සටහන් කිරීම සඳහා ඉඩ දුන් විකල්ප ක්‍රමයට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ ප්‍රතිඋපවර්තන අනිරික්ෂය ගණනය කිරීමේ දී ප්‍රාග්ධන ප්‍රදාන රු.මිලියන 111.521 ක් ද ඇතුළත් කිරීම හේතුවෙන්, එම අගයෙන් ප්‍රතිඋපවර්තන අනිරික්ෂය හා ප්‍රාග්ධන ප්‍රදාන උනෙනාවය අධි ගණනය වී තිබුණි.

(ට) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 හි 86(අ) ඡේදය අනුව ආයෝජන දේපළ අගය කිරීමට යොදා ගන්නා ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඩ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 14 හි 27,28 සහ 34 ඡේද ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන්ගේ සම්බන්ධතා පිළිබඳ, එනම් ප්‍රධාන කළමනාකරණ පිරිසගේ එකිනෙක පාර්ශවයේ විස්තර ඇතුළත් කරමින් ඔවුන්ගේ පාරිශ්‍රමික, වෙනත් දීමනා, මූල්‍ය නොවන ප්‍රතිලාභ හා පුද්ගලයින් ගණන, වාහන්‍ය කාර්යාල වෙත අනියුක්ත කර ඇති කළමනාකරුවන් ගණන හා වැටුප් හා දීමනා, අනුබද්ධිත සමාගම් අතර ගිවිසුම් හා ගණුදෙණු, මූල්‍යයතය සහ අතිරේක ඇප පිළිබඳ හෙළිදරවිකිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර නොතිබුණි.

(ණ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 38 ඡේදයේ නිර්නායකයන්ට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් සේවාදායක කොන්ත්‍රාත් කාර්යයන් සඳහා වැය කරන ලියදමට සියයට 20 ක ලාභාන්ශිකයක් එකතු කර සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 490.97 ක සේවාදායක ආදායම් හඳුනාගෙන තිබුණි.

(ත) අධිකාරයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.1 ට අනුකූල වන පරිදි අන්තර්ජාතික රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 26 හා 52 වගන්තීන් අනුව අක්‍රීත්වයක් විසින් සෑම ගිණුම් වාර්තාකරණ දිනයකදී වත්කම් හානිකරණ පිළිබඳ ඇඟවීම් (Indication) පවතීද යන්න පිළිබඳ ඇගයීමක් කර, එසේ ඇඟවීම් පවතී නම්, වත්කමක ආපසු අයකර ගත හැකි අගය (Recoverable Amount) ගණනය කළ යුතු වුවත්, වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙලින් වටිනාකම් රු.මිලියන 32,676 ක් හා රු.මිලියන 577.28 ක් වූ වැඩ පුර්ව අන්තිකාරම් සහ ණය ගැනි ශේෂ සඳහා ප්‍රමිතය අනුව හානිකරන ගැලපීම් සිදුකර නොතිබුණි. තවද, මෙම ණය ගැනි ශේෂය තුළ දැනට නොපවතින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.මි 306.5 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණු අතර එම වටිනාකම් නහවුරු කිරීමට අදාළ ලිඛිත ගිවිසුම් හෝ ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ද) 2021 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ වටිනාකමින් ලියා හරින ලද අධිකාරියට අයත් නොවන මාර්ග සඳහා දරන ලද රු.මි 8,550 කට අදාළ මාර්ග, පලාත් පාලන ආයතන වෙත භාර දුන් හා භාර ගත් ලේඛන විගණනයට ඉදිරිපත් නොවිය.

(ත) දක්ෂිණ අධිවේගී මාර්ග දිර්ඝ කිරීම (2 කොටස) වාහන්‍ය අවසන්කර 2021 දෙසැම්බර් 31 දින අධිකාරිය වෙත භාර දුන් ගොඩනැගිලි 12 ක වටිනාකම් අධිකාරිය විසින් ගිණුම් නැතිමේ දී රු.මිලියන 141.43 ක් අඩුවෙන් සටහන් කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම් හා ප්‍රාග්ධන ප්‍රදාන ඊට සමාන වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි.

(ථ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 20 වන වගන්තියට හා කම්කරු කොමසාරිස් ජනරාල් විසින් විගණක ඇමතූ අංක B/පොදු උපදෙස්/5 දරන 2022 ඔක්තෝබර් 19 දිනැති ලිපියේ සඳහන් කරුණු වලට පටහැනිව අධිකාරිය විසින් පාරිතෝෂික දීමනා ගණනය කිරීමේ දී මූලික වැටුප හා ජීවන වියදම් දීමනාවට අමතරව, ගැලපුම් දීමනාව, මාර්ග සංවර්ධන අධිකාරි දීමනාව, ආදී අනුමත නොවන දීමනා 12 ක් සැලකිල්ලට ගෙන පාරිතෝෂික ගණනය කිරීම සිදු කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්

කිරීමේ වටිනාකම රු.මිලියන 954.34 කින් අධිගණනය කර සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඌනය ගණනය කර තිබුණි. එසේම සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව, 2024 ජනවාරි මස සිට මැයි මස දක්වා කාලය තුළ දකුණු පළාත් කාර්යාලයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකු වෙත එකතුව රු.මිලියන 1.06 ක්වූ පාරිතෝෂික දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

(ඛ) අංක 02/2016 දරන හා 2016 ඔක්තෝබර් 21 දිනැති කළමනාකරණ සේවා වක්‍රලේඛය අනුව එක් එක් තනතුරු සඳහා වැටුප් වර්ධක ප්‍රතිශතය අවම 1% සිට උපරිම 2.9% දක්වා පරාසයක පැවතියදී, අධිකාරිය විසින් සියයට 04 ක වැටුප් වර්ධක සීමාවක් පදනම් කරගෙන පාරිතෝෂික වෙත් කිරීම රු.මිලියන 3,600.1 ක් ලෙස ගණනය කර තිබීම හේතුවෙන් සියයට 2.9 ක උපරිම වැටුප් වර්ධක සීමාව යටතේ වෙත් කළ හැකි උපරිම පාරිතෝෂික වෙත් කිරීම වටිනාකම වූ රු.මිලියන 3,315.33 ට වඩා රු.මිලියන 284.77 ක් වැඩියෙන් පාරිතෝෂික වෙත්කර තිබුණි. ඒ අනුව එම අගයෙන් වියදම වැඩිවීමෙන් අතිරික්තය අවප්‍රමාණය වී තිබුණි.

(ම) අධිකාරියේ සියළු පළාත් කාර්යාල සතුව 2024 දෙසැම්බර් 31 දිනට පවතින මුදල් ශේෂය ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කර එදිනට පවතින අතැති මුදල් ශේෂය ලෙස සටහන් කළ යුතු වුවත්, එසේ නොමැතිව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත්කළ මූල්‍ය ප්‍රකාශනයනයෙහි මාර්ගස්ථ මුදල් ලෙස රු.මිලියන 422.95 ක් සටහන්කර තිබුණි. තවද, සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව, පළාත් කාර්යාල සහ පෙරමුසු අංශන වෙතින් ප්‍රධාන කාර්යාලය වෙත 2025 ජනවාරි 03 දින සිට පෙබරවාරි 10 දින දක්වා කාලය තුළ ප්‍රේෂණය කළ රු.මිලියන 311.27 ක මුදලක් 2024 දෙසැම්බර් 31 දිනට පැවති මාර්ගස්ථ මුදල් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම අගයෙන් මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම වැඩියෙන් හා පළාත් කාර්යාල සතුව අතැති මුදල් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ය) රෙජිය අමාත්‍යාංශය මඟින් වැය විෂයන් 30 ක් යටතේ සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියට ලද රු.මිලියන 151,652 ක ප්‍රතිපාදන ලැබීම සහ එමඟින් දරන ලියදම් වෙන වෙනම හඳුනා ගත හැකි වන පරිදි ලෙජර් ගිණුම් පවත්වා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා එකිනෙක වැය විෂය සඳහා ලද ප්‍රතිපාදන එම ප්‍රතිපාදන මඟින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැය කළ හා ඉතිරි වූ ප්‍රතිපාදන වෙන වෙනම හඳුනා ගත නොහැකි විය.

(ර) මාර්ග සංවර්ධන අධිකාරියේ අනුබද්ධිත සමාගම් 03 වර්තමානය වන විට ඇවරකර නැති සමාගමක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ලබාගෙන තිබූ නමුත් අදාළ සමාගම් 03 විසින් අවසන් වරට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් අදාළ සමාගම් වෙත භාවිතය සඳහා ලබා දුන් පිරිවැය රු.මිලියන 17.55 ක් වූ වාහන 05 ක් සහ පිරිවැය සටහන් නොවූ වත්කම් අයිතම 39 ක් පවරාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් කර නොතිබුණි.

(ල) මූල්‍ය ප්‍රකාශන අනුව පෙරමුසු අංශයේ කොටස් නොගයේ වටිනාකම රු.මිලියන 157 ක් ලෙස ගිණුම් තබා ඇති නමුත් එහි ඇතුලත් රු.මිලියන 47.86 ක් වූ අමතර කොටස් 2024 වර්ෂය තුළ භාවිතයට ගෙන නිබුණද ඊට අදාල ගැලපීම් සිදුකර නොමැති බැවින් අවසන් නොගයෙහි වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි.

(ව) ඉබ්බාගමුව කුඹුක්ගැටේ මඩගල්ල මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළව 2022 වර්ෂයේ ප්‍රාග්ධනිත කළ රු. මිලියන 52.04 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දී නැවත ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව මාර්ග වත්කම රු.මිලියන 52.04 කින් වැඩියෙන්ද කෙරීගෙන යන වැඩ ගිණුම එම අගයෙන් අඩුවෙන්ද ගිණුම් ගතවී තිබුණි.

(ශ) කි.මී 1500 ක විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු අනුයාත කිරීමේ දී පරිපාලන වියදම් සඳහා සියයට 6.5 ක් ඇතුළත් කර තිබූ නමුත්, එම සීමාව ඉක්මවා අධිකාරියට අයත් මාර්ග ඉදිකිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 101.49 ක් රු.මිලියන 69.88 ක් හෙවත් සියයට 68 ක් අනිකාදෙ, නිවාඩු දින, ගමන් වියදම්, තාක්ෂණික කමිටු ගෙවීම් ඉන්ධන හා අනෙකුත් වියදම් ඇතුළු පරිපාලන වියදම් සඳහා දරා තිබුණි. ඒ අනුව 2023 අංක 34 දරන විසර්ජන පනත අනුව පිළියෙල කළ වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ ලද මුදල් වලින් රු.මිලියන 69.88 ක් විධිමත් අධිකාරි අනුමැතියකින් තොරව පුනරාවර්ථන වියදම් සඳහා වැය කර තිබුණු බැවින් හා මෙම වියදම් කෙරී ගෙන යන වැඩ ලෙස ප්‍රාග්ධනිත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ කෙරී ගෙන යන වැඩ වටිනාකම වැඩියෙන්ද මෙහෙයුම් වියදම් අඩුවෙන්ද ගිණුම් ගත වී තිබුණි.

(ෂ) ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වැය වැය විෂයක් යටතේ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම (RWI) සඳහා අධිකාරිය වෙත ලබාදුන් ප්‍රතිපාදන මගින් දරන ලද පිරිවැය ප්‍රාග්ධනිත නළ යුතු වුවත්, එම වැය විෂය යටතේ සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. මිලියන 1,300.41 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම අගයෙන් මූල්‍ය ප්‍රකාශනයේ කෙරිගෙන යන වැඩ වටිනාකම හා අනිරික්තය අඩුවෙන් සටහන් වී තිබුණි.

(ස) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ මගනැගුම් කොමිස්සන් සමාගමේ සියයට 99 ක කොටස් පාලන හිමිකමක් අධිකාරියට හිමි බව හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහනික විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාගමේ අධීක්ෂණ මණ්ඩලය තුළ ද එම ප්‍රතිශතයට සමපාත නියෝජනයක් අධිකාරියට නොමැති අතර අදාළ සමාගමේ රු.මිලියන 01 ක ආයෝජනයක් සිදුකළ බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මගින් සඳහන් වුවද අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එය ණය මුදලක් ලෙස ගිණුම්ගත කිරීමේ දෝෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිවැරදි කර නොතිබුණි.

(හ) මූල්‍ය ප්‍රකාශන අනුව දක්ෂිණ අධිවේගී මාර්ගය, පිටත වටරවුම් මාර්ගය, කොළඹ කටුනායක අධිවේගී මාර්ගය, මධ්‍යම අධිවේගී මාර්ග අදියර II, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව යන සමස්ථ අධිවේගී මාර්ග භාවිතා කිරීමේ ආදායම (User Income) රු.මිලියන 12,153.45 ක් වූ අතර අධිවේගී මාර්ග අදායම් වාර්තා කිරීමේ පරිගණක පද්ධතිය මගින් 2024 වර්ෂයට අදාළව ලබාගත් ආදායම (VAT රහිත) රු.මිලියන 12,092.59 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගතකළ ආදායම සහ අදාළ පරිගණක පද්ධතිය මගින් වාර්තාකර ඇති ආදායම් අතර රු.මිලියන 60.86 ක වෙනසක් පැවතුණි.

(ළ) කණු මතින් ඉදි වන අධිවේගී මාර්ග (නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා) ව්‍යාපෘතිය 16.4 km ක් දක්වා සංවර්ධනය කිරීමේ අරමුණින් 2017 අගෝස්තු මස ආරම්භ කර 2025 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිතව තිබූ නමුත්, ව්‍යාපෘතියේ ඉඩම් අත් කර ගැනීමේ ප්‍රගතිය සියයට 85 මට්ටමේ

පැවතියදී 2023 ජනවාරි 31 දින වාහපෘතිය අතරමඟ නතරකර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී නිබුණි. ඒ වන විට පැවති ඉඩම් අත්පත්කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එලෙසම පැවතීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය අනුව ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ 2020 වර්ෂයේ සිට වංචස්ථාපිත වන්දි මුදල් සඳහා සියයට 07 ක වාර්ෂික පොලී මුදලක් ගෙවීමට සිදු වූවත් ඊට අදාළ වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඛ) මධ්‍යම අධිවේගී මාර්ග අදියර IV වාහපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ හෙක්ටයාර් 475 ක් වූ බිම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබුණු අතර ඉඩම් අත්පත් පනතේ 10 (1) වගන්තිය නිකුත් කරන ලද කැබලි 2335 න් කැබලි 218 ක නක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒකතුව රු.මිලියන 455.51 ක් ලෙස වන්දි නිශ්චය කළ ඉඩම් කැබලි 207 ක් වූ අතර නක්සේරු වාර්තා ලැබී තිබුණු ඉඩම් කැබලි 1571 න් කැබලි 863 කට අදාළව 17 වන වගන්තිය ප්‍රකාශයට පත්කර නොතිබුණි. ඒ අනුව මෙම වාහපෘතිය යටතේ අත්පත් කරගනු ලැබූ ඉඩම් හෙක්ටයාර් 475 ට අදාළ වියදම් ඉඩම් වත්කම් යටතේ සටහන් කිරීමට සහ නක්සේරු වාර්තා ලැබී නිබුණු ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වන්දි හා පොලී මුදල් හඳුනාගෙන ගිණුම්ගතකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඝ) මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීම යටතේ කෙරීගෙන යන වැඩ ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,817.45 ක් ලෙස සඳහන්ව තිබෙන වටිනාකම තුළ රු.මිලියන 355.72 ක් වටිනා කොන්ත්‍රාත් 8 ක් 2017,2018,2019,2021 සහ 2022 වර්ෂයන්හි අන්තර් නිම කිරීමේ සහතික (Substantially Completed Certificate) කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය විසින් අදාළ මාර්ග නිශ්චිතව අවසාන වී ඇත්ද ඇගයීමක් සිදු කර මාර්ග වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව කෙරීගෙන යන වැඩ වටිනාකම් එම වටිනාකම්වල අධිගණනය වී මාර්ග වත්කම් වටිනාකම් උණ ගණනය වී නිබුණි.

(ඞ) විගණනය සඳහා සාක්ෂි නොවීම

අනු අංකය	අයිතමය	වටිනාකම රු. මිලියන	නොසැපයූ විගණන සාක්ෂි
(i)	ඉඩම්	60,549.89	ඉඩම් වටිනාකමට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය ඉඩම් වල අයිතිය හඳුනාගැනීමේ ලේඛන
(ii)	මාර්ග වත්කම්	6,792.09	පිරිවැය දරන ලද මාර්ගයන් හා අදාළ කාලය
(iii)	සෘජු අමුද්‍රව්‍ය තොග	1,222.23	තොග සනාථ ලේඛණ,
(iv)	ණයගැනි ශේෂ (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළුව)	833.17	ශේෂ සනාථ කිරීමේ ලිපි, ලිඛිත ගිවිසුම්
(v)	ණයගිමි ශේෂ	17.47	ශේෂ සනාථ කිරීමේ ලිපි
(vi)	දේපළ පිරියත හා උපකරණ	525.014	වත්කම් උප ලේඛන

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිනතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. නව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වාර්ෂ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය

විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අවශ්‍ය පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වලංගුභාවය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ අභිනතකර මතය සඳහා පදනම කොටසේ 1.2 අ,ආ,ඉ,ඊ,උ,ඕ,ක,ඛ,ඟ,ඡ,ට,ණ,ඵ,ම,ඹ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාවැකාරයකින් සාමාන්‍ය වශපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
(I) මූ.රෙ 3(2) ii (ආ)	මූලික පිරිවැය රු. මිලියන 10 ට නොඅඩු සහ වාර්ෂික ඵලදායීතා වර්ධනය හා නඩත්තු පිරිවැය රු. ලක්ෂ 05 ඉක්ම වන්නාවූ ව්‍යාපෘතීන් අදියර දෙකකදී අනුමත කිරීමේ කාර්ය පටිපාටිය සම්පූර්ණයෙන්ම අනුගමනය කළ යුතු වුවත්, මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ මාර්ග සංවර්ධන කොන්ත්‍රාත් පැකේජ 3928 ක් සඳහා මූලික අනුමැතිය පමණක් ලබාගෙන තිබුණු අතර, ඒ යටතේ මාර්ග කි.මී 17,847 ක් සංවර්ධනය සඳහා දරන ලද රු.මිලියන 188,955.91 ක පිරිවැය සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(II) මූ.රෙ 102-113	වර්ෂ 2008 හා 2009 දී ජනාධිපති ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද රු.මිලියන 3.24 ක වටිනාකමින් යුත් වාහන 04 ක් සහ පිරිවැය සටහන් නොකළ වාහන 01 ක් එම කාර්යාලයේ නොමැති බව අධිකාරිය වෙත ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන අධ්‍යක්ෂ විසින් 2015 මාර්තු 17 දින දැනුම් දී ඇති බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2024 ඔක්තෝබර් 01 දින පොලීස්පතිවරයා වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව අදාළ වාහන භාරදුන් සහ භාර ගත් පුද්ගලයින් පිළිබඳ විධිමත් විමර්ෂණයක් පවත්වා මූදල් රෙගුලාසි අනුව වගකිව යුත්තන් හඳුනා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.
(III) මූ.රෙ 371 (5)	තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂයන් ආපසු භාර දීම කවර අන්දමකින් වුවද එම අග්‍රිමය නිකුත් කරන ලද මූදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඩෙඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරිය විසින් ලබා දී තිබුණු රු.මිලියන 119.95 ක අත්තිකාරම් සියවීමට කටයුතු කර නොතිබුණි. එම වටිනාකම් තුළ වූ එකතුව රු.මිලියන 53.9 ක් වර්ෂ 01 සිට වර්ෂ 35 ක අතර කාලයක සිට පියවා නොතිබුණි.
(IV) මූ.රෙ 880	මූදල් රෙගුලාසි ප්‍රකාරව මූදල් ආදායම් භාර ගැනීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරෙන නිලධාරීන් ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කෙරෙන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප කැබිය යුතු වුවත් අධිවේගී මාර්ග සේවය සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට යොදවාගෙන තිබුණු මූදල් අයකැම්වරුන් 943 ක් ගෙන් ඇප සුරැකුම් ලබා ගෙන නොතිබුණි.

(අ)	2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.6 වගන්තිය	2020 ජනවාරි 01 දිනෙන් පසු වෙළඳපළ මිල සැදුම් ක්‍රමය යටතේ සිදු කරන ප්‍රසම්පාදන කාර්යයන් e-GP Portal හරහා සිදු කළ යුතු බව දක්වා තිබුණ ද, අධිකාරිය විසින් එම විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය (e-procurement) මේ දක්වා අනුගමනය කර නොතිබුණි.
(ආ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 හා 2022 මැයි 30 දිනැති අංක 04/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛ	මෙම චක්‍රලේඛ මගින් වියදම් සීමා කිරීම් සම්බන්ධයෙන් උපදෙස් ලබා දී තිබිය දී, එම කරුණු නොසලකා රේගිය අමාත්‍යාංශයේ හා රාජ්‍ය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන් සඳහා 2023 ජනවාරි මාසයේ සිට 2024 මාර්තු මාසය දක්වා කාලය තුළ අධිකාරියට අයත් වාහන භාවිතා කිරීම වෙනුවෙන් රු.මිලියන 4.39 ක් ද, ඉන්ධන ලීටර් 12,605.91 ක් විධිමත් අනුමැතියකින් තොරව ලබා දී තිබුණි.
(ඇ)	1995 ජූලි 21 දින ජනාධිපති ලේකම් කාර්යාලය නිකුත්කළ රජයේ ඉඩම් පැවරීම් පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 සහ 08 වගන්ති	රජයේ ඉඩම් පැවරීම් පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, වෙළඳපළ පදනම්කරගත් බදු ගිවිසුම් සඳහා යථාර්තවාදී බදු කුලියක් නියමකළ යුතු අතර, ගිවිසුමේ කොන්දේසි ලෙස අවුරුදු 05 කට වරක් බදුකුලී ප්‍රතිශෝධනය කළ යුතු වුවත් එසේ නොමැතිව, කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොළඹැකඩ ගමෙහි මුලික පිඹුරුපත් අංක 4363 දරන හෙක්ටයාර් 6.40 ක ප්‍රමාණය කැබලි අංක 01 සිට 09 දක්වා කොටස් 09 කට බෙදා වෙන් කර, වැලිපැන්න සේවා පෙදෙස ඉදිකිරීම සඳහා එම කැබලි වලින් අංක 04 සහ 06 දරන ඉඩම් වසර 99 ක කාලයක් අක් මුදල් ලෙස (එකවර ගෙවන) රු.මිලියන 21.8 ක් සහ රු.10,000 ක වාර්ෂික නාමික බදුකුලී ගෙවීමේ පදනම් මත පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදී බදු පදනම් ලබා දී තිබුණි. තවද, එම කැබලි වලින් අංක 01 සහ 09 දරන ඉඩම් වසර 30 ක් සඳහා ඉන්ධන පිරවුම්හල් පවත්වා ගෙන යාමට අක් මුදල් ලෙස (එකවර ගෙවන) රු. මිලියන 2.92 ක් සහ රු.10,000 ක වාර්ෂික බදු කුලී ගෙවීමේ පදනම් මත වෙනත් පුද්ගලික සමාගමක් වෙත 2013 සහ 2014 වර්ෂයන්හි දී බදු දී තිබුණි.
(ඉ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය:	
	(i) 1 වගන්තිය	අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.
	(ii) 5 වගන්තිය	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(ඊ)	2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009	පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගැනීමෙන් පසුව ගෙවීම් සහතික කළ යුතු වුවත්, එසේ නොමැතිව පැමිණීමේ ලේඛනය අනුව සේවයට වාර්තා කළ සහ පිටව ගිය වේලාවන් පරීක්ෂා කිරීම මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 94.46 ක් අනිකාල ලෙස ගෙවා තිබුණි. තවද, මාතර විධායක ඉංජිනේරු කාර්යාලයේ සේවය කරන කාර්මික නිලධාරියකු 2024 මාර්තු 25 දින සිට 2025 පෙබරවාරි 11 දින දක්වා කාලය තුළ පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණු නමුත් ඒ කාලය තුළ වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන1.09 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.
(උ)	2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි ඇමුණුම II හි 04 ඡේදය	දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර තිබූ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක නොකර අධිකාරිය විසින් බඳවා ගෙන තිබුණු නතනුරු නිලධාරීන් 106 දෙනෙකු වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු MM 1-3 වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පරිමාව වෙනුවට HM වැටුප් පරිමාවේ පිහිටුවා තිබුණි. එම නිලධාරීන් වෙත ගෙවිය යුතු වැටුප් පරිමාණයේ මූලික වැටුපට වඩා රු.මිලියන 451.58 ක් මූලික වැටුප් ලෙස ගෙවා තිබුණි.
(ඌ)	2009 මැයි 26 දිනැති කළමනාකරණසේවා චක්‍රලේඛ අංක 39	නිලධාරීන් හට අනුමත වූ වැටුපකට අමතරව යම් දීමනාවක් ලබා ගන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හා වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතු වුව ද, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් පදනම්ව මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාව (Professional Allowance) ලෙස රු.මිලියන 98.71 ක් හා 2015 අප්‍රේල් 04 දින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළු වෘත්තීය සමිති ඇමතූ ලිපියක් පදනම් කරගෙන අධිකාරී දීමනා ලෙස රු.මිලියන 976.61 ක් ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.
(එ)	2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
(i)	4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්තිය,	අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිතිපතා යාවත්කාලීන කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

(ii) 8.10.1 වගන්තිය සහ 8.11.4 (අ) (i) වගන්තිය		අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි.
(ඒ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛනය මගින් හඳුන්වා දුන් ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය	ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් තුළ තම ආයතනයේ ස්ථාපිත අරමුණු ලබාගැනීම සඳහා උපායමාර්ගික සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය සකස්කර මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කළයුතු වුවද, අධිකාරිය ඒ අනුව කටයුතුකර නොතිබුණි.
(ඔ)	2023 සැප්තැම්බර් 27 දිනැති අංක PED 01/2021 (iii) දරන වක්‍රලේඛය - රාජ්‍ය ව්‍යාපාර ආයතන සඳහා හඳුන්වා දුන් මෙහෙයුම් අත්පොතෙහි - අතිරේක (III)	සියලුම රාජ්‍ය ව්‍යවසායී ආයතන (SOEs) සතුව, ප්‍රධාන මෙහෙයුම් සියල්ල ආවරණය වන පරිදි, තමන්ගේම පද්ධති, ක්‍රියාවලීන් සහ ක්‍රමෝපායික (Protocols) පැහැදිලිව නිශ්චිත කළ අත්පොත් තිබිය යුතු අතර මෙම අත්පොත් කාලීනව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. ඒ අනුව සංවිධාන සටහනට (Organization Chart) අනුකූලව ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බලතල සහ වගකීම් පැහැදිලිව පවරා තිබිය යුතු වුවත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, මෙම මෙහෙයුම් අත්පොතෙහි සඳහන් විධිවිධාන හා යෝජනා සලකාබලා පරිපාලන සහ මූල්‍ය අත්පොත් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
(ඕ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ මගින් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොත	
	(i) 3.2 වගන්තිය,	බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සඳහා (Scheme of Recruitment) අධීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය සහ පේමිය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුව ද, අධිකාරියේ සියළු සේවකයින් සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනුමතකරගෙන නොතිබුණි.

(ii) 3.3 වගන්තිය,	අධිකාරිය විසින් පිළියෙල කරනු ලබන උපාය මාර්ගික සැලැස්මෙහි ආයතනයේ එක් එක් අංශයේ (Divisions of the SOE) සේවක අවශ්‍යතාවය, මානව සම්පත් සැලැස්මක් ආකාරයෙන් (Human Resource Plan) දැක්විය යුතු වුව ද එවැනි අංග වශයෙන් සේවක අවශ්‍යතාවයක් පිළියෙල කර නොතිබුණි.
(iii) 3.5 වගන්තිය,	කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව රාජ්‍ය ව්‍යවසායක සේවකයකු අමාත්‍යාංශයක හෝ වෙනත් ආයතනයක් වෙත නිදහස් නොකළයුතු බවත් අදාළ අනුමැතීන් මත නිදහස් කළහොත් එසේ නිදහස්කරන කාලයට අදාළව කිසිදු ගෙවීමක් සිදුනොකළ යුතු වුවද අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව මහාමාර්ග අමාත්‍යාංශයට සේවකයින් 07 දෙනෙකු නිදහස්කර 2023 වර්ෂය තුළදී වැටුප්, අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු. 4,384,439 ක් ගෙවා තිබූ අතර එම අනුකූල නොවූ ගෙවීම් සමාලෝචිත වර්ෂය අවසන් වනතුරු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි.
(iv) 6.2 වගන්තිය	රජය සතු ව්‍යවසායක වාර්ෂික ආදායම රු.බිලියන 30 ඉක්මවන විට අධීක්ෂණ මණ්ඩලය අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි ආයෝජන කමිටුවක් ස්ථාපිත කිරීමටත්, සේවක පාරිශ්‍රමික ඇතුළු ප්‍රතිලාභ දීම සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන ලබා නොගත යුතු බව සඳහන් කළද අධිකාරිය විසින් 2023 හා 2024 වර්ෂයන් හී ආදායම පිළිවෙලින් රු. මිලියන 108,970.58 ක් හා රු. මිලියන 44,789.35 ක් වුවද අදාළ ආයෝජන කමිටුව පිහිටුවීමට කටයුතු කර නොමැති අතර, සමාලෝචිත වර්ෂය තුළ සේවක වැටුප් හා පාරිශ්‍රමික ගෙවීම සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන මගින් රු.මිලියන 9,461 ක් ලබාගෙන තිබුණි.
(v) 6.6 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.
(ක) 2023 මැයි 16 දිනැති අංක අමප/23/0738/607/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණය.	මාර්ග කි.මී.100,000 ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අධිකාරියට අයත් නොවන මාර්ග අදාළ ආයතන වෙත පවරා දීමට වැඩ පිළිවෙලක් සකස්කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ග)	2005 නොවැම්බර් 03 දිනැති අංක: අමප/05/1711/016/110 දරන අමාත්‍ය මණ්ඩල නිර්ණය	සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍ය මණ්ඩලය නිර්ණය කර තිබූ මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදලක් පිහිටු වීමට කටයුතු කර නොතිබුණි.
(ඩ)	2023 පෙබරවාරි 06 දිනැති අංක 23/0256/604/030 දරන අමාත්‍ය මණ්ඩල නිර්ණය පරිදි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා වූ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ (PERC) සාමාන්‍ය නිර්දේශ	
	නිර්දේශ අංක 05	මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු අධිවේගී මාර්ග ජාලයට සහ ජාතික මාර්ග වලට පමණක් (A & B පන්තියට) සීමා විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ කි.මී 1500 ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ප්‍රතිපාදන ලෙස රු.මිලියන 12,700.95 කින් රු.මිලියන 11,007.27 ක් ප්‍රතිශතයක් ලෙස 87% ක් අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් රජයේ අරමුදල් ප්‍රතිපාදනය කළ අරමුණට පටහැනිවව වියදම් කර තිබුණි.
	නිර්දේශ අංක 13	අධිකාරිය යටතේ සියළු මාර්ග වල සංචලනය සම්බන්ධයෙන් දත්ත ඇතුළත් ඒකාබද්ධ මධ්‍යම දත්ත ගබඩාවක් ස්ථාපිත කර සංවර්ධන අරමුණු සඳහා අවශ්‍ය දත්ත සංචලනය සම්බන්ධ ඕනෑම රාජ්‍ය ආයතනයකට ප්‍රවේශ වීමේ හැකියාව අධිකාරිය විසින් සැපයිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	අනුකූල නොවීම
2008 අංක 40 දරන ජාතික මාර්ගවල් පනත	
(i) 6(1) වගන්තිය	උසස් මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස්කිරීමට, ක්‍රමෝපාය සංවර්ධනය කිරීමට, මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් පියවර ගැනීමට, අධිකාරිය විසින්

	යොමු කරනු ලබන මාර්ග සැලසුම් පිළිබඳ කටයුතු කිරීමට අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා පිහිටවිය යුතු "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවා නොතිබුණි.
(ii) 7(3) වගන්තිය	දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු මගින් සෑම දිස්ත්‍රික්කයක් සඳහාම මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ වෙනත් නියෝජිත ආයතන විසින් භාර ගෙන ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන වැඩසටහන් නිර්දේශ කරන "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයෝජනය කර ගෙන ඇති බව.

(අ) අධිකාරිය සතු ගැටලුකාරී තත්ත්වයන් පවතින වාහන සම්බන්ධව පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා දීම සඳහා පත් කරන ලද කමිටුවේ සාමාජිකයින් වෙත 2022 ඔක්තෝබර් 03 දින සිට 2023 පෙබරවාරි 23 දින දක්වා කාලයට අදාළව රු. මිලියන 2.78 ක් ගෙවීම් කර තිබුණද, එම වාර්තාව මගින් සිදුකළ නිර්දේශයන් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි.

(ආ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදුව සිට කොටටාව දක්වා කොටස මෘදු බිම් ප්‍රදේශ (Soft Ground Areas) හරහා දිවෙන බැවින් වර්ෂ 07 ක කාලයෙන් පසු Asphalt Overlaying කිරීම් සිදු කළ යුතු බව හඳුනා ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම මාර්ගය ඉදිකර වර්ෂ 13 ක් ගත වුවද එම කාර්යය සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි දැනට භාවිතා කරන අයකැම් පද්ධතිය 2011 වර්ෂයේ තාවකාලිකව ස්ථාපිත කරන ලද පද්ධතියක් වූ අතර, නවීන තාක්ෂණය අනුව, ගෙවීම් සිදු කළ හැකි මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබූ අතර, අධිවේගී මාර්ග වලින් පිට වීමේ ගේට්ටු වැසීම හා විවෘත කිරීමේ සවයංක්‍රීය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද, එවැනි ක්‍රමවේදයක්ද ස්ථාපිතකර නොතිබුණි.

(ඈ) අධිවේගී මාර්ග පරිශීලක ගාස්තු නිරණය කිරීමට අදාළව ස්ථාවර ගාස්තුව ගණනය කර තිබුණේ අපේක්ෂිත ආයෝජනය නැවත අය කර ගැනීමේ වර්ෂ 30 ක කාලය තුළ (Target Period of Investment Recovery) ඇස්තමේන්තුගත වාර්ෂික මෙහෙයුම් වියදම්, වර්ෂය තුළ සියළු ඇතුල්වීමේ ගේට්ටු තුළින් අධිවේගී මාර්ගයට ඇතුළු වන අපේක්ෂිත වාහන සංඛ්‍යාවෙන් බෙදීමෙන් වන අතර, අපේක්ෂිත ආයෝජනය නැවත අයකර ගැනීමේ කාලය තුළ මුළු ඉදිකිරීම් පිරිවැය සහ දැරීමට සිදුවන නඩත්තු වියදම් වර්තමාන, එම කාලය තුළ ඇතුළු වන මුළු වාහන ධාවනය කරන කි.මී ගණන

බෙදීමෙන් ලැබෙන රේටය විවලා ගාස්තුව ලෙස ගණනය කර තිබුණි. ඒ අනුව කොටටාව කඩුවෙල (OCH) අධිවේගී මාර්ගයට අදාළව වාර්ෂික මෙහෙයුම් වියදම් (Operation cost During the recovery Period) රු.මිලියන 46 ක් ලෙසත් මුළු වාහන ඇතුළුවීම් 131,155,450 ක් සිදුවේ යැයි උපකල්පනය කර තිබුණු අතර, දක්ෂිණ අධිවේගී මාර්ගයට (කොටටාව සිට මාතර දක්වා) අදාළව වාර්ෂික මෙහෙයුම් වියදම් රු.මිලියන 1000 ක් ලෙසත් මුළු වාහන ඇතුළු වීම් 974,958,800 ක් සිදු වෙතැයි උපකල්පනය කර තිබුණද, 2024 වර්ෂයේ පමණක් එම අධිවේගී මාර්ග දෙකෙහි මෙහෙයුම් වියදම් රු.මිලියන 2,220.48 ක් වී තිබුණි. ඒ අනුව සැලසුම්කළ පරිදි මෙහෙයුම් වියදම් පාලනය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) අධිවේගී මාර්ග අන්තර් ගුවන්තොරතුරු කාර්යාලය මගින් දෛනිකව එකතුකරනු ලබන පරිගීලක ගාස්තු දෛනිකව බැංකුගත නොකිරීම හේතුවෙන්, අතිරේක මුදල් කෙටි කාලීන ආයෝජන මාර්ග වල යෙදවීම මගින් ලැබීමට හැකි ආදායම අධිකාරියට අහිමි වන බවත් මුදල් චංචා සිදුවීමට හැකි පරිසරයක් අන්තර් ගුවන්තොරතුරු කාර්යාලය තුළ ගොඩනැගී තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණයවිය.

(ඊ) 2019 නොවැම්බර් මස සිට 2024 ජූලි දක්වා වූ වර්ෂ 04 මාස 09 ක් තුළ ප්‍රවේශ ටිකට් පත් (Entry Tickets) 133,840,213 ක් නිකුත් කර තිබුණු අතර ඉන් වාහන 18,291,430 ක් සඳහා පිටවීමේ ටිකට් පත් (Exit Ticket) නිකුත් කර නොතිබීම හේතුවෙන් එම කාලය තුළ අධිවේගී මාර්ගයන්හි ගමන්කළ වාහනයකින් අයකළ සාමාන්‍ය ගාස්තුව පදනම් කරගෙන සිදු කළ ගණනය කිරීම් අනුව, අධිකාරියට අහිමි වූ ආදායම දළ වශයෙන් රු. මිලියන 4,614.47 ක් පමණ වන අතර දෛනික ආදායම් අහිමි වීම රු.මිලියන 01 ට ආසන්න වී තිබුණි. ඒ අනුව අධිවේගී මාර්ග ආදායම් විවිධ උපක්‍රම භාවිතාකර සංචාරක පරිහරණයට හා චංචාවන්ට ලක්කර තිබුණු නමුත්, වගකිව යුතු මුදල් අයකැමිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීමට හා එම අඩුපාඩු වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට අධිවේගී මාර්ග කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(උ) 2019 වර්ෂයේ සිට වසර 04 මාස 09 ක කාල සීමාව තුළ ප්‍රවේශ වීමේ කවුළුවේ සිටි අයකැමිවරුන් විසින් තම අභිමතය පරිදි හෝ නොසැලකිල්ල හේතුවෙන් වාහනයේ වර්ගය වෙනස් කරන(Category Change) ලද ටිකට්පත් 241,964 ක් නිකුත් වී තිබුණි. මෙවැනි අවස්ථා පාලනය කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට මේ දක්වා ඒවැනි දෝෂ වාර්තා වීමේ ප්‍රවණතාවය (Trend) වර්ධනය වී තිබුණි.

(ඌ) අධිවේගී මාර්ග පද්ධතිය ඉදි කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් රු.මිලියන 611,374 ක ණය මුදල් ලබා ගෙන තිබුණු අතර අධිවේගී මාර්ග සාමාන්‍ය වාර්ෂික ශුද්ධ ලාභය රු.මිලියන 3560.62 ක් විය. ඒ අනුව ණය මුදල් පමණක් (පොලිය හැර) ගෙවීමට ගතවන කාලය වර්ෂ 171 කට වැඩි බව නිරීක්ෂණය විය. ඒ අනුව ණය සහ පොලී ගෙවීම් මෙම අධිවේගී මාර්ග ආදායමින් ආවරණය කර ගැනීමට නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඒ) 2009 දෙසැම්බර් 31 දින එක් යන්ත්‍රයක් රු. මිලියන 40.62 ක් බැගින් එකතුව රු. මිලියන 365.60 කට මිලදී ගත් Bitumen Sprayer යන්ත්‍ර 09 ක් දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව රඳවාගෙන තිබුණු අතර අදාළ යන්ත්‍ර වල භාවිතය හා කාලය පිළිබඳ තොරතුරුද විගණනය වෙත ඉදිරිපත් නොවීය.

(ඓ) ජනාධිපති කාර්යසාධන බලකාය විසින් එක් යන්ත්‍රයක රු. .මිලියන 31.57 (276,040.69USD*114.4) ක් වූ Aggregate Chip Spreaders යන්ත්‍ර 11 ක්, 2010 වර්ෂයේ දී රු. මිලියන 347.37 කට ආනයනය කර අධිකාරිය වෙත ලබා දී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන මාර්ග කාපට් ඇතිරූ A සහ B බාණ්ඩයේ මාර්ග වීම හේතුවෙන් මෙම වර්ගයේ යන්ත්‍ර වල අවශ්‍යතාවය මතු වී නොතිබුණු නමුත්, ඒවා භාවිතාකරන පලාත් සභා හෝ පලාත් පාලන ආයතන වෙත එම යන්ත්‍ර පවරාදීමට කටයුතු නොකර වර්ෂ 14 ක් නිෂ්කාර්යව අධිකාරිය යටතේ රඳවාගෙන 2024 වර්ෂයේ දී රු.මිලියන 9.36 ක වටිනාකමකට අපහරණය කර තිබුණි.

(ඔ) අධිවේගී මාර්ග කළමණාකරන හා නඩත්තු අංශය විසින් කොවිඩ්-19 වසංගත අවස්ථාවේ දී, ආරක්ෂිත පියවරක් ලෙස මිලදී ගනු ලැබූ රු. මිලියන 2.88 ක් වූ ආරක්ෂක කුට් 33 ක් කොවිඩ්-19 වසංගත තත්වයෙන් පසුවද, කාසි ගණන් කිරීමේ යන්ත්‍ර 20 ක් හා බර මැනීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර 05 ක් අධිකාරිය වෙත මිලදී ගැනීමේ සිටද නිෂ්කාර්යව පැවතුණි.

(ඕ) අධිවේගී මාර්ග පරිශීලක ගාස්තු අත්පොත සහ අංක 1732/12 දරන හා 2011 නොවැම්බර් 18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ඇතුළු පසුව කලින් කළට ගාස්තු සම්බන්ධයෙන් නිකුත් කරන ලද අනෙකුත් අති විශේෂ ගැසට් පත්‍ර අනුව ජනාධිපතිතුමා, අගමැතිතුමා ගමන් කරන වාහන සහ අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු කළමනාකරණ අංශයට අදාළ වාහන, අධිවේගී මාර්ග භාවිතා කිරීමේ දී ගාස්තු ගෙවීමෙන් බැහැර කර තිබුණද, ඉහත සඳහන් කළ අතිවිශේෂ ගැසට් පත්‍ර වලට පටහැනිව අධිකාරිය විසින් හිටපු ජනාධිපතිවරුන් 04 දෙනෙකු සඳහා අධිවේගී මාර්ග පද්ධතිය ආරම්භයේ සිට එනම් 2012 වර්ෂයේ සිට ගාස්තු රහිත අවසර පත් (Fee Exempted Vehicles) 10 ක් ලබා දී තිබුණු අතර එම අවසරපත් 2024 ඔක්තෝබර් 01 දින අවලංගු කර ඇති බව විගණනයට දන්වා තිබුණද, 2024 දෙසැම්බර් මස වන විටත් එම අවසර පත් අතරින් 03 ක් ක්‍රියාකාරී තත්ත්වයේ පැවතුණි.

(ක) 2024 වර්ෂය අවසන් වන විට අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු කළමනාකරණ අංශයේ මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගන්නා වාහන සඳහා සේවා "S" වර්ගයේ අවසර පත් 381 ක් නිකුත් කර තිබුණු අතර එයින් අවසර පත් 14 ක් නිකුත් කළ වාහන අනුයුක්ත කර ඇති අංශ පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණු අතර අධිකාරිය විසින් එකම අංකය සහිත වාහන 42 ක් සඳහා වෙනස් අංක සහිත අවසර පත් 02 බැගින් නිකුත් කිරීම මගින් අදාළ අවසරපත් අවභාවිතයට හැකියාවක් පවතින බව ද, අධිවේගී මාර්ග ආදායම් වාර්තා කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන පරිගණක පද්ධතියෙන් කිසියම් දිනක "S" අවසරපත් මාර්ගයෙන් ගමන් කළ වාහන අංක ලේඛනයක් ලබා ගැනීමේ පහසුකම්ද සලසා දී නොතිබුණි.

(ග) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් 32-1863 දරන ජීප් රථය 1994 ජනාධිපතිවරණ රාජකාරි කටයුතු සඳහා නිදහස් කර තිබියදී බීම බෝම්බයකට අසු වී විනාශ වූ බව නාවික හමුදාව විසින් දන්වා මැතිවරණ කොමිසම වෙත සුන්බුන් භාර දී පසුව එම සුන්බුන් මැතිවරණ මහලේකම් කාර්යාලය මගින් වෙන්දේසි කර අදාළ රථයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර නිබුණි. පසුව එම වාහන අංකය යටතේ වාහනයක් බස්නාහිර පළාත් තුළ ධාවනය වීම හේතුවෙන් ඒ බව විමසා සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) විසින් කොළඹ අපරාධ කොට්ඨාශ වෙත 2011 පෙබරවාරි 10 වන දින පැමිණිලි කර නිබුණි. අදාළ වාහනය මැතිවරණ රාජකාරි සඳහා නාවිකාලික පදනමින් පැවරීමෙන් පසු එම වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට අධිකාරියේ එකඟතාවයක් නොමැතිව කටයුතු කිරීම සම්බන්ධයෙන් මැතිවරණ මහ ලේකම් කාර්යාලයෙන් නොවිමසීමට සහ ඊට අදාළ වාහන වෙනත් පෞද්ගලික පාර්ශවයක් පරිහරණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික පියවර කාලීනව නොගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොනිබුණි.

(ඩ) 1995 වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත බාරදී ඇති බවට වාර්තා කර ඇති ටැක්ටර් 14 ක් සහ ට්‍රෙලර් 18 ක් අයිතිය විධිමත් ව බාරදීමට හෝ නැවත පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් නවදුරටත් අදාළ වාහන මාර්ග සංවර්ධන අධිකාරිය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියේ පැවතුණි.

(ච) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මාර්ග සංවර්ධන අධිකාරිය නමින් ලියාපදිංචි වී ඇති අංක 40-8641 හා අංක 26-6492 දරන වාහන 02 පිළිබඳ කිසිදු තොරතුරක් අධිකාරිය පවත්වාගෙන ගොස් නොනිබුණි. ඒ අනුව අදාළ වාහන බාහිර පාර්ශවයන් වෙත පැවරීමක් හෝ අවභාවිතා වීමක් සිදු වී නිමේ ද යන්න අනාවරණය කර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන පාලනය පිළිබඳ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොනිබුණි.

(ජ) නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදි වන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන අනවසර පදිංචි 1100 ක් සඳහා නිවාස ලබා දීම වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2025 දක්වා වාරික 05 කින් රු. මිලියන 2388.85 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවීමට 2021 ජූලි 14 දින ගිවිසුම් ගත වී නිබුණු අතර, අදාළ නිවාස කොළොන්නාව, මාලිගාවත්ත සහ හේනමුල්ල නිවාස ව්‍යාපෘති මගින් ලබාගැනීමට සැලසුම්කර නිබුණි. 2024 අගෝස්තු 23 වගඋත දින වි‍ට එකතුව රු. මිලියන 960 ක් වූ වාරික 02 ක් ගෙවා අවසන් කර, 03 වන වාරිකය වූ රු. මිලියන 480 ක් ගෙවීමට නියමිතව නිබුණ නමුත් කිසිදු නිවාසයක් අධිකාරිය වෙත භාර ගැනීමට මේ දක්වා කටයුතුකර නොනිබුණි.

(ඣ) සෑම ව්‍යාපෘති යෝජනාවක් ම නිසි ශක්‍යතා අධ්‍යන වාර්තාවක් සමඟ ඇගයීම සහ නිර්දේශ කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු බවට 2019 දෙසැම්බර් 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර නිබුණද, ඒ අනුව කටයුතු නොකර මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය යටතේ 2020-2022 කාල සීමාව තුළ දුර කි.මී. 17,847 කින් යුත් මාර්ග 13,160 ක් සඳහා රු. මිලියන 394,508.09 ක ඇස්තමේන්තු අනුයාත කොට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්

ගත් විමට හා 2024 සැප්තැම්බර් 30 දිනට රු. මිලියන.190,516.15 ක් වියදම් දැරීමට රේඛිය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කර තිබුණි.

(ට) 2020 සිට 2024 කාල සීමාවේදී මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 215,981ක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම කාල සීමාව තුළ මාර්ග කි.මී 17,847 ක් සඳහා ඇස්තමේන්තු අනුයාත කොට කොන්ත්‍රාත්කරුවන් සමඟ රු.මිලියන 394,508 කින් යුත් බැඳීම් ඇති කරගෙන තිබුණු අතර අනුමත අයවැය ප්‍රතිපාදන ඉක්මවා මු.රෙ. 94 ට පටහැනිව රු.මිලියන 178,527 ක බැඳීම් ඇති කරගෙන තිබුණි. මු.රෙ.127 (5) අනුව, ඇස්තමේන්තු වල ප්‍රතිපාදන මුදල් හා වියදම් අතර ඇති සැලකිය යුතු වෙනස් වීම් පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වූ ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගේ වගකීම් රේඛිය අමාත්‍යාංශ ලේකම් විසින් ඉටු නොකර අවධිමත් ලෙස ඇති කර ගත් බැඳීම් පියවීමට ඉහළ වාණිජ අනුපාතික ණය සහ සියයට 22.5 සහ 20 පොලී අනුපාතිකයන් යටතේ වර්ෂ 04 කින් කල්පිරෙන වටිනාකම් රු.මිලියන 40,691.79 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර භාණ්ඩාගාරය විසින් නිකුත්කර තිබුණි.

(ඩ) 2019 දෙසැම්බර් 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගත් ලැබූ තීරණය අනුව මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කිරීමට ග්‍රාමීය මාර්ග හඳුනා ගැනීම සඳහා නිර්ණායකයන් 09 ක් යටතේ මාර්ග තෝරාගත යුතු වූවත් එලෙස මාර්ග කි.මී.17,648 ක් තෝරාගත් බවට වන තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අදාළ නිර්නායකයන්ට පටහැනිව බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය , වයඹ හා උතුරු මැද පළාත් වල රු. මිලියන 1,426.67 ක් වැය කර පාසල්, පල්ලි හා පුජනීය ස්ථාන හා රාජ්‍ය ආයතන වලට අයත් අභ්‍යන්තර මාර්ගවල හා භූමිවල කාපට් ඇතිරීම, කොන්ක්‍රීට් යෙදීම, කැට ගල් ඇල්ලීම ආදී කාර්යයන් සිදු කර තිබුණි.

(ණ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5 මාර්ගෝපදේශයට නිකුත් කරන ලද අතිරේක 39 ට අනුව කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමිය හැකි කොන්ත්‍රාත් වටිනාකම් සඳහා පැවති සීමාවන් මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සඳහා අවමය රු.මිලියන 75 සිට උපරිමය රු.මිලියන 300 දක්වා අසාමාන්‍ය පරාසයකින් ඉහළ දැමීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමිය යුතු CIDA ශ්‍රේණිය හා කොන්ත්‍රාත් ප්‍රදාන වටිනාකම් වෙනස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත්කිරීමට පෙර CIDA ආයතනයේ එකඟතාවය ලබා ගැනීමට රේඛිය අමාත්‍යාංශය කටයුතුකර නොතිබුණි.

(ත) මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් නියැදි පරීක්ෂණය අනුව දිස්ත්‍රික්ක 06 ක්‍රියාත්මක කොන්ත්‍රාත්වලට අදාළ ඇස්තමේන්තු වටිනාකම් 2021 අප්‍රෙල් මස වන විට රු.මිලියන 3,504 කින් අධි ගණනය වී තිබුණද රේඛිය අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ඔක්තෝබර් 03 දිනැති අංක MOH/SEC/GEN/2022/71 දරන "කොන්ත්‍රාත් මුදල් සඳහා යෝජිත අඩු කිරීම් සම්බන්ධයෙන් පැන නැඟුණු ආරවුල්" පිළිබඳ ලිපියට අනුව දැනටමත් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල රේටියන් සංශෝධනය කිරීමට නොහැකි බව දන්වා තිබුණු බැවින් මෙම අධි ගණනය වීම් නිවැරදි කර නොතිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රජයට සිදුවූ අලාභය මේ දක්වා නිවැරදි කර නොතිබුණු අතර අධි ඇස්තමේන්තුගත රේටියන් සංශෝධනය

නොකිරීම මත පරිපාලන වියදම් සඳහා පමණක් ඇස්තමේන්තු කළ වටිනාකම රු.මිලියන 2,186.14 කින් අධිගණනය කර තිබුණි. ඒ අනුව ප්‍රදානය කරන ලද සියලු කොන්ත්‍රාත්වල සංශෝධනය නොකරන ලද අනෙකුත් රේට් අධිගණනය වීම සැලකූ විට මෙම අලාභය තවදුරටත් වැඩි වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ද) අධිකාරියට අයත් සියලුම පළාත් කාර්යාලයන් හි ඉංජිනේරුවරුන් නාක්ෂණ සහයකවරුන්, නාක්ෂණ නිලධාරීන් සහ වැඩ අධිකාරිවරුන් 1148 ක සංඛ්‍යාවක් සිටියද, රාජකාරී පැවරීමේ ක්‍රියාවලිය විධිමත් ව සිදු නොකිරීම සහ දුර්වල අධීක්ෂණය හේතුවෙන් අවසාන කොන්ත්‍රාත් බිල්පත් ගෙවීම සඳහා දීර්ඝ කාලයක් ප්‍රමාද වූ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර බිල්පත් ගෙවීම ප්‍රමාද වීම මත ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 42.89 ක් ගෙවීමකර තිබුණු බව මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය පිලිබඳව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(හ) මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සම්බන්දයෙන් මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සේවා සැපයුම් ගිවිසුම් හි වගන්ති අංක 3(ඇ) අනුව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුව ද, සමාගම විසින් උප කොන්ත්‍රාත්කරුවන් සඳහා ලබා දුන් වටිනාකම රු. මිලියන 125,730 ක් වූ වැඩ ඇණවුම් 1753 න් වැඩ ඇණවුම් 145ක් සඳහා පමණක් වටිනාකම රු. මිලියන 1,113 ක් වූ කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන තිබූ අතර ඒ අනුව ඉතිරි වැඩ ඇණවුම් 1608 ක් සඳහා සමාගම විසින් කිසිදු කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගෙන වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ දී තිබුණි.

(ව) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු පරිදි 2025 පෙබරවාරි 28 දිනට වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමේ දී රු. මිලියන 16,785 ක් අත්තර් ගෙවීම් බිල්පත් වලින්ද, රු. මිලියන 2,812 කොන්ත්‍රාත්කරුවන්ගේ වෙනත් කොන්ත්‍රාත් සඳහා ගෙවීමට නියමිත බිල්පත් වලින් පියවා ගැනීමට හා රු.මිලියන 26 ක වැඩ පූර්ව අත්තිකාරම් බැර්ලිකර මගින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. නමුත් රු. මිලියන 2,812 ක් කොන්ත්‍රාත්කරුවන්ගේ වෙනත් බිල්පත් මඟින් පියවා ගැනීමට කටයුතු කර නිබුණද ඒ සඳහා ලබා ගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ශ) අංක 79/2023 දරන හා 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අතරමඟ නවතා දමන ලද මාර්ග සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ සඳහා වෙන් වූ රු. බිලියන 28 ක මුදල් නැවතත් සංශෝධනය කර එම ප්‍රතිපාදන වටිනාකමින් රු. බිලියන 20 ක් මාර්ග කි.මී. 1500 වැඩි දියුණු කිරීමේ වැඩසටහනට වෙන් කරදීමට යෝජනා කර තිබුණු අතර, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ වලට යටත් ව ක්‍රියාත්මක කිරීමට 2024 ජනවාරි 25 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව නව මාර්ග මෙම වැඩසටහනට ඇතුළත් නොකළ යුතු බව සඳහන් වුවද එයට පටහැනිව අධිකාරී අයත් නොවන නව මාර්ග කි.මී 973.5 ක් සංවර්ධනය කිරීම ආරම්භ කර තිබුණි.

(ම) අධිකාරියේ විෂය පථයට අයත් නොවන මාර්ගයක පිහිටි නින්නියා - කුරුන්වත්කරිනි මාර්ගයේ පාලම අංක 01 (කුරුවත්කරිනි පාලම) මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන යටතේ රු. මිලියන 227.7 කට පිරිනමා 2022අගෝස්තු 25 දින වන විට සියයට 25 ක භෞතික ප්‍රගතියක් සඳහා කොන්ත්‍රාත්කරුට රු. මිලියන 60.6 ක් ගෙවා තිබුණි. තවද, 2024 ජනවාරි 31 දින තාවකාලික යකඩ පාලමක් ඉදිකර ගමනාගමනය පහසුකම් සැලසීමට මෙම වැඩසටහන යටතේ හා අධිකාරියේ RMT අරමුදල් මඟින් එකතුව වූ රු. මිලියන 13.504 ක පිරිවැයක්ද දරා තිබුණි. ඒ අනුව, අධිකාරියේ විෂය පථයට පරිබාහිරව මෙම පාලම සහ විකල්ප ප්‍රවාහන කටයුතු සැලසීම වෙනුවෙන් දරන ලද රු.මිලියන 74.104 ක වටිනාකම අනුමැතියකින් තොරව දරන ලද වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ය) මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන යටතේ පළාත් 09 ක කොන්ත්‍රාත් 29 ක් සඳහා ලබා දුන් රු. මිලියන 245.8 ක් වැඩ පූර්ව අත්තිකාරම් සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් ලබා දුන් බැඳුම්කර 2021,2022 සහ 2023 වර්ෂ වල දී කල් ඉකුත් වී තිබුණද මෙම කල් ඉකුත් වූ වැඩ පූර්ව අත්තිකාරම් වල බැඳුම්කර කාලය ඉකුත්වීමට පෙර කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොමැතිවීම හේතුවෙන් අදාළ අත්තිකාරම් අයකර ගැනීමේ අවධානමක් පැවතියද, ඊට අදාළ භාණ්ඩකරන අලාභ වෙන්කිරීමට හා වගකීම් පැහැරහැර ඇති නිළධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි.

2.3 වෙනත් කරුණු.

(අ) අධිකාරියට අයත් සී/ස අධිවෙගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණන මතය වෘත්තාන්ත කර තිබූ අතර 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අනිකර විගණන මතයක් ලබා දී තිබුණි. 2023 මාර්තු 20 දිනැති අංක CP/23/0394/608/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අධිකාරිය සතු පාලිත සමාගම් 04 ඇවර කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් අදාළ සමාගම්වල අබෙදිඩ පැවැත්මද අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ආ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය අනුව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් සියලු සමාගම් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2024 වර්ෂය වෙනුවෙන් සිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ නිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගත හැකි වන ආකාරයෙන් වැඩ පිළිවෙලක් නිරූපනය නොවූ අතර අධිකාරිය විසින් හඳුනාගත් නිරසර සංවර්ධන ඉලක්ක යටතේ ඉටු කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන්වල මොනවාද යන්නත්, ඊට අදාළ නිරසර සංවර්ධන දර්ශකයන් (SDG Indicators) සහ වර්ෂය තුළ දී එම දර්ශකයන්ගේ අපේක්ෂිත කාර්යසාධනය වැනි නිර්ණායක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවුණි. එමෙන්ම 2030 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට අපේක්ෂිත නිරසර අරමුණු මොනවාද යන්නත් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2024 නොවැම්බර් 12 දිනට දකුණු පළාත තුළ තනතුරු 07 ක අතිරික්ත නිලධාරීන් 215ක් ද, තනතුරු 05 ක නිලධාරීන් 18 දෙනෙකුගේ සුරක්ෂාවුද පැවති නමුත් අතිරික්ත නිලධාරීන් වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට / අනුයුක්ත කිරීමට හෝ සුරක්ෂාව සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබීම තුළ මානව සම්පත් කාර්යක්ෂමව හා එලදායීව උපයෝජනය කර නොතිබූ බැවින් අතිරික්ත නිලධාරීන් වෙත ගෙවන ලද වැටුප් හා දීමනා නිෂ්කාර්ය වියදම් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පිහිට වූ පනත අනුව අධිකාරියට පැවරී ඇති කාර්යභාරය වූ මාර්ග ඉදිකිරීම්, වත්කම් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා පළාත් අධීක්ෂණ කාර්යාල, ප්‍රධාන ඉංජිනේරු කාර්යාල, විධායක ඉංජිනේරු කාර්යාල සහ ප්‍රාදේශීය වැඩ ඒකක පිහිටුවා එම ඒකක වෙත අවශ්‍ය නිලධාරීන් බඳවා ගෙන අනුයුක්ත කර තිබියදී, අධීක්ෂණ මණ්ඩල අනුමැතියකින් තොරව බස්නාහිර පළාත් වාහන කාර්යාලය, දකුණු පළාතේ අතිරේක අධීක්ෂණ ඉදිකිරීම් කාර්යාලය, වයඹ පළාතේ ප්‍රධාන ඉංජිනේරු වාහන කාර්යාලය සහ සබරගමුව පළාතේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන ඉංජිනේරු වාහන කාර්යාල පිහිටුවා එම කාර්යාල සඳහා 2021, 2022 හා 2023 යන වර්ෂයන්හිදී පිළිවෙලින් සේවකයින් 91 ක්, 85 ක් හා 81 ක් අනුයුක්ත කර එම වර්ෂවල සේවක වැටුප් හා අනෙකුත් වියදම්, වාහන කුලී ඇතුළු නඩත්තු හා මෙහෙයුම් වියදම් සඳහා පිළිවෙලින් රු.මිලියන 213.96 ක්, රු.මිලියන 186.073 ක් හා රු.මිලියන 120.613 ක් වැයකර තිබුණි.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 36 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩල තුළ පමණක් සේවක බඳවා ගැනීම් සිදු කළ යුතු වුව ද, එයට පටහැනිව අධිකාරිය සේවක බඳවා ගැනීම් සිදු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය හා තනය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 9474 ක් හා 9274 ක් වී සේවක අතිරික්තය 477 ක් හා ඌනතාවය 677 ක් තිබුණි. එම අතිරික්ත සේවක සංඛ්‍යාව තුළ කොන්ත්‍රාත් පදනම් මත වසරක සේවා කාලයකට මධ්‍යම අධිවේගී මාර්ගය අදියර 2 මෙහෙයුම් කටයුතු සඳහා සේවකයින් 105ක් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2023 මාර්තු 22වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබී තිබුණි. ඒ අනුව අදාළ කොන්ත්‍රාත් කාලය 2024 මාර්තු 21 දිනෙන් අවසන් වූවද, එම කාලය දීර්ඝ කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ සේවා අවශ්‍යතාවයන් නොමැති සේවකයින්ගේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(උ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු හා වැටුප් පරිමාණය අනුමත කර නොගත් තනතුරු 07 ක් සඳහා නිලධාරීන් 19 දෙනකු බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 14.04 ක් සමාලෝචිත වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවීමිකර තිබුණි.

(ඌ) මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණ ජනරාල් ධුරය සඳහා 2024 මාර්තු 05 දින සිදු කළ පත්වීමට අදාළ නිවැරදිභාවය හා පත්වීමේ ක්‍රමවේදය පරීක්ෂා කිරීමට අවශ්‍ය අධීක්ෂණ මණ්ඩල පත්‍රිකා, සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් වෙත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දුන් ලකුණු වාර්තා,

හා ඊට අදාළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වූරයට පත් කිරීම හා ඊට අදාළ ක්‍රමවේදයේ නිවැරදිභාවය පිළිබඳ විගණනයට තහවුරු කිරීමට නොහැකි විය.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව බාහිර අයදුම්කරුවෙකු සඳහා අදාළවන අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව වෘත්තීය සුදුසුකම් ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 04 ක සේවා පලපුරුද්දක් අවශ්‍ය බව දක්වා ඇතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා බාහිර අයදුම්කරුවන් සඳහා අනුමත කර ඇති සුදුසුකම් යටතේ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අයදුම්කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද, අධිකාරිය ඊට පවතිනිව වෘත්තීය සුදුසුකම් නිර්ණය කිරීමේ දී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (Senior Managerial Level) අවශ්‍ය වන අවුරුදු 04 ක සේවා පලපුරුද්ද අඩු කොට සේවා කාලය ගණනය කර තිබුණි.

(ඈ) 2024 වර්ෂයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා නිරණ විගණනය සඳහා ලබා දෙන ලෙස ඉල්ලුම්කර තිබුණද, අදාළ තොරතුරු 2025 ජුනි 03 දින වන විටත් නොලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද, බඳවාගැනීම්, උසස් කිරීම්, විනය ක්‍රියාමාර්ග, අයෝජන නිරණ, දීමනා ගෙවීම්, ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් හා ඉවත්කිරීම් හා කල්බදු ගිවිසුම් වලට එලඹීම් යනාදිය පිළිබඳ විධිමත් අධිකාරියක් සහිතව කටයුතු කලේද යන්න විගණනයේදී තහවුරුකරගත නොහැකි විය.

(ඉ) 2024 ජුනි 18 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් පහත සඳහන් නියෝග අධිකාරිය විසින් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

- නියෝග අංක 07

  කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කරන ලද බඳවා ගැනීම් සහ උසස් කිරීම් ප්‍රමාණය, සිදු කරන ලද වර්ෂය ඒවාට අනුමැතිය ලබා දුන් නිලධාරීන් පිළිබඳ කාරක සභාව රැස් වූ දිනට පසුව සති 02 ක් ඇතුළත (2024 ජූලි 02) වාර්තාවක් ඉදිරිපත් කිරීම.

- නියෝග අංක 09

  ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල හා සෘජු ශ්‍රමය මගින් සිදු කරන ව්‍යාපෘතිවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ස්වාධීන ඇගයීම් ක්‍රමවේදයක් සකස් කිරීම.

- නියෝග අංක 11

ජාතික ජල සම්පාදන සහ ජල ප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා විදුලි බලමණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය යන ආයතන සහ අදාළ වන අනෙකුත් සියලු ආයතන නියෝජනය වන පරිදි කමිටුවක් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සහ එම කමිටුව විධිමත් ව රැස්ව අන්තර් ආයතන සම්බන්ධීකරණයෙන් මෙම ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර, ඊට අවශ්‍ය නියෝග සැකසීම. ගැසට් පත්‍රයේ පළ කිරීම සහ අවශ්‍ය සියලු කටයුතු මාස 03 ක් ඇතුළත (2024 09.18 දිනට පෙර) සිදු කර ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.

- නියෝග අංක 14

මාර්ග කිලෝමීටර් 100,000 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මග නැගුම සමාගම වෙත 25 % ක් ලබා දෙමින් ක්‍රියාත්මක කළ මාර්ග ප්‍රමාණය සහ එම ප්‍රමාණය නැවත කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කිරීම, එම සංවර්ධන කටයුතු අවසන් කර ඇති ප්‍රමාණය, එම මාර්ග වල වර්තමාන තත්ත්වය පිළිබඳ නොරහුරු ඇතුළත් වාර්තාවක් සති 01 තුළ (2024/06/26 දිනට පෙර) කාරක සභාවට ඉදිරිපත් කිරීම.

- නියෝග අංක 15

ඉඩම් මැනුම් කටයුතු නිමකර ඉඩම් හඳුනා ගැනීමට හා 2018 අගෝස්තු 09 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම.

- නියෝග අංක 16

මාර්ග සංවර්ධන අධිකාරිය සහ ව්‍යාපෘති කාර්යාල අතර අතරමැදි නිහඬ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ඇති කිරීම, ව්‍යාපෘති භාර දීමට විධිමත් ක්‍රමවේදයක් (Project Handing over) සකස් කිරීම සහ එය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

- නියෝග අංක 19

අධිවේගී මාර්ගයේ පරිපාලන කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා කුලී වාහන වෙනුවට නව වාහන මිලදී ගැනීමේ හැකියාව සොයා බලා ඒ අනුව කටයුතු කිරීම.

- නියෝග අංක 21

අධිවේගී මාර්ග වල මුදල් ගෙවීම් කවුළුවල සිදු වන මූල්‍ය අක්‍රමිකතාවන්ට සම්බන්ධ පරීක්ෂණ අවසන් වන තෙක් එම නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීම සහ පවත්වන පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීම හා බහු මං තීරු නිදහස් ප්‍රවාහන ගාස්තු පද්ධතියක් ස්ථාපිත කිරීම.

(ඇ) මාර්ග ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අත්පත්කර ගනු ලබන සියළු ඉඩම් වල ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ වූ අත්පත්කර ගැනීමේ ගැසට් නිවේදනය නිකුත් කළ දින සිට වන්දි ගෙවීම් සිදු කරන දිනය දක්වා ගෙවිය යුතු සියයට 07 ක වාර්ෂික පොළිය සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක්ද, සිදුකර නොතිබුණි. තවද, අධිවේගී මාර්ග ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් පමණක් ඉඩම් කැබලි 43,350 ක්

අත්පත්කරගෙන නිවූ නමුත් ඒවාට අදාළ වන්දි ගෙවීම සම්බන්ධ ප්‍රේක්ෂන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු. මිලියන 3,017.64 ක් වූ ණය හිමි ශේෂයෙන් රු.මිලියන 27.7ක් වර්ෂ 02 ත් 05 ත් අතරද රු. මිලියන 13.8 ක් වර්ෂ 05 ත් 10 ත් අතරද රු. මිලියන 6.08 ක් වර්ෂ 10 ත්ද කල් ගත වී තිබුණද එම ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඍ) කි.මී 100,000 ක විකල්ප මාර්ග, අතුරු මාර්ග, ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම යන මැයෙන් ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4.1 ඡේදයේ සඳහන් පරිදි මාස 06 ක කාලසීමාවක් තුළ මාර්ග ආරක්ෂිතව ගමනාගමනයට සුදුසු තත්වය දක්වා වැඩි දියුණු කිරීමටත්, 2024 වර්ෂය සඳහා වෙන්කර නිවූ රු.බිලියන 28 ක ප්‍රතිපාදන මඟින් රු.බිලියන 20 ක් ඒ සඳහා යෙදවීමටත් අනුමැතිය ඉල්ලා නිවූණු අතර 2024 මාර්තු 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ඒ සඳහා අනුමැතිය ලබා දී නිබුණි. ඒ අනුව, 2024 වර්ෂයේ පළමු කාර්තු දෙක තුළ නිමකිරීම සඳහා ගිවිසුම් වලට එළඹී කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 562.48 ක්වූ මාර්ග 28 ක ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණු අතර අදාළ මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ ස-ඵර්ධන කටයුතු ආරම්භ නොකළ මාර්ග විය. ඒ අනුව, උක්ත කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්ගත වූ වටිනාකම් විධිමත් අධිකාරී බලයක් නොමැතිව සිදුකරන නිබුණි.

(ඎ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඇති මුදලින් රදවාගත් වටිනාකම් වූ රු.මිලියන 4517.51 ක් ජංගම හා ජංගම නොවන වශකීම් ලෙස වෙන්කර මූල්‍ය තත්ත්ව විස්තරයේ සටහන්කර නොතිබුණි. තවද, එම ශේෂයෙහි ඇතුළත් රු.මි.2,500.74 ක් වූ රදවාගැනීම් වටිනාකම් මාර්ග කි.මී 100,000 ව්‍යාපෘතියට අදාළ වන අතර එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී අනෙක්නාට එකඟනාවය මත අවසන්කර නිබුණද, කොන්ත්‍රාත් නිමවන කාලය, දෝෂ වගකීම් කාලය, කාලය දීර්ඝ කිරීම්, කාර්යසාධන බැඳුම්කර කාලය යනාදී තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

ජී.වී.පී. ධර්මපාල
විගණකාධිපති.(වැ.බ)

මාර්ග සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.

1.2 අභිනකර මතය සඳහා පදනම.

අනු අංකය	විගණන ඡේදය	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති පියවරයන්
1.2 (අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 07 ඡේදය අනුව ගනුදෙනු හා සිද්ධීන් ඒවා අදාළ වන කාලපරිච්ඡේදය තුල මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගැනීම හා වාර්තා කිරීම සිදුකළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළව 2024 ජනවාරි 08 දින රාජ්‍ය බැංකුවක් වෙත ගෙවූ රු.මිලියන 5.97 ක දඩ මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්කබා කිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් සටහන් වී තිබුණි. තවද, උක්ත ප්‍රමිතයේ 107 (ඊ) ඡේදයට අනුකූලව මෙම දඩ මුදල් ගෙවීම පිළිබඳ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව්කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 07 වන වගන්තියේ යම් අයිතමයන්ගේ අත්හැරීම ප්‍රමාණාත්මක බව මත රඳා පවතින බව සඳහන් වේ. ඒ අනුව 2023 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකරන ලද දඩ මුදල ප්‍රමාණාත්මකව ගත හොත් ගෙවන ලද මුළු පොළී ප්‍රමාණයෙන් 0.007% කි. එසේම වගන්ති අංක 107හි (ඊ) මගින් දැක්වෙන්නේ නීතිමය කටයුතු නිරවුල්කිරීමක් වන අතර මෙම දඩ මුදල ගෙවීම ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම නිසා සිදු වූවකි.
1.2 (ආ)	අධිකාරිය විසින්, මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර තිබූ රු. මිලියන 581,000 ක ණය සීමාව හා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන සහනදායී ලිපි (letter of comfort) යටතේ අධිකාරියේ ස්ථාවර තැන්පතු ඇපයට තබා ලබා ගත් ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට දේශීය වාණිජ බැංකු 05 ක් වෙත ගෙවීමට පැවති රු.මිලියන 233,054 ක ණය හා රු.මිලියන 88,515 ක ණයකර ශේෂ සම්බන්ධ උපලේඛණ පිලියෙළ කිරීම හා උක්ත ණය ගැනීම් භාවිතාකළ ආකාරය, එම ණය ආයෝජනය කර ඉදිකරන ලද මාර්ග පිලිබඳ තොරතුරු හා ණය ලබා ගත් මූලාශ්‍ර, දිනය, ණය මුදල, එක් එක් මාර්ගය සඳහා ප්‍රාග්ධනිත කළ ණය ගැණුම් පිරිවැය, ඇපකර, සහන කාලය, ආපසු ගෙවීමේ කාලය, ණය ප්‍රතිව්‍යුහගත කිරීම්, ණය වාරික ගෙවීම්, පොලී ගෙවීම් ආදී තොරතුරු	ණයකර නිකුත් කිරීම සිදු වූයේ 2021 වර්ෂයේ වන අතර ණයකර නිකුත් කිරීමට අදාලව ඉදිකල මාර්ග පිළිබඳව වර්ගීකරණ මාර්ග ලැයිස්තුව 2021.12.31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය තුල හෙළිදරව් කර ඇති අතර ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වල මෙම විස්තර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 15 හා 16 වගන්තීන් හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 04 හි 18, 19, 20, 31, 32, 33, 34, 36 හා 40 ඡේදයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.	
1.2 (ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 16 (ආ) ඡේදය අනුව ව්‍යාවස්ථාදායක අධිකාරීන් විසින් ස්ථාපිත කර ඇති මූල්‍ය සීමා සහිතව, නෛතික හා ගිවිසුම්ගත අවශ්‍යතාවයන්ට අනුකූලව සම්පක් ලබා ගන්නා ලද්දේ ද සහ භාවිතා කරන ලද්දේ ද යන්න මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය කළ යුතුය. එනමුත්, මාර්ග නඩත්තු කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රු.මිලියන 20,749 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 84.6 ක් බාහිර ආයතන විසින් නඩත්තු කටයුතු සඳහා මුදල් තැන්පත්කර තිබූ මාර්ග 43 ක් වෙනුවෙන් වැය කර නිබුණද, එම මුදල රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණයකළ යුතු මුදල් ලෙස ගිණුම් ගත නොකර සේවාදායක ආදායමක් ලෙස ගිණුම් කැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අධිගණනය වී තිබුණි.	සේවාදායක තැන්පතුවලින් රඳවාගෙන ඇති රු. මිලියන 84.8ක මුදල අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත.
1.2 (ඇ)	2020 පෙබරවාරි 05 දිනැති අංක අමප/20/0313/204/029 හා 2020 ජුනි මස 24 දිනැති අංක අමප/20/0974/204/029 - VI දරන අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුව ණය මුදල් වලට අදාළ පොලී වියදම් සහ අනෙකුත් පිරිවැයන් පියවීම සඳහා ණිමිකම් දායකත්ව වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබූ ප්‍රතිපාදන එම තීරණයට හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිත අංක 01 හි 16 ඡේදයට පටහැනිව දේශීය බැංකු ණය පොලී හා වාරික ගෙවීම් සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් ලබා දී තිබුණු ප්‍රතිපාදන මගින් සමාලෝචිත වර්ෂයේදී වැය කල රු.මිලියන 48,195 ක් හා 2021, 2022 හා 2023 වර්ෂයන්හිදී වැයකර තිබූ රු.මිලියන 137,271.96 ක් ඇතුළුව රු.මිලියන 185,466.96 ක් ප්‍රාග්ධන ප්‍රදාන (Capital contribution) ලෙස වාර්ෂික ආදායම් යටතේ	ණයකර සම්බන්ධයෙන් පමණක් ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ගිණුම් කැබීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර ඒ සම්බන්ධව SLPSAS 11 අදාල කර නොගෙන ගිණුම් කැබිය යුතු ආකාරය පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇත.

	ගිණුම් තැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ අතිරික්තය පිළිවෙලින් රු.මිලියන 48,195 ක් හා රු.මිලියන 137,271.96 ක් වැඩියෙන්ද නිමිකම් දායකත්වය එම වටිනාකම්වලින් අඩුවෙන්ද සටහන් වී තිබුණි.	
1.2 (ඉ)	මාර්ග සංවර්ධන අධිකාරියේ නිත්‍ය විෂය පථයට ඇතුළත් නොවන මාර්ග කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් අධිකාරියට ලද ප්‍රතිපාදන සහ ඊට අදාළ වියදම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 15 හා 16 ඡේදයන්ට අනුකූලව වෙනම ව්‍යාපෘති ගිණුමක සටහන් නොකර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළම සටහන් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් සහ වත්කම් හා පෙර වර්ෂ ආදායම් සහ වත්කම් පිළිවෙලින් රු. 25,537.47 ක් හා රු.මිලියන 155,703.94 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.	කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2020 සිට ක්‍රියාත්මක සෞභාග්‍යයේ දැක්ම සංවර්ධන වැඩසටහනක් මගින් අධිකාරියේ විෂය පථයට ඇතුලත් නොවන මාර්ගද ඉදිකිරීමට හා සංවර්ධනය කිරීමට සිදු විය. කැබිනට් මණ්ඩල අනුමැතිය මගින් ක්‍රියාකාරී ආයතනය ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වගකීම පවරා මේ වන විට නීත්‍යානුකූලව සම්මත කර ගන්නා ලද වැය ශීර්ෂයකින් මුදල් වෙන් කිරීම සිදු කරන අතර එම මුදල් සෘජුව රේඛීය අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත නිදහස් කර ඉන්පසු අධිකාරිය හරහා ව්‍යාපෘතිය වෙත මූල්‍ය සම්පාදන කිරීම දිගින් දිගටම සිදු වී ඇත. ඒ අනුව වෙනම ව්‍යාපෘති ගිණුම් තැබීමක් සිදු කරන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් දැනුම් දී නොමැත. එබදු පසුබිමක් තුල මෙම ව්‍යාපෘතිය වෙත නිදහස් වන ප්‍රතිපාදන ආදායම ලෙස ගිණුම් තැබීමක් ඉදි කල හා ඉදි කරමින් පවතින මාර්ග වත්කම් ලෙස ගිණුම් කැබීමත් සිදු කරන ලදී.
1.2 (ඊ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 16 හා 17 ඡේදයන්ට අනුකූල වන පරිදි, අධිකාරිය විසින් එහි පරිපාලිත සමාගම් 04 ඒකාබද්ධ කර සමූහයට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.	කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් මඟින් මෙම පරිපාලිත සමාගම් ඇවර කිරීමට තීරණය වී ඇති අතර මේ වන විටද එම පරිපාලිත සමාගම්හි ගිණුම් සකසා ඇත්තේ අධිවේගී මාර්ග බස් සමාගම - 2017 , මග නැගුම ඉමල්ෂන් සමාගම සහ මගනැගුම මාර්ග ඉදිකිරීම් සමාගම -2023 හා මගනැගුම උපදේශන සමාගම- 2024 වර්ෂයන්ට වේ. තවද අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් කටයුතු සිදු කරනු ලබන අතර සමාගම් ගිණුම් කටයුතු සිදු කරනු ලබන්නේ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුවය. ප්‍රමිත අංක 01හි 38, 39 වගන්ති අනුව මෙම සමාගම්වල අඛණ්ඩ පැවැත්මක් නොමැති බැවින් ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ

		නොකරන ලදී.
1.2 (උ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 49 ඡේදයට පටහැනිව, සමාලෝචිත වර්ෂයේදී අධිවේගී මාර්ග පද්ධතියෙන් උපයන ලද රු.මිලියන 12,766.5 ක ආදායම් හා රු.මිලියන 7,534.85 ක මෙහෙයුම් වියදම් වෙන වෙනම ගිණුම්ගත නොකර ශුද්ධ ආදායම් වූ රු.මිලියන 5,231.66 ක් පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සටහන් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපනය වී තිබුණි.	පසුගිය විගණන වාර්තා මගින් අධිවේගී මාර්ග පද්ධතියේ ශුද්ධ ආදායම් වෙනමම ඛණ්ඩයක් ලෙස ඉදිරිපත්කරන ලෙස දැන් වූ බැවින් ද ප්‍රමිත අංක 17 හි 66 වන වගන්තියේ සඳහන් පරිදි අධිවේගී මාර්ග පද්ධතිය වෙනමම ඛණ්ඩයක් ලෙස සලකා එහි ආදායම් හා වියදම් හිලව් කර ලාභය පමණක් ආදායම් ප්‍රකාශනයට 2021 වසරේ සිට ගලපා ඇත. ඛණ්ඩ වාර්තාකරණය මගින් වගකිවයුතු භාවයේ සහ තීරණ ගැනීමේ අරමුණු සඳහා තොරතුරු හෙළිදරව් කිරීමත් පරීශීලනය කරන්නන්ට අදාල තොරතුරු ලබා දීමත් සිදු වේ.
1.2 (ඌ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 39 ඡේදය අනුව විදේශ විනිමය අනුපාතයන් වෙනස් වීම නිසා ඇතිවන උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ මුදල් කාල පරිච්ඡේදයේ මුල හා අග මුදල් හා මුදල් සමාන දෑ සංසන්දනය කිරීම යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ රු.මිලියන 358 ක් වූ විනිමය ලාභය සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට සිදු කරන ගැලපීම් යටතේ රු.මිලියන 375.8 ක් ලෙස අඩු කිරීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය රු.මිලියන 17.72 ක් අඩුවෙන් හා වර්ෂ අවසාන මුදල් වටිනාකම රු.මිලියන 358 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 15 (ආ) වගන්තියෙහි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනිව, සමාලෝචිත වර්ෂයේදී මුදලින් දරන ලද රු.මිලියන 32.74 ක් වූ කෙරිගෙන යන වැඩ වටිනාකම සහ මිලදී ගත් එකතුව රු.මිලියන 6,691.56 ක් වූ දේපල පිරියත උපකරන වටිනාකම් මූල්‍යනය කරන ලද මූලාශ්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් නොකිරීම හේතුවෙන් උක්ත සඳහන් මෙහෙයුම් කටයුතු වල මුදල් ප්‍රවාහයේ සිදු වූ වෙනස්කම් තහවුරු කර ගත නොහැකි විය.	ප්‍රමිත අංක 02 හි 39 පරිදි විනිමය අනුපාතයන් වෙනස් වීමෙහි වන බලපෑම් කාලවිච්ඡේදයේ මුදල් හා මුදල් සමාන දෑ සන්සන්දය කිරීම පිණිස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කරන බවද එය මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඇති වන මුදල් ප්‍රවාහයන්ගෙන් වෙන් කොට ඉදිරිපත් කරන බවද දැක්වේ. එම නිසා අදාල ගැලපීම් සිදු කිරීමට උචිත ස්ථානය වන්නේ අතිරික්තයට සිදු වන බලපෑම් යටතේ වන හෙයින් එලෙස ගලපා ඇති අතර එසේ නොවන්නේ නම් කාලවිච්ඡේදයේ මුදල් හා මුදල් සමාන දෑ යටකට ගැලපූ විට මුදල් හා බැංකුව සමඟ තුලනය නොවන බව දන්වමි. එසේම කෙරිගෙන යන වැඩ (උපලේඛන අංක 193 සිට 226), අධිකාරියේ අරමුදල් වලින් මිලදීගත් දේපළ පිරියත වටිනාකම (උපලේඛන අංක 453 A), දේශීය අරමුදල් වලින් මිලදී ගනු ලැබූ දේපළ පිරියත වටිනාකම (උපලේඛන අංක 453 C) පිළිබඳ විස්තර මේ වන විටත් ඉදිරිපත් කර ඇත.

1.2 (එ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 හි 19 ඡේදයට අනුව, සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය එම වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීත කළ යුතු වුවද, අධිකාරිය විසින් වාණිජ බැංකු මගින් ණය ලබාගෙන මධ්‍යම අධිවේගී මාර්ග I හා III කොටස් උප ව්‍යාපෘති 02 ක් වෙත පිළිවෙළින් ලබා දී තිබුණු රු.මිලියන 38,260 ක හා රු. මිලියන 8,738.66 ක ණය මුදලට අදාළව 2024 වර්ෂය තුළ දරන ලද රු. මිලියන 5,918 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට දරා තිබුණු රු.මිලියන 33,631 ක ණය ගැනුම් පිරිවැය, අධිකාරිය විසින් අදාළ ව්‍යාපෘති වෙත ලබාදුන් ප්‍රාග්ධන දායකත්වයක් ලෙස සටහන් නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් තැබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම වටිනාකමින් කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන්ද, ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රාග්ධන දායක වීම වටිනාකම අඩුවෙන්ද සටහන් කර තිබූ අතර යථෝක්ත ප්‍රමිතියේ අංක 40 (ඇ) ඡේදය අනුව ප්‍රාග්ධනීත කිරීම සඳහා සුදුසුකම් ලබන ණය ගැනුම් පිරිවැය නිර්ණය කිරීමට භාවිතා කළ ප්‍රග්ධනගත කිරීමේ අනුපාතිකය, හෙළිදරවු කර නොතිබුණි.	අදාල ණය මාර්ග සංවර්ධන අධිකාරිය නමින් ලබා ගෙන ඇති අතර ඒ සඳහා වන ණය වාරික හා පොළී ගෙවීමට මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය වන ප්‍රතිපාදන ලබා දෙයි. අධිකාරිය විසින් අදාල ව්‍යාපෘති වලට ලබා දුන් ණය ප්‍රාග්ධන දායකත්වයන් ලෙස සටහන් කරන්නේ නම්, ණය මුදල පෙන්වනු ලබන්නේ අධිකාරියේ ගිණුම් තුල වන නිසා ණය මුදලේ අඩුවීම් පෙන්වීම ව්‍යාපෘති ගිණුම් වාර්තාවන්හි සිදු කල නොහැකි වනු ඇත. ඒ අනුව අධිවේගී මාර්ගය ප්‍රාග්ධනීත කරන තෙක් ප්‍රමිත අංක 04 හි වගන්ති 11 අනුව කෙරීගෙන යන වැඩ වටිනාකමට ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනීත කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයෙන්ද ඒ පිළිබඳව නහවුරුවක් ලබා දී ඇත.
1.2 (ඒ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 හි 34 වන වගන්තිය අනුව, දීර්ඝ කරන ලද කාලපරිච්ඡේද තුළදී, ක්‍රියාකාරී සංවර්ධන කටයුතු අතරමැද නවතා ඇති විටක ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනීත කිරීම අත්හිටුවිය යුතු වුවත්, අතරමැද නවතා තිබූ රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘති සහ මධ්‍යම අධිවේගී මාර්ග I කොටස ව්‍යාපෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.මිලියන 4,839.29 ක ණය ගැනුම් පිරිවැය කාලපරිච්චේදයේ වියදමක් ලෙස හඳුනාගැනීමකින් තොරව, කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයෙහි කෙරීගෙන යන වැඩ වටිනාකම හා අතිරික්තය එම	මෙම අධිවේගී මාර්ග ව්‍යාපෘති රට තුල ඇති වූ ආර්ථික අර්බුද හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා තිබූ හෙයින් හා ප්‍රමිත අංක 04 හි 35 අනුව ඇති වූ තාවකාලික ප්‍රමාද කිරීමක් පමණක් වන නිසා කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ඇත.

	අගයෙන් අධිගණනය වී තිබුණි.	
1.2 (ඔ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 14 අනුව වත්කම් ලෙස හඳුනා ගත යුතු, අධිකාරිය භාවිතා කරනු ලබන සියළුම ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශන වල සටහන්කර නොතිබූ අතර උක්ත ප්‍රමිතයේ 51 වගන්තියට පටහැනිව ගොඩනැගිලි 1134 ක වටිනාකම රු.මිලියන 11,840.02 ක් ලෙස ගිණුම්ගතකර තිබියදී, ගොඩනැගිලි 789 ක් පමණක් 2019 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීම සඳහා හඳුනාගෙන ඒයින් ගොඩනැගිලි 561 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. තවද, තක්සේරුකළ ගොඩනැගිලි වල පිහිටීම, ප්‍රමාණය, අයිතියේ ස්වභාවය, වටිනාකම, තක්සේරු කළ දිනය, වර්ථමාන භාවිතය ආදී තොරතුරු ඇතුළත්කොට යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ගොඩනැගිලි ප්‍රත්‍යාගණන කටයුතු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන අතර අදාළ තක්සේරු වටිනාකම් කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින්නා අතර 2025 වර්ෂය අවසන් වන විට නිම කිරීමට අපේක්ෂා කර ඇත. ස්ථාවර වත්කම් ලේඛනයේ තක්සේරු වටිනාකම, තක්සේරු කල දිනය හා වර්තමාන භාවිතය සඳහන් වුවද ගොඩනැගිලිවල පිහිටීම, ප්‍රමාණය හා අයිතියේ ස්වභාවය ඇතුලත් කර ඒවා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ඕ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 14 අනුව වත්කම් ලෙස හඳුනා ගත යුතු, අධිකාරිය සතු සමාලෝචිත වර්ෂය අවසන් වන විට භාවිතා කරනු ලබන සම්පූර්ණ මහා මාර්ග ප්‍රමාණය හා වටිනාකම එනම් මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථයට අයත් AA , AB, AC, B සහ E ශ්‍රේණි යටතේ මාර්ග කි.මී 12,568 ක් පවතින බව හඳුනාගෙන තිබූ නමුත් එයින් සියයට 29.71 කට සමාන මාර්ග කි.මී 3,734 ක වටිනාකම පමණක් රු.මිලියන 1,140,180 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. 2016 වර්ෂයේ සිට විගණන වාර්තා මඟින් මෙම කාරණය පෙන්වා දී තිබුණද, ඉතිරි මාර්ග කි.මී 8,834 ක වටිනාකම හඳුනාගෙන ප්‍රග්ධනික කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2025 වසර තුල මාර්ග ව්‍යුහය හා පාදම කි.මී. 5,000 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට සැලසුම් කර ඇති අතර මේ වන විට කි.මී. 2,981 ක මාර්ග ව්‍යුහය තක්සේරු කර ඇති අතර ගිණුම්ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
1.2 (ක)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 14 අනුව වත්කම් ලෙස හඳුනා ගත යුතු සහ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කල යුතු ඉදිකිරීම් ආරම්භ කිරීමකින් තොරව 2022 වර්ෂයේ දී අත්හැර දමා තිබූ මධ්‍යම අධිවේගී මාර්ග - IV කොටස	ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 14 (අ) වගන්තිය අනුව වත්කමක පිරිවැය අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතා අස්පිත්වයට ගලා ඒමේ හවුතාවන් තිබෙ නම් වත්කමක් ලෙස හඳුනාගනී. මෙම ව්‍යාපෘතිය 2025 ජූනි මස කැබිනට් මණ්ඩල තීරණ (අංක

	ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් වටිනාකම් රු. මිලියන 1,360.12 ක් වූ ඉඩම්, වර්ෂ 2021 සිට 2024 දක්වා කාලය තුළ කොන්ත්‍රාත් 23 ක් යටතේ නිමකර තිබූ වටිනාකම් රු.මිලියන 706.94 ක් වූ මාර්ග, ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය මගින් 2023 දෙසැම්බර් 31 දින අධිකාරිය වෙත බාර දී තිබූ රු.මිලියන 916.41 ක් වූ වත්කම් සහ දක්ෂිණ අධිවේගී මාර්ග දිර්ඝ කිරීම 3 කොටස ව්‍යාපෘතිය මගින් 2021 දෙසැම්බර් 31 දින අධිකාරිය වෙත බාර දී තිබූ රු.මිලියන 40.6 ක් වූ විද්‍යාගාර උපකරණද, ස්ථාවර වත්කම් ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර නොතිබුණි. එසේම, ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් වූ එහෙත්, වටිනාකම් හඳුනාගනු නොලැබූ වාහන 153ක්, විද්‍යාගාර උපකරණ 12,716 ක් හා පර්යේෂණ හා සංවර්ධන උපකරණ (**R& D Equipments) 14,413** ක් මූල්‍ය ප්‍රකාශන වල වත්කම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. කවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අධිකාරිය නමින් හා පෙර පැවැති දෙපාර්තමේන්තුව නමින් හෝ අධිකාරිය වෙත පවරන ලද RCDC ආයතනය නමින් හෝ ලියාපදිංචි වී නොමැති වාහන 71 ක්, අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන වත්කම් ලේඛනයෙහි ඇතුළත් වී නොමැති එහෙත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අධිකාරිය නමින් ලියාපදිංචිව හා පෙර පැවති දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී ඇති වාහන 1206 ක් පිළිබඳව යාවත්කාලීන කිරීම් ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	අමප/25/0892/809/068 හා 2025.06.17) අනුව නැවත ආරම්භ කිරීමට තීරණය වී ඇති අතර මෙතෙක් ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා ගෙවන ලද මුදල් ඉඩම් යටතේ හඳුනා නොගෙන නොනිමි වැඩ යටතේ ගිණුම් ගත කර ඇති බැවින් අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ග)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 50 වගන්තියට පටහැනිව මූල්‍ය ප්‍රකාශනයේ මාර්ග වත්කම් ලෙස සටහන්කර තිබූ රු. මිලියන 381,641 ක වටිනාකම් තුළ පිළිවෙලින් රු.මිලියන 214.74 ක් හා රු. මිලියන 1,328.34 ක් වූ ඉඩම් හා පාලම් වත්කම් වටිනාකම් ඇතුළත්කර තිබීම හේතුවෙන් ඊට සමාන වටිනාකමින් මාර්ග වත්කම් අඩි ගණනය කර ඉඩම් හා පාලම් වත්කම් වටිනාකම් ඌන ගණනය කර තිබුණි.	රු. මිලියන 1,328.34 මාර්ග වත්කමට අදාළ වන අතර ඒ ඉඩම් වටිනාකම් ලෙස පොදු සටහන් අංක 10 හි පෙන්වීම, පරිගණක ගත කිරීමේදී ඇති ඇතිවූ දෝෂයක් වන අතර එය නිවැරදි කර ඇත. ඒ අනුව ඊට අදාල ක්ෂය ගණනය නිවැරදි වන අතර ක්ෂය වියදම් මාර්ග යටතේ රුපියල් මිලියන 92.983 කින් අධිගනනය වී නොමැති අතර ඉඩම් වත්කම් ඌන ගණනය වී නොමැත. රු. මිලියන 214.748 සඳහා නිවැරදි කිරීම් ජර්නල් අංක

	තවද, අදාළ ඉඩම් හා පාලම් වටිනාකම මාර්ග වත්කමක් ලෙස ක්ෂය කිරීම හේතුවෙන් වාර්ෂික ක්ෂය වියදම් රු.මිලියන 103.72 ක් වැඩියෙන් හා අදාළ වත්කම් වටිනාකම් අඩුවෙන් සටහන්කර තිබුණි.	160/J05 මඟින් 2025 වසරේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
1.2 (ඩ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 58 වගන්තිය අනුව අස්ථීත්වයක් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් සඳහා මුලින් හඳුනාගත් වටිනාකම එහි වැදගත් කොටස් වලට වෙන්කර ක්ෂය කළ යුතු වුවත්, අධිකාරියේ මුළු වත්කම් වලින් සියයට 82 ක් හෙවත් රු.මිලියන 1,140,180 ක් නියෝජනය කරන අධිවේගී මාර්ග පිරිවැය සහ ව්‍යාපෘති 04 ක් මඟින් ඉදි කරන ලද මහාමාර්ග 42 කට අදාළ රු. මිලියන 71,982.01 ක් වූ පිරිවැය, බෝක්කු, පාලම්, පදික වෙදිකාව, ආලෝකය සැපයීම් යනාදී වැදගත් කොටස් වලට වෙන්කර ක්ෂය නොකර, සියයට 03 ක පොදු අනුපාකයකින් ක්ෂය කිරීම හේතුවෙන් අධිවේගී හා මහාමාර්ග වත්කම් සහ ඊට අදාළ එකතුව රු.මිලියන 29,567 ක ක්ෂය වියදම් නිවැරදිව ගිණුම්ගතකර නොතිබුණි.	මාර්ග ගිණුම් ගත කිරීමේදී විස්තරාත්මක තොරතුරු නොමැති මාර්ගවල වටිනාකම සියයට 40% ක් සහ 60% ලෙස වෙන් කර පිළිවෙලින් 10% ක සහ 05% ක ක්ෂය අනුපාතයන් යටතේ සිදු කරන ලදී. එය ගිණුම් සටහන් 2.3 (i) යටතේ හෙළිදරව් කර ඇත. එසේ වුවද, මාර්ග වත්කම් කළමනාකරණ අංශය මඟින් SLRAM පද්ධතියේ වත්කම් කළමනාකරණ මොඩියුලය හරහා තක්සේරු කිරීමේදී මාර්ග වත්කම් ඛාණ්ඩ වශයෙන් තක්සේරුව හා ක්ෂය ගණනය කිරීම සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ච)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 87, 90 හා 92 ඡේදයන්ට අනුකූලව අයිතිය මත පැනවී ඇති සීමාවන් සහ වගකීම් සඳහා ආරක්ෂණයන් ලෙස ප්‍රතිඥා දී ඇති ස්ථාවර වත්කම් අගය, අත්පත්කර ගැනීම සඳහා වූ ගිවිසුම්ගත බැඳීම් ප්‍රමාණය, ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනයන්, තාවකාලිකව අක්‍රීයව ඇති දේපළ වල ධාරණ අගය, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් නවමත් භාවිතාකරන වත්කම් වල ධාරණ අගය සහ ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති සහ බැහැර කිරීම සඳහා තබා ඇති සේ වර්ගීකරණය කළ වත්කම් පිලිබඳ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන මඟින් සිදුකර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 87, 90 සහ 92 වගන්තින්ට අනුකූලව කරනු ලබන හෙළිදරව් කිරීම් ඉදිරියේදී සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ඡ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදය ප්‍රකාරව නොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්විය යුතු වුව ද, අධිකාරියේ අංශ 03 ක වර්ෂ අවසානයට පැවති තොග	අදාල අමුද්‍රව්‍ය තොග වර්ග 03 විස්තර 2025.06.03 දින ඉදිරිපත් කර ඇත.

	වටිනාකම ප්‍රමිතය අනුව අගය නොකර එහි පිරිවැය වටිනාකම වූ රු.මිලියන 286.89 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	
1.2 (ඤ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 හි අතිරේකය යටතේ ප්‍රාග්ධන ප්‍රදාන සටහන් කිරීම සඳහා ඉඩ දුන් විකල්ප ක්‍රමයට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන අතිරික්තය ගණනය කිරීමේ දී ප්‍රාග්ධන ප්‍රදාන රු.මිලියන 111.521 ක් ද ඇතුළත් කිරීම හේතුවෙන්, එම අගයෙන් පුනරාවර්තන අතිරික්තය හා ප්‍රාග්ධන ප්‍රදාන ශූන්‍යතාවය අධි ගණනය වී තිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 පරිදි මූල්‍යප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු දැනට භාවිතා කරනු ලබන ආකෘතිය නිර්මාණය කර ගත් අතර නැවත වරක් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් කහවුරුවක් ලබා ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.
1.2 (ට)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 හි 86(අ) ඡේදය අනුව ආයෝජන දේපළ අගය කිරීමට යොදා ගන්නා ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.	ප්‍රමිත අංක 13හි 64 වගන්තියේ සඳහන් පරිදි ආයෝජන දේපළ සාධාරණ අගය අනුරූපය මත (එනම් තක්සේරු වටිනාකම මත) ගිණුම්ගත කර ඇති නිසා එහි සන්සන්දනය කල හැකි වෙළඳපළ ගණුදෙණු සිදු වන වාර ගණන අඩු හා වෙළඳපළ මිල ගණන් ලබා ගත නොහැකි වන නිසා සාධාරණ අගය මත ගිණුම්වලට ගෙන ඇත. ආයෝජන දේපළ අගය කිරීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
1.2 (ඩ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 14 හි 27,28 සහ 34 ඡේද ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන්ගේ සම්බන්ධතා පිළිබඳ, එනම් ප්‍රධාන කළමනාකරණ පිරිසගේ එකිනෙක පංතියෙහි විස්තර ඇතුළත් කරමින් ඔවුන්ගේ පාරිශ්‍රමික, වෙනත් දීමනා, මූල්‍ය නොවන ප්‍රතිලාභ හා පුද්ගලයින් ගණන, ව්‍යාපෘති කාර්යාල වෙත අනුයුක්ත කර ඇති කළමනාකරුවන් ගණන හා වැටුප් හා දීමනා, අනුබද්ධිත සමාගම් අතර ගිවිසුම් හා ගණුදෙණු, මූල්‍යයනය සහ අතිරේක ඇප පිළිබඳ හෙළිදරව්කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර නොතිබුණි.	මෙම හෙළිදරව් කිරීම ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ණ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 38 ඡේදයේ නිර්නායකයන්ට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් සේවාදායක කොන්ත්‍රාත් කාර්යයන් සඳහා වැය කරන වියදමට සියයට 20 ක ලාභාන්තිකයක් එකතු කර සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 490.97 ක සේවාදායක ආදායම් හඳුනාගෙන	ප්‍රමිත අංක 16 හි 38 වන වගන්තියෙන් හා 31,32,34 වගන්තිවලත් දක්වා ඇති පරිදි කොන්ත්‍රාත් පිරිවැය හා කොන්ත්‍රාත් අයභාරය හඳුනාගෙන ඇති අතර සෑම විටකම කොන්ත්‍රාත් වියදමට 20% ක ලාභාන්තිකයක් එකතු කර නොමැති බව දන්වමි. එසේම 39 වන ඡේදයෙන් නිමැවුම් අදියර මත කොන්ත්‍රාත් පිරිවැය

	තිබුණි.	තීරණය කරන්නේ නම් එම පිරිවැය තුළ අදාල දිනට දරණ ලද පිරිවැය ඇතුලත් වන බව සඳහන් වන බැවින් ඉහත සඳහන් වගන්ති අනුව අධිකාරිය විසින් කොන්ත්‍රාත් අයභාරය හඳුනාගෙන ගිණුම්ගත කර ඇත.
1.2 (ත)	අධිකාරයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.1 ට අනුකූල වන පරිදි අන්තර්ජාතික රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 26 හා 52 වගන්තීන් අනුව අස්ථීත්වයක් විසින් සෑම ගිණුම් වාර්තාකරණ දිනයකදී වත්කම් හානිකරණ පිළිබඳ ඇඟවීම් (Indication) පවතීද යන්න පිළිබඳ ඇගයීමක් කර, එසේ ඇඟවීම් පවතී නම්, වත්කමක ආපසු අයකර ගත හැකි අගය (Recoverable Amount) ගණනය කළ යුතු වුවත්, වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙලින් වටිනාකම රු.මිලියන 32,676 ක් හා රු.මිලියන 577.28 ක් වූ වැඩ පුර්ව අත්තිකාරම් සහ ණය ගැති ශේෂ සඳහා ප්‍රමිතය අනුව හානිකරන ගැලපීම් සිදුකර නොතිබුණි. තවද, මෙම ණය ගැති ශේෂය තුළ දැනට නොපවතින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.මී 306.5 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණු අතර එම වටිනාකම නහවුරු කිරීමට අදාළ ලිඛිත ගිවිසුම් හෝ ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.	මාර්ග සංවර්ධන අධිකාරිය සතු වත්කම් අයිතම ප්‍රමාණය අධික වන අතර එලෙස හානිකරණ ඇගයීම් සිදු කිරීම ප්‍රායෝගිකව දුෂ්කර කටයුත්තකි. එහෙත් ඒ සඳහා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කර දත්ත ඇතුලත් කිරීමෙන් පසු මෙම වත්කම් හානිකරණය පිළිබඳ ඇගයීම් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන වැඩ පුර්ව අත්තිකාරම් සහ ණය ගැති ශේෂ සඳහා ප්‍රමිතය අනුව අදාල හානිකරණ ගැලපීම් මෙම වසරේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. ණය ගැති ශේෂය තුළ දැනට නොපවතින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.මී 306.5 ක ශේෂය සඳහා ශේෂ තහවුරු කිරීමට 2025.04.23 දින ලිපියක් යොමු කර ඇති අතර මහාමාර්ග අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය වෙත කරුණු දක්වා ඒ සම්බන්ධයෙන් තව දුරටත් ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලබන අතර ඒ අනුව හානිකරණ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ද)	2021 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ වටිනාකමින් ලියා හරින ලද අධිකාරියට අයත් නොවන මාර්ග සඳහා දරන ලද රු.මී 8,550 කට අදාළ මාර්ග, පලාත් පාලන ආයතන වෙත භාර දුන් හා භාර ගත් ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.	2024.12.31 දිනට ශේෂය රු. මිලියන 161,684 පැවති අතර 2025.09.30 දින වන විට ඉන් රු. මිලියන 153,735 ක් ප්‍රමාණයක මාර්ග වලට අදාල පිරිවැය , අදාල පළාත් පාලන ආයතන වෙත දැනුම් දීමට කටයුතු කර ඇත.
1.2 (න)	දක්ෂිණ අධිවේගී මාර්ග දීර්ඝ කිරීම (2 කොටස) ව්‍යාපෘතිය අවසන්කර 2021 දෙසැම්බර් 31 දින අධිකාරිය වෙත භාර දුන් ගොඩනැගිලි 12 ක වටිනාකම අධිකාරිය විසින් ගිණුම් කැඩීමේ දී රු.මිලියන 141.43 ක් අඩුවෙන් සටහන් කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම හා ප්‍රාග්ධන ප්‍රදාන	මෙම ගොඩනැගිලි 2021 වර්ෂයේ අදාළ ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදෙන ලද තොරතුරු අනුව ප්‍රාග්ධනීත කර ඇති අතර ඇවර ගිණුම් නිකුත් කිරීමෙන් පසුව සැසඳීමක් නොකළ බැවින් මෙසේ වෙනසක් හට හටගෙන ඇත. එය 2025 වසරේ ජර්නල්

	ඊට සමාන වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි.	අංක 295/J03 මඟින් නිවැරදි කර ඇත.
1.2 (ප)	1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 20 වන වගන්තියට හා කම්කරු කොමසාරිස් ජනරාල් විසින් විගණක ඇමතූ අංක B/පොදු උපදෙස්/5 දරන 2022 ඔක්තෝබර් 19 දිනැති ලිපියේ සඳහන් කරුණු වලට පටහැනිව අධිකාරිය විසින් පාරිතෝෂික දීමනා ගණනය කිරීමේ දී මූලික වැටුප හා ජීවන වියදම් දීමනාවට අමතරව, ගැලපුම් දීමනාව, මාර්ග සංචර්ධන අධිකාරි දීමනාව, ආදී අනුමත නොවන දීමනා 12 ක් සැලකිල්ලට ගෙන පාරිතෝෂික ගණනය කිරීම සිදු කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන් කිරීමේ වටිනාකම රු.මිලියන 954.34 කින් අධිගණනය කර සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඌන ගණනය කර තිබුණි. එසේම සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව, 2024 ජනවාරි මස සිට මැයි මස දක්වා කාලය තුළ දකුණු පළාත් කාර්යාලයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකු වෙත එකතුව රු.මිලියන 1.06 ක්වූ පාරිතෝෂික දීමනා වැඩිපුර ගෙවා තිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාරිතෝෂික ගෙවීම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතෙහි 20 වන වගන්තියට අනුව සිදු කරයි. ඒකාබද්ධ වැටුප යන්නට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවනු ලබන අනෙකුත් ස්ථිර දීමනා සියල්ල අදාල කර ගෙන ඇති අතර මෙය 1986 වර්ෂයේ සිට එකම පදනම මත සිදු කර ඇත. තවද දීර්ඝ කාලයක් තිස්සේ අධිකාරිය විසින් පාරිතෝෂික දීමනා ගණනය කිරීමේදී ඒකාබද්ධ වැටුප යන්නට අදාල කර ගත් වැටුප වෙනස් කිරීම මඟින් කාර්මික ආරවුලක් පැන නැඟිය හැකි අතර ඒ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් කාර්යාලයෙන් විමසීම් කර අදාල පියවර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
1.2 (බ)	අංක 02/2016 දරන හා 2016 ඔක්තෝබර් 21 දිනැති කළමනාකරණ සේවා වක්‍රලේඛය අනුව එක් එක් නනතුරු සඳහා වැටුප් වර්ධක ප්‍රතිශතය අවම 1% සිට උපරිම 2.9% දක්වා පරාසයක පැවතියදී, අධිකාරිය විසින් සියයට 04 ක වැටුප් වර්ධක සීමාවක් පදනම් කරගෙන පාරිතෝෂික වෙන් කිරීම් රු.මිලියන 3,600.1 ක් ලෙස ගණනය කර තිබීම හේතුවෙන් සියයට 2.9 ක උපරිම වැටුප් වර්ධක සීමාව යටතේ වෙන් කළ හැකි උපරිම පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම වූ රු.මිලියන 3,315.33 ට වඩා රු.මිලියන 284.77 ක් වැඩියෙන් පාරිතෝෂික වෙන්කර තිබුණි. ඒ අනුව එම අගයෙන් වියදම වැඩිවීමෙන් අතිරික්තය අවප්‍රමාණය වී තිබුණි.	සූත්‍ර ක්‍රමය අනුව පාරිතෝෂික ගණනය කිරීම ආරම්භයේ සිට වැටුප් වර්ධක ප්‍රතිශතය 4% ක් ලෙස ගණනය කර ඇත. එහෙත් ඉදිරි වර්ෂයේදී මෙම අනුපාතය සමාලෝචනය කර වඩාත් නිවැරදි ආසන්න ප්‍රතිශතයකට ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ .
1.2 (ම)	අධිකාරියේ සියළු පළාත් කාර්යාල සතුව 2024 දෙසැම්බර් 31 දිනට පවතින මුදල් ශේෂය ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කර එදිනට පවතින අනෑකි මුදල් ශේෂය ලෙස සටහන් කළ යුතු වුවත්, එසේ	මේ වන විට සෘජු ප්‍රේෂණ මඟින් සෑම මසකම අවසානයේදී ප්‍රධාන කාර්යාලයට අදාල මුදල් බැර කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

	නොමැතිව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත්කළ මූල්‍ය ප්‍රකාශනයනයෙහි මාර්ගස්ථ මුදල් ලෙස රු.මිලියන 422.95 ක් සටහන්කර තිබුණි. තවද, සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව, පළාත් කාර්යාල සහ පෙරමුසු අංගන වෙතින් ප්‍රධාන කාර්යාලය වෙත 2025 ජනවාරි 03 දින සිට පෙබරවාරි 10 දින දක්වා කාලය තුළ ප්‍රේෂණය කළ රු.මිලියන 311.27 ක මුදලක් 2024 දෙසැම්බර් 31 දිනට පැවති මාර්ගස්ථ මුදල් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම අගයෙන් මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම වැඩියෙන් හා පළාත් කාර්යාල සතුව අතැති මුදල් අඩුවෙන් සටහන් කර තිබුණි.	
1.2 (ශ)	රේඛීය අමාත්‍යාංශය මඟින් වැය විෂයන් 30 ක් යටතේ සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියට ලද රු.මිලියන 151,652 ක ප්‍රතිපාදන ලැබීම් සහ එමඟින් දරන ලද වියදම් වෙන වෙනම හඳුනා ගත හැකි වන පරිදි ලෙජර් ශීර්ෂ පවත්වා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා එකිනෙක වැය විෂය සඳහා ලද ප්‍රතිපාදන එම ප්‍රතිපාදන මඟින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැය කළ හා ඉතිරි වූ ප්‍රතිපාදන වෙන වෙනම හඳුනා ගත නොහැකි විය.	රේඛීය අමාත්‍යාංශයෙන් ලැබෙන අක්මුදල් ප්‍රතිපාදන සටහන් අංක 29 හා 30 මඟින් දක්වා ඇති අතර වියදම් සටහන් අංක 41-46 යටතේ දක්වා ඇත. ඊට අමතරව ප්‍රාග්ධනික කිරීම සඳහා ලැබෙන ප්‍රතිපාදන වලට අදාල වියදම් සටහන් අංක 13 යටතේ ද කෙරිගෙන යන වැඩ වලට අදාල වියදම් සටහන් අංක 15 මඟින් ද දක්වා ඇත.
1.2 (ර)	මාර්ග සංවර්ධන අධිකාරියේ අනුබද්ධිත සමාගම් 03 වර්තමානය වන විට ඈවරකර තනි සමාගමක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ලබාගෙන තිබූ නමුත් අදාළ සමාගම් 03 විසින් අවසන් වරට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් අදාළ සමාගම් වෙත භාවිතය සඳහා ලබා දුන් පිරිවැය රු.මිලියන 17.55 ක් වූ වාහන 05 ක් සහ පිරිවැය සටහන් නොවූ වත්කම් අයිතම 39 ක් පවරාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් කර නොතිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරියට අනුබද්ධිත සමාගම් 03 මඟින් ලබා ගත් වත්කම් පිළිබඳ විස්තර ඉදිරිපත් කර ඇත. මෙම වත්කම් වලින් වාහන තක්සේරු කර අධිකාරියේ පොත් වලට ගෙන ඇති අතර අනෙකුත් වත්කම් තක්සේරු කිරීමට යම් පිළිගත් ක්‍රමවේදයක් සකසා ඒ අනුව තක්සේරු ඉදු කිරීම කළ යුතු බැවින් ඒ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඈවර කිරීමේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති නිසා සමාගම් අවසන් ගිණුම් වලට අනුව මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරනු ලබන වත්කම් සහ මාර්ග සංවර්ධන අධිකාරියට භාර දුන් වත්කම් අතර සැසඳීම් කටයුතු සිදුකිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. මහනැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ

		සමාගම සහ මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම ඔවුන්ගේ වත්කම් මෙතෙක් අධිකාරිය වෙත ලබාදී නොමැත.
1.2 (ඉ)	මූල්‍ය ප්‍රකාශන අනුව පෙරමුසු අංගනයේ කොටස් තොගයේ වටිනාකම රු.මිලියන 157 ක් ලෙස ගිණුම් තබා ඇති නමුත් එහි ඇතුලත් රු.මිලියන 47.86 ක් වූ අමතර කොටස් 2024 වර්ෂය තුළ භාවිතයට ගෙන තිබුණද ඊට අදාල ගැලපීම් සිදුකර නොමැති බැවින් අවසන් තොගයෙහි වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි.	පෙරමුසු අංගනයේ කොටස් තොගයේ වටිනාකම රු.මිලියන 157 ක් ලෙස ගිණුම් තබා ඇති නමුත් එයින් රු.මිලියන 47.56 ක් වූ අමතර කොටස් 2024 වර්ෂය තුළ භාවිතයට ගෙන ඇති අතර ඕට අදාල ගිණුම් ගැලපුම් 2025 මාර්තු මස සිදු කර ඇත.
1.2 (ව)	ඉඹබාගමුව කුඹුක්ගැවේ මඩගල්ල මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළව 2022 වර්ෂයේ ප්‍රාග්ධනිත කළ රු. මිලියන 52.04 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දී නැවත ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව මාර්ග වත්කම් රු.මිලියන 52.04 ක් වැඩියෙන්ද කෙරිගෙන යන වැඩ ගිණුම් එම අගයෙන් අඩුවෙන්ද ගිණුම් ගතවී තිබුණි.	2022 වර්ෂයේ ප්‍රාග්ධනිත කර 2024 වර්ෂයේදී වැරදීමකින් නැවත ප්‍රාග්ධනිත කර ඇති අතර මේ වන විටත් එය ජනල් අංක 156/J03 මඟින් 2025 වසරේදී නිවැරදි කර ඇත.
1.2 (ශ)	කි.මී 1500 ක විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු අනුයාත කිරීමේ දී පරිපාලන වියදම් සඳහා සියයට 6.5 ක් ඇතුළත් කර තිබූ නමුත්, එම සීමාව ඉක්මවා අධිකාරියට අයත් මාර්ග ඉදිකිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 101.49 න් රු.මිලියන 69.88 ක් හෙවත් සියයට 68 ක් අනිකාල, නිවාඩු දින, ගමන් වියදම්, තාක්ෂණික කමිටු ගෙවීම් ඉන්ධන හා අනෙකුත් වියදම් ඇතුළු පරිපාලන වියදම් සඳහා දරා තිබුණි. ඒ අනුව 2023 අංක 34 දරන විසර්ජන පනත අනුව පිළියෙල කළ වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ ලද මුදල් වලින් රු.මිලියන 69.88 ක් විධිමත් අධිකාරි අනුමැතියකින් තොරව පුනරාවර්ථන වියදම් සඳහා වැය කර තිබුණු බැවින් හා මෙම වියදම් කෙරී ගෙන යන වැඩ ලෙස ප්‍රාග්ධනිත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ කෙරී ගෙන යන වැඩ වටිනාකම වැඩියෙන්ද මෙහෙයුම්	මාර්ග සංවර්ධන අධිකාරියේ වක්‍රලේඛ අංක 2024/CL/25 හා 2024.04.19 දිනැති හා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOT & M/ADM/04 (01)/RDA හා 2024.04.09 දිනැති ලිපි මඟින් කි.මී.1500 ව්‍යාපෘතිය ඉතා කෙටි කාලයක් තුල කඩිනමින් අවසන් කල යුතුව තිබූ නිසා පොදු කාර්ය පිරිවැය 6.5%ක වියදම් දැරීමට අනුමැතියට යටත්ව මෙම ව්‍යාපෘති කාර්යයන් සිදු කර ඇත. ඒ අනුව අධිකාරියට අයත් හා අධිකාරියට අයත් නොවන මාර්ග යන දෙකොටසම අයත් මාර්ග ඉදිකිරීම සිදු කර ඇති අතර ඒ සඳහා පොදු කාර්ය වියදම් දරා ඇත. තවද පරිපාලන වියදම් වෙනම මුදලක් ලෙස අමාත්‍යාංශය ලබා නොදුන් අතර ව්‍යාපෘතියට දුන් මුළු මුදල තුල කළමනාකරණය කර ගන්නා ලදී.

	වියදම් අඩුවෙන්ද ගිණුම් ගත වී තිබුණි.	
1.2 (ෂ)	ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වැය වැය විෂයක් යටතේ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් (RWI) සඳහා අධිකාරිය වෙත ලබාදුන් ප්‍රතිපාදන මගින් දරන ලද පිරිවැය ප්‍රග්ධනිත නළ යුතු වූවත්, එම වැය විෂය යටතේ සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. මිලියන 1,300.41 ක් ප්‍රග්ධනිත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම අගයෙන් මූල්‍ය ප්‍රකාශනයේ කෙරිගෙන යන වැඩ වටිනාකම හා අතිරික්තය අඩුවෙන් සටහන් වී තිබුණි.	ඉදිකිරීම් අංශය මගින් මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම වැය ශීර්ෂය යටතේ කොන්ත්‍රාත් ගිවිසුම්ගත කාර්යයන් හා සෘජු කම්කරු කාර්යයන් යන ක්‍රම දෙක යටතේම ඉදිකිරීම් සිදු කරන අතර කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ඉදිකල මාර්ග වල බිල්පත් ගෙවීමේදී අධිකාරියට අයත් මාර්ග වල ගෙවීම් කෙරිගෙන යන වැඩ ගිණුමට මාරු කරනු ලැබේ. සෘජු ශ්‍රමය යටතේ ඉදිකරන ලද මාර්ග වල ඉදිකිරීම් සඳහා 2024 වසරේදී රු. මිලියන 1,300.41 ක වියදමක් දරා ඇති අතර මෙම කාර්යයන් සඳහා අවශ්‍ය සෘජු ශ්‍රමය පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලවල සිටින සෘජු කම්කරුවන්ගෙන් ලබා ගන්නා අතර අමුද්‍රව්‍ය සඳහා මෙම වැය ශීර්ෂය යටතේ මුදල් ලබා ගනු ලබයි. මෙම සෘජු ශ්‍රමය යටතේ කරනු ලබන කාර්යයන් ප්‍රාග්ධනිත කිරීම ප්‍රායෝගිකව සංකීර්ණ කටයුත්තකි. මෙම මාර්ගයන් SLRAM පද්ධතිය මගින් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. කෙසේවෙතත් මේ වන විට වැඩ අවසන් කර ඇති මාර්ග ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමින් පවතී.
1.2 (ස)	අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක සෘජු පාලන හිමිකමක් අධිකාරියට හිමි බව හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහතික විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ද එම ප්‍රතිශතයට සමපාත නියෝජනයක් අධිකාරියට නොමැති අතර අදාළ සමාගමේ රු.මිලියන 01 ක ආයෝජනයක් සිදුකළ බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මගින් සඳහන් වූවද අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එය ණය මුදලක් ලෙස ගිණුම්ගත කිරීමේ දෝෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිවැරදි කර නොතිබුණි.	මේ වන විට මෙම සමාගම් ඇවරකරණයේ පවතින අතර ඇවරකරණ ගණුදෙණු වලදී මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
1.2 (හ)	මූල්‍ය ප්‍රකාශන අනුව දක්ෂිණ අධිවේගී මාර්ගය, පිටත වටරවුම මාර්ගය, කොළඹ කටුනායක අධිවේගී මාර්ගය, මධ්‍යම අධිවේගී මාර්ග අදියර II, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව යන සමස්ථ අධිවේගී මාර්ග	මුදල් අයකැමි අංශය විසින් 2024 වසරේ දත්ත පද්ධතිය මගින් ලබා දුන් මුළු ආදායම් වැටි රහිත අගය රු.12,092,597,161.02 කි. මෙම දත්ත පද්ධතිය තුලට පහත සඳහන් දත්ත 2024 වර්ෂයේදී ඇතුලත් වී

	භාවිතා කිරීමේ ආදායම් (User Income) රු.මිලියන 12,153.45 ක් වූ අතර අධිවේගී මාර්ග අදායම් වාර්තා කිරීමේ පරිගණක පද්ධතිය මගින් 2024 වර්ෂයට අදාළව ලබාගත් ආදායම (VAT රහිත) රු.මිලියන 12,092.59 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා හිඟුම්ගතකළ ආදායම සහ අදාළ පරිගණක පද්ධතිය මගින් වාර්තාකර ඇති ආදායම අතර රු.මිලියන 60.86 ක වෙනසක් පැවතුණි.	නොතිබුණි. 1. QR ලැබීම් 2. ETC ලැබීම් 3. සිදුවේ සිට පැමිණෙ ජාඇල හරහා පිටවන රථවාහන වලට අදාල ටිකට් පත් නිකුත් වීම් POS යන්ත්‍ර මගින් සිදු නොවේ. එය Chineese System මඟින් සිදු වන නිසා එම දත්ත පරිගනක පද්ධතියට ඇතුලත් නොවුණි. 2025 ජුනි මස සිට ණය කාඩ් පත් මගින් ගෙවීම් කිරීම ආරම්භ වීමත් සමඟ ඉහත ETC ලැබීම් හැර අනෙකුත් ලැබීම් දැනට පවතින දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත. අදාල සැසඳුම් සිදු කර මෙම ගැටළුව විසඳීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ළ)	කණු මඟින් ඉදි වන අධිවේගී මාර්ග (නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා) ව්‍යාපෘතිය 16.4 km ක් දක්වා සංවර්ධනය කිරීමේ අරමුණින් 2017 අගෝස්තු මස ආරම්භ කර 2025 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිතව තිබූ නමුත්, ව්‍යාපෘතියේ ඉඩම් අත් කර ගැනීමේ ප්‍රගතිය සියයට 85 මට්ටමේ පැවතියදී 2023 ජනවාරි 31 දින ව්‍යාපෘතිය අකරමහ නතරකර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. ඒ වන විට පැවති ඉඩම් අත්පත්කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එලෙසම පැවතීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(ආ) වගන්තිය අනුව ගෙසට පත්‍රයේ පල කරනු ලැබූ 2020 වර්ෂයේ සිට ව්‍යවස්ථාපිත වන්දි මුදල් සඳහා සියයට 07 ක වාර්ෂික පොලී මුදලක් ගෙවීමට සිදු වුවත් ඊට අදාළ වෙන්කිරීම් සිදුකර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය අංක අමප/23/0631/608/47 හා 2023.05.03 දිනැති කැබිනට් තීරණය මගින් අත්හිටුවා ඇති අතර රාජගිරිය දක්වා කොටසට වන්දි හා පොළී ගෙවීම් සඳහා වන අදාල වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (බ)	මධ්‍යම අධිවේගී මාර්ග අදියර IV ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ හෙක්ටයාර් 475 ක් වූ බිම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබුණු අතර ඉඩම් අත්පත් පනතේ 10 (1) වගන්තිය නිකුත් කරන ලද කැබලි 2335 න් කැබලි 218 ක තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කර	අදාල වියදම් කෙරිගෙන යන වැඩ යටතේ සඳහන් කර ඇති බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. තවද, ගෙවිය යුතු වන්දි හා පොලී මුදල් හඳුනාගෙන හිඟුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

	නොතිබුණි. එකතුව රු.මිලියන 455.51 ක් ලෙස වන්දි නිශ්චය කළ ඉඩම් කැබලි 207 ක් වූ අතර තක්සේරු වාර්තා ලැබී තිබුණු ඉඩම් කැබලි 1571 න් කැබලි 863 කට අදාළව 17 වන වගන්තිය ප්‍රකාශයට පත්කර නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ අත්පත් කරගනු ලැබූ ඉඩම් හෙක්ටයාර් 475 ට අදාළ වියදම් ඉඩම් වත්කම් යටතේ සටහන් කිරීමට සහ තක්සේරු වාර්තා ලැබී තිබුණු ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වන්දි හා පොලී මුදල් හඳුනාගෙන ගිණුම්ගතකිරීමට කටයුතු කර නොතිබුණි.	
1.2 (ඝ)	මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීම යටතේ කෙරිගෙන යන වැඩ ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,817.45 ක් ලෙස සඳහන්ව තිබෙන වටිනාකම තුළ රු.මිලියන 355.72 ක් වටිනා කොන්ත්‍රාත් 8 ක් 2017,2018,2019,2021 සහ 2022 වර්ෂයන්හි අන්තර් නිම කිරීමේ සහතික (Substantially Completed Certificate) කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය විසින් අදාළ මාර්ග නිශ්චිතව අවසාන වී ඇත්ද ඇගයීමක් සිදු කර මාර්ග වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව කෙරිගෙන යන වැඩ වටිනාකම එම වටිනාකමින් අධිගණනය වී මාර්ග වත්කම් වටිනාකම ඌණ ගණනය වී තිබුණි.	කොන්ත්‍රාත් අඩුපාඩු සකස් කර නොමැති බැවින් වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කර නොමැත. අදාල වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කල පසු මාර්ග වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.
1.2 (ඡ) (i)	විගණනයට සාක්ෂි නොවීම - නොසැපයූ විගණන සාක්ෂි ඉඩම් වටිනාකමට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය ඉඩම් වල අයිතිය හඳුනාගැනීමේ ලේඛන රු.මිලියන 60,549.89 ක් වූ ඉඩම්	ඉඩම් වටිනාකමට අදාල ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විටත් ලබා දී ඇත.
(ii)	පිරිවැය දරන ලද මාර්ගයන් හා අදාල කාලය රු. මිලියන 6,792.09 ක් වූ මාර්ග වත්කම්	මාර්ග වත්කම් ලේඛනයේ යාවත්කාලීන කිරීමේදී ඇති වූ දෝෂයක් නිසා මාර්ගයේ නම නිවැරදිව සඳහන් කිරීම මගහැරී ඇති අතර පොදු සටහන අංක 10 හි නිවැරදිව දරන ලද වටිනාකම සහ දුර ප්‍රමාණය සටහන් කර මූල්‍ය ප්‍රකාශන තුළින් ඉදිරිපත් කර ඇත.

(iii)	තොග සත්‍යාපන ලේඛණ, රු.මිලියන 1,222.23 ක් වූ සෘජු අමුද්‍රව්‍ය තොග	අදාල තොරතුරු 2025.06.03 දින ඉදිරිපත් කර ඇත.
(iv)	ශේෂ සනාථ කිරීමේ ලිපි, ලිඛිත ගිවිසුම් රු.මිලියන 833.17 ක් වූ ණය ගැනි ශේෂ (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළුව) රු.මිලියන 17.47 ක් වූ ණය හිමි ශේෂ	අදාල ශේෂ සනාථ කිරීමේ ලිපි රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.
(v)	වත්කම් උප ලේඛන රු.මිලියන 525.014 ක් වූ දේපළ පිරියත හා උපකරණ	මහා මාර්ග දෙපාර්තමේන්තුවෙන් ලද මෙම වත්කම් වලින් මාර්ග සංවර්ධන අධිකාරියේ භාවිතයේ පවතින ගොඩනැගිලි, වාහන සහ පිරියත වල අගයන් තක්සේරු කර තක්සේරු වටිනාකම් මූල්‍ය වාර්තා වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2 ඡේදයේ සඳහන් ඇ, ඈ, උ, ඌ, ඒ, ක, ඛ, ප, න යනාදී පහත සඳහන් නිර්දේශයන් හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

අනු අංකය	විගණන ඡේදය	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති පියවරයන්
2.2.2 (අ) (i)	මූලික පිරිවැය රු. මිලියන 10 ට නොඅඩු සහ වාර්ෂික පුනරාවර්තන හා නඩත්තු පිරිවැය රු. ලක්ෂ 05 ඉක්ම වන්නාවූ ව්‍යාපෘතීන් අදියර දෙකකදී අනුමත කිරීමේ	මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය සඳහා අංක 19/3398/221/001 හා 2019.12.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මූලික අනුමැතිය ලබා ගෙන ඇති

	කාර්ය පටිපාටිය සම්පූර්ණයෙන්ම අනුගමනය කළ යුතු වුවත්, මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ මාර්ග සංවර්ධන කොන්ත්‍රාත් පැකේජ 3928 ක් සඳහා මූලික අනුමැතිය පමණක් ලබාගෙන තිබුණු අතර, ඒ යටතේ මාර්ග කි.මී 17,847 ක් සංවර්ධනය සඳහා දරන ලද රු.මිලියන 188,955.91 ක පිරිවැය සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සහ ප්‍රතිපාදන වෙන් කර ගැනීමේ ක්‍රමවේදය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ අංක 20/0142/221/005 හා 2020.02.05 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම මගින් අනුමැතිය ලබා ගන්නා ලදී. තවද මෙම ව්‍යාපෘතියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අංක අමප/20/1952/319/018 හා 2020.12.14 දිනැති රැස්වීමේදී අනුමත වී ඇති අතර එය පදනම් කර ගෙන ව්‍යාපෘතියේ කටයුතු වාර්ෂිකව සිදු කර ඇත.එලෙසම සංවර්ධන කිරීමට යෝජිත මාර්ග සියල්ල ඉඩම් අත්පත් කර ගැනීමකින් තොරව පවතින මාර්ග තලයම වැඩිදියුණු කිරීම සිදු කරන බැවින් සහ නව මාර්ග අඩංගු වී නොතිබීම හේතුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවීය. එලෙසම මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන අනුමත කිරීම රාජ්‍ය භාණ්ඩාගාරය හරහා වාර්ෂික අනුමත ප්‍රතිපාදන සීමාවන් තුල සිදු කර ඇති අතර ගෙවීම් කර ඇති සම්පූර්ණ මුදල එම වාර්ෂිකව සිදු කල ගෙවීම් වල එකතුවක් වේ.
2.2.2 (අ) (II)	වර්ෂ 2008 හා 2009 දී ජනාධිපති ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද රු.මිලියන 3.24 ක වටිනාකමින් යුත් වාහන 04 ක් සහ පිරිවැය සටහන් නොකළ වාහන 01 ක් එම කාර්යාලයේ නොමැති බව අධිකාරිය වෙත ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන අධ්‍යක්ෂ විසින් 2015 මාර්තු 17 දින දැනුම් දී ඇති බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2024 ඔක්තෝබර් 01 දින පොලිස්පතිවරයා වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව අදාළ වාහන භාරදුන් සහ භාර ගත් පුද්ගලයින් පිළිබඳ විධිමත් විමර්ෂණයක් පවත්වා මුදල් රෙගුලාසි අනුව වගකිව යුත්තන් හඳුනා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.	එක් වාහනයක් මේ වන විට සූරිය වැව පොලිස් ස්ථානයේ ගාල් කර ඇති අතර එය නැවත ලබා ගැනීමට නීති අංශය මගින් කටයුතු කරමින් පවතී. තවත් එක් වාහනයක් ගොතටුව පොලිසිය මගින් සොයා ගෙන ඒ පිළිබඳව අදාල නීතිමය කටයුතු සිදු කරමින් පවතින අතර අදාල වාහනය අඟුලාන වැඩ බිම් පරිශ්‍රයේ ගාල් කර ඇත. ඉතිරි වාහන 03 පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ෂණ සිදු කරමින් පවතී.
2.2.2 (අ) (III)	තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂයන් ආපසු භාර දීම කවර අන්දමකින් වුවද එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරිය විසින් ලබා දී තිබුණු රු.මිලියන 119.95 ක	අය කර ගැනීමට නොහැකිව පවතින අත්තිකාරම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

	අත්තිකාරම් පියවීමට කැටයුතු කර නොතිබුණි. එම වටිනාකම තුළ වූ එකතුව රු.මිලියන 53.9 ක් වර්ෂ 01 සිට වර්ෂ 35 ක අතර කාලයක සිට පියවා නොතිබුණි.	
2.2.2 (අ) (iV)	මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් ආදායම් භාර ගැනීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරෙන නිලධාරීන් ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කෙරෙන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වූවත් අධිවෙඟී මාර්ග සේවය සඳහා සමාලොචිත වර්ෂය අවසන් වන විට යොදවාගෙන තිබුණු මුදල් අයකැමිවරුන් 943 ක් ගෙන් ඇප සුරුකුම් ලබා ගෙන නොතිබුණි.	මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාල මුදල් අයකැමිවරුන්ගෙන් ඇප සුරැකුම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.
2.2.2 (ආ)	2020 ජනවාරි 01 දිනෙන් පසු වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදු කරන ප්‍රසම්පාදන කාර්යයන් e-GP Portal හරහා සිදු කළ යුතු බව දක්වා තිබුණ ද, අධිකාරිය විසින් එම විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය (e-procurement) මේ දක්වා අනුගමනය කර නොතිබුණි.	වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදු කරනු ලබන ප්‍රසම්පාදන කාර්යයන් e-GP Portal හරහා සිදු කිරීම ආරම්භ කල අතර එහිදී සැපයුම්කරුවන් වෙන් වෙන්ව ගොනු කර නොතිබූ බැවින් සැපයුම්කරුවන් තෝරා ගැනීමෙදී ගැටළු සහගත තත්ත්වයන් මතු විය. e-GP කාර්යාංශය මගින් එය නිවැරදි කල පසු ඉදිරියේදී වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ e-GP හරහා සිදු කිරීමට පියවර ගනු ලැබේ.
2.2.2 (ඇ)	මෙම චක්‍රලේඛ මගින් වියදම් සීමා කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී තිබිය දී, එම කරුණු නොසලකා රේඛීය අමාත්‍යාංශයේ හා රාජ්‍ය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන් සඳහා 2023 ජනවාරි මාසයේ සිට 2024 මාර්තු මාසය දක්වා කාලය තුළ අධිකාරියට අයත් වාහන භාවිතා කිරීම වෙනුවෙන් රු.මිලියන 4.39 ක් ද, ඉන්ධන ලීටර් 12,605.91 ක් විධිමත් අනුමැතියකින් තොරව ලබා දී තිබුණි.	රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය මගින් කරන ලද ඉල්ලීම් මත වාහන ලබා දී ඇති අතර ඊට අවශ්‍ය ඉන්ධන ද අධිකාරිය මගින් ලබා දී ඇත. මේ වන විට ඉන්ධන ලබාදීම සීමා කර ඇත.
2.2.2 (ඈ)	රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, වෙළඳපළ පදනම්කරගත් බදු ගිවිසුම් සඳහා යථාර්තවාදී බදු කුලියක් නියමකළ යුතු අතර, ගිවිසුමේ කොන්දේසි ලෙස අවුරුදු 05 කට වරක් බදුකුලී ප්‍රතිශෝධනය කළ යුතු වූවත් එසේ නොමැතිව, කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොලැහැකඩ ගමෙහි මූලික පිඹුරුපත් අංක 4363 දරන හෙක්ටයාර් 6.40 ක ප්‍රමාණය කැබලි අංක 01 සිට	මෙම ඉඩම් පැවරීමට අදාළව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012.09.14 දිනැති තක්සේරුව මගින් ඉහත සඳහන් වැලිපැන්න කොළහැකඩ ප්‍රදේශයේ පිඹුරු අංක 4363 දරණ ඉඩමේ කැබලි අංක 4,6,1 සහ 9 ට අදාළව තක්සේරු වාර්තාවක් ලබා දී ඇත. එහිදී කැබලි අංක 4ට සහ 6 ට අවුරුදු 99 කට සහ කැබලි අංක 1 සහ 9 සඳහා අවුරුදු 30 කටද අදාළව බදු මුදල් දක්වා ඇත. එම තක්සේරු වාර්තාව තුල වසර පහකට වරක් බදු කුළී

	09 දක්වා කොටස් 09 කට බෙදා වෙන් කර, වැලිපැන්න සේවා පෙදෙස ඉදිකිරීම සඳහා එම කැබලි වලින් අංක 04 සහ 06 දරන ඉඩම් වසර 99 ක කාලයක් අක් මුදල් ලෙස (එකවර ගෙවන) රු.මිලියන 21.8 ක් සහ රු.10,000 ක වාර්ෂික නාමික බදුකුලි ගෙවීමේ පදනම් මත පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදී බදු පදනම් ලබා දී තිබුණි. තවද, එම කැබලි වලින් අංක 01 සහ 09 දරන ඉඩම් වසර 30 ක් සඳහා ඉන්ධන පිරවුම්හල් පවත්වා ගෙන යාමට අක් මුදල් ලෙස (එකවර ගෙවන) රු. මිලියන 2.92 ක් සහ රු.10,000 ක වාර්ෂික බදු කුලි ගෙවීමේ පදනම් මත වෙනත් පුද්ගලික සමාගමක් වෙත 2013 සහ 2014 වර්ෂයන්හි දී බදු දී තිබුණි.	ප්‍රතිශෝධනය කල යුතු බව දක්වා නොමැත.
2.2.2. (ඉ) (i)	අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදය මේ වන විටත් ක්‍රියාත්මක කරන අතර මානව සම්පත් කළමනාකරණ අත්පොත සකස් කල පසු කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදය ආරම්භ කරනු ලැබේ.
2.2.2 (ඉ) (ii)	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂයට අදාලව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම (අභ්‍යන්තර පුහුණුවීම්) පිළියෙල කර ඉදිරිපත් කර ඇත.
2.2.2 (ඊ)	පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගැනීමෙන් පසුව ගෙවීම් සහතික කළ යුතු වුවත්, එසේ නොමැතිව පැමිණීමේ ලේඛනය අනුව සේවයට වාර්තා කළ සහ පිටව ගිය වෙලාවන් පරීක්ෂා කිරීම මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 94.46 ක් අතිකාල ලෙස ගෙවා තිබුණි. තවද, මාතර වීධායක ඉංජිනේරු කාර්යාලයේ සේවය කරන කාර්මික නිලධාරියකු 2024 මාර්තු 25 දින සිට 2025 පෙබරවාරි 11 දින දක්වා කාලය තුළ පැමිණීම් සහ පිටවීම් සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණු නමුත් ඒම කාලය තුළ වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන1.09 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.	2024 දෙසැම්බර් මාසයේ පාලන අංශයේ කාර්යාල කම්කරු W.A.C. රත්නසේකර මහතා (P.F 8031) අතිකාල පැය 107.5 ක් සඳහා රු.19,578.43 ලබාගෙන ඇත. ඔහුගේ පැමිණීම් හා පිටවීම් ඇඟිළි සළකුණු යන්ත්‍රය පදනම් කරගෙන සනාථ කර ඇති බව දන්වමි. සේවා අංක 4276, 7963, 8027, 8204, 12298, 9136, 11340, 11891, 11981, 12270 දරණ සේවක මහත්ම මහත්මීන්ගේ අතිකාල ගෙවීම් සිදු කර ඇත්තේ ඇඟිලි සලකුණු යන්ත්‍රය හා බැහැරයාමේ ලේඛනය පරීක්ෂා කිරීමෙන් පසුවය. ඉහත සේවා අංක දරණ සේවක මහත්ම මහත්මීන් කිහිප දෙනෙක් වත්කම් භාණ්ඩ සමීක්ෂණ රාජකාරි වල නිරතව සිටි අතර තවත් අය දින කිහිපයක් පිටත රාජකාරි වල නිරතව ඇත. ඒ අනුව පිටවීම් බැහැරයාමේ ලේඛනයේ සටහන්ව ඇත.

		සේවා අංක 9028 දරණ සේවක මහත්මියගේ අතිකාල ගණනය සිදු කර ඇත්තේ ඇඟිලි සලකුණු යන්ත්‍රය පදනම් කරගෙන වේ. සේවා අංක 11891 දරණ සේවක මහත්මා අතපසුවීමකින් දෙසැම්බර් මස 02 පිටවීම හා 03 දින පැමිණීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කර නොමැත. එනමුත් ඔවුන්ගේ නිවැරදි අත්සන අත්සන් ලේඛනයේ සටහන් කර ඇති බව තහවුරු කර ගෙන ඇත. ඉඩම් අංශයේ හා නාත්තු කළමනාකරණ අංශයේ අතිකාල හා නිවාඩු දින වැටුප් ගණනය කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සඳහන් වේලාවේ සහ බැහැර යාමේ ලේඛනයේ සඳහන් වේලාව පදනම් කර ගෙන ගෙවීම් කර ඇත.
2.2.2 (උ)	දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර තිබූ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක නොකර අධිකාරිය විසින් බඳවා ගෙන තිබුණු තනතුරු නිලධාරීන් 106 දෙනෙකු වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු MM 1-3 වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පරිමාව වෙනුවට HM වැටුප් පරිමාවේ පිහිටුවා තිබුණි. එම නිලධාරීන් වෙත ගෙවිය යුතු වැටුප් පරිමාණයේ මූලික වැටුපට වඩා රු.මිලියන 451.58 ක් මූලික වැටුප් ලෙස ගෙවා තිබුණි.	මේ වන විට ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ට HM 1 වැටුප් ක්ෂේත්‍රය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පමණක් ලබා දීමට කටයුතු කරමින් පවතී.
2.2.2 (ඌ)	නිලධාරීන් හට අනුමත වූ වැටුපකට අමතරව යම් දීමනාවක් ලබා ගන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හා වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතු වුව ද, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් පදනම්ව මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාව (Professional Allowance) ලෙස රු.මිලියන 98.71 ක් හා 2015	වෘත්තීය දීමනාව (Professional Allowance) යනු එක් එක් වෘත්තීයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Corporate Membership) ලබා ඇති මෙම අධිකාරියේ විධායක තනතුරු දරණ නිලධාරීන් හට පමණක් ගෙවනු ලබන විශේෂිත දීමනාවක් වේ. මාර්ග සංවර්ධන අධිකාරිය හා සමාන සේවා සපයන ආයතනයන් වන ලංකා විදුලිබල මණ්ඩලය, ජල

	අප්‍රේල් 04 දින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළු වෘත්තීය සමිති ඇමතූ ලිපියක් පදනම් කරගෙන අධිකාරී දීමනා ලෙස රු.මිලියන 976.61 ක් ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.	සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය වැනි ආයතනයන්හි වෘත්තිකයන් සඳහා වෘත්තීය දීමනාව ගෙවනු ලබන බැවින්, එයට අනුව අධිකාරියේ වෘත්තිකයන් හට සිදුවී තිබූ වැටුප් විෂමතාවයට පිළියමක් ලෙසත්, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවන් ඇතුළු වෘත්තිකයින් අධිකාරිය තුල රඳවා ගනිමින් ඔවුන්ගෙන් වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමේ අරමුණින් එක් එක් වෘත්තියට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Corporate Membership) ලබා ඇති විධායක ශ්‍රේණියේ කනතුරු දරණ නිලධාරීන් හට වෘත්තීය දීමනාවක් ගෙවීමට අංක. 1698/2016 මඟින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙය මාර්ග සංවර්ධන අධිකාරිය තුල ගෙවනු ලබන විශේෂිත දීමනාවක් වන අතර, මෙම ගෙවීම් මධ්‍යම කළමනාකරණ මට්ටමේ හා ඉහල කළමනාකරණ මට්ටමේ නිලධාරීන් සඳහා ශ්‍රේණි පදනම් කර ගනිමින් සිදු කරනු ලබයි. එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබා දී තිබූ අනුමැතියකට අනුව මෙම දීමනාව මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවන් සඳහා 1993 වසරේ සිට ගෙවීම් කර ඇත.පසුකාලීනව සියළුම සේවකයින්ට මෙම දීමනාව ගෙවා ඇති අතර සාමූහික ගිවිසුම මඟින් අදාල අනුමැතිය ලබා දී ඇත. තවද මාර්ග සංවර්ධන අධිකාරී දීමනාව ගෙවීමගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය කැබිනට් මණ්ඩලය විසින් විමසා ඇති අතර ඒ සම්බන්ධයෙන් වන සාකච්ඡා සිදු කරමින් පවතී.
2.2.2 (ඒ) (i)	අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිකුපතා යාවත්කාලීන කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.	වර්ෂ තුනක කාලයක් සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලසුම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබා ගෙන මේ වන විට වෙබ් පිටුවෙහි පල කර ඇත.

2.2.2. (එ) (ii)	අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි.	අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලබන ඉහළ වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් පිළිබඳව අධිකාරියේ වෙබ් පිටුවෙහි පල කිරීමට කටයුතු කරනු ලැබේ. කොන්ත්‍රාත් පැහැර හැර ඇති සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් සකසා නඩත්තු කිරීම සඳහා මෙම වන විට වෙනම අංශයක් පිහිටුවා ඇති අතර ඒ හරහා එම කටයුතු මෙම වර්ෂය තුල ආරම්භ කර නඩත්තු කිරීමට කටයුතු කර ඇත.
2.2.2. (ඒ)	ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් තුළ තම ආයතනයේ ස්ථාපිත අරමුණු ලභාකර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය සකස්කර මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු වුවද, අධිකාරිය ඒ අනුව කටයුතුකර නොතිබුණි.	2024-2028 වර්ෂය සඳහා සැකසූ ආයතනික උපායමාර්ග සැලසුම් (කෙටුම්පත) 2023.12.07 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කල අතර, 2023.12.22 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ආයතනික උපාය මාර්ගික කෙටුම්පත සඳහා සිදු කල යුතු සංශෝධන කිහියක් ඉදිරිපත් කර ඇති අතර, එම සංශෝධන සිදු කිරීම සඳහා විශේෂඥයකුගේ (Expert) සහය ලබා ගන්නා ලෙසද නිර්දේශ කොට තිබිණි. එසේම නිසි පරිදි සැකසූ ආයතනික උපාය මාර්ගික සැලැස්ම (2024-2028) ඉදිරිපත් කිරීම සඳහා අදාල ආයතනය වෙතින් කාලය දිර්ඝ කරගැනීමක් ලබා ගන්නා ලෙසත් නිර්දේශ කොට තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතනික උපාය මාර්ගික සැලස්ම (2024-2028) නිවැරදිව සකස් කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් කාලය දිර්ඝ කිරීමක් ලබාගත් අතර, විශේෂඥයෙකුගේ සහයද ලබාගැනිමෙන් අනතුරුව නිවැරදිව සැකසූ 2024-2028 ආයතනික උපාය මාර්ගික සැලැස්ම 2024.05.21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කළ අතර, 2024.06.17 වන දින අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.
2.2.2. (ඔ)	සියලුම රාජ්‍ය ව්‍යවසායී ආයතන (SOEs) සතුව, ප්‍රධාන මෙහෙයුම් සියල්ල ආවරණය වන පරිදි, තමන්ගේම පද්ධති, ක්‍රියාවලීන් සහ ක්‍රමෝපායික (Protocols) පැහැදිලිව නිශ්චිත කළ අත්පොත් තිබිය යුතු අතර මෙම අත්පොත් කාලීනව සමාලෝචනය කර යාවත්කාලීන	මෙහෙයුම් අත්පොත හා ඊට අනුකූල වන පරිදි පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර රාජ්‍ය ව්‍යාපෘර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

	කළ යුතුය. ඒ අනුව සංවිධාන සටහනට (Organization Chart) අනුකූලව ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බලතල සහ වගකීම් පැහැදිලිව පවරා තිබිය යුතු වුවත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, මෙම මෙහෙයුම් අත්පොතෙහි සඳහන් විධිවිධාන හා යෝජනා සලකාබලා පරිපාලන සහ මූල්‍ය අත්පොත් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	
2.2.2 (ඔ) (i)	බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සඳහා (Scheme of Recruitment) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුව ද, අධිකාරියේ සියළු සේවකයින් සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනු මතකරගෙන නොතිබුණි.	පහතින් සඳහන් තනතුරුවලට හැර බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ වන විට ලබා ගෙන ඇති අතර , තව දුරටත් ලබා ගත යුතුව ඇත්තේ ඉංජිනේරු (Incorporate),ජ්‍යෙෂ්ඨ කාර්මික නිළධාරී, ජ්‍යෙෂ්ඨ විදුලි අධිකාරී, ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික නිළධාරී යන තනතුරු සඳහා පමණි.
2.2.2 (ඔ) (ii)	අධිකාරිය විසින් පිළියෙල කරනු ලබන උපාය මාර්ගික සැලැස්මෙහි ආයතනයේ එක් එක් අංශයේ (Divisions of the SOE) සේවක අවශ්‍යතාවය, මානව සම්පත් සැලැස්මක් ආකාරයෙන් (Human Resource Plan) දැක්විය යුතු වුව ද එවැනි අංශ වශයෙන් සේවක අවශ්‍යතාවයක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් කළමනාකරණ හා පාලන අංශය මගින් අධිකාරියේ එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය, සඳහා මානව සම්පත් සැලැස්ම මේ වන විට පිළියල කරමින් පවතී.
2.2.2 (ඔ) (iii)	කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව රාජ්‍ය ව්‍යවසායක සේවකයකු අමාත්‍යාංශයක හෝ වෙනත් ආයතනයක් වෙත නිදහස් නොකළයුතු බවත් අදාළ අනුමැතීන් මත නිදහස් කළහොත් එසේ නිදහස්කරන කාලයට අදාළව කිසිදු ගෙවීමක් සිදුනොකළ යුතු වුවද අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව මහාමාර්ග අමාත්‍යාංශයට සේවකයින් 07 දෙනෙකු නිදහස්කර 2023 වර්ෂය තුළදී වැටුප්, අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු. 4,384,439 ක් ගෙවා නිබු අතර එම අනුකූල නොවූ ගෙවීම් සමාලෝචිත වර්ෂය අවසන් වනතුරු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සේවකයින් බඳවාගනු ලබන්නේ අධිකාරියේ අවශ්‍යතාවය මත වුවද සේවා අවශ්‍යතාවය මත නිළධාරීන් පහත පරිදි අනුයුක්ත කර ඇත. 1. රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, 2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමට අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතියට යටත්ව 3. ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත මොවුන් අධිකාරිය මගින් බඳවා ගත් නිලධාරීන් / සේවකයන් වන බැවින් ඔවුන්ට වැටුප්, අතිකාල හා ගමන් වියදම් අධිකාරිය විසින් ගෙවා ඇත. එහෙත් මෙම අතිකාල සහ ගමන් වියදම් සම්බන්ධයෙන් සහතික කිරීම සිදු කරනු ලබන්නේ ඔවුන් අනුයුක්තව සිටින කාර්යාලයේ ප්‍රධානියා වන බැවින් එකී සහතික කිරීම /

		නිර්දේශය මත මොවුන්ට වැටුප් හා අනෙකුත් දීමනා අධිකාරිය මගින් ගෙවනු ලබයි.
2.2.2 (ඔ) (iv)	රජය සතු ව්‍යවසායක වාර්ෂික ආදායම රු.බිලියන 30 ඉක්මවන විට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි ආයෝජන කමිටුවක් ස්ථාපිත කිරීමටත්, සේවක පාරිශ්‍රමික ඇතුළු පුනරාවර්ථන දැරීම සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන ලබා නොගත යුතු බව සඳහන් කළද අධිකාරිය විසින් 2023 හා 2024 වර්ෂයන් හී ආදායම පිළිවෙලින් රු. මිලියන 108,970.58 ක් හා රු. මිලියන 44,789.35 ක් වූවද අදාළ ආයෝජන කමිටුව පිහිටුවීමට කටයුතු කර නොමැති අතර, සමාලෝචිත වර්ෂය තුළ සේවක වැටුප් හා පාරිශ්‍රමික ගෙවීම සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන මගින් රු.මිලියන 9,461 ක් ලබාගෙන තිබුණි.	2024 වර්ෂයේදී ලද ආදායම (අධිවේගී මාර්ග ආදායම ඇතුළුව) රු. බිලියන 16.2 ක් වන අතර 2023 වර්ෂයේදී ආදායම රු. බිලියන 14.6කි. ඒ අනුව අධිකාරියේ ආදායම 2023 හා 2024 වසර වල රු. බිලියන 30 ඉක්මවා නොමැත.
2.2.2 (ඔ) (v)	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	මේ වන විටත් ගිණුම් විගණකාධිපති වෙත දින 60ක් ඇතුලත ඉදිරිපත් කර ඇති අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර ඇත.
2.2.2 (ක)	මාර්ග කි.මී.100,000 ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අධිකාරියට අයත් නොවන මාර්ග අදාළ ආයතන වෙත පවරා දීමට වැඩ පිළිවෙලක් සකස්කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 03/2022 චක්‍රලේඛය සහ ඒ අනුව මහාමාර්ග අමාත්‍යාංශය මගින් දෙන ලද උපදෙස් වලට අනුව වැඩ අවසන් නොවූ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග අදාල පළාත් පාලන ආයතන වෙත භාර දීමට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශයක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කලද අනුමැතිය හිමි වූයේ මහජනතාවට මාර්ගය අපහසුවකින් තොරව භාවිතා කල හැකි පරිදි වාර්ෂිකව වෙන් කර ඇති ප්‍රතිපාදන ඇතුලත එම මාර්ග සංවර්ධනය කර නැවත භාර දෙන ලෙසයි. ඒ අනුව එම මාර්ගයන්හි වත්කම් භාරකාරීත්වය දරණ ආයතන වලට මාර්ගයේ වැඩ නිම කර එම වත්කම් මාරු කරන අවස්ථාවේදී අදාල පිරිවැයද සහිතව මාරු කිරීමට අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ. මේ වන විට බිලියන 100 කට ආසන්න වැඩ නිම කල මාර්ග අදාල පළාත් පාලන ආයතන වෙත භාර දී ඇති

		අතර ඉතිරිය මෙම වසර තුලදී සිදු කිරීමට නියමිතව ඇත.
2.2.2 (ග)	2005 නොවැම්බර් 03 දිනැති අංක: අමප/05/1711/016/110 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබූ මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදලක් පිහිටු වීමට කටයුතු කර නොතිබුණි	මාර්ග නඩත්තු භාරකාර අරමුදල පිහිටුවීම සඳහා සකසන ලද වාර්තාව මහාමාර්ග අමාත්‍යාංශය හරහා මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇතත් ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග මහා භාණ්ඩාගාරය මඟින් ගෙන නොමැත.
2.2.2. (ඩ) නිර්දේශ අංක 05	මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු අධීක්ෂණ මාර්ග ජාලයට සහ ජාතික මාර්ග වලට පමණක් (A & B පන්තියට) සීමා විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ කි.මී 1500 ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ප්‍රතිපාදන ලෙස රු.මිලියන 12,700.95 කින් රු.මිලියන 11,007.27 ක් ප්‍රතිශතයක් ලෙස 87% ක් අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් රජයේ අරමුදල් ප්‍රතිපාදනය කළ අරමුණට පරිබාහිරව වියදම් කර තිබුණි.	අංක MF/NB/CM/01/2024/117/01 හා 2024.01.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අදාල කටයුතු සිදු කර ඇත.
2.2.2 (ඩ) නිර්දේශ අංක 13	අධිකාරිය යටතේ සියළු මාර්ග වල සංචලනය සම්බන්ධයෙන් දත්ත ඇතුළත් ඒකාබද්ධ මධ්‍යම දත්ත ගබඩාවක් ස්ථාපිත කර සංවර්ධන අරමුණු සඳහා අවශ්‍ය දත්ත සංචලනය සම්බන්ධ ඕනෑම රාජ්‍ය ආයතනයකට ප්‍රවේශ වීමේ හැකියාව අධිකාරිය විසින් සැපයිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

අනු අංකය	විගණන ඡේදය	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති පියවරයන්
(අ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත		
2.2.3 (i) 6(1) වගන්තිය	උසස් මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස්කිරීමට, ක්‍රමෝපාය සංවර්ධනය කිරීමට, මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් පියවර ගැනීමට, අධිකාරිය විසින් යොමු කරනු ලබන	නව විෂය භාර අමාත්‍යවරයා යටතේ මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

	මාර්ග සැලසුම් පිළිබඳ කටයුතු කිරීමට අමාත්‍යාංශය වෙත උපදෙස් ලබා දීම සඳහා පිහිටවිය යුතු "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවා නොතිබුණි.	
2.2.3 (ii) 7(3) වගන්තිය	දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු මගින් සෑම දිස්ත්‍රික්කයක් සඳහාම මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ වෙනත් නියෝජිත ආයතන විසින් භාර ගෙන ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	දිස්ත්‍රික් මාර්ග සංවර්ධන සම්බන්ධීකරණ කමිටු සඳහා පළාත්සභා හා පළාත් පාලන ආයතනයන්ගේ මහජන නියෝජිත සහභාගීත්වය අවශ්‍ය බැවින් අදාල පළාත්සභා හා පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයින් පත් කර ගැනීමෙන් අනතුරුව මාර්ග පද්ධති සංවර්ධන උපදේශන සභාවේ කාර්යයන් ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සම්පත් සකසුරුවම් ලෙස , කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුල අදාල නීතිරීති වලට අනුකූලව සම්පාදනය කර භාවිතා කර ඇති බව.

අනු අංකය	විගණන ඡේදය	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති පියවරයන්
2.2.4 (අ)	අධිකාරිය සතු ගැටලුකාරී තත්ත්වයන් පවතින වාහන සම්බන්ධව පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා දීම සඳහා පත් කරන ලද කමිටුවේ සාමාජිකයින් වෙත 2022 ඔක්තෝබර් 03 දින සිට 2023 පෙබරවාරි 23 දින දක්වා කාලයට අදාළව රු. මිලියන 2.78 ක් ගෙවීම් කර තිබුණද, එම වාර්තාව මගින් සිදුකළ නිර්දේශයන් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි.	අධිකාරියෙහි ගැටළු සහිත වාහන 306 ක් සම්බන්ධව පරීක්ෂා කර වාර්තාවක් ලබා දීමට පත් කරන ලද කමිටුව මගින් එම වාර්තාවේ අංක vii යටතේ යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කර ඇත. එහි වත්කම් ලේඛනය පවත්වා ගෙන යාම සම්බන්ධව ඉදිරිපත් කර ඇති කරුණු බොහොමයක් මේ වන විටත් ඉටු කර පවතී. වාහන වත්කම් ලේඛන යාවත්කාලීන කරමින් පවතින අතර මූල්‍ය අංශය විසින් පවත්වා ගෙන යනු ලබන වත්කම් ලේඛනය හා යාන්ත්‍රික අංශය මගින් පවත්වා ගෙන යන වත්කම් ලේඛනය සැසඳීම් කර අදාල ගැලපීම් ද මේ වන විට සිදු කරමින් පවතී.

2.2.4 (ආ)	දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදුව සිට කොට්ටාව දක්වා කොටස මෘදු බිම් ප්‍රදේශ (Soft Ground Areas) හරහා දිවෙන බැවින් වර්ෂ 07 ක කාලයෙන් පසු Asphalt Overlaying කිරීම සිදු කළ යුතු බව හඳුනා ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම මාර්ගය ඉදිකර වර්ෂ 13 ක් ගත වුවද එම කාර්යය සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි.	රට තුළ පැවති කොවිඩ් අර්බුධය හා මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම කාර්යය පමාවීම හා මන්දගාමී වීම සිදු වුවද මේ වන විට කොට්ටාව සිට දොඩංගොඩ දක්වා කොටසේ පෙරමුසු ඇතිරීමට අදාලව ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතින අතර මෙම වසර අවසාන වන විට මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අපේක්ෂිතය.
2.2.4 (ඇ)	දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි දැනට භාවිතා කරන අයකැම් පද්ධතිය 2011 වර්ෂයේ තාවකාලිකව ස්ථාපිත කරන ලද පද්ධතියක් වූ අතර, නවීන තාක්ෂණය අනුව, ගෙවීම් සිදු කළ හැකි මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබූ අතර, අධිවේගී මාර්ග වලින් පිට වීමේ ගේට්ටු වැසීම හා විවෘත කිරීමේ සවයංක්‍රීය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද, එවැනි ක්‍රමවේදයක්ද ස්ථාපිතකර නොතිබුණි.	කොට්ටාව සිට කඩවත දක්වා ස්වයංක්‍රීය ගේට්ටු පරිපාලන පද්ධති නවීකරණය කර ඇත. කහතුඩුවේ සිට ගොඩගම දක්වා ස්වයංක්‍රීය ගේට්ටු පරිපාලන පද්ධති 2025 වසර අවසන් වන විට සම්පූර්ණ කිරීමට නියමිතව ඇත. එවිට 2025 වසර අවසන් වන විට කඩවත සිට ගොඩගම දක්වා සියලුම අන්තර් හුවමාරු වල ස්වයංක්‍රීය ගේට්ටු ස්ථාපිත කිරීමට නියමිතය.
2.2.4 (ඈ)	අධිවේගී මාර්ග පරිශීලක ගාස්තු නිරණය කිරීමට අදාලව ස්ථාවර ගාස්තුව ගණනය කර තිබුණේ අපේක්ෂිත ආයෝජනය නැවත අය කර ගැනීමේ වර්ෂ 30 ක කාලය තුළ (Target Period of Investment Recovery) ඇස්තමේන්තුගත වාර්ෂික මෙහෙයුම් වියදම්, වර්ෂය තුළ සියළු ඇතුල්වීමේ ගේට්ටු තුළින් අධිවේගී මාර්ගයට ඇතුළු වන අපේක්ෂිත වාහන සංඛ්‍යාවෙන් බෙදීමෙන් වන අතර, අපේක්ෂිත ආයෝජනය නැවත අයකර ගැනීමේ කාලය තුළ මුළු ඉදිකිරීම් පිරිවැය සහ දැරීමට සිදුවන නඩත්තු වියදම් වටිනාකම, එම කාලය තුළ ඇතුළු වන මුළු වාහන ධාවනය කරන කි.මී ගණන බෙදීමෙන් ලැබෙන රේටය විවල්‍ය ගාස්තුව ලෙස ගණනය කර තිබුණි. ඒ අනුව කොට්ටාව කඩුවෙල (OCH) අධිවේගී මාර්ගයට අදාළව වාර්ෂික මෙහෙයුම් වියදම් (Operation cost During the recovery Period) රු.මිලියන 46 ක් ලෙසත් මුළු වාහන ඇතුළුවීම් 131,155,450 ක් සිදුවේ යැයි උපකල්පනය කර තිබුණු අතර, දක්ෂිණ අධිවේගී මාර්ගයට (කොට්ටාව සිට මාතර දක්වා) අදාළව වාර්ෂික මෙහෙයුම් වියදම් රු.මිලියන 1000 ක් ලෙසත් මුළු වාහන ඇතුළු වීම්	අධිවේගී මාර්ග පරිශීලක ගාස්තු 2023 මැයි මසදී සංශෝධනය කර ඇත.

	974,958,800 ක් සිදු වෙතැයි උපකල්පනය කර තිබුණද, 2024 වර්ෂයේ පමණක් එම අධිවේගී මාර්ග දෙකෙහි මෙහෙයුම් වියදම් රු.මිලියන 2,220.48 ක් වී තිබුණි. ඒ අනුව සැලසුම්කළ පරිදි මෙහෙයුම් වියදම් පාලනය කිරීමට කටයුතුකර නොතිබුණි.	
2.2.4 (ඉ)	අධිවේගී මාර්ග අන්තර් හුවමාරු කාර්යාලය මඟින් දෙනිකව එකතුකරනු ලබන පරිශීලක ගාස්තු දෙනිකව බැංකුගත නොකිරීම හේතුවෙන්, අතිරේක මුදල් කෙටි කාලීන ආයෝජන මාර්ග වල යෙදවීම මඟින් ලැබීමට හැකි ආදායම අධිකාරියට අහිමි වන බවත් මුදල් වංචා සිදුවීමට හැකි පරිසරයක් අන්තර් හුවමාරු කාර්යාලය තුළ ගොඩනැඟී තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.	කොටටාව සිට ගොඩගම දක්වා අන්තර් හුවමාරු 11 ක එක් දිනක මුදල් ආදායම දළ වශයෙන් රු. මිලියන 14.5 ක් වන අතර එය එක් දිනක ආයෝජනය කිරීමෙන් ලැබෙන පොළී ආදායම රු 2,681.50 ක් වේ. සෑම සතියකම සඳුදා, බදාදා, සිකුරාදා සහ සෙනසුරාදා මුදල් එකතු කිරීම ලංකා බැංකුව විසින් සිදු කරනු ලබයි. මසකට දින 13 ක් පමණ මුදල් එකතු නොකරන අතර එයින් අහිමි වන ආදායම වනුයේ රු. 34,859.50 ක් වන අතර එම මුදල් එකතු කිරීම සඳහා දෙනිකව සිදුකරන්නේ නම් ඒ සඳහා දෙනිකව දැරීමට සිදුවන වියදම ආදායමට සාපේක්ෂව අධික වේ. 2025 ජුනි මාසයේදී කාඩ්පත් මඟින් ගෙවීමේ ක්‍රමය හඳුන්වා දීමෙන් පසු මුදල් භාවිතය අඩුවන බැවින් අහිමිවන පොලී ආදායම අවම වේ.
2.2.4 (ඊ)	2019 නොවැම්බර් මස සිට 2024 ජූලි දක්වා වූ වර්ෂ 04 මාස 09 ක් තුළ ප්‍රවේශ ටිකට් පත් (Entry Tickets) 133,840,213 ක් නිකුත් කර තිබුණු අතර ඉන් වාහන 18,291,430 ක් සඳහා පිටවීමේ ටිකට් පත් (Exit Ticket) නිකුත් කර නොතිබීම හේතුවෙන් එම කාලය තුළ අධිවේගී මාර්ගයන්හි ගමන්කළ වාහනයකින් අයකළ සාමාන්‍ය ගාස්තුව පදනම් කරගෙන සිදු කළ ගණනය කිරීම් අනුව, අධිකාරියට අහිමි වූ ආදායම දළ වශයෙන් රු. මිලියන 4,614.47 ක් පමණ වන අතර දෛනික ආදායම් අහිමි වීම රු.මිලියන 01 ට ආසන්න වී තිබුණි. ඒ අනුව අධිවේගී මාර්ග ආදායම් විවිධ උපක්‍රම භාවිතාකර සාවද්‍ය පරිහරණයට හා වංචාවන්ට ලක්කර තිබුණු නමුත්, වගකිව යුතු මුදල් අයකැමිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීමට හා එම අඩුපාඩු වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට අධිවේගී	අධිවේගී මාර්ග පද්ධතිය තුල දිනකට අසම්පූර්ණ ටිකට්පත් 3600 ක් පමණ නිකුත් වේ. ඉන් අසම්පූර්ණ ටිකට්පත් 1700 ක් කෙළවරපිටිය අන්තර් හුවමාරුවෙන් පමණ දිනකට නිකුත් වේ. දැනට පවතින තත්වය මත එම අසම්පූර්ණ ටිකට්පත් ප්‍රමාණය අවම කර ගැනීමට ද නොහැකි වී අතර අසම්පූර්ණ ටිකට්පත් සියල්ලම ආදායම් උපදින ටිකට්පත් නොවේ. (දිනකට අවම වශයෙන් ටිකට්පත් 3 ක් වත් අපතේ යන අතර දිනකට සැසිවාර 450 ක්ද ඇත.)

	මාර්ග කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.	
2.2.4 (උ)	2019 වර්ෂයේ සිට වසර 04 මාස 09 ක කාල සීමාව තුළ ප්‍රවේශ වීමේ කවුළුවේ සිටි අයකැම්වරුන් විසින් තම අභිමතය පරිදි හෝ නොසැලකිල්ල හේතුවෙන් වාහනයේ වර්ගය වෙනස් කරන(Category Change) ලද ටිකට්පත් 241,964 ක් නිකුත් වී තිබුණි. මෙවැනි අවස්ථා පාලනය කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට මේ දක්වා ඒවැනි දෝෂ වාර්තා වීමේ ප්‍රවණතාවය (Trend) වර්ධනය වී තිබුණි.	ගැලනිගම CCTV අංශය සහ එක් එක් අත්තර් භුවමාරු වල පවතින පහසුකම් අනුව CCTV අහඹු ලෙස නිරීක්ෂණය කරන අතර අදාල වාහන category නිවැරදි නොවීම් සම්බන්ධව අදාළ අයකැමීන් හට වාචිකව හා ලිඛිතව අවවාද කර පසුව චීනය ක්‍රියාමාර්ගද ගෙන ඇත.
2.2.4 (ඌ)	අධිවේගී මාර්ග පද්ධතිය ඉදි කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් රු.මිලියන 611,374 ක ණය මුදල් ලබා ගෙන තිබුණු අතර අධිවේගී මාර්ග සාමාන්‍ය වාර්ෂික ශුද්ධ ලාභය රු.මිලියන 3560.62 ක් විය. ඒ අනුව ණය මුදල් පමණක් (පොලිය හැර) ගෙවීමට ගතවන කාලය වර්ෂ 171 කට වැඩි බව නිරීක්ෂණය විය. ඒ අනුව ණය සහ පොලී ගෙවීම මෙම අධිවේගී මාර්ග ආදායමින් ආවරණය කර ගැනීමට නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.	පොදු මහජන සුභසාධන අරමුණින් අධිවේගී මාර්ග සඳහා වන ගාස්තු අවම පිරිවැයකට නියම කර ඇති අතර එම ආදායමින් ණය වාරික හා පොළී ගෙවීම සිදු කල නොහැකි නිසා මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම සිදු කරයි.
2.2.4 (එ)	2009 දෙසැම්බර් 31 දින එක් යන්ත්‍රයක් රු. මිලියන 40.62 ක් බැගින් එකතුව රු. මිලියන 365.60 කට මිලදී ගත් Bitumen Sprayer යන්ත්‍ර 09 ක් දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව රඳවාගෙන තිබුණු අතර අදාළ යන්ත්‍ර වල භාවිතය හා කාලය පිළිබඳ තොරතුරුද විගණනය වෙත ඉදිරිපත් නොවීය.	මෙහි සඳහන් Sprayer යන්ත්‍ර 09 අධිකාරිය සතු වන අතර ඉන් 02ක් යාපනය හා පැල්මඩුල්ල යන ප්‍රදේශවල භාවිතා කරනු ලබයි. වර්තමානයේ මාර්ග සඳහා ගල් අතුරා තාර දැමීමේ ක්‍රියාවලිය එතරම් ප්‍රචලිත නොවන අතර කුඩා මාර්ග පවා කාපට් අතුරා නිම වන බැවින් මෙම බවුසර් රථ සඳහා ඉල්ලුමක් නැති අතර තව දුරටත් අවශ්‍ය නොවේ නම් ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරනු ඇත.
2.2.4 (ඒ)	ජනාධිපති කාර්යසාධන බලකාය විසින් එක් යන්ත්‍රයක රු. .මිලියන 31.57 (276,040.69USD*114.4) ක් වූ Aggregate Chip Spreaders යන්ත්‍ර 11 ක්, 2010 වර්ෂයේ දී රු. මිලියන 347.37 කට ආනයනය කර අධිකාරිය	මෙම Aggregate Chip Spreaders යන්ත්‍ර 11 භාවිතා කරනු ලබන්නේ ගල් තාර ක්‍රමය යටතේ DBST මාර්ග සෑදීමටයි. නමුත් අධිකාරිය යටතේ පවතින A,B කාණ්ඩ දෙකෙහි පාරවල් සඳහා මෙම ගල් තාර ක්‍රමය

	වෙත ලබා දී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන මාර්ග කාපට් ඇතිරූ A සහ B බාණ්ඩයේ මාර්ග වීම හේතුවෙන් මෙම වර්ගයේ යන්ත්‍ර වල අවශ්‍යතාවය මතු වී නොතිබුණු නමුත්, ඒවා භාවිතාකරන පලාත් සභා හෝ පලාත් පාලන අයතන වෙත එම යන්ත්‍ර පවරාදීමට කටයුතු නොකර වර්ෂ 14 ක් නිශ්කාර්යව අධිකාරිය යටතේ රඳවාගෙන 2024 වර්ෂයේ දී රු.මිලියන 9.36 ක වටිනාකමකට අපහරණය කර තිබුණි.	භාවිතා කිරීම ඉතා සීමිත වූ අතර ඒ සඳහා කාපට් ඇතිරීම සිදු කරයි. තවද ඉහත සඳහන් Aggregate Chip Spreaders යන්ත්‍ර වල පළල මීටර් 4.2ක් වන බැවින් අධිකාරිය පළාත්සභා හෝ පළාත් පාලන ආයතන මඟින් නඩත්තු කරනු ලබන පටු මාර්ග සඳහා මෙම යන්ත්‍ර භාවිතා කල නොහැක. එබැවින් මෙම යන්ත්‍ර වෙනත් කිසිදු ආයතනයකට පවරා දීම නිෂ්ඵල කාර්යක් බැවින් අපහරණය කරන ලදී.
2.2.4 (ඔ)	අධිවේගී මාර්ග කළමණාකරන හා නඩත්තු අංශය විසින් කොවිඩ්-19 වසංගත අවස්ථාවේ දී, ආරක්ෂිත පියවරක් ලෙස මිලදී ගනු ලැබූ රු. මිලියන 2.88 ක් වූ ආරක්ෂක කුටි 33 ක් කොවිඩ්-19 වසංගත තත්වයෙන් පසුවද, කාසි ගණන් කිරීමේ යන්ත්‍ර 20 ක් හා බර මැනීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර 05 ක් අධිකාරිය වෙත මිලදී ගැනීමේ සිටද නිෂ්කාර්යව පැවතුණි.	කොවිඩ් වසංගතය අවසන් බැවින් එම කොවිඩ් විෂබීජ හරණ කුටි 33 භාවිතයෙන් ඉවත් කොට ඇති අතර ආරක්ෂිත මුරකුටි කැනීම සහ නඩත්තු අංශයේ නඩත්තු වැඩකටයුතු සඳහා මේ වන විට යොදාගෙන ඇත. කාසි ගණන් කිරීමේ යන්ත්‍ර 20 වෙන්දේසි කිරීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. ගබඩාවෙහි ඇති බර මැනීමේ යන්ත්‍ර අනුමැතියට යටත්ව අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට අපේක්ෂිතය.
2.2.4. (ඕ)	අධිවේගී මාර්ග පරිශීලක ගාස්තු අත්පොත සහ අංක 1732/12 දරන හා 2011 නොවැම්බර් 18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ඇතුළු පසුව කලින් කළට ගාස්තු සම්බන්ධයෙන් නිකුත් කරන ලද අනෙකුත් අති විශේෂ ගැසට් පත්‍ර අනුව ජනාධිපතිතුමා, අගමැතිතුමා ගමන් කරන වාහන සහ අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු කළමනාකරණ අංශයට අදාළ වාහන, අධිවේගී මාර්ග භාවිතා කිරීමේ දී ගාස්තු ගෙවීමෙන් බැහැර කර තිබුණද, ඉහත සඳහන් කළ අතිවිශේෂ ගැසට් පත්‍ර වලට පටහැනිව අධිකාරිය විසින් හිටපු ජනාධිපතිවරුන් 04 දෙනෙකු සඳහා අධිවේගී මාර්ග පද්ධතිය ආරම්භයේ සිට එනම් 2012 වර්ෂයේ සිට ගාස්තු රහිත අවසර පත් (Fee Exempted Vehicles) 10 ක් ලබා දී තිබුණු අතර එම අවසරපත් 2024 ඔක්තෝබර් 01 දින අවලංගු කර ඇති බව විගණනයට දන්වා තිබුණද, 2024 දෙසැම්බර් මස වන	අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු කළමනාකරණ අංශයට අදාළ වාහන හැර අනෙකුත් සියළුම වාහන සඳහා නිකුත් කර තිබූ ගාස්තු රහිත අවසරපත් මේ වන විට අවලංගු කර ඇත.

	විටත් එම අවසර පත් අතරින් 03 ක් ක්‍රියාකාරී තත්ත්වයේ පැවතුණි.	
2.2.4 (ක)	2024 වර්ෂය අවසන් වන විට අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු කළමනාකරණ අංශයේ මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගන්නා වාහන සඳහා සේවා "S" වර්ගයේ අවසර පත් 381 ක් නිකුත් කර තිබුණු අතර එයින් අවසර පත් 14 ක් නිකුත් කළ වාහන අනුයුක්ත කර ඇති අංශ පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණු අතර අධිකාරිය විසින් එකම අංකය සහිත වාහන 42 ක් සඳහා වෙනස් අංක සහිත අවසර පත් 02 බැගින් නිකුත් කිරීම මගින් අදාළ අවසරපත් අවභාවිතයට හැකියාවක් පවතින බව ද, අධිවේගී මාර්ග ආදායම් වාර්තා කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන පරිගණක පද්ධතියෙන් කිසියම් දිනක "S" අවසරපත් මාර්ගයෙන් ගමන් කළ වාහන අංක ලේඛනයක් ලබා ගැනීමේ පහසුකමද සලසා දී නොතිබුණි.	එකම වාහනයට අවසරපත් 2ක් නිකුත් කිරීම නවතා ඇති අතර යම් දිනක S පාස්පත භාවිතා කරමින් අධිවේගී මාර්ගයේ ගමන්කළ වාහන සංඛ්‍යාව දත්ත පද්ධතිය මඟින් ලබා ගැනීමේ හැකියාවද ඇත.
2.2.4 (ග)	මාර්ග සංවර්ධන අධිකාරියට අයත් 32-1863 දරන ජීප් රථය 1994 ජනාධිපතිවරන රාජකාරී කටයුතු සඳහා නිදහස් කර තිබියදී බීම් බෝම්බයකට අසු වී විනාශ වූ බව නාවික හමුදාව විසින් දන්වා මැතිවරණ කොමිසම වෙත සුන්බුන් භාර දී පසුව එම සුන්බුන් මැතිවරණ මහලේකම් කාර්යාලය මගින් වෙන්දේසි කර අදාළ රථයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර තිබුණි. පසුව එම වාහන අංකය යටතේ වාහනයක් බස්නාහිර පළාත් තුළ ධාවනය වීම හේතුවෙන් ඒ බව විමසා සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) විසින් කොළඹ අපරාධ කොට්ඨාශ වෙත 2011 පෙබරවාරි 10 වන දින පැමිණිලි කර තිබුණි. අදාළ වාහනය මැතිවරණ රාජකාරී සඳහා තාවකාලික පදනමින් පැවරීමෙන් පසු එම වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට අධිකාරියේ එකඟතාවයක් නොමැතිව කටයුතු කිරීම සම්බන්ධයෙන් මැතිවරණ මහ ලේකම් කාර්යාලයෙන් නොවිසීමට සහ ඊට අදාළ වාහන වෙනත් පෞද්ගලික පාර්ශවයක් පරිහරණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික පියවර කාලීනව නොගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.	අදාල ලිපි ගොනු පරීක්ෂා කර ඒ පිළිබඳව කරුණු අනාවරණය වූ හෙයින් පොලිස් පැමිණිල්ලක් කර ඇත.

2.2.4 (ඩ)	1995 වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත බාරදී ඇති බවට චාර්තා කර ඇති ට්‍රැක්ටර් 14 ක් සහ ට්‍රෙලර් 18 ක් අයිතිය විධිමත් ව බාරදීමට හෝ නැවත පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් තවදුරටත් අදාළ වාහන මාර්ග සංවර්ධන අධිකාරිය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියේ පැවතුණි.	1995 වර්ෂයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබා දුන් ට්‍රැක්ටර් සහ ට්‍රෙලර් රථ වලින් කොටසක් යුද්ධය නිමා වීමත් සමඟ අධිකාරිය වෙත නැවත භාර දුන් අතර ඉතිරි වාහන පිළිබඳව කිහිප වරක්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් විමසා සිටි නමුත් මේ වන විටත් කිසිදු පිළිතුරක් ලැබී නොමැත. මේ වන විට ට්‍රැක්ටර් 13 ක් සහ ට්‍රෙලර් 19 ක් නැවත අපවෙත ලබා දිය යුතුව ඇත. එයින් එක් ට්‍රැක්ටර් රථයක් සහ ට්‍රෙලර් රථ 02 ක් විනාශ වූ බව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් දන්වා සිටියත් මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් සමඟ කරන ලද සාකච්ඡා අනුව එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා එම ලිපි ප්‍රමාණවත් නොවන බව දන්වා සිටින ලදී. එබැවින් ඉහත ට්‍රැක්ටර් 13 ක් සහ ට්‍රෙලර් 19 පිළිබඳව අධිකාරිය විසින් පොලිස් පැමිණිලි ගොනු කරන ලදී.
2.2.4 (ච)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මාර්ග සංවර්ධන අධිකාරිය නමින් ලියාපදිංචි වී ඇති අංක 40-8641 හා අංක 26-6492 දරන වාහන 02 පිළිබඳ කිසිදු තොරතුරක් අධිකාරිය පවත්වාගෙන ගොස් නොකිබුණි. ඒ අනුව අදාළ වාහන බාහිර පාර්ශවයන් වෙත පැවරීමක් හෝ අවභාවිතා වීමක් සිදු වී කිබේ ද යන්න අනාවරණය කර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන පාලනය පිළිබඳ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොකිබුණි.	මෙම වාහන දෙක පිළිබඳව විමර්ෂනයක් සිදු කරන මෙන් පොලිස්පතිතුමා දැනුවත් කර 2024.10.01 දින ලිපියක් යොමු කර ඇත.
2.2.4 (ජ)	නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදි වන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන අනවසර පවුල් 1100 ක් සඳහා නිවාස ලබා දීම වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2025 දක්වා වාරික 05 කින් රු. මිලියන 2388.85 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවීමට 2021 ජූලි 14 දින ගිවිසුම් ගත වී තිබුණු අතර, අදාළ නිවාස කොලොන්නාව, මාලිගාවත්ත සහ හේනමුල්ල නිවාස ව්‍යාපෘති මගින් ලබාගැනීමට සැලසුම්කර තිබුණි. 2024 අගෝස්තු 23 වගණික දින වන විට එකතුව රු. මිලියන 960 ක් වූ වාරික 02 ක් ගෙවා අවසන් කර, 03 වන වාරිකය වූ රු. මිලියන 480 ක්	අදාල නිවාස ඒකකයන්හි තිබූ අඩුපාඩු සැකසීම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කල නමුත් , ඒ සඳහා නිසි ප්‍රතිචාර නොලැබුනු බැවින් එම නිවාස, අධිකාරිය වෙත භාර ගැනීම සිදු නොකරන ලදී.

	ගෙවීමට නියමිතව තිබූ නමුත් කිසිදු නිවාසයක් අධිකාරිය වෙත භාර ගැනීමට මේ දක්වා කටයුතුකර නොතිබුණි.	
2.2.4 (ඤ)	සෑම ව්‍යාපෘති යෝජනාවක් ම නිසි ශක්‍යතා අධ්‍යන වාර්තාවක් සමඟ ඇගයීම සහ නිර්දේශ කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු බවට 2019 දෙසැම්බර් 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද, ඒ අනුව කටයුතු නොකර මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය යටතේ 2020-2022 කාල සීමාව තුළ දුර කි.මී. 17,847 කින් යුත් මාර්ග 13,160 ක් සඳහා රු. මිලියන 394,508.09 ක ඇස්තමේන්තු අනුයාත කොට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් ගත වීමට හා 2024 සැප්තැම්බර් 30 දිනට රු. මිලියන.190,516.15 ක් වියදම් දැරීමට රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කර තිබුණි.	2019 නොවැම්බර් 25 වන දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාලව 2019 දෙසැම්බර් 18 වන දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබා දුන් අනුමැතියට අනුව මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා අංක 20/0142/221/005 හා 2020.01.14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා 2020.02.05 වන දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැති ලබා දෙන ලදී. කි.මී. 100,000 ව්‍යාපෘතිය 2020 වසරේදී ආරම්භ කල අතර පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වූ අතර මෙම ක්‍රියාකාරී සැලැස්ම සඳහා කැබිනට් අනුමැති ලබා ගෙන ඇත (2020 දෙසැම්බර් 14 දිනැති අංක අමප/20/1952/319/018 දරණ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම). මෙම අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව වාර්ෂිකව ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද ප්‍රතිපාදන සීමාවන් තුල එක් එක් වර්ෂයන් වලදී ව්‍යාපෘතියේ වැඩ පිරිනමා ඇත.
2.2.4 (ට)	2020 සිට 2024 කාල සීමාවෙදි මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 215,981ක් වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම කාල සීමාව තුළ මාර්ග කි.මී 17,847 ක් සඳහා ඇස්තමේන්තු අනුයාත කොට කොන්ත්‍රාත්කරුවන් සමඟ රු.මිලියන 394,508 කින් යුත් බැඳීම් ඇති කරගෙන තිබුණු අතර අනුමත අයවැය ප්‍රතිපාදන ඉක්මවා මු.රෙ. 94 ට පටහැනිව රු.මිලියන 178,527 ක බැඳීම් ඇති කරගෙන තිබුණි. මු.රෙ.127 (5) අනුව, ඇස්තමේන්තු වල ප්‍රතිපාදන මුදල් හා වියදම් අතර ඇති සැලකිය යුතු වෙනස් වීම් පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වූ ප්‍රධාන ගණුන් දීමේ නිළධාරීගේ වගකීම් රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් ඉටු නොකර අවිධිමත් ලෙස ඇති කර ගත් බැඳීම් පියවීමට ඉහල වාණිජ අනුපාතික ණය සහ සියයට 22.5	2020 වසරේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව කි.මී. 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩල පූර්ණ අනුමැතිය සහිතව 2020 වසරේදී පස් අවුරුදු සැලැස්මක් ලෙස ආරම්භ කරන ලදී. 2024 වසරේදී කි.මී. 100,000 ක මාර්ග පද්ධතියක් නිම කිරීමේ මූලික අරමුණ සහිතව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සකස් කර ඇත. වසර තුල ලබා දුන් ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා කිසිදු ගෙවීමක් සිදු කර නොමැති අතර 2022.04.26 මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛයට අනුව විෂය පථය සංශෝධනය කොට ප්‍රදානය කරන ලද

	සහ 20 පොලී අනුපාතිකයන් යටතේ වර්ෂ 04 කින් කල්පිරෙන වටිනාකම රු.මිලියන 40,691.79 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර භාණ්ඩාගාරය විසින් නිකුත්කර තිබුණි.	කොන්ත්‍රාත් සඳහා බැඳීම් වල වටිනාකම් රු. බිලියන 394.508 සිට රු. බිලියන 232 දක්වා අඩුකරන ලදී. එලෙසම 2022 වසරේ දෙසැම්බර් සහ 2023 වසරේ පෙබරවාරි වලදී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරනු ලැබුවේ 2021 වසරේ සිට පැවැති අතැති බිල්පත් නිරාකරණය සඳහා බවත් 2021 වසරේදී සහ 2022 වසරේ අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය රාජ්‍ය භාණ්ඩාගාරය මඟින් පැවැති ආර්ථික අර්බුදය හමුවේ ගෙවීම් කිරීමට අපහසු වූ බැවින් 2022 වසරේ අග භාගයේදී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට රජය විසින් තීරණය කරන ලදී.
2.2.4 (ඩ)	2019 දෙසැම්බර් 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කිරීමට ග්‍රාමීය මාර්ග හඳුනා ගැනීම සඳහා නිර්ණායකයන් 09 ක් යටතේ මාර්ග තෝරාගත යුතු වුවත් එලෙස මාර්ග කි.මී.17,648 ක් තෝරාගත් බවට වන තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අදාළ නිර්නායකයන්ට පටහැනිව බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය , වයඹ හා උතුරු මැද පළාත් වල රු. මිලියන 1,426.67 ක් වැය කර පාසල්, පල්ලි හා පූජනීය ස්ථාන හා රාජ්‍ය ආයතන වලට අයත් අභ්‍යන්තර මාර්ගවල හා භූමිවල කාපට ඇතිරීම, කොන්ක්‍රීට් යෙදීම, කැට ගල් ඇල්ලීම ආදී කාර්යයන් සිදු කර තිබුණි.	2020.02.13 දිනැති අංක: අමප/20/0142/221/005 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙහි සඳහන් වන්නේ ව්‍යාපෘතියේ මාර්ග තෝරා ගැනීමේදී ලකුණු ලබා දීමේ ක්‍රමවේදය අනුගමනය කරන ලෙසත්, ලකුණු සීමාව 40 ට වැඩි මාර්ග සඳහා ආරම්භයේදී මූලිකත්වය ලබා දෙන ලෙසත්ය. ඒ අනුව, කි.මී. 100,000 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙදී ව්‍යාපෘතියේ මාර්ග තෝරා ගැනීමට ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක විය. ඒ අනුව ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මඟින් ලකුණු 40 ඉක්මවා ඇති මාර්ග සඳහා මූලිකත්වය ලබා දෙමින් එම ව්‍යාපෘතින්ට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර කොන්ත්‍රාත් පිරිනැමීම මඟින් ඉටු කල අතර ලකුණු 40 යන ප්‍රමාණයට අඩු අත්‍යාවශ්‍ය සහ ආර්ථික හා සමාජීය වශයෙන් වැදගත් මාර්ග, අමාත්‍යාංශ ලේකම් හා ඉහළ කළමණාකාරීත්වයේ අනුමැතිය සහිතව සෘජු කම්කරු ශ්‍රමය යටතේ සංවර්ධනය කිරීම සිදු කර ඇත. ප්‍රදේශයේ මහජනතාවට අතිශය වැදගත් පොදු ස්ථාන වෙනුවෙන් සිදු කළ යුතු අත්‍යවශ්‍ය සංවර්ධනය කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුහිදී සාකච්ඡාවට වූ අතර එහිදී ගනු ලැබූ එකඟතාවයන්ට අනුව අමාත්‍යාංශය වෙත පළාත් නියෝජිතයින් විසින් ඇතැම් මාර්ග සංවර්ධන යෝජනා ඉදිරිපත් කරනා ලදී.මෙම ස්ථාන රටෙහි

		ජාතික ආරක්ෂාව, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය, ස්ථානීය වැදගත්කම හා පොදු ජනතාවගේ ජන ජීවිතය හා සම්බන්ධ ස්ථාන බැවින්, එම පොදු ස්ථාන වල සංවර්ධන කටයුතු වෙනුවෙන් ඇස්තමෙන්තු පිළියෙල කර අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම ව්‍යාපෘති සිදු කර ඇත. මෙම ඉදිකිරීම් සම්බන්ධ තොරතුරු සටහන් කර ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.
2.2.4 (ණ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5 මාර්ගෝපදේශයට නිකුත් කරන ලද අතිරේක 39 ට අනුව කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමිය හැකි කොන්ත්‍රාත් වටිනාකම් සඳහා පැවති සීමාවන් මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සඳහා අවමය රු.මිලියන 75 සිට උපරිමය රු.මිලියන 300 දක්වා අසාමාන්‍ය පරාසයකින් ඉහළ දැමීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමිය යුතු CIDA ශ්‍රේණිය හා කොන්ත්‍රාත් ප්‍රදාන වටිනාකම වෙනස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත්කිරීමට පෙර CIDA ආයතනයේ එකඟතාවය ලබා ගැනීමට රේඛීය අමාත්‍යාංශය කටයුතුකර නොතිබුණි.	කි.මී. 100,000 ව්‍යාපෘතියේ වැඩ පූර්ව අත්තිකාරම් ලෙස අයකර ගැනීමට ඉතිරිව ඇති මුදල සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාල පියවර ගෙන ඇත. කි.මී 100,000 ව්‍යාපෘතිය යටතේ ගෙවන ලද වැඩ පූර්ව අත්තිකාරම් මුදලින් නැවත අයකර ගැනීම සඳහා ඉතිරිව ඇති වැඩ පූර්ව අත්තිකාරම් මුදල් ප්‍රමාණය රු.290,906,845.83 ක් දක්වා අඩු වී ඇත. එම ඉතිරි මුදල් ප්‍රමාණය කොන්ත්‍රාත් 29 ක් සඳහා වන අතර එම මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා පහත ක්‍රමවේදයන් අනුගමනය කරමින් පවතී. 1. කොන්ත්‍රාත්වලට අදාලව ඉතිරිව ඇති අත්තිකාරම් ප්‍රමාණය අඩුකර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් වැඩ ප්‍රමාණයක් ලබාදී එම මුදල අඩුකර ගැනීම සඳහා සාකච්ඡා සිදු කරන ලදී. ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ එකඟතාවය ද ලැබී ඇත. 2. 2025.04.03 වන දින අමාත්‍යාංශ අතිරේක ලේකම් (ඉංජිනේරු) ගේ ප්‍රධානත්වයෙන් සියලුම කොන්ත්‍රාත් සමාගම්, මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, CGF ආයතනය හා CIDA ආයතනය සමඟ නැවතක් සාකච්ඡා පැවති අතර එහිදී කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ පදනම යටතේ අත්තිකාරම් මුදල් අයකර ගැනීම සඳහා ව්‍යාපෘතිවල ඉතිරි වැඩ ලබා දීමට යෝජනා කල අතර ඒ සඳහා ඇස්තමේන්තු මේ වන විට පිළියෙල කරමින් පවතී. තවද වැඩිපුර ප්‍රමාණයක් අත්තිකාරම් බැලූම් කර නිකුත් කල ආයතනය ලෙස CGF ආයතනය, අයකර ගැනීමට නොහැකි කොන්ත්‍රාත් සඳහා ඔවුන්ගේ සහයෝගය ලබාදීමට එකඟතාවය ලබා දී ඇත.

2.2.4 (ත)	මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් නියැදි පරීක්ෂණය අනුව දිස්ත්‍රික්ක 06 ක්‍රියාත්මක කොන්ත්‍රාත්වලට අදාළ ඇස්තමේන්තු වටිනාකම 2021 අප්‍රෙල් මස වන විට රු.මිලියන 3,504 කින් අධි ගණනය වී තිබුණද රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ඔක්තෝබර් 03 දිනැති අංක MOH/SEC/GEN/2022/71 දරන "කොන්ත්‍රාත් මුදල සඳහා යෝජිත අඩු කිරීම සම්බන්ධයෙන් පැන නැගුණු ආරවුල්" පිළිබඳ ලිපියට අනුව දැනටමත් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල රේටයන් සංශෝධනය කිරීමට නොහැකි බව දන්වා තිබුණු බැවින් මෙම අධි ගණනය වීම නිවැරදි කර නොතිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රජයට සිදුවූ අලාභය මේ දක්වා නිවැරදි කර නොතිබුණු අතර අධි ඇස්තමේන්තුගත රේටයන් සංශෝධනය නොකිරීම මත පරිපාලන වියදම් සඳහා පමණක් ඇස්තමේන්තු කළ වටිනාකම රු.මිලියන 2,186.14 කින් අධිගණනය කර තිබුණි. ඒ අනුව ප්‍රදානය කරන ලද සියලු කොන්ත්‍රාත්වල සංශෝධනය නොකරන ලද අනෙකුත් රේට අධිගණනය වීම් සැලකූ විට මෙම අලාභය තවදුරටත් වැඩි වන බව විගණනයේදී නිරීක්ෂණය විය.	කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකරන ලද්දේ තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් වේ. එලෙසම තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් ලබාගන්නා ලද වටිනම මුදලක් මඟින් කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කිරීම නිසා ඉංජිනේරු ඇස්තමේන්තුව මත පදනම්ව මෙම කොන්ත්‍රාත් ප්‍රදානය ගැන නිර්වචන සිදු කිරීම සාධාරණ නොවනු ඇත. තවද කිලෝමීටර් 100,000 ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදුකිරීමේදී ලබා ගන්නා ලද වටිනම වල මුළු වටිනාකම රුපියල් මිලියන 7,200 ක් වන අතර ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුම් ගතවී ඇත. මෙම වටිනම මුදල වැඩබිමෙහි තත්ත්වය සැලකිල්ලට ගෙන කොන්ත්‍රාත්කරුවන් විසින් පිරිනමා ඇත. එම නිසා ඇස්තමේන්තුව මත රජයට අලාභයක් හෝ හානියක් සිදුවී නොමැත.
2.2.4 (ද)	අධිකාරියට අයත් සියලුම පළාත් කාර්යාලයන් හි ඉංජිනේරුවරුන් තාක්ෂණ සහයකවරුන්, තාක්ෂණ නිලධාරීන් සහ වැඩ අධිකාරිවරුන් 1148 ක සංඛ්‍යාවක් සිටියද, රාජකාරී පැවරීමේ ක්‍රියාවලිය විධිමත් ව සිදු නොකිරීම සහ දුර්වල අධීක්ෂණය හේතුවෙන් අවසාන කොන්ත්‍රාත් බිල්පත් ගෙවීම සඳහා දීර්ඝ කාලයක් ප්‍රමාද වූ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර බිල්පත් ගෙවීම ප්‍රමාද වීම මත ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 42.89 ක් ගෙවීමකර තිබුණු බව මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය පිළිබඳව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.	කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු ඇස්තමේන්තු පිලියෙල කිරීම, මාර්ග අධීක්ෂණ කටයුතු හා බිල්පත් නිරාකරණය වැනි කාර්යයන් අදාළ පළාත් කාර්යාල හරහා සිදුවිය. ඊට අමතරව සෘජු කම්කරු ශ්‍රමය යටතේදී මාර්ග වැඩිදියුණු කිරීම පළාත් කාර්යාල හරහා සිදුකරන ල්දී. තවද මාර්ග නඩත්තු කටයුතු අධීක්ෂණය වැනි කාර්යයන්ද එම කාර්යාලයේ සීමිත ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන්, තාක්ෂණික සහයකවරුන් හා වැඩ අධීක්ෂකරුවන් හරහා ඉටු කර ගන්නා ලදී. එබැවින් පවතින සීමිත සේවක පිරිස යටතේ කාර්යයන් ඉටු කිරීමේදී බිල්පත් පරීක්ෂා කටයුතුවල ප්‍රමාද වීම් සිදුවී ඇත. තවද ව්‍යාපෘතිය සිදුකරන අවස්ථාවේදී සිටි නිලධාරීන් ස්ථාන මාරු ලැබීම, විදේශගත වීම, විශ්‍රාම යෑම් වැනි සිදුවීම් නිසාද නව නිලධාරීන් එම බිල්පත්

		පරීක්ෂා කිරීමට වැඩි කාලයක් යෙදවීම නිසාද ප්‍රමාද වීම් සිදුවී ඇත.
2.2.4 (න)	මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සේවා සැපයුම් ගිවිසුම් හි වගන්ති අංක 3(e) අනුව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුව ද, සමාගම විසින් උප කොන්ත්‍රාක්කරුවන් සඳහා ලබා දුන් වටිනාකම රු. මිලියන 125,730 ක් වූ වැඩ ඇණවුම් 1753 න් වැඩ ඇණවුම් 145ක් සඳහා පමණක් වටිනාකම රු. මිලියන 1,113 ක් වූ කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන තිබූ අතර ඒ අනුව ඉතිරි වැඩ ඇණවුම් 1608 ක් සඳහා සමාගම විසින් කිසිදු කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගෙන වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාක්කරුවන්ට ඉඩ දී තිබුණි.	මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම ඉදිරිපත් කරන ලද සේවා සැපයුම් ගිවිසුම් පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් නැත.
2.2.4 (ප)	විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු පරිදි 2025 පෙබරවාරි 28 දිනට වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමේ දී රු. මිලියන 16,785 ක් අන්තර් ගෙවීම් බිල්පත් වලින්ද, රු. මිලියන 2,812 කොන්ත්‍රාක්කරුවන්ගේ වෙනත් කොන්ත්‍රාත් සඳහා ගෙවීමට නියමිත බිල්පත් වලින් පියවා ගැනීමට හා රු.මිලියන 26 ක වැඩ පූර්ව අත්තිකාරම් බැදුම්කර මගින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. තවද රු. මිලියන 2,812 ක් කොන්ත්‍රාක්කරුවන්ගේ වෙනත් බිල්පත් මඟින් පියවා ගැනීමට කටයුතු කර තිබුණද ඒ සඳහා ලබා ගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුණි.	අයකර ගැනීමට ඉතිරිව ඇති අත්තිකාරම් මුදල් එම කොන්ත්‍රාත් සමාගම විසින් ඉටු කරන ලද වෙනත් කොන්ත්‍රාත් මඟින් පියවා ගැනීමට අදාල අනුමැතිය ලබා ගෙන ඇත. තවද අදාල කොන්ත්‍රාක්කරුවන්ගේ එකඟතාවය මත එසේ සිදු කර ඇත.
2.2.4 (බ)	අංක 79/2023 දරන හා 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අතරමඟ නවතා දමන ලද මාර්ග සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ සඳහා වෙන් වූ රු. බිලියන 28 ක මුදල් නැවතත් සංශෝධනය කර එම ප්‍රතිපාදන වටිනාකමින් රු. බිලියන 20 ක් මාර්ග කි.මී. 1500 වැඩි දියුණු කිරීමේ වැඩසටහනට වෙන් කරදීමට යෝජනා කර තිබුණු අතර, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ වලට	2023 දෙසැම්බර් 11 වන දින අංක 79/2023 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රු. බිලියන 08 ක් පමණක් කි.මී. 100,000 ව්‍යාපෘතිය මගින් ගෙවීමට ඉතිරිව පවතින හිඟ බිල්පත් පියවීමට යොදා ගැනීමට වෙන් කර තිබුණි.

	යටත් ව ක්‍රියාත්මක කිරීමට 2024 ජනවාරි 25 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව නව මාර්ග මෙම වැඩසටහනට ඇතුළත් නොකළ යුතු බව සඳහන් වුවද එයට පටහැනිව අධිකාරී අයත් නොවන නව මාර්ග කි.මී 973.5 ක් සංවර්ධනය කිරීම ආරම්භ කර තිබුණි.	
2.2.4 (ම)	අධිකාරියේ විෂය පථයට අයත් නොවන මාර්ගයක පිහිටි කින්නියා - කුරුන්වන්කර්නි මාර්ගයේ පාලම අංක 01 (කුරුවන්කර්නි පාලම) මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 227.7 කට පිරිනමා 2022 අගෝස්තු 25 දින වන විට සියයට 25 ක භෞතික ප්‍රගතියක් සඳහා කොන්ත්‍රාත්කරුට රු. මිලියන 60.6 ක් ගෙවා තිබුණි. තවද, 2024 ජනවාරි 31 දින කාවකාලික යකඩ පාලමක් ඉදිකර ගමනාගමනය පහසුකම් සැලසීමට මෙම ව්‍යාපෘතිය යටතේ හා අධිකාරියේ RMT අරමුදල මඟින් එකතුව වූ රු. මිලියන 13.504 ක පිරිවැයක්ද දරා තිබුණි. ඒ අනුව, අධිකාරියේ විෂය පථයට පරිබාහිරව මෙම පාලම සහ විකල්ප ප්‍රවාහන කටයුතු සැලසීම වෙනුවෙන් දරන ලද රු.මිලියන 74.104 ක වටිනාකම අනුමැතියකින් තොරව දරන ලද වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.	මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතියට අනුමත ප්‍රතිපාදන තුල ක්‍රියාකාරී අයවැය (Activity Budget) යටතේ කින්නියා - කුරුන්වන්කර්නි මාර්ගයේ පාලම අංක 01 (කුරුවන්කර්නි පාලම) ඉදිකිරීම සඳහා, ඉදිකිරීම් අංශය මඟින් කොන්ත්‍රාත් ප්‍රදානය කොට ආරම්භ කර ඇත.
2.2.4 (ය)	මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය යටතේ පළාත් 09 ක කොන්ත්‍රාත් 29 ක් සඳහා ලබා දුන් රු. මිලියන 245.8 ක් වැඩ පූර්ව අත්තිකාරම් සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් ලබා දුන් බැඳුම්කර 2021,2022 සහ 2023 වර්ෂ වල දී කල් ඉකුත් වී තිබුණද මෙම කල් ඉකුත් වූ වැඩ පූර්ව අත්තිකාරම් වල බැඳුම්කර කාලය ඉකුත්වීමට පෙර කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොමැතිවීම හේතුවෙන් අදාළ අත්තිකාරම් අයකර ගැනීමේ අවධානමක් පැවතියද, ඊට අදාළ හානිකරණ අලාභ වෙන්කිරීමට හා වගකීම් පැහැරහැර ඇති නිළධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි.	දෙන ලද අත්තිකාරම් මුදල් වෙනුවෙන් ලබා දෙන ලද අත්තිකාරම් සුරක්ෂිත යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී.කල්ඉකුත්වූ අත්තිකාරම් සුරක්ෂිත දීර්ඝ කරන ලෙසත් එසේ නොකරන්නේ නම් එම වටිනාකම මුදලින් අධිකාරිය වෙත ලබා දෙන ලෙස අදාල පාර්ශව දැනුවත් කර ඇත. රටෙහි පැවැති කොවිඩ් 19 හේතුවෙන් හා මූල්‍ය අර්බුදය හේතුවෙන් අත්තිකාරම් බැඳුම්කර ලබා දී ඇති මූල්‍ය ආයතන මෙම කරුණ සම්බන්ධයෙන් ක්‍රියාකර නොමැත. තවද, මෙම බැඳුම්කර දීර්ඝ කිරීම වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්කරුවන් විසින් මූල්‍ය ආයතන වෙතට ගෙවීම් සිදු කල යුතු අතර දීර්ඝ කාලයක් බිල්පත් නිරවුල් නොකිරීම හේතුවෙන් එම ගෙවීම්ද සිදු වී නැත. මෙවැනි කරුණු හේතුවෙන් මූල්‍ය ආයතන විසින්

		බැලුමකර දිර්ඝ කිරීමේ ඉල්ලීම් සිදු කලද එම දිර්ඝ කිරීම් සිදු කර නොමැත.

2.3 වෙනත් කරුණු

අනු අංකය	විගණන ඡේදය	පිළිතුර
2.3 (අ)	අධිකාරියට අයත් සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණන මතය ව්‍යාවනය කර තිබූ අතර 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අනිකර විගණන මතයක් ලබා දී තිබුණි. 2023 මාර්තු 20 දිනැති අංක CP/23/0394/608/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අධිකාරිය සතු පාලිත සමාගම් 04 ඇවර කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් අදාළ සමාගම්වල අඛණ්ඩ පැවැත්මද අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.	එකඟ වේ.
2.3 (ආ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය අනුව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් සියලු සමාගම් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මෙම සමාගම් මේ වන විට ඇවරකරණ කටයුතු සිදු කරමින් පවතී.
2.3 (ඇ)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2024 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගත හැකි වන ආකාරයෙන් වැඩ පිළිවෙලක් නිරූපනය නොවූ අතර අධිකාරිය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ඉටු කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතීන් මොනවාද යන්නත්, ඊට අදාළ තිරසර සංවර්ධන දර්ශකයන් (SDG Indicators) සහ වර්ෂය තුළ දී එම දර්ශකයන්ගේ අපේක්ෂිත කාර්යසාධනය වැනි නිර්ණායක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවුණි. එමෙන්ම 2030 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර අරමුණු මොනවාද යන්නත් හඳුනාගෙන	මාර්ග සංවර්ධන අධිකාරිය මගින් තිරසර සංවර්ධන ඉලක්ක සඳහා තිරසර සංවර්ධන සභාව වෙත ලබා දිය යුතු දර්ශකයන්, 2023 වර්ෂය වන තෙක් ලබා දී ඇත. තවද "ජාතික තිරසර සංවර්ධන ඉලක්ක ප්‍රගති පුවරුව" හි දත්ත යාවත්කාලීන කිරීම සඳහා පැවති වැඩමුළුවටද සහභාගී වූ අතර, ඒ අනුව එම ඉලක්ක හා දර්ශකයන් යාවත්කාලීන කරන ලදී. ආයතනයේ සමස්ත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැදී ඇත්තේ එක් එක් අංශයන්ට අදාළ ක්‍රියාකාරී සැලසුම් වල එකතුවකිනි.

	නොකිබුණි.	සෑම ව්‍යාපෘතියක් තුලින්ම එම ඉලක්ක සපුරා ගැනීම සිදු වන අතර,කිරසර සංවර්ධන ඉලක්ක සඳහා දක්වා ඇති අංශයන් මගින් ඊට අදාළ දත්ත වාර්ෂිකව ලබාදෙනු ලැබේ.
2.3 (ඇ)	2024 නොවැම්බර් 12 දිනට දකුණු පළාත තුළ තනතුරු 07 ක අතිරික්ත නිලධාරීන් 215ක් ද, තනතුරු 05 ක නිලධාරීන් 18 දෙනෙකුගේ පුරප්පාඩුද පැවති නමුත් අතිරික්ත නිලධාරීන් වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට / අනුයුක්ත කිරීමට හෝ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොකිබීම තුළ මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර නොකිබූ බැවින් අතිරික්ත නිලධාරීන් වෙත ගෙවන ලද වැටුප් හා දීමනා නිෂ්කාර්ය වියදම් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.	2025 වර්ෂික ස්ථාන මාරු යටතේ දකුණු පළාත තුල සිටින අතිරික්ත නිලධාරීන්/ සේවකයින් පුරප්පාඩු පවතින කාර්යාල වෙත ස්ථාන මාරු කිරීමට කටයුතු කරන ලදී. එහිදී, වසර 5 කට වඩා වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් / සේවකයින් සේවා අවශ්‍යතාවය ද සලකා බලා ස්ථාන මරු කිරීමට කටයුතු කර ඇත. පුරප්පාඩුව පවතින ඇතැම් තනතුරු සඳහා අතිරික්ත සේවකයින් අනුයුක්ත කිරීමක් සිදු නොකළ අතර, අභ්‍යන්තර උසස්වීම් ලබාදීමේදී අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.
2.3 (ඉ)	1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පිහිට වූ පනත අනුව අධිකාරියට පැවරී ඇති කාර්යභාරය වූ මාර්ග ඉදිකිරීම්, වක්කම් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා පළාත් අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රධාන ඉංජිනේරු කාර්යාල, විධායක ඉංජිනේරු කාර්යාල සහ ප්‍රාදේශීය වැඩ ඒකක පිහිටුවා එම ඒකක වෙත අවශ්‍ය නිලධාරීන් බඳවා ගෙන අනුයුක්ත කර තිබියදී, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය, දකුණු පළාතේ අතිරේක අධ්‍යක්ෂ ඉදිකිරීම් කාර්යාලය, වයඹ පළාතේ ප්‍රධාන ඉංජිනේරු ව්‍යාපෘති කාර්යාලය සහ සබරගමුව පළාතේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන ඉංජිනේරු ව්‍යාපෘති කාර්යාල පිහිටුවා එම කාර්යාල සඳහා 2021, 2022 හා 2023 යන වර්ෂයන්හිදී පිළිවෙලින් සේවකයින් 91 ක්, 85 ක් හා 81 ක් අනුයුක්ත කර එම වර්ෂවල සේවක වැටුප් හා අනෙකුත් වියදම්, වාහන කුලී ඇතුළු නඩත්තු හා මෙහෙයුම් වියදම් සඳහා පිළිවෙලින් රු.මිලියන 213.96 ක්, රු.මිලියන 186.073 ක් හා රු.මිලියන 120.613 ක් වැයකර තිබුණි.	රජය විසින් කලින් කලට ආරම්භ කරන ලද නව සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහාක්, මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතනික කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහාත් අවශ්‍ය අවස්ථාවන්හිදී පමණක් කාර්යාලවල අවශ්‍යතාවය අනුව එම කාර්යාල පිහිටුවීමට කටයුතු කර ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය තුල පවතින තනතුරු සඳහා අනුමත සමස්ථ කාර්ය මණ්ඩලය අතරින් සේවා අවශ්‍යතාවය මත රේඛීය අමාත්‍යාංශයේ සහ ව්‍යාපෘති ප්‍රධානීන් විසින් කරන ලද ඉල්ලීම්ද සැලකිල්ලට ගනිමින් අවම සේවක සංඛ්‍යාවක් එම ව්‍යාපෘති වෙත අනුයුක්ත කිරීමට මෙම අධිකාරිය විසින් පියවර ගෙන ඇත. මෙම ව්‍යාපෘති කාර්යාල මගින් සිදු කරනු ලබන්නේ ද මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති කාර්යභාරයට අදාළ වන දිවයිනේ මහාමාර්ග පද්ධතියෙහි හා පාලම් වල ඉදිකිරීම්, නඩත්තු හා ඊට සම්බන්ධ අනෙකුත් කටයුතු වේ. එම කටයුතු සිදු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්/සේවකයින් හට දැනුම හා පලපුරුද්ද

		පවතින බැවින්, පුහුණු නිළධාරීන්/සේවකයින් වශයෙන් ඔවුන් ව්‍යාපෘති කාර්යාල වෙත නිදහස් කරමින් එම රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටුකරවා ගැනීමට කටයුතු කර ඇත.
2.3 (ඊ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 36 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩය තුළ පමණක් සේවක බඳවා ගැනීම් සිදු කළ යුතු වුව ද, එයට පටහැනිව අධිකාරිය සේවක බඳවා ගැනීම් සිදු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 9474 ක් හා 9274 ක් වී සේවක අතිරික්තය 477 ක් හා ඌනතාවය 677 ක් තිබුණි. එම අතිරික්ත සේවක සංඛ්‍යාව තුළ කොන්ත්‍රාත් පදනම මත වසරක සේවා කාලයකට මධ්‍යම අයිවේගී මාර්ගය අදියර 2 මෙහෙයුම් කටයුතු සඳහා සේවකයින් 105ක් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2023 මාර්තු 22වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබී තිබුණි. ඒ අනුව අදාළ කොන්ත්‍රාත් කාලය 2024 මාර්තු 21 දිනෙන් අවසන් වුවද, එම කාලය දිර්ඝ කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ සේවා අවශ්‍යතාවයක් නොමැති සේවකයින්ගේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.	මධ්‍යම අයිවේගී මාර්ගයේ අදියර 2 හි මෙහෙයුම් කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2023 මාර්තු 22 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබී තිබුනු නමුත් එම දෙපාර්තමේන්තුවේ අංක: DMS/7777/CEP දරණ ලිපිය මගින් ඔවුන්ගේ කොන්ත්‍රාත් සේවා කාලය දිර්ඝ කර නොමැත. එහෙත් එම සේවකයින් 105 දෙනාගේ සේවා කාලය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක: 2523/2023 ට අනුව දිර්ඝ කර ඇත.
2.3 (උ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු හා වැටුප් පරිමාණය අනුමත කර නොගත් තනතුරු 07 ක් සඳහා නිලධාරීන් 19 දෙනකු බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 14.04 ක් සමාලෝචිත වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවීම්කර තිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරිය ආරම්භයේ සිට පාලම් හා නඩත්තු කටයුතු සිදු කල අතර එතෙක් කරන ලද කාර්ය භාරයට අමතරව පසු කාලීනව අධිවේගී මාර්ගයන්ද ඉදිකරන ලදී. අධිවේගී මාර්ගයන්හි නඩත්තු කටයුතු සිදු කිරීමට විවිධ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමේ අවශ්‍යතාවක් ඇති වී තිබුණි. ඒ අනුව සේවා අවශ්‍යතාවය මත එවකට සිටි කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවුනු හෙයින් අවශ්‍ය අවස්ථාවන්හිදී එවකට සිටි කළමනාකාරීත්වය විසින් සේවක සංඛ්‍යාවක් ඒ ඒ තනතුරු සඳහා

		බඳවාගෙන ඇත. 2023 වර්ෂයෙන් පසුව අධිකාරිය මගින් සිදු කරනු ලබන බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
2.3 (ඌ)	මාර්ග ස්ංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය සඳහා 2024 මාර්තු 05 දින සිදු කළ පත්වීමට අදාළ නිවැරදිභාවය හා පත්වීමේ ක්‍රමවේදය පරීක්ෂා කිරීමට අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් වෙත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දුන් ලකුණු වාර්තා, හා ඊට අදාළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් කිරීම හා ඊට අදාළ ක්‍රමවේදයේ නිවැරදිභාවය පිළිබඳ විගණනයට කහවුරු කිරීමට නොහැකි විය.	මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය සම්බන්ධව විමසා ඇති තොරතුරු නීති අංශය විසින් 2025.06.25 දින ඉදිරිපත් කර ඇත.
2.3 (එ)	මාර්ග සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව බාහිර අයදුම්කරුවෙකු සඳහා අදාළවන අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව වෘත්තීය සුදුසුකම් ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 04 ක සේවා පලපුරුද්දක් අවශ්‍ය බව දක්වා ඇතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා බාහිර අයදුම්කරුවන් සඳහා අනුමත කර ඇති සුදුසුකම් යටතේ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අයදුම්කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද, අධිකාරිය ඊට පටහැනිව වෘත්තීය සුදුසුකම් නිර්ණය කිරීමේ දී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (Senior Managerial Level) අවශ්‍ය වන අවුරුදු 04 ක සේවා පලපුරුද්ද අඩු කොට සේවා කාලය ගණනය කර තිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය වූ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 04 ක පලපුරුද්ද සියළුම අයදුම්කරුවන් විසින් සම්පූර්ණකර තිබුණි.
2.3 (ඒ)	2024 වර්ෂයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා තීරණ විගණනය සඳහා ලබා දෙන ලෙස ඉල්ලුම්කර තිබුණද, අදාළ තොරතුරු 2025 ජූනි 03 දින වන විටත් නොලැබීම	2024 වර්ෂයට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මේ වන විට භාර දී ඇත.

	හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද, බදවාගැනීම්, උසස් කිරීම්, විනය ක්‍රියාමාර්ග, අයෝජන තීරණ, දීමනා ගෙවීම්, ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් හා ඉවත්කිරීම් හා කල්බදු ගිවිසුම් වලට ඵලඹීම් යනාදිය පිළිබඳ විධිමත් අධිකාරියක් සහිතව කටයුතු කලේද යන්න විගණනයේදී තහවුරුකරගත නොහැකි විය.	
2.3 (ඔ) නියෝග අංක 07	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කරන ලද බඳවා ගැනීම සහ උසස් කිරීම ප්‍රමාණය, සිදු කරන ලද වර්ෂය ඒවාට අනුමැතිය ලබා දුන් නිලධාරීන් පිළිබඳ කාරක සභාව රැස් වූ දිනට පසුව සති 02 ක් ඇතුළත (2024 ජූලි 02) වාර්තාවක් ඉදිරිපත් කිරීම.	මේ වන විටත් මේ සඳහා පිළිතුරු ලබා දී ඇත.
නියෝග අංක 09	ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල හා සෘජු ශ්‍රමය මඟින් සිදු කරන ව්‍යාපෘතිවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ස්වාධීන ඇගයීම් ක්‍රමවේදයක් සකස් කිරීම.	අදාල ආයතන වලින් නාමයෝජනා ගෙන්වා ගෙන අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.
නියෝග අංක 11	ජාතික ජල සම්පාදන සහ ජල ප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය යන ආයතන සහ අදාළ වන අනෙකුත් සියලු ආයතන නියෝජනය වන පරිදි කමිටුවක් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සහ එම කමිටුව විධිමත් ව රැස්ව අන්තර් ආයතන සම්බන්ධීකරණයෙන් මෙම ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර, ඊට අවශ්‍ය නියෝග සැකසීම. ගැසට් පත්‍රයේ පළ කිරීම සහ අවශ්‍ය සියලු කටයුතු මාස 03 ක් ඇතුළත (2024 09.18 දිනට පෙර) සිදු කර ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.	ජාතික ජල සම්පාදන සහ ජල ප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය යන ආයතන වල නාමයෝජනා ලැබී ඇති අතර ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර, ඊට අවශ්‍ය නියෝග සැකසීම. ගැසට් පත්‍රයේ පළ කිරීම ආදිය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අදාල කමිටුව පත් කිරීම රේඛීය අමාත්‍යාංශයේ අතිරේඛ ලේකම් (ඉංජිනේරු) විසින් සිදු කරමින් පවතී.
නියෝග අංක 14	මාර්ග කිලෝමීටර් 100,000 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මග නැගුම සමාගම වෙත 25 % ක් ලබා දෙමින් ක්‍රියාත්මක කළ මාර්ග ප්‍රමාණය සහ එම ප්‍රමාණය නැවත කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කිරීම, එම සංවර්ධන කටයුතු අවසන් කර ඇති ප්‍රමාණය. එම මාර්ග වල වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් සති 01 තුළ (2024/06/26 දිනට පෙර) කාරක සභාවට ඉදිරිපත් කිරීම.	2024 ජූනි මස 18 වන දින පැවැත් වූ රැස්වීමේ කාරක සභා නිර්දේශ අනුව 2024.07.16 දිනැතිව කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කරන ලද වැඩ නියෝග සම්බන්ධව තොරතුරු වාර්තාවක් එම කාරක සභාව වෙත යොමු කරන ලද අතර 2024.07.17 දින වාර්තාව භාර ගත් බව සහතික කර ඇත.
නියෝග	ඉඩම් මැනුම් කටයුතු නිමකර ඉඩම් හඳුනා ගැනීමට හා	ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවෙන් (Public Work

අංක 15	2018 අගෝස්තු 09 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම.	Department - PWD) අධිකාරිය වෙත නාමිකව පවරනු ලැබූ අක්කර 829.64ක් වූ ඉඩම් ප්‍රමාණය මැන අවසන් කර ඇති අතර එම ඉඩම් ප්‍රමාණය ලේඛන ගත කර පවත්වා ගෙන යනු ලබයි.
නියෝග අංක 16	මාර්ග සංවර්ධන අධිකාරිය සහ ව්‍යාපෘති කාර්යාල් අතර අතරමැදි නිත්‍ය ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ඇති කිරීම, ව්‍යාපෘති භාර දීමට විධිමත් ක්‍රමවේදයක් (Project Handing over) සකස් කිරීම සහ එය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.	මේ වන විට ව්‍යාපෘති කාර්යාල 05ක් පමණක් ක්‍රියාත්මක වන අතර ඔවුන් අධිකාරිය හා වක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි කටයුතු කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් වන වක්‍රලේඛනයක් නිකුත් කර ඇති අතර එම ක්‍රම වේදය අනුව පමණක් ව්‍යාපෘති අවසන් වීමේදී අධිකාරියට අදාල වත්කම් භාර දීම සිදු කරයි.
නියෝග අංක 19	අධිවේගී මාර්ගයේ පරිපාලන කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා කුලී වාහන වෙනුවට නව වාහන මිලදී ගැනීමේ හැකියාව සොයා බලා ඒ අනුව කටයුතු කිරීම.	දක්ෂිණ අධිවේගී මාර්ගයේ මෙහෙයුම් කටයුතු සඳහා කුලී පදනම මත ගිලන් රථ හා ආපදා රථ (Vehicle Carriers) ලබා ගනු ලබයි. මෙම වාහන අධිකාරිය සතුව නොමැත. මාර්ග සංවර්ධන අධිකාරියේ කළමණාකාරීත්වය වාහන මිළට ගැනීමට තීරණය කළද එවකට රජයේ පැවති වාහන ආනයනය සීමා කිරීම හේතුවෙන් එම තීරණය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.
නියෝග අංක 21	අධිවේගී මාර්ග වල මුදල් ගෙවීම් කවුළුවල සිදු වන මූල්‍ය අක්‍රමිකතාවන්ට සම්බන්ධ පරීක්ෂණ අවසන් වන තෙක් එම නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීම සහ පවත්වන පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීම හා බහු මං තීරු නිදහස් ප්‍රවාහන ගාස්තු පද්ධතියක් ස්ථාපිත කිරීම.	මූල්‍ය අක්‍රමිකතා වල සම්බන්ධ සහ මූලික විමර්ශන වලින් වරදකරුවන් බවට පත්වූ සේවකයන් පහත පරිදි 2024 වසරේදී සේවය නහනම්කර ඇත. අතුරුගිරිය 23 කොට්ටාව 01 මත්තල 01 පින්නදූව 01 ජාඇල 01 27 බහු මං තීරු නිදහස් ප්‍රවාහන ගාස්තු පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

2.3 (ඕ)	මාර්ග ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අත්පත්කර ගනු ලබන සියළු ඉඩම් වල ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ වූ අත්පත්කර ගැනීමේ ගැසට් නිවේදනය නිකුත් කළ දින සිට වන්දි ගෙවීම සිදු කරන දිනය දක්වා ගෙවිය යුතු සියයට 07 ක වාර්ෂික පොළිය සඳහා සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක්ද, සිදුකර නොතිබුණි. තවද, අධිවේගී මාර්ග ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් පමණක් ඉඩම් කැබලි 43,350 ක් අත්පත්කරගෙන තිබූ නමුත් ඒවාට අදාළ වන්දි ගෙවීම සම්බන්ධ ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අදාල වන්දි හා පොළී මුදල් 38 (අ) ගැසට් නිවේදනය අනුව සකස් කර ඉල්ලුම් කරන අතර එම ඉල්ලීම් වලට 2024.12.31 දිනට අදාල වන වන්දි හා පොළී මුදල් සඳහා වන විස්තර මූල්‍ය ප්‍රකාශන වල සාමාන්‍ය සටහන් අංක 01 (General Notes) යටතේ හෙලිදරව් කර ඇති අතර තවදුරටත් ගෙවිය යුතු පොළිය සඳහා ප්‍රතිපාදනයන් වෙන් කිරීමට කටයුතු කරනු ලැබේ.
2.3 (ඖ)	සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු. මිලියන 3,017.64 ක් වූ ණය හිමි ශේෂයෙන් රු.මිලියන 27.7ක් වර්ෂ 02 ත් 05 ත් අතරද රු. මිලියන 13.8 ක් වර්ෂ 05 ත් 10 ත් අතරද රු. මිලියන 6.08 ක් වර්ෂ 10 ක්ද කල් ගත වී තිබුණද එම ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.	වසර 10ක් කල් ගත වූ රු. මිලියන 6.08 ක අගය දක්වා ඇත්තේ මාර්ග නඩත්තු කොන්ත්‍රාත්කරුවන් විසින් තබන ලද ආරක්ෂිත තැන්පතු මුදල් වන අතර 2025 වසර තුල ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. තවද වසර 2-5ත් අතර ඇති රු. මිලියන 27.7ක මුදල හා වසර 5-10 අතර ඇති රු. මිලියන 13.8 සම්බන්ධයෙන් අවශ්‍ය නිරවුල් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදු කරනු ලැබේ.
2.3 (ක)	කි.මී 100,000 ක විකල්ප මාර්ග, අතුරු මාර්ග, ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම යන මැයෙන් ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4.1 ඡේදයේ සඳහන් පරිදි මාස 06 ක කාලසීමාවක් තුළ මාර්ග ආරක්ෂිතව ගමනාගමනයට සුදුසු තත්වය දක්වා වැඩි දියුණු කිරීමටත්, 2024 වර්ෂය සඳහා වෙන්කර තිබූ රු.බිලියන 28 ක ප්‍රතිපාදන මගින් රු.බිලියන 20 ක් ඒ සඳහා යෙදවීමටත් අනුමැතිය ඉල්ලා තිබුණු අතර 2024 මාර්තු 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2024 වර්ෂයේ පළමු කාර්තු දෙක තුළ නිමකිරීම සඳහා ගිවිසුම් වලට එළඹී කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 562.48 ක්වූ මාර්ග 28 ක ඉදිකිරීම් කටයුතු සමාලෝචිත	අදාල මාර්ග සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව ගිවිසුම්ගත වූ වටිනාකම විධිමත් අධිකාරී බලයක් සහිතව සිදු කර ඇත.

	වර්ෂය අවසන් වන විටත් නිම කර නොනිබුණු අතර අදාළ මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු ආරම්භ නොකළ මාර්ග විය. ඒ අනුව, උක්ත කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්ගත වූ වටිනාකම විධිමත් අධිකාරී බලයක් නොමැතිව සිදුකරන ලබුණි.	
2.3 (ග)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඇති මුදලින් රඳවාගත් වටිනාකම වූ රු.මිලියන 4517.51 ක් ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස වෙන්කර මූල්‍ය තත්ත්ව විස්තරයේ සටහන්කර නොනිබුණි. තවද, එම ශේෂයෙහි ඇතුළත් රු.මි.2,500.74 ක් වූ රඳවාගැනීම් වටිනාකම මාර්ග කි.මී 100,000 ව්‍යාපෘතියට අදාළ වන අතර එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී අන්‍යෝන්‍ය එකඟතාවය මත අවසන්කර තිබුණද, කොන්ත්‍රාත් නිමවන කාලය, දෝෂ වගකීම් කාලය, කාලය දීර්ඝ කිරීම්, කාර්යසාධන බැඳුම්කර කාලය යනාදී තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය 2022 වසරේ නිම කර ඇති අතර ඉතිරි වී ඇති සියළුම රඳවාගත් මුදල් ඉතා ඉක්මණින් නිරවුල් කල යුතු බැවින් ජංගම වගකීම් යටතේ පෙන්නුම් කරන ලදී. අනෙකුත් තොරතුරු මේ වන විට යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී.

ටී. පාස්කරන්
සභාපති
මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරිය, වාර්ෂික වාර්තාව – 2024

2024 වර්ෂය සඳහා මා.සං. අධිකාරියේ කාර්ය සාධනය

ඉහත දැක්වෙන වාර්තාව මගින් 2024 වර්ෂය සඳහා මා.සං. අධිකාරියේ සහ විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතිවල කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සපයනු ලබයි. පහත දැක්වෙන්නේ මා.සං. අධිකාරියේ ක්‍රියාකාරකම්වල වැදගත් ක්ෂේත්‍රවල කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් පමණි.

1. **මාර්ග නඩත්තුව ක්‍රියාත්මක කිරීම:**
   2024 වසර තුළ A සහ B-පන්තියේ මාර්ග මෙන්ම පාලම්, අනෙකුත් අදාළ ව්‍යුහයන් සහ අධිවේගී මාර්ගවලින් සමන්විත සමස්ත ජාතික මාර්ග ජාලයම නඩත්තු කරන ලදී. ඉරිතැලීම් මුද්‍රා තැබීම, වැලි මුද්‍රා තැබීම, නිවැරදි කිරීම, පතුරු ගැසීම් මුද්‍රා තැබීම සහ ඇස්පෝල්ට් කොන්ක්‍රීට් (AC) ආවරණ තැබීම මගින් A සහ B පන්තියේ මාර්ග කිලෝමීටර් 1,669.33 ක් වැඩිදියුණු කරන ලදී. මෙම වර්ෂය සඳහා මාර්ග නඩත්තුව සහ සංවර්ධනය සඳහා වූ වැය ශීර්ෂය යටතේ රු.මි. 11,333.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ජාතික මාර්ග නඩත්තු වියදම රුපියල් මිලියන 11,249.80 ක් විය.

2024 වර්ෂය තුළ සිදුකරන ලද මාර්ග නඩත්තු කටයුතුවල මූල්‍ය කාර්ය සාධනය

විස්තරය	**2024** වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.)	**2024** දෙසැම්බර් වනවිට වියදම (රු.මි.)
ව්‍යාපෘතිය 01 - දෛනික නඩත්තු කටයුතු	2,415.30	2,415.30
ව්‍යාපෘතිය 02 - කාලීන නඩත්තු කටයුතු	1,867.30	1,867.30
ව්‍යාපෘතිය 03 - පුනරාවර්තන නඩත්තු කටයුතු	2,506.10	2,362.70
ව්‍යාපෘතිය 04 - හදිසි නඩත්තු කටයුතු	2,374.70	2,374.70
ව්‍යාපෘතිය 05 - ගංවතුර නිසා සිදුවන හානි	1,391.50	1,391.50
ප්‍රාදේශීය ඒකකය		1.90
ගෙවීම් ඒකකය		137.50
උප එකතුව	**10,554.90**	**10,550.90**
ඉදිකිරීම් අංශය (රාජ මාවත)	210.90	131.70
අරමුදල් මාරු කිරීම - ඉදිකිරීම් අංශය (පළල් කිරීම සහ වැඩිදියුණු කිරීම)	500.00	500.00
අරමුදල් මාරු කිරීම - විශේෂ ව්‍යාපෘතිය (අතුරුගිරිය හන්දිය)	67.20	67.20
මුලු එකතුව	**11,333.00**	**11,249.80**

2024 වර්ෂය තුළ සිදුකරන ලද කාලීන නඩත්තු කටයුතුවල ප්‍රගතිය

පළාත	ඉරි තැලීම් මුද්‍රා තැබීම (කි.මී.)	නිවැරදි කිරීම් (කි.මී.)	වැලි මුද්‍රා තැබීම (කි.මී.)	AC ආවරණ තැබීම (කි.මී.)	පතුරු ගැසීම් මුද්‍රා තැබීම (කි.මී.)
බස්නාහිර පළාත	42.3	78.6	1	15.6	8.2
මධ්‍යම පළාත	62.3	60.5	9.6	15.6	18.3
දකුණු පළාත	78.2	50.2	7.4	9.75	0.00
උතුරු පළාත	48.6	60.2	6.5	24.5	3.88
නැගෙනහිර පළාත	72.13	94.116	9.76	13.707	0
අක්කරෙයිපත්තු	45.6	45.8	18.3	0.33	0.00
වයඹ පළාත	65.7	98.6	8.3	18.6	0.00
උතුරු මැද පළාත	62.6	93.6	27.10	0.00	0.00
ඌව පළාත	58.6	85.6	7.8	9.2	1.4
සබරගමුව පළාත	90.2	82.4	20.1	25.3	13.2
Total	**626.23**	**749.6**	**115.9**	**132.6**	**45.0**

2. අධිවේගී මාර්ග සංවර්ධනය කිරීම :

දේශීය හා විදේශීය අරමුදල් යන දෙවර්ගයම භාවිතා කරමින් රට පුරා මාර්ග පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක කරන ලදී. 2024 අවසානය වන විට, A&B පන්තියේ මාර්ග කිලෝමීටර 53.16 ක් සම්පූර්ණ කර ඇති අතර, දේශීය අරමුදල් මගින් අරමුදල් සපයන ලද මාර්ග පළල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති යටතේ කිලෝමීටර 15.89 ක වැඩ සිදුකෙරමින් පවතී. ඊට අමතරව, දේශීය අරමුදල් මගින් මාර්ග කිලෝමීටර 221.06 ක් නිම කරන ලද අතර, විදේශීය ආධාර යටතේ කිලෝමීටර 70.29 ක් නිම කරන ලදී. තවදුරටත්, මෙම වර්ෂය වසර අවසන් වන විට දේශීය හා විදේශීය අරමුදල් මූලාශ්‍ර යටතේ ජාතික මාර්ග කිලෝමීටර 123.61 ක් ආවරණය කරමින් ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු වෙමින් පැවතුනි.

2024 වසර තුළදී, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග කිලෝමීටර 1,616.33 ක් ඉදිකොට සම්පූර්ණ කරන ලද අතර, දේශීය හා විදේශීය අරමුදල් මගින් අරමුදල් සපයන ලද විවිධ වැඩසටහන් යටතේ අතිරේක කිලෝමීටර 699.52 ක ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පැවතුනි.

3. පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම:

2024 වසර අවසානය වනවිට ජාතික මාර්ගවල ගුවන් පාලම් 3 ක් ඉදිකොට සම්පූර්ණ කර ඇත. ඒවා කොහුවල, උත්තරානන්ද මාවත සහ විනිසුරු අක්බාර් මාවත යන ස්ථානවල පිහිටා ඇති අතර, වසර අවසානය වනවිට ගුවන් පාලම් 2 ක් ඉදිවෙමින් පැවතුනි. 2024 වසර තුළ සිදු කරන ලද පාලම්/ගුවන් පාලම් ව්‍යාපෘතිවල සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

2024 වර්ෂය තුළදී දේශීය අරමුදල් භාවිතා කරමින් දුර්වල පාලම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ජාතික මාර්ගවල පාලම් 35 ක් ඉදිකොට සම්පූර්ණ කරන ලදී. මීට අමතරව, දේශීය හා විදේශීය මූලාශ්‍ර හරහා අරමුදල් සපයන ලද ව්‍යාපෘති යටතේ තවත් පාලම් 6 ක් නිම කරන ලද අතර, වසර අවසානය වනවිට තවත් පාලම් 9 ක ඉදිකිරීම් කටයුතු තවදුරටත් සිදුවෙමින් පැවතින. ග්‍රාමීය පාලම් ඉදිකිරීම් වැඩසටහන යටතේ දේශීය අරමුදල් භාවිතා කරමින් ග්‍රාමීය පාලම් 9 ක් ඉදිකොට සම්පූර්ණ කරන ලද කරන ලද අතර, තවත් ග්‍රාමීය පාලම් 12 ක වැඩ කටයුතු සිදුවෙමින් පැවතින.

2024 වසර අවසන් වන විට, කොහුවල, උත්තරානන්ද මාවත සහ ජස්ටිස් අක්බාර් මාවත යන ප්‍රදේශවල ජාතික මාර්ගවල ගුවන් පාලම් 3 ක් ද නිම කර තිබුණි. තවද, වසර තුළ අතිරේක ගුවන් පාලම් 2 ක් ඉදිකිරීම සිදුවෙමින් පැවතුනි. 2024 දී සිදු කරන ලද පාලම් සහ ගුවන් පාලම් ව්‍යාපෘතිවල සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.

2024 වසර තුළදී ඉදිකරන ලද පාලම් සහ ගුවන් පාලම් පිළිබඳ සාරාංශය

අංකය	අයිතම විස්තරය	සම්පූර්ණ කරන ලද පාලම් සහ ගුවන් පාලම් ගණන	වැඩ සිදුකෙරමින් පවතින පාලම් සහ ගුවන් පාලම් ගණන
1	ජාතික මාර්ගවල පාලම් අලුතින් ඉදිකිරීම /ප්‍රතිසංස්කරණය/පුළුල් කිරීම	6	9
2	ජාතික මහාමාර්ගවල හානි වූ/දුර්වල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම.	**35 (**පෙර වසරේ සිට ඉදිකෙරමින් පවතින ගණන **13)**	07
3	මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගවල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම/පුළුල් කිරීම	9	12
4	ගුවන් පාලම් ඉදිකිරීම	3	2

4. මාර්ග සහ පාලම් ඉදිකිරීම් වැඩවල තත්ත්ව පාලනය:

2024 වර්ෂය තුළදී, මා.සං. අධිකාරිය සතු රසායනාගාර මගින් සේවාදායක කටයුතු සඳහා රු. 26,720,641.61 ක් වටිනා පරීක්ෂණ සේවාවන් සිදු කරන ලද අතර, මා.සං. අධිකාරියට අයත් ව්‍යාපෘති සඳහා රු. 1,829,827.63 ක වටිනාකමකින් යුත් පරීක්ෂණ සේවාවන් නොමිලේ ලබා දෙන ලදි. එමෙන්ම පර්යේෂණ කාර්යයන් සඳහා රු. 225,851.22 ක වටිනාකමකින් යුත් පරීක්ෂණ කටයුතුද සිදු කරන ලදී.

2024 වර්ෂය තුළදී රසායනාගාරවලින් ලද ආදායම් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ;

2024 වර්ෂය තුළදී අධ්‍යක්ෂ-ES විසින් ඉල්ලා සිටි, නොමිලේ ලබාදෙන ලද පරීක්ෂණ සේවාවන්හි වටිනාකම රු. 9,949,391.58 ක් (නොමිලේ (බදු හැර) විය. ඊට සමගාමීව, බාහිර සේවාදායකයින් විසින් ඉල්ලා සිටින ලද, ගෙවීමේ පදනම මත ලබාදෙන ලද පරීක්ෂණ සේවාවන් මගින් රු. 22,801,769.77 ක (බදු සහිත) ආදායමක් උපයා ඇත. මෙය විශේෂයෙන්ම ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී ඉහළම අගයන් වාර්තා කළ සේවාලාභීන් විසින් ඉල්ලා සිටින ලද සේවාවන්ගෙන් ලද සැලකිය යුතු දායකත්වයක් පෙන්නුම් කරයි.

2024 වර්ෂය තුළදී භූමි විමර්ශනවලින් (විදුම් වැඩ) ලැබුණු ආදායම් පිළිබඳ සාරාංශය

මාසය	අධ්‍යක්ෂ-ES විසින් ඉල්ලා සිටින ලද සහ නොමිලේ සිදුකරන ලද (රු.) (බදු රහිත)	සේවාදායකයින් විසින් ඉල්ලා සිටිල ලද (රු.) (බදු රහිත)
ජනවාරි	861,149.80	
පෙබරවාරි		500,000.00
මාර්තු		163,531.50
අප්‍රේල්	935,684.30	
මැයි	1,930,229.01	4,400,000.00
ජූනි		
ජූලි	501,963.10	2,774,715.75
අගෝස්තු	741,186.40	
සැප්තැම්බර්		
ඔක්තෝබර්		6,078,583.75
නොවැම්බර්	1,893,127.06	
දෙසැම්බර්	3,086,051.91	8,884,938.77
එකතුව	**9,949,391.58**	**22,801,769.77**

5. දේපළ කළමනාකරණය සහ ආදායම් එකතු කිරීම

2024 වර්ෂය තුළදී, මා.සං. අධිකාරියේ දේපල කළමනාකරණ සහ ආදායම් අංශය (PM&R) විසින් අධිකාරිය සතු දේපල භාවිතය ඵලදායීව කළමනාකරණය කිරීම සහ නියාමනය කිරීම අඛණ්ඩව සිදුකරගෙන ගියේය. මාර්ග දෙපස ඇති පුවරු, ගැන්ට්‍රි, කැන්ටිලිවර්, බැනර්, බස් නැවතුම් සහ අනෙකුත් වෙළඳ දැන්වීම් ව්‍යුහයන් සඳහා බලපත්‍ර 2024 දෙසැම්බර් 31 වන දින දක්වා නිකුත් කරන ලදී. මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් අනුමත පුවරු සහ බැනර් පිළිබඳ විස්තර අධීක්ෂණ කාර්යය සඳහා කාලීන සාරාංශ සහිතව අදාළ විධායක ඉංජිනේරුවන්, ප්‍රධාන ඉංජිනේරුවන් සහ අනෙකුත් අදාළ බලධාරීන් වෙත යොමු කරන ලදි. වර්ෂය තුළදී අනිකුත් කාණ්ඩ කිහිපයක් අතුරින් බැනර් 3,826 ක්, පුවරු 2,742 ක්, බස් නැවතුම් 157 ක්, ලොතරැයි කුටි 266 ක් සහ ෆයිබර් ඔප්ටිකල් කණු 62,331 ක් ඇතුළුව සැලකිය යුතු අනුමැතීන් සහ අලුත් කිරීම් ප්‍රමාණයක් ලබා දෙන ලදී.

ආදායම සම්බන්ධව බලනවිට, **2024** වර්ෂය තුළදී ව්‍යාපෘති කළමනාකරණ සහ ආදායම් (PM&R) අංශය විසින් මා.සං. අධිකාරිය සතු විවිධ දේපල කළමනාකරණය කිරීම මගින් රුපියල් මිලියන 382.44 ක සමස්ථ ආදායමක් උපයා ඇත. පෙර වර්ෂයට සාපේක්ෂව මෙම අගයේ පහත වැටීමක් පිළිබිඹු කරන අතර, සැලකිය යුතු ආදායමක් උපයා ගනු ලැබුවේ හෝඩින් (රු. මිලියන 118.08), ගැන්ට්‍රි/කැන්ටිලිවර් (රු. මිලියන 73.17) සහ ෆයිබර් ඔප්ටික්/කේබල් ජාල (රු. මිලියන 105.01) මගින් ය. විශේෂයෙන්ම, වෙළඳ හා ලොතරැයි කුටිවලින් ලැබෙන ආදායම රුපියල් මිලියන 13.71 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. මාර්ග අද්දර යටිතල පහසුකම් සහ දේපළ ක්‍රමානුකූලව භාවිතා කිරීමට වගබලා ගනිමින්, මා.සං. අධිකාරියේ මූල්‍ය තිරසාරභාවයට හේතුවන අංශයේ අඛණ්ඩ කාර්යභාරය මෙම කාර්ය සාධනය මගින් පෙන්නුම් කෙරේ.

6. පාරිසරික හා සමාජ ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම:

2024 වර්ෂය තුළදී මාර්ග සංවර්ධන අධිකාරියේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය (ESDD) විසින් අධිවේගී මාර්ග, මහාමාර්ග සහ පාලම් සංවර්ධන ව්‍යාපෘති ඔස්සේ පාරිසරික හා සමාජ ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීමේදී වැදගත් කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කරන ලදි. මධ්‍යම අධිවේගී මාර්ගයේ ගම්පහ අන්තර් හුවමාරුව සඳහා අතිරේක පාරිසරික බලපෑම් තක්සේරුව (SEIA) මෙම අංශය විසින් සම්පූර්ණ කරන ලද අතර ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) අනුමැතියද ලබා ගන්නා ලදි. එසේම, කඩවත අන්තර් හුවමාරු වැනි ව්‍යාපෘති සඳහා අනුමැතීන් යවත්කාලීන කරන ගමන් රුවන්පුර අධිවේගී මාර්ගය - II සහ III අදියරයන් වැනි ප්‍රධාන ව්‍යාපෘති සඳහා EIAs, IEEs සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් (RAPs), උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘති - II අදියර (රාජගිරිය - අතුරුගිරිය), සහ කටුගස්තොට බයිපාස් යන ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කරන ලදි.

වර්ෂය තුළ ලද සුවිශේෂී ජයග්‍රහණයක් වූයේ ලෝක බැංකුව විසින් සපයනු ලැබූ අරමුදල් මගින් සිදුකරන ලද සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) යටතේ දුර්වල පාලම් **15** ක් සඳහා පාරිසරික හා සමාජීය පරීක්ෂණ වාර්තා (ESSRs) සහ, පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලසුම් (ESMPs) සකස් කිරීමට හැකිවීම වන අතර, එ් සියල්ල තවත් දිස්ත්‍රික්ක **32** ක් ආවරණය කරමින් පසුකාලීනව දීර්ඝ කරන ලද වැඩසටහන්ද ඇතුළුව ලෝක බැංකුව විසින් අනුමත කරන ලදි. මේවාට අමතරව, සිදුකෙරෙමින් පවතින ව්‍යාපෘති කිහිපයක් සඳහා ESDD විසින් ආරක්ෂක අනුකූලතා වාර්තා සමාලෝචනය කරන ලද අතර, ජාතික මාර්ග ව්‍යාපෘතිවල පාරිසරික හා සමාජ ආරක්ෂණය පිළිබඳව නිරීක්ෂණය කරන ලදි. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය (CEA), CCD සහ පරිසර අමාත්‍යාංශය වැනි ආයතන විසින් සංවිධානය කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු **37** ක් සහභාගි විය. එසේම මෙම අංශය විසින් පාරිසරික අනුමැතීන් ලබාගනිමින්, මහජන පැමිණිලිවලට ප්‍රතිචාර දන්වමින් සහ ආරක්ෂක අවශ්‍යතා පිළිබඳව දැනුවත් කිරීම් පවත්වමින් දත්ත එක්රැස් කිරීම, GIS සිතියම්ගත කිරීම සහ ආරක්ෂක ලිපිලේඛන සඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) ශක්තිමත් කරන ලදි.

7. සීඝ්‍රගාමී මාර්ග සංවර්ධනය කිරීම :

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ, මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතන දෙක දිවයින පුරා ප්‍රවාහන යටිතල ව්‍යුහය සහ සම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සීඝ්‍රගාමී මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සක්‍රියව කටයුතු කරමින් සිටී. මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින සීඝ්‍රගාමී මාර්ග සංවර්ධන කටයුතු පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

අගභාගය වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙමින් පවතින සීඝ්‍රගාමී මාර්ග සංවර්ධන කටයුතුවල තත්ත්වය

අංකය	ව්‍යාපෘතියේ නම		මුළු දිග (කි.මී.)	සංශෝධිත කොන්ත්‍රාත් මුදල (රු.මී.)	භෞතික ප්‍රගතිය
1	වරාය ප්‍රවේශ උන්නත අධිවේගී මාර්ගය ව්‍යාපෘතිය		5.27	52,579	97.40 %
2	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - **1** කොටස (කඩවත සිට මීරිගම දක්වා)	පැකේජය I (කඩවත සිය කොස්සින්න දක්වා)	4.04	12,586	ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය - 92.79% භෞතික ප්‍රගතිය – 36.14%
		පැකේජය II (කොස්සින්න සිට මීරිගම දක්වා)	32.55	145,799	
3	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය –III වෙනි කොටස (පොතුහැර සිට ගලගෙදර දක්වා)		32.45	209,168	ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය - 89.60% භෞතික ප්‍රගතිය –22.60%

2022 දී, පවතින ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශාල සංවර්ධන ව්‍යාපෘති නැවත උපායමාර්ගීකරණය කිරීම සහ කඩිනම් කිරීම (RAMP) සඳහා බලය පවරන ලද නිල කමිටුව විසින් **2022** වර්ෂයේදී සියලුම විශාල ව්‍යාපෘති ඇගයීමට ලක් කළේය. මෙම තක්සේරුවෙන් පසුව ඇතැම් ව්‍යාපෘති අමාත්‍ය මණ්ඩල තීරණ පදනම් කරගෙන අත්හිටුවන ලද අතර, කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘති අතර, සමහර ව්‍යාපෘති මා.සං. අධිකාරියේ විෂය පථය යටතේ (හෝ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ලෙස) ක්‍රියාත්මක වන අතර අනෙක් ඒවා අත්හිටුවා ඇත. දැනටමත් අත්හිටුවා ඇති ව්‍යාපෘති පහත පරිදි වේ;

අංකය	ව්‍යාපෘතියේ නම	මුළු දිග (කි.මී.)	මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මී.)	භෞතික ප්‍රගතිය	වර්තමාන තත්ත්වය
1	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (කහතුඩුව සිට ඉංගිරිය දක්වා)	24.30	රු.මී. 65,695	6.5%	* ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යය මා.සං. අධිකාරියේ ඉඩම් අත්පත් කරගැනීමේ අංශය විසින් **2023** ජනවාරි **01** දින සිට සිදුකරන ලදි. * ව්‍යාපෘති කළමනාකරණ ඒකකය **2023** මාර්තු **31** දින වසා දමා එය මා.සං. අධිකාරිය වෙත භාරදෙන ලදි.
2	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - IV වෙනි කොටස (කුරුණෑගල සිට දඹුල්ල දක්වා)	58.60	රු.මී. 292,381.00	ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය - 73.20%	• ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කර ඇති අතර පාරිසරික නිෂ්කාශනය (EIA), මධ්‍යම පරිසර අධිකාරිය විසින් **2016** වර්ෂයේදී සිදුකරන ලදි. මේ වනවිට එහි වලංගුභාවය **2026** සැප්තැම්බර් මාසය දක්වා දීර්ඝ කර ඇත. • ජලාපවහන කළමනාකරණ සැලැස්ම සහ ජලවිද්‍යා අධ්‍යයනය SLLDC විසින් සම්පූර්ණ කරන ලද අතර, මූලික අනුමැතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සහ අනෙකුත් අදාළ ආයතනවලින් ලැබී ඇත. • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කොන්දේසි සහිත අනුමැතිය ලැබී ඇත. • ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ භෞතික ප්‍රගතිය 73.2% ක් දක්වා සාක්ෂාත් කරගෙන ඇත. **38(අ)** වගන්තිය යටතේ ප්‍රධාන සොයාබැලීමේ භූක්තිය ආපසු ලබාගැනීම **100%** කින් සම්පූර්ණ කර ඇත • ව්‍යාපෘතිය අත්හිටුවනු ලැබූ අවස්ථාව වන විට සියලුම ඉඩම් කට්ටි (පෞද්ගලික ඉඩම් කට්ටි **3505** ක් සහ රජය සතු ඉඩම් කට්ටි **1550** ක් ඇතුළුව මුළු ඉඩම් කට්ටි ගණන **5055**), ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ **38(අ)** වගන්තිය යටතේ අත්පත් තිබුණි. ඉඩම් කට්ටි **207** ක් සඳහා පළමු ගෙවීම වන රු.මී. **344.223** ක් සහ ඉඩම් කට්ටි **148** ක් සඳහා පොලී මුදල වන රු.මී. **89.69** ක් ගෙවා ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අත්පත් කරගන්නා ලද එහෙත් ගෙවීම් සිදු නොකරන ලද සියලුම ඉඩම් කට්ටි ආපසු පැවරිය යුතුය. අමාත්‍ය මණ්ඩල තීරණය මේ වනවිට මා.සං. අධිකාරියේ ඉඩම් අංශය විසින් ක්‍රියාත්මක කරමින් සිටී. • මේ අතර, 2024.04.01 දිනැති අංක CP/0501/608/020

					දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මධ්‍යම අධිවේගී මාර්ගයේ IV වෙනි කොටස සහ රුවන්පුර අධිවේගී මාර්ගය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේද (PPP) සඳහා යෝජනා කරමින් ඒ සඳහා අනුමැතිය ලබාදී ඇත. මේ වනවිට අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම පිණිස ඒ සඳහා සුදුසු ආකෘතියක් යෝජනා කිරීමට විශේෂඥ කමිටුවක් පත්කර ඇත. • මේ අතර, ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට අනුමැතිය ඉල්ලමින් අධිවේගී මාර්ග සහ ප්‍රවාහන ගරු අමාත්‍යවරයා විසින් **2024.06.05** දිනැති අංක CP24/1108/608/049 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට ප්‍රමුඛත්වය ලබාදීම පිණිස මධ්‍ය කාලීන අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැති බව සඳහන් කරමින් ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැත.

8. අධිවේගී මාර්ග මෙහෙයුම් කටයුතු

2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය ක්‍රියාත්මක තත්තවයේ පැවැති අන්තර් හුවමාරු **36** ක් සහිතව කි.මී. **312.57** ක් දන්වා විහිදී තිබූ අතර එහි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමනය **115,853** ක් විය. උපයන ලද ආදායම රු.මී. **37** ක් වූ අතර ඉහළම AADT වාර්තා කරනු ලැබුවේ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේය **(**වාහන **34,292).** අඩුම AADT වාර්තා කරනු ලැබුවේ දක්ෂිණ අධිවේගී මාර්ගයේය **(**වාහන **34,292).**

මා.සං. අධිකාරිය විසින් **2024** වර්ෂය තුළ සුවිශේෂී ජයග්‍රහණයක් සනිටුහන් කරමින් අධිවේගී මාර්ග මෙහෙයුම් කටයුතුවලින් රු.බි. **5.23** ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. මෙම අගය පෙර වර්ෂයේදී වාර්තා කරන ලද ලාභය මෙන් ආසන්න වශයෙන් **1.5** ක ගුණයක් වූ අතර එය මෙම ප්‍රධාන ආදායම් මූලාශ්‍රයේ ශක්තිමත් ආදායම් වර්ධනයක් ඉස්මතු කරන්නක් විය. අධිවේගී මාර්ග, මා.සං. අධිකාරියේ මූල්‍ය කාර්යසාධනයේ ප්‍රධාන දායකයා වශයෙන් පවතින අතර ලාභ ඉපයීමේ මෙම වර්ධනය අධිවේගී මාර්ග ජාලයේ සාර්ථක කළමනාකරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය පිළිබිඹු කරයි.

අධිවේගී මාර්ගවල මාර්ග ආරක්ෂාව පිළිබඳව මා.සං. අධිකාරිය දැඩි සැලකිල්ලක් දක්වන අතර අරක්ෂක ක්‍රියාමාර්ගවල නැඹුරුතා හඳුනාගැනීමට එවා ශක්තිමත් කිරීමට අධිවේගී මාර්ග අනතුරු සම්බන්ධ සංඛ්‍යා ලේඛන අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබයි. **2024** වර්ෂය තුළ එකිනෙකට වෙනස් අධිවේගී මාර්ග කොටස්වල සිදුවූ රිය අනතුරු පිළිබඳ විස්තර පහත පරිදි සාරාංශගත කරනු ලැබේ.

අනතුරේ බරපතලත්වය	මරණීය	දරුණු	දරුණු නොවන	දේපළ හානි
දක්ෂිණ අධිවේගී මාර්ගය **(**කොට්ටාව - ගොඩගම**)**	7	31	41	1348
පිට වටරවුම් අධිවේගී මාර්ගය	2	6	5	228
කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය	1	5	2	315
මධ්‍යම අධිවේගී මාර්ගය	0	10	10	180
දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම	2	4	14	376
මුළු අනතුරු සංඛ්‍යාව	**12**	**56**	**72**	**2447**

9. අයවැයට එරෙහිව **2024** වර්ෂයේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

දේශීය සහ විදේශීය අරමුදල්ද ඇතුළුව 2024 වර්ෂයේදී මා.සං. අධිකාරිය සඳහා වෙන් කරන ලද මුළු අයවැය වෙන්කිරීම රු.බි. **322.14** ක් වූ අතර එම වර්ෂය තුළ වියදම රු.බි. **231.16** ක් විය. **2024** වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයේ සාරාංශය පහත පරිදි වගුගත කරනු ලැබේ.

වගුව 4- 2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයේ සාරාංශය

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මී.)	වියදම (රු.මී.)
අධිවේගී මාර්ග සංවර්ධනය	102,990.29	46,245.98
මාර්ග සහ පාලම් නඩත්තු කිරීම	11,333.00	11,249.81
අධිවේගී මාර්ග සංවර්ධනය කිරීම	183,219.83	155,126.91
මාර්ග පළල් කිරීම සහ වැඩිදියුණු කිරීම	1,991.00	1,628.83
පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම	13,109.66	7,410.05
මා.සං. අධිකාරිය විසින් වැටුප් ගෙවීම	9,500.00	9,500.00
එකතුව	**322,143.78**	**231,161.58**

මාර්ග සංවර්ධන අධිකාරියේ (මා.සං.අ.) 2024 වර්ෂයේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට සඳහා අනුගමනය කිරීමට අපේක්ෂා කරන මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

මාර්ග වත්කම් කළමනාකරණ අංශය

දේශයේ මාර්ග ජාලය ක්‍රමානුකූලව සැලසුම් කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ වගකීම මාර්ග වත්කම් කළමනාකරණ අංශය වෙත පැවරේ. මධ්‍ය කාලීන ක්‍රියාමාර්ගවලදී කාර්යක්ෂම සහ තිරසර මාර්ග වත්කම් කළමනාකරණයක් උදෙසා මෙම අංශයේ තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කරමින්, ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කරමින් සහ උසස් තාක්ෂණය උපයෝගී කරගනිමින් කටයුතු කිරීමට වගබලා ගනු ඇත.

- දත්ත එක්රැස් කිරීම, පද්ධති උඩුගත කිරීම, දත්ත පිරිසැකසුම් කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා අදාළ කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම.
- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සඳහා ArcGIS සේවාදායක පහසුකම් ලබාගැනීම.
- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සතු තොරතුරු ජාතික අවකාශ දත්ත යටිතල ව්‍යුහය (NSDI), ශ්‍රී ලංකා රථවාහන දත්ත ගබඩා කළමනාකරණ පද්ධතිය (SLTDBMS) සහ ජාතික දේශගුණික විපර්යාස දත්ත හුවමාරු ජාලය වැනි අභ්‍යන්තර සහ බාහිර ආයතන සමඟ හුවමාරු කරගැනීම.
- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සඳහා අඛණ්ඩ නඩත්තු සහාය ලබාදීම.
- මා.සං. අධිකාරිය සඳහා මාර්ග වත්කම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ස්ථාපනය කොට ඒ අනුව විස්තීර්ණ අත්පොතක් පිළියෙල කිරීම.
- සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) මගින් පොළොව විනිවිද යන රේඩාර් (GPR) පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම.
- මාර්ග වත්කම් දත්ත රැස් කිරීම සඳහා ආයතනික අවශ්‍යතාවලට අනුව ඩ්‍රෝන සමීක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම.
- සමීක්ෂණ වාහන නවතා තැබීම සහ කාර්ය මණ්ඩලයේ පහසුකම් සම්බන්ධ ගැටළු විසඳීම.

තොරතුරු පද්ධති සහ ජාල කළමනාකරණ අංශය

මෙම අංශය, මා.සං. අධිකාරියේ ඩිජිටල් පරිවර්තනය තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) විසඳුම් සහ නවීන පද්ධති මගින් සිදුකිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. මධ්‍ය කාලීන ක්‍රියාමාර්ගවලදී ක්‍රියාපටිපාටීන් විධිමත් කිරීම, තොරතුරුවල සුරක්ෂිත බව සහතික කිරීම සහ නවීන යටිතල ව්‍යුහය ගෝලීය හොඳම පරිචයන්ට අනුකූල කිරීම පිණිස අති නවීන ඩිජිටල් ආරම්භයන් ක්‍රියාත්මක කරනු ඇත.

විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධතිය (EDMS)

විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධතිය (EDMS) නිර්මාණය කර ඇත්තේ ආයතනයේ ලේඛන ආශ්‍රිත ක්‍රියාපටිපාටීන් විධිපත් කිරීම පිණිස විද්‍යුත් විසඳුමක් ලබාදෙමින් එහි පවතින ඩිජිටල් ලේඛන කළමනාකරණය කිරීම පිණිස ය. මෙම පද්ධතිය මගින් ආයතනය තුළ තිබෙන තොරතුරු සහ දත්ත මෙන්ම ලේඛන පරිලෝකනය කිරීම, ගබඩා කිරීම, නිවැරදි කිරීම, හුවමාරු කිරීම, සොයා බැලීම සහ බෙදා හැරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයයි.

මෙම පද්ධති ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂා කරන ප්‍රධාන ප්‍රතිලාභ පහත පරිදි වේ:

- කඩදාසි රහිත කාර්යාල සංකල්පයක් අනුගමනය කිරීම
- කාර්යක්ෂම ලේඛන හුවමාරු සහ සොයා බැලීම
- සරල කළ ලේඛන බෙදා හැරීම
- වැඩිදියුණු කළ තොරතුරු ආරක්ෂාව

සමස්තයක් ලෙස, විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධතිය (EDMS) මඟින් මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) කාර්යසාධනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මා.සං. අධිකාරිය ඩිජිටල්කරණය කිරීම උදෙසා තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුනා ගැනීම සහ තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහය වැඩිදියුණු කිරීම සඳහා සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) අරමුදල් ලබන උපදේශන සේවා.

මා.සං. අධිකාරිය (RDA), ලෝක බැංකු අරමුදල් ලබන සියලු සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) යටතේ උපදේශන සේවා ලබා ගැනීමට පියවර ගෙන තිබේ. මෙම ආරම්භය මගින් අරමුණු කරනු ලබන්නේ මා.සං. අධිකාරිය සඳහා සුදුසු තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුනා ගැනීම සහ එහි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ය.

ඉහත වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම, පහත දක්වා ඇති පරිදි අදියර දෙකකින් සිදුකරනු ඇත:

- **අදියර I:** මා.සං. අධිකාරිය සඳහා පස් අවුරුදු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මාර්ග සිතියමක් පිළියෙල කිරීමට උපදේශන ආයතනයක් සම්බන්ධ කර ගැනීම.
- අදියර II: ඉහත අදියර I හි සපයා ඇති විසඳුම් සහ නිර්දේශ පදනම් කරගෙන, අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යූහ සහ උපකරණ ප්‍රසම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

මෙම ආරම්භය යටතේ කීර්තිමත් උපදේශන සමාගමක් දැනටමත් තෝරාගෙන ඇත. එම සමාගම මේ වනවිට මා.සං අධිකාරියේ මෙහෙයුම්වල ඩිජිටල් පරිණාමණය සහ නවීකරණය සඳහා මහ පෙන්වන පුළුල් වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටී.

මූල්‍ය අංශය

මා.සං. අධිකාරියේ මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීමේදී වගවීම, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීමේ වගකීම මූල්‍ය අංශය වෙත පැවරේ. මධ්‍ය කාලීනව මෙම අංශය මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමට සහ තීරණ ගැනීමට උපකාරීවීම පිණිස ස්වයංක්‍රීයකරණය, තොරතුරු සඳහා වඩාත් හොඳින් ප්‍රවේශවීම සහ ප්‍රමිතිගත ක්‍රියාපටිපාටීන් කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

- විස්තීර්ණ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

පොදු ලෙජරය, මුදල් පොත, වත්කම් කළමනාකරණය, වැටුප් ලේඛනය, ව්‍යාපෘති පිරිවැයකරණය, භාණ්ඩ ලේඛනය සහ ප්‍රසම්පාදනය ඇතුළුව සියලුම ප්‍රධාන මොඩියුල ආවරණය වන පරිදි පූර්ණ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග විසඳුමක් යෙදවීම. මෙමගින් මූල්‍ය මෙහෙයුම් විධිමත් කිරීමට, නිරවද්‍යතාවය වැඩිකිරීමට සහ තත්‍ය කාලීන වාර්තාකරණය වැඩිදියුණු කිරීමට හැකිවනු ඇත.

- වෙබ් පාදක මූල්‍ය තොරතුරු ද්වාරයක් ස්ථාපනය කිරීම

තීරණාත්මක මූල්‍ය තොරතුරුවලට ප්‍රවේශවීමට සහ ඒ පිළිබඳව දැනුවත් බව වැඩිකිරීමට සුරක්ෂිත මාර්ගගත ද්වාරයක් සංවර්ධනය කොට පවත්වාගෙන යාම. මෙම ද්වාරය මගින් පාර්ශවකරුවන්ට විගණකාධිපතිගේ නිරීක්ෂණ, මූල්‍ය ගිණුම්වලට අදාල මූල්‍ය චක්‍රලේඛ සහ අනිකුත් වැදගත් මූල්‍යමය කරුණු කලෝචිතව යාවත්කාලීන කිරීම් ලබාදෙනු ඇත.

- මූල්‍ය අංශයේ මෙහෙයුම් අත්පොතක් පිළියෙල කිරීම

ක්‍රියාපටිපාටීන් ප්‍රමිතිගත කිරීමට, රෙගුලාසිවලට අනුකූලවීමට වගබලා ගැනීම සහ කාර්යමණ්ඩලයට සඳහා සමුද්දේශ මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කිරීමට මූල්‍ය අංශය සඳහා පුළුල් මෙහෙයුම් අත්පොතක් සම්පාදනය කොට ප්‍රසිද්ධ කිරීම.

- **ආදායම් එකතු කිරීම් සඳහා බැංකු ගෙවීම් පත්‍රිකා ක්‍රමයක් හඳුන්වාදීම.**

විවිධ ආදායම් එක්රැස් කිරීම් විධිමත් කිරීම සඳහා ව්‍යුහගත බැංකු ගෙවීම් පත්‍රිකා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. මෙමගින් සොයා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමට, වගවීම වැඩි කිරීමට සහ වඩාත් කාර්යක්ෂම මුදල් කළමනාකරණයක් සහතික කිරීමට හැකිවනු ඇත.

දේපළ කළමනාකරණ සහ ආදායම් ඒකකය

දේපල කළමනාකරණ සහ ආදායම් ඒකකයට පැවරී ඇත්තේ මා.සං. අධිකාරියේ දේපළ වත්කම් භාවිතය ප්‍රශස්ත කිරීම සහ මාර්ග යටිතල ව්‍යුහය ආරක්ෂා කරමින් ආදායම් උත්පාදනය කිරීමට වගබලා ගැනීම ය. මධ්‍ය කාලීනව මෙම ඒකකය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට සහ වත්කම් අගය උපරිම කිරීම සඳහා ආදායම් වැඩි දියුණු කිරීම සහ අනවසර ව්‍යුහයන් නියාමනය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

- දේපළ කළමනාකරණය සහ ආදායම් ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- මා.සං. අධිකාරියේ මාර්ග රක්ෂිත සහ යටිතල ව්‍යුහය තුන්වන පාර්ශවයන් විසින් ප්‍රයෝජනයට ගැනීමට කුලියට දීම සහ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වන තීරුබදු සහ ගාස්තු සංශෝධනය කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරිය සතු රක්ෂිත තුළ ඉදිකර ඇති පුවරු, දැන්වීම් පුවරු, ගැන්ට්‍රි, කැන්ටිලිවර්, ටෙලිකොම් යටිතල ව්‍යුහයන්, බස් අවරණ සහ ඒ හා සමාන ව්‍යුහයන් වැනි අනවසර ඉදිකිරීම් නිරීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම.
- නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ පෞද්ගලික ආයෝජකයින් සමඟ එකව මාර්ග ආරක්ෂාවට හෝ රථවාහන ප්‍රවාහයට බලපෑමක් නොවන පරිදි ඌන උපයෝජිත ඉඩම් කොටස් හඳුනාගෙන ඒවා වාණිජකරණය කිරීම.

පාලම් නඩත්තු සහ ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශය

මෙම අංශය, විශේෂයෙන්ම ග්‍රාමීය සම්බන්ධතාවය සහ හදිසි අවස්ථාවකදී සූදානම්වීම කෙරෙහි අවධානය යොමු කරමින් පාලම් යටිතල ව්‍යුහවල ආරක්ෂාව, නඩත්තුව සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව කටයුතු කිරීමට වගබලානී.

මධ්‍ය කාලීනව, මෙම අංශය විසින් පාලම් කළමනාකරණ පද්ධති ශක්තිමත් කරනු ඇති අතර ආපදා ප්‍රතිසාධනය උදෙසා වේගවත් ප්‍රතිචාර ධාරිතාවක් ගොඩනඟනු ඇත.

- සංයුක්ත 200 පාලම් සංරචක මිලදී ගැනීම තුළින් හදිසි සංචිත ශක්තිමත් කිරීම.
- මා.සං. අධිකාරියට අයත් නොවන වැඩවලදී භාවිතා කරනු ලබන බෙලි පාලම් සඳහා ඒකාකාරී කුලී /භාවිතය සහ පිරිවැය අයකර ගැනීමේ ක්‍රමයක් වැඩිදියුණු කිරීම.
- ආපදා ප්‍රතිසාධනය සඳහා වේගවත් ප්‍රතිචාර බෙලි පාලම් සවිකිරීමේ ඒකකයක් ස්ථාපනය කිරීම.
- වේගවත් යෙදවීම සඳහා කලාපීය අංගනවල ප්‍රමාණවත් අමතර කොටස් සහ පාලම් ඒකක පවත්වා ගැනීම.

මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන අංශය

මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන අංශය, ඵලදායී මානව සම්පත් පරිචයන් තුළින් මා.සං. අධිකාරියේ ආයතනික ධාරිතාව ගොඩනැඟීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මධ්‍ය කාලීනව, මෙම අංශය විසින් කාර්ය මණ්ඩල කළමනාකරණ පද්ධති නවීකරණය කිරීම, ත්‍යාග පිරිනැමීම සඳහා කාර්යසාධනය සම්බන්ධ කිරීම සහ අභිප්‍රේරණය වැඩිකිරීම සහ වෘත්තීය සංවර්ධනය සඳහා පුහුණු අවස්ථා පුළුල් කරනු ඇත.

- කාර්යසාධනය මත පදනම්ව වැටුප් වර්ධන ලබාදීම සඳහා ඇගයීමේ ක්‍රමයක් පිළිබඳව සොයා බලා හඳුන්වාදීම.
- නව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ, කළමනාකරණ මට්ටමේ තනතුරුවලට උසස් කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා ඉංජිනේරු නොවන කාර්ය මණ්ඩලයට පුහුණු අංශය මගින් පුහුණු අවස්ථා ලබා දීම.